# සමාජ නිරීක්ෂා

**උපදේශකත්වය හා මෙහෙයවීම**

ආචාර්ය කුමාරි තෝරදෙණිය

අංශාධිපති

සමාජවිද්‍යා අධ්‍යයන අංශය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පේරාදෙණිය

**පිටකවර නිර්මාණය**

රෝෂන ද සිල්වා

**මුද්‍රණය**

නෙත්වින් ප්‍රින්ටර්ස්

නො. 832, "දළදා සෙවනේ අපි පදනම"

ගැටඹේ හන්දිය

මහනුවර

081 2 386 908

# සමාජ නිරීක්ෂා

## 2020/21 හත්වන කලාපය

සංස්කාරක

කථිකාචාර්ය සමින්ද ඥාණරත්න

ශිෂ්‍ය සංස්කරණ දායකත්වය

ටී.ඩබ්ලිව්.ආර්.ලක්ෂානි

ටී.පී.සී.එස්.තිළිණි

ප්‍රකාශනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා සංගමය

## සමාජ නිරීක්ෂා සඟරාව සඳහා ලිපි සම්පාදකයින්ට උපදෙස්

මෙම සඟරාව සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වෙන් වූ සඟරාවකි. මෙය සමාජවිද්‍යා සංගමයේ ප්‍රකාශනයක් වුවත් ඕනෑම විෂයක් හදාරණ විශේෂවේදී හෝ සාමාන්‍යවේදී සිසුසිසුවියන්ට මෙම සඟරාව සඳහා ලිපි සැපයිය හැක. සමාජය පිළිබඳ කෙරෙන පර්යේෂණාත්මක, විශ්ලේෂණාත්මක සහ විමර්ශනාත්මක ලිපි මෙම සඟරාවේ පළ කිරීමට අපේක්ෂා කෙරෙයි. මෙහිදී සිංහල භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව යන දෙකෙන්ම ලිපි භාර ගැනේ. මෙම සඟරාව සඳහා ලිපි ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේනම් එහිදී පහත සඳහන් කරුණු වෙත විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කෙරෙයි.

1. ලිපිය ස්වාධීන නිර්මාණයක් වීම.

2. ලේඛකයා විසින් ලිපිය ලිවීමේදී පරිශීලනය කළ ආශ්‍රිත කරුණු අනිවාර්යෙන්ම ඇතුළත් කළ යුතු අතර එම කෘතිය පිළිබඳ අංග සම්පූර්ණ තොරතුරු ඇතුළත් කළ යුතු ය.

3. ලිපියේ අඩංගු කරුණු පිළිබඳව වගකීම රචකයා විසින් භාරගත යුතු ය.

මෙම කලාපයේ පලවන සෑම ලිපියකින්ම ප්‍රකාශිත අදහස් පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයා සතු ය.

## සමාජ විද්‍යා සංගමයේ පණිවිඩය....

ශ්‍රී ලාංකීය සමාජය තුළ සිදුවෙමින් පවතින දැවැන්ත සමාජ පරිවර්තනය හේතුවෙන් පැන නැගී ඇති අනේකවිධ වූ පුද්ගල හා සමාජ ප්‍රශ්න හමුවේ අන්කවරදාකටවත් වඩා සමාජ විද්‍යාඥයාගේ වැදගත්කම ඉස්මතු වෙමින් පවතී. පැන නැගී ඇති මෙම පුද්ගල හා සමාජ ප්‍රශ්න විසඳීම සඳහා විවිධ සමාජ විද්‍යාඥයින් අප මේ කතා කරන මොහොතේ දී පවා විවිධ සමාජ කාර්යයන්වල නිරත වෙමින් සිටී. මෙකී කාර්යය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය දක්වන දායකත්වය සුළු පටු නොවේ. අප විසින් ඉටුකරන මෙකී කාර්යභාර්යට අමතරව ශාස්ත්‍රීය කාර්යභාර්යන් රැසක් ඉටුකරන අතර සමාජ නිරීක්ෂා සඟරාව වූ කලී සමාජ විද්‍යාව හදාරන සිසුන්ගේ එකී ශාස්ත්‍රීය කාර්යභාරයේ ප්‍රතිඵලයකි.

මෙම සඟරාව තුළින් සමාජ විද්‍යාව හදාරන ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය හැකියාවන් හා ලේඛන කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා මනා පිටිවහලක් ලබා දෙන අතර අනාගතයේ හොඳ ශාස්ත්‍රඥයින් පිරිසක් බිහි කිරීම ද අරමුණු කර ගනී. මෙම සඟරාව පළ කිරීම සඳහා ඉතාමත් උනන්දුවෙන් උපදේශකත්වය, මෙහෙයවීම හා මඟපෙන්වීම සිදුකළ සමාජවිද්‍යා දෙපාර්තමේන්තුවේ අංශාධිපති ආචාර්ය කුමාරි තෝරදෙණිය ආචාර්යතුමිය, සඟරාවේ කටයුතු අධීක්ෂණය හා සංස්කරණ කටයුතුවලට අදාළ දායකත්වය සැපයූ කථිකාචාර්ය සමින්ද ඥානරත්න ආචාර්යතුමා මෙන් ම මෙහි අඩංගු ලිපි විචාරය කොට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය මඟපෙන්වීම් සිදුකළ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ සමස්ත ආචාර්ය මණ්ඩලයත් ඉතා ගෞරවයෙන් හා කෘතවේදීත්වයෙන් යුතුව සිහිපත් කරමු. ඒ වගේ ම මෙම සඟරාව සඳහා ලිපි සම්පාදනය කරදුන් සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත්, සඟරාවේ ශිෂ්‍ය සංස්කරණ දායකත්වය සැපයූ ටී.ඩබ්ලිව්.ආර්.ලක්ෂානි හා ටී.ජී.සී.එස්.තිළිණි යන සහෝදරියන්ටත් සමාජ විද්‍යා සංගමය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි.

මෙම ග්‍රන්ථය වඩාත් සර්ව සම්පූර්ණ වූ පර්යේෂණ ග්‍රන්ථයක් බව අප කිසිවිටකත් ප්‍රකාශ නොකරමු. උපාධි අපේක්ෂක සිසු සිසුවියන් විසින් රචනා කරන ලද මෙම පර්යේෂණ ලිපි තුළ බොහෝ අඩුපාඩු දුර්වලතා තිබෙන්නට පුළුවන. මේ සම්බන්ධයෙන් ඇති සෑම විවේචනයක් ම අප සංගමය ඉතසිතින් පිළිගන්නෙමු. කෙසේ වෙතත් අන් කිසිඳු අධ්‍යයනාංශයකින් සිදුනොවන්නා වූ මෙවැනි කාර්යයක් මේ ආකාරයෙන් හෝ සිදුකිරීමට ලැබීම සම්බන්ධයෙන් අප සංගමය තුළ ඇත්තේ නිහතමානී ආඩම්බරයකි.

කේ.පී.චානක මදුෂංක
සමාජ විද්‍යා සංගමය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ශාස්ත්‍ර පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

# පෙරවදන

සාම්ප්‍රදායිකත්වය හා නවීනත්වය අතර දෝලනය වන වර්තමාන ගෝලීය සමාජ සන්දර්භය තුළ සිදුවන්නාවූ සකලවිධ පරිවර්තනයන්ගේ බලපෑම මත ශ්‍රී ලාංකීය සමාජය ද යම් යම් වෙනස්වීම්වලට භාජනය වෙයි. එවන් පසුබිමක එකී සමාජ ප්‍රපංචයන් යථාර්ථවාදීව විශ්ලේෂණය කිරීම සඳහා අතිශය වැදගත්වන්නා වූ විෂය ධාරවක් බවට සමාජවිද්‍යාව පත්ව ඇත. ඒ සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ සමාජවිද්‍යාව සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකරණු ලබන පර්යේෂකවරයන්/වරියන් විසින් ස්වකීය පර්යේෂණ ආශ්‍රයෙන් දායක කරන්නා වූ ශාස්ත්‍රීය සම්මාදම ප්‍රකාශන තුළින් එළිදැක්වීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

මෙවර ඔබ අතට පත්වන සමාජ නිරීක්ෂා සඟරාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂවේදී උපාධි අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ නිර්මාණ ඇතුළත් ශාස්ත්‍රීය ප්‍රකාශනයකි. මෙම සඟරාව පළ කිරීමට උන්නදු වූ 2020/21 සමාජවිද්‍යා සංගමයේ නිලධාරී මණ්ඩලයට හා සාමාජික සාමාජිකාවන්ට මෙන් ම මේ කාර්යය අධීක්ෂණය කරමින් සිසුන් සමග දැඩි කැපවීමකින් කටයුතු කළ අප දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය සමින්ද ඥානරත්න මහතාට ද මාගේ කෘතඥතාව පළ කරමි. එමෙන්ම මෙහි ඇතුළත් ලිපි සංස්කරණය කිරීමට සහය වෙමින් හා අදාල සිසුන් දිරිමත් කළ අපගේ ආචාර්ය මණ්ඩලයේ සැමට මාගේ ගෞරව පූර්වක ස්තුතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කරමි. මෙ වර කළාපයේ අන්තර්ගත වන ලිපි වර්තමාන සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ලක්ෂණ සම්බන්ධව රචනා කර ඇති ලිපි මාලාවකි. මේ තුළින් ශ්‍රී ලාංකීය සමාජවිද්‍යා ක්ෂේත්‍රයට යම්කිසි ආකාරයක සම්මාදමක් නිසැකව ම සිදුවන බව අප විශ්වාස කරමු. මෙවැනි ප්‍රකාශන අනාගතයේදීත් එළිදැක්වීමට මෙම ප්‍රකාශනය පරිහරණය කරණ ශ්‍රාස්ත්‍රවන්තයන්/ වන්තියන්ගේ

අදහස්/ යෝජනා/ චෝදනා ප්‍රතිපෝෂණ මම ඉතා අගේ කොට සළකමි.

2022 ඔක්තෝම්බර් මස
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුවේදී ය.

ආචාර්ය කුමාරි තෝරදෙණිය
අංශාධිපති
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# පටුන

සමාජ පාලන ක්‍රමයක් ලෙස ආගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්: ශ්‍රී ලංකාව සහ ඉන්දියාව ඇසුරින්.
(එච්. කේ. ඊ. විජේසිංහ) 001

දකුණු ආසියානු කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය පිළිබඳව කලාපීය රටවල් කිහිපයක් ඇසුරෙන් සිදු කෙරෙන සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.
(ආර්. ඒ. වයි. ආර්. රණවීර) 061

ශ්‍රී ලංකාවේ පෞද්ගලික උපකාරක පන්තිවලින් එල්ල වන සෘණාත්මක සමාජ සංස්කෘතික බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්.
(ආර්. එම්. ඩබ්ලිව්. ජී. සචිනි රවින්දිකා රාජපක්ෂ) 108

සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ හැඳින්වීමක්
(ඩී. එම්. එන්. ලක්මිණි) 140

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා පළිබෝධ නාශක භාවිත කිරීමේ අර්බුදය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්
(ආර්.ඩී.ඒ.එන්. තිලකසේන) 179

# සමාජ පාලන ක්‍රමයක් ලෙස ආගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්ඃ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව ඇසුරින්.

**එච්. කේ. ඊ. විජේසිංහ**

**සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**පේරාදෙණිය**

## 1. හැඳින්වීම.

සමජාතීත්වයන්යෙන් මෙන් ම විවිධත්වයෙන් සැඳුම්ලත් සංකීර්ණ සමාජය ඉදිරියට පවත්වා ගැනීම ඉතා දුෂ්කර කටයුත්තකි. මෙලෙස ගොඩනැගුණු සමාජය පාලනය කිරීමේ මෙවලමක් ලෙස ආගම සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන්නේ සමාජයේ සෑම සමාජ සංස්ථාවක් කෙරෙහිම බලපෑම් එල්ල කරමිනි. මේ තත්ත්වය තුළ මානව සමාජයේ කුඩාම පුරුක වන පුද්ගලයා ද සමාජීය ජීවියෙක් ලෙස පමණක් නොව ආධ්‍යාත්මික ජීවිතයක ද කොටස්කරුවෙකු වශයෙන් ආගම සමඟ අත්‍යන්තයෙන් ම බැඳී සිටිමින් එහි බලපෑමට නතුවන ආකාරය හඳුනාගත හැකි ය. ඒ අනුව, අතීතයේ සිට නූතනය දක්වා ම එකිනෙකට අනන්‍ය වූ විශ්වාස පද්ධතීන් යටතේ නිර්මාණය වූ ආගම් සිය අනුගාමිකයන්ගේ ජීවිතය හා බද්ධව ඉදිරියට ගමන් කරමින් සමාජ වෙනස්වීම ඇති කරන ඒජන්තවරයෙකු ලෙස ක්‍රියාකරනු දැකිය හැකි ය.

ඒ අනුව ආගම පිළිබඳ අවධානය යොමු කරන කෘත්‍යවාදී ගුරුකුලයේ සමාජ විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකිරීම ආගමේ ප්‍රධාන කාර්යභාරයක් වන බවයි (කුමාර, 2002). මෙම තත්ත්වය තුළ ආසියානු සන්දර්භය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස දායක වන බවට බොහෝ විද්වතුන්ගේ අදහස් පල වී ඇති අතර මෙහි දී ආර්නෝල්ඩ් ටොයින්බි සමාජ විද්‍යාඥයා විසින් ඓතිහාසික ලෙස ආසියානු සමාජ ක්‍රමය නිර්මාණය වීම සඳහා බලපා ඇති ප්‍රධාන සාධක දෙකක් ලෙස ආසියානු ආගමික සම්ප්‍රදාය සහ ආගම මත හැඩගැසුණු සංස්කෘතිය යන හේතූන් දක්වයි (පෙරේරා, 2011). ඒ

අනුව, ආසියානු සමාජය තුළ සාපේක්ෂව ඉහළ ආගමික විවිධත්වයක් පවතින දකුණු ආසියාතික කලාපය තුළ සේම එම කලාපයේ සංස්කෘතිය නිර්මාණය වීමට දායක වී ඇති ඉන්දියාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ද ආගම සමාජය හැඩගැසීමේ මෙවලමක් ලෙස ක්‍රියාකරනු දැකිය හැකි ය. එලෙසම ඉන්දියාවට වෙන්ව ආසන්නව පිහිටි රටක් ලෙස ඉන්දීය සංස්කෘතියේ බලපෑමට ලක් වූ ශ්‍රී ලංකාව තුළ ද මෙම තත්ත්වය දැකිය හැකි වනුයේ දකුණු ආසියානු කලාපයේ සමජාතීත්වය සිහිපත් කරමිනි.

ඒ අනුව, මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ව්‍යාප්තව ඇති ප්‍රමුඛ ආගම් වන බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආගම් සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ශ්‍රී ලංකා සහ ඉන්දියානු සමාජ ඇසුරින් උදාහරණ සපයමින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. එහි දී මූලික ලෙසම සමාජ පාලනය සහ ආගම අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරගැනීමට අපේක්ෂිත අතර සමාජ පාලනය සඳහා ආගමේ පවතින මූලික ඉගැන්වීම් බලපාන ආකාරය පමණක් නොව එතුළින් අතීතයේ ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකර ඇති ආකාරය විමසා බැලීම සිදු වේ. ඉන් අනතුරුව නූතනයේ ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන්දියානු සමාජය තුළ ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රවණතා විමසා බැලීමට බලාපොරොත්තු වේ. ඒ අනුව, මෙහි දී සාහිත්‍ය කෘති, පුවත්පත්, අන්තර්ජාල ලිපි ලේඛන, වාර්තා මඟින් ලබා ගන්නා දත්ත තේමාකරණය මඟින් විශ්ලේෂණය කිරීම ඔස්සේ ශ්‍රී ලංකා සහ ඉන්දියානු සමාජයන් තුළ ආගම සමාජ පාලනයට මැදිහත් වන ස්වරූපය තේරුම් ගැනීම තුළින් එහි සාර්ථක, අසාර්ථකභාවය විමර්ශනය කිරීමට අපේක්ෂිත ය.

## 2. සමාජ පාලනය පිළිබඳ හැඳින්වීම.

සමාජය වූ කලී මිනිස් සම්බන්ධතා අන්තර්ක්‍රියාකාරීත්වයෙන් යුතු සංකීර්ණ ඒකකයකි. මෙම සංකීර්ණ සමාජයේ ක්‍රමානුකූල පැවැත්ම තහවුරු කර ගත හැක්කේ සමාජ පිළිවෙල ඒකාබද්ධතාව පවතින විට පමණි. යම් අයුරින් මෙම සමාජ ක්‍රියාවලිය බිඳ වැටෙන්නේ ද එය ගැටලු රැසකට හේතුවකි. ඒ අනුව, පුද්ගල සමාජය තුළ අඛණ්ඩ පැවැත්ම සඳහා සමාජ පාලනයක් පැවතීම අවශ්‍ය දෙයකි. මෙහි දී සමාජ පාලනය යන්න හඳුනා ගැනීමේ දී මේ සඳහා විවිධ අර්ථකථන ඉදිරිපත් වී තිබෙනු දැකිය හැකි ය. ඒ අනුව,

ඇමරිකානු සමාජවිද්‍යාත්මක නීතිවිද්‍යා ගුරුකුලය විසින් සමාජ පාලනය යන්න විවිධ ක්‍රමවේදයන් තුළින් සමාජය, එහි ක්‍රියාකාරීත්වය සහ ස්ථාවරත්වය සහතික කරන මාර්ග සඳහා භාවිත කර තිබේ (Cristian, 2015). සමාජ පාලනය පිළිබඳ මූලික විග්‍රයක් ඉදිරිපත් කළ G.A Lunberg ඇතුළු පිරිස පෙන්වා දී ඇත්තේ, සමාජ පාලනය යන්න "ස්ථාපිත හෝ අපේක්ෂිත සම්මතයන්ට අනුකූලවීම සඳහා පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට බලපෑම් කරන සමාජ හැසිරීම්" ලෙස ය (Rao, 2012: 456). මෙහි දී සමාජ පාලනය පිළිබඳ වැදගත් අදහසක් ඉදිරිපත් කරන J.S Roucek ට අනුව, "සමාජ පාලනය යනු කණ්ඩායම්වල භාවිතයන් සහ ජීවන වටිනාකම්වලට අනුකූලවීමට පුද්ගලයන්ට උගන්වනු ලබන, ඒත්තු ගන්වන හෝ බල කරන ලද සැලසුම්සහගත හෝ සැලසුම්සහගත නොවන ක්‍රියාවලියකි" (Rao, 2012 :456). මේ අනුව, මෙලෙස ඉදිරිපත් වී ඇති සියලු අර්ථකථනයන් විමසා බැලීමේ දී පැහැදිලි වනුයේ, සමාජ පාලනය යන්න සමාජයේ හෝ සමාජ කණ්ඩායම්වල ගොඩනැඟී පවත්නා අපේක්ෂාවන්, සම්මතයන්ට අනුකූලවීම සඳහා මඟපෙන්වන ක්‍රමානුකූල සහ ක්‍රමානුකූල නොවන ආකාරයේ උපක්‍රමයන්ගෙන් සමන්විත සමාජීය ක්‍රියාවලීන්ගේ එකතුවක් බවයි.

මෙලෙස ස්ථාපිතව පවත්නා සමාජය තුළ ජීවත්වීමේ දී සමාජ රටාවේ ඒකාබද්ධතාව පවත්වා ගැනීම සඳහා පිළිගත් සම්මතයන්, නීතිරීති, පිළිවෙත්, වටිනාකම් සහිත සාරධර්මයන්ට පුද්ගලයා අනුගතවීමට සිදුවේ. සමාජ ව්‍යූහයන්ගේ සේම කෘත්‍යයන්ගේ ඒකාබද්ධතාව පවතිනුයේ මෙම පිළිගත් රටාවන් අනුගමනය කිරීම තුළිනි. එමඟින් ඍජු ලෙසම පුද්ගලයාගේ සමාජ ජීවිතය පාලනය වන්නා වූ සේ ම පුද්ගලික ජීවිතය හැඩගැසීම සඳහා ද දායකත්වය සපයයි. යම් පුද්ගලයෙකු සමාජයේ පිළිගත් ප්‍රමිතීන්ට බැහැරව අපචාරී හැසිරීම් කෙරෙහි නැඹුරු වන්නේ ද එම පුද්ගලයා සමාජය විසින් බැහැර කිරීම සිදුවේ. නිදසුනක් ලෙස යම්කිසි පුද්ගලයෙකු අපරාධකරුවෙකු බවට පත් වූ විට සමාජයේ පුද්ගලයන්, සමාජ ආයතන මඟින් බැහැර කිරීම පමණක් නොව නීතිය මඟින් දඬුවම් ලබාදීම ද සිදු වේ. මෙම තත්ත්වය තුළ පුද්ගලයා විසින් දඬුවමට, කොන් කිරීමට, අපවාදයට බිය හේතුවෙන් පාලනයට නතුවේ.

මෙලෙස පවත්නා සමාජ පාලනය පිළිබඳ න්‍යායාත්මක ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙහි ස්වභාවය පිළිබඳ වඩාත් පැහැදිලි කර ගත හැකි වේ. ඒ අනුව, විවිධ සමාජ විද්‍යාඥයින් විසින් සමාජ පාලනය සිදුවන ආකාරය පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන් ඉදිරිපත් කර තිබෙනු දැකිය හැකි ය. මෙහි දී එමිල් ඩර්කයිම්ගේ විග්‍රහය පිළිබඳ අවධානයේ දී ඔහු The Rules of Sociological Method යන කෘතිය තුළින් පෙන්වාදෙන්නේ සමාජ කරුණු තුළින් සමාජය තුළ පුද්ගල හැසිරීම මෙහෙයවන බව වන අතර එම සමාජ කරුණු ප්‍රධාන වශයෙන් ද්‍රව්‍යාත්මක සමාජ කරුණු සහ ද්‍රව්‍යාත්මක නොවන සමාජ කරුණු ප්‍රභේද වන බව සඳහන් කර තිබේ. මේ අනුව, සමාජ කරුණු පුද්ගලයාට පරිබාහිරව සිට පුද්ගල හැසීරීම සඳහා සංරෝධකයක්, බලපෑමක් ඇති කරන බව ඩර්කයිම්ගේ අදහස වී තිබේ (කුමාර, 2020). එසේම ටැල්කොට් පාසන් වෙත අවධානයේ දී ඔහු ද සමාජ පාලනය සිදුවන ආකාරය විග්‍රහයට ලක්කර ඇත්තේ සමාජයේ පවතින පද්ධති, උපපද්ධති සහ එහි ව්‍යුහමය එකඟතාවය හරහා ය. ඔහුට අනුව, සමාජයට ඉහළින් ඇති සංස්කෘතික පද්ධතිය මඟින් සමාජය පාලනයට ලක්වේ. මීට සමාන අදහසක් ඉදිරිපත් කරන ජේම්ස් කෝල්මන් ප්‍රතිමාන අභ්‍යන්තරීකරණය පිළිබඳ සාකච්ඡාවට ලක්කර තිබේ. ඔහුට අනුව, පුද්ගලයා ප්‍රතිමාන, අගනාකම් ජීවිතයේ කොටසක් කරගනිමින් ඒ අනුව ජීවිතය හැඩගසා ගැනීම වෙනත් පාලන ක්‍රමයන්ට සාපේක්ෂව පුද්ගල හැසිරීම් පාලනය සඳහා වඩා කාර්යක්ෂම ක්‍රමයක් බවයි. මේ අනුව, සමාජ පාලනය ආශ්‍රිත න්‍යායාත්මක කරුණු තුළින් පැහැදිලි වනුයේ පුද්ගල හැසිරීම සමාජය තුළ බාහිර බලවේග ඔස්සේ පාලනය වන බවයි.

මෙලෙස පවත්නා සමාජ පාලනය සඳහා සමාජ සංස්ථා මඟින් සුවිශේෂී කාර්යයභාරයක් ඉටුවනු දැකිය හැකි ය. මේ අනුව අවධානය යොමු කිරීමේ දී සමාජ පාලනය විවිධ අයුරින් ප්‍රභේද වනු හඳුනාගත හැකි ය. C. N. Shankar Rao ගේ 'Soiology' නම් ග්‍රන්ථය තුළ සමාජ පාලනය සිදුකරන කාරකයන් අනුව ඒවා ප්‍රධාන වශයෙන් විධිමත් සමාජ පාලන ක්‍රම සහ අවිධිමත් සමාජ පාලන ක්‍රම ලෙස වර්ගීකරණයට ලක්කර ඇති අයුරු හඳුනා ගත හැකි ය. මෙහි දී විධිමත් සමාජ පාලනය වෙත අවධානයේ දී නීතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ආදි ආයතන හරහා සිදුවන පාලනයක් ලෙස පැහැදිලි කර තිබේ (Rao, 2012: 457). ඒ අනුව, පුද්ගලයා සමාජය තුළ ක්‍රියාකිරීමේ දී නීතිවිරෝධී හැසිරීම් පාලනය සඳහා නීතිය ක්‍රියාත්මක

කරමින් දඬුවම් ලබාදීම මීට අයත් වේ. මෙහි දී විධිමත් පාලනයේ වෙනස් වීම අවධානයේ දී අතීතයේ රාජ්‍ය නීතියට අමතරව ගම්සභා පාලන ක්‍රම තවදුරටත් වර්ධනය වී පළාත් පාලන ආයතන උසාවි, පොලිසිය, හමුදාව වැනි ආයතන මඟින් පාලනය සංවිධානාත්මක වී ඇති අයුරු හඳුනාගත හැකි ය.

එනමුත් මෙයින් වෙනස්ව සමාජය පාලනය සඳහා අවිධිමත් සමාජ පාලන ක්‍රමවේදයන් පිළිබඳ අවධානයේ දී අඟනාකම්, චාරිත්‍ර වාරිත්‍ර, ආගම, සමවයස් කණ්ඩායම් ජනාචාර, සනාචාර මඟින් සමාජයේ හැසිරීම පාලනය වනු දැකිය හැකි ය. මේවා සමාජයේ ස්ථාපිත පාලන උපක්‍රම ලෙස ක්‍රියාකරමින් පුද්ගලයන් අදාළ සමාජයේ අපේක්ෂාවන් සඳහා උපායශීලීව හැඩගැස්වීම සිදුවේ. මෙහි දී අවබෝධ කරගත යුතු තවත් කරුණක් වනුයේ සමාජ පාලනය යන්න කාලීනව මෙන් ම අවකාශීයවම වශයෙන් වෙනස්වීමට බඳුන්වීමයි. එනම්, මානව සමාජයේ ආරම්භයේ සිටම සමාජ පාලනය පැවත එමින් කාලීන වශයෙන් වෙනසට ලක්වෙමින් පවතින අතර සමාජ සන්දර්භය අනුව ද එකිනෙකට වෙනස් වනු හඳුනාගත හැකිය. මෙලෙස පවත්නා සමාජ පාලනය සමාජ පර්යාය පවත්වා ගැනීමට බාධවක් වන අතර එය සමාජ විසංවිධානයට හේතුවක්වේ. මේ අනුව, සමාජ පාලන උපක්‍රම ක්‍රියාත්මක වන්නා වූ ආකාරය සමාජ සන්දර්භය අනුව විමසා බැලීමේ පදනම මත මෙම අධ්‍යයනය තුළින් අවධානය යොමු කරනුයේ සමාජය තුළ පවත්නා සම්මතයන්, අපේක්ෂාවනගේ පැවැත්ම සඳහා ප්‍රබල බලපෑමක් සිදුකරන ආගම නැමති සමාජ සංස්ථාව, සමාජ පාලනයට මැදිහත් වන ආකාරය පිළිබඳවයි.

### 3. ආගම පිළිබඳ හැඳින්වීම.

සමාජය තුළ දැඩි ලෙස මුල් බැසගත් සමාජ සංස්ථාවක් ලෙස ආගම සමාජයේ පැවැත්මට සුවිශේෂී දායකත්වයක් සපයයි. මෙලෙස පවත්නා ආගම පිළිබඳ හඳුනාගැනීමේ දී එහි සංකල්පීය අර්ථය වටහාගැනීම අත්‍යවශ්‍ය දෙයකි. ඒ අනුව, ආගම සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදී ඇති religion යන පදය ලතින් භාෂාවේ religio යන වචනයෙන් බිඳී ආවක් වන අතර එය අල්ලාගැනීම, එකට බැඳීම යන්න අර්ථවත් කර තිබේ (කුමාර, 2002: 319). ආගම පිළිබඳ මූලික විග්‍රයක් ඉදිරිපත් කළ ඊ. බී. ටයිලර් අර්ථකථනය කර ඇත්තේ ආගම යනු අධිභෞතික සත්ත්වයන් පිළිබඳ විශ්වාසයයි යනුවෙනි. ඔහු

එමඟින් ආගම අදෘශ්‍යමාන බලවේග කෙරෙහි විශ්වාසය පදනම් කරගත් ප්‍රපංචයක් ලෙස දැක්වීමට උත්සාහ කර තිබේ. එලෙසම ආගම පිළිබඳ කෘත්‍යාත්මක විමර්ශනය කළ එමිල් ඩර්කයිම් විසින් ඔහුගේ The Elementary Forms of the Religious Life කෘතිය තුළින් විග්‍රහ කර ඇත්තේ "ආගම යනු ශුද්ධ යැයි සම්මත විශ්වාසයන් සහ භාවිතයන් පද්ධතියක් වටා බැඳුණු අන්තර් රඳා පැවැත්මක් ඇති, යම් සමාජයක පුද්ගලයන් සියල්ල එක් සදාචාර ප්‍රජාවක් ලෙස සංවිධානය කරන ආයතනයකි" යනුවෙනි (කුමාර, 2002: 326). මෙහි දී ශුද්ධ, අශුද්ධ වස්තූන් පිළිබඳ පැහැදිලි කරන ඩර්කයිම් පෙන්වා දී ඇත්තේ ආගම ශුද්ධත්වය පූජනීයත්වය මත පදනම්ව සමාජය ක්‍රමවත් පාලනයකට නතු කරන බවයි. ඒ අනුව, අතීත ගෝත්‍රික සමාජය තුළ තෝටමායනය එනම්, යම් වස්තුවක්, සත්ත්වයෙක්, ශාකයක් වශයෙන් යම් සංකේතයක් පාදක කරගනිමින් ඇති වූ ඇදහීමේ පිළිවෙත ආගමේ මූලාරම්භය බව දක්වන ඩර්කයිම් ආගම සමාජ පර්යාය ඇති කරන්නක් ලෙස පැහැදිලි කිරීමට උත්සාහ කර තිබේ.

එලෙසම ජේම්ස් ප්‍රෙසර් විසින් ඔහුගේ 'The Golden Bough' කෘතියෙහි ආගම පිළිබඳ විග්‍රහ කරමින් පෙන්වා දෙන්නේ මිනිසාට වඩා උත්තරීතර වූ ද, ස්වභාවධර්මය සහ තම ජීවිතය මෙහෙයවා හසුරුවා පාලනය කරන්නා වූ ද තමාට වඩා උසස් බලවේගයක් පහදවා ගැනීමට දරනු ලබන උත්සාහයන් ආගම බවයි (අතුකෝරාල, 2016). ඒ අනුව, මෙහි දී ද ආගම උසස් බලවේගයක් ලෙස පුද්ගලයාට ඉහළින් සිට ජීවිතය පාලනය කරන්නා වූ ක්‍රමයක් ලෙස විමසුමට ලක්කර තිබෙනු දැකිය හැකි ය. ඒ අනුව, අභිචාරවලින් ආරම්භ වී නිර්මාණය වූ ආගම පසුව විද්‍යාව දක්වා ගමන් කරනු ඇති බවට ආගමේ විකාශනය පිළිබඳ පැහැදිලි කරන ප්‍රේසර්ගේ අදහස වී තිබේ. ඒ අනුව විමසීමේ දී මෙලෙස ආගම පිළිබඳ සමාජ හා මානවවිද්‍යාත්මක විග්‍රහයන් තුළින් ආගමේ මූලික ස්වරූපය මෙන් ම කෘත්‍යාත්මක පැතිකඩ පැහැදිලි කරගැනීමට උත්සාහ දරා තිබෙනු හඳුනාගත හැකි ය..

මේ අනුව පැහැදිලි වනුයේ ආගම වූ කලී ඇසට පෙනෙන සහ ඇසට නොපෙනෙන වස්තුවක් හෝ බලවේගයක් කෙරෙහි පවතින පිළිගැනීම පදනම් කරගත් ඇදහිලි විශ්වාස පද්ධතියක් මඟින් පුද්ගලයන් මෙහෙයවනු ලබන සමාජය විසින් උත්තරීතර යැයි පිළිගනු ලබන දර්ශනයක් බවයි. මෙහි දී ආගම සමාජය මෙහෙයවනු ලබන ප්‍රධාන ගාමක බලවේගය ලෙස පමණක් නොව

පුද්ගලයෙකුගේ සිය දුෂ්කර මානසික බිඳවැටීම්වලදී ආධ්‍යාත්මික සුවය සඳහා ආගමේ පිහිට පැතීමට පුරුදුව සිටී. එමගින් පුද්ගල ජීවිතය සාර්ථක කරගැනීම සඳහා මඟපෙන්වීමක් පමණක් නොව ශක්තියක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරයි. එහි දී විවිධ ආගමික ඇදහිලි, ඉගැන්වීම් පිළිබඳ ප්‍රශ්න කිරීමකින් තොරව පුද්ගලයා අනුගතවීම සිදුවන අතර ඒ සඳහා ශ්‍රද්ධවීම, සම්මත වීම පමණක් ප්‍රමාණවත් වේ. නිදසුනක් ලෙස දෙවියන් සත්‍ය ලෙසම සිටිනවා ද යන්න පවා අවබෝධයක් නොමැතිව ජීවිතයේ අසීරු අවස්ථාවන් වල දී දෙවියන්ගේ පිහිට පැතීමට ජනයා පුරුදුව සිටීම දැක්විය හැකි ය. ඒ අනුව මෙමඟින් පැහැදිලි වනුයේ ආගම සහ අනුගාමිකයන් අතර අන්තර් සම්බන්ධතා විශ්වාසය මත ගොඩනැගී ඇති බවයි.

මෙලෙස ආගම සමඟ ඒකාබද්ධ වූ පුද්ගලයා ඇඳබැඳ තබා ගනිමින් ආගමේ මූලධර්ම ක්‍රමයෙන් අනුගාමිකයන්ට මුදා හැරීම සිදුවන අතර එමඟින් ආගම තුළ පවත්නා මූලික ඉගැන්වීම් අනුව කටයුතු කිරීමට සේ ම පිළිවෙත් පද්ධතියට ගරු කිරීමට පුද්ගලයාට සිදු වේ. මෙය හුදෙක් පුද්ගලයා ආගමේ පාලනයට නතු කර ගැනීමක් ලෙස සැලකිය හැකි ය. මේ පිළිබඳ කාල් මාක්ස්ගේ විග්‍රහයෙන් මනාව පැහැදිලි වේ. කාල් මාක්ස් දක්වන ආකාරයට මිනිසා ආගම නිර්මාණය කළ පසුව ආගම මිනිසා නිර්මාණය, කිරීම, පාලනය ආරම්භ කරයි. එහි දී ඔහු ආගම අබිං ලෙස පුද්ගලයාට නැගීටීමට ඉඩ නොතබමින් අඳුරේ ගිල්වා තබන මත්වීමක් වශයෙන් හඳුනාගෙන තිබේ (කුමාර, 2002). ඒ අනුව, ආගම සිය අනුගාමිකයන් මෙහෙයවන ඒජන්තවරයෙකු වශයෙන් හඳුනාගෙන තිබෙනු දැකිය හැකි ය.

එපමණක් නොව සමාජය තුළ ස්ථාපිතව පවත්නා ආගමික සංස්ථාව මඟින් සමාජයේ සදාචාර පිළිවෙල පවත්වා ගැනීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරයි. එහි දී ආගම සමාජයේ ප්‍රධාන සමාජානුයෝජන කාරකයක් ලෙස ක්‍රියාකිරීම තුළින් පුදගලයා සමාජයේ පිළිගත් ක්‍රමයට අනුගතකිරීම සිදු වේ. කෘත්‍යවාදය අනුව විමසා බැලීමේ දී සමාජයේ අනිකුත් සමාජ ආයතන සේ ම ආගම මඟින් ඉටු කරන කාර්යකොටසක් පවතී. මෙලෙස ක්‍රියාකිරීම මඟින පවුල, ආර්ථිකය, දේශපාලනය, නීතිය වශයෙන් අනිකුත් සමාජ සංස්ථාවනවල ක්‍රියාකාරීත්වය සඳහා එකිනෙකට බලපෑම් කිරීම සිදුවේ. මෙයට නිදසුනක් ලෙස මැක්ස් වෙබර් විසින් සිය 'පොතෙස්තන්ත්‍ර ආචාරධර්ම සහ ධනවාදයේ සාරය' නැමති කෘතිය තුළින් පොතෙස්තන්ත්‍ර ආගමික ඉගැන්වීම් ධනවාදය නිර්මාණය

සඳහා දායක වන බවට සිදු කළ පැහැදිලි කිරීම දැක්විය හැකි ය. එලෙසම ආගම ආර්ථිකයට බලාන ආකාරය පැහැදිලි කළ වෙබර් ආසියානු කලාපයේ බුද්ධාගම, හින්දු වැනි පරලොවට නැඹුරු වූ ආගම් එම කලාපයේ දුප්පත්කම පැතිරීමට හේතු වී ඇති බව දක්වා තිබේ. මේ අනුව, පිළිබඳ සිදු කරන ලද බොහෝ අධ්‍යයනයන් තුළින් ආගම සමාජ පාලන මෙවලමක් ලෙස හඳුනා ගෙන තිබෙනු දැකිය හැකි ය.

මෙලෙස ආගම සමාජ පාලනයක් ලෙස ක්‍රියාකිරීමේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණ වනුයේ විවිධත්වය සහ වෙනස් වීම කෙරෙහි ය. සමාජය තුළ එක් ආගමක් පමණක් පවතින්නේ නම් පුද්ගලයා එකම පාලනයකට නතු වේ. නමුත් ලෝකය තුළ එකිනෙකට වෙනස් ධර්මතාවන්ගෙන් සමන්විත ආගම් රැසක් ව්‍යාප්ත වී ඇත. මෙම ආගම්වල ඇදහිලි විශ්වාසයන් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් එකිනෙකට වෙනස් වේ. සදාචාර සහ දුරාචාර ලෙස අගයන්නා වූ සංකල්පයන් ද විවිධත්වය උසුලයි. එලෙසම ආගම නැමැති සමාජ සංස්ථාව කාලීනව මෙන් ම අවකාශීයව වෙනස් වීම සිදු වේ. කාලීන වශයෙන් සැලකීමේ දී යම් ආගමක් තුළ පවතින ක්‍රියා පිළිවෙත ක්‍රමික විකාශනයට හෝ නවීකරණයට ලක්විය හැකි ය. නවාංග ආගමට එකතු වීම සිදු වේ. එලෙසම අවකාශීය ලෙස සැලකීමේ දී රටින් රටට සමාජයේ සමාජයට විවිධ පුද්ගලයින් අදහන් ආගම වෙනස් වේ. එකම ප්‍රදේශයක වුව ද විවිධ ආගම් ඇදහීම සිදු වන අතර ඒ මත සමාජ පාලනය ද එකිනෙකට වෙනස් ස්වරූප ගැනීම සිදු වේ. මේ අනුව ආගම මඟින් සිදු කරන සමාජ පාලනය අධ්‍යයනය කිරීම වූ කලී විවිධත්වයෙන් යුතු සම්මිශ්‍රණයක් මඟින් කෙරෙන මෙහෙයවීමක් අධ්‍යයනය කිරීමකි. ඒ අනුව, මෙම කරුණු සැලකිල්ලට ගනිමින් ආගම සමාජ පාලනයක් ලෙස ක්‍රියාකරන්නා වූ ආකාරය පිළිබඳ ශ්‍රී ලංකාව සහ ඉන්දියානු සමාජය තුළ මුල් බැසගත් ආගම්වල ක්‍රියාකාරීත්වය ඇසුරින් විමසුමට ලක්කිරීම මෙම අධ්‍යයනය තුළ සිදු වේ.

## 4. ශ්‍රී ලංකා සහ ඉන්දියානු සමාජවල ආගමික ව්‍යුහය

දකුණු ආසියාතික කලාපයේ ඉතා ඉහළ ආගමික විවිධත්වයෙන් යුතු රටවල් අතර ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. විශේෂයෙන්ම ඉන්දියාවට ආසන්නව

වෙන්ව පිහිටි රටක් ලෙස ශ්‍රී ලංකාව, ඉන්දියානු සංස්කෘතියේ පමණක් නොව ආගම්වල බලපෑමට ලක්වුව ද තමන්ටම අනන්‍යය වූ සංස්කෘතියක් ගොඩනඟාගෙන තිබෙනු දැකිය හැකි ය. මෙහි ප්‍රතිඵලය ලෙස ශ්‍රී ලංකාව ඉන්දියාව පමණටම විවිධත්වයෙන් යුතු රටක් නොවුන ද බහු ආගමික රටක් ලෙස ස්ථාපිත වී ඇති ආකාරය හඳුනා ගත හැකි ය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ බහුතරය අදහන ආගම බවට බුද්ධාගම පත්ව තිබෙන අතර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2011 දත්ත වාර්තාවන් අනුව එය 70.2% ප්‍රතිශතයකි. එලෙසම හින්දු ආගම අදහන්නන් 12.6% ක්ද ඉස්ලාම් ආගම අදහන්නන් 9.7% ලෙස ද ක්‍රිස්තියානි ආගම අදහන්නන් 7.4%ක් ලෙස ද වෙනත් ආගම් අදහන්නන් 0.1%ක් සිටින බවට ද වාර්තා වී තිබේ (United Nations Human Rights, 2019). එලෙසම ඉන්දියාව වෙත අවධානයේ දී බහුසංස්කෘතික රටක් වශයෙන් ඉතා ඉහළ ආගමික විවිධත්වයකට උරුමකම් කියන සමාජයක් ලෙස දැඩි ආගමික විවිධත්වයක් පවතිනු දැකිය හැකි ය. මේ අනුව, එරට තුළ ආගමික සංයුතිය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඉන්දියාවේ බහුතර ප්‍රජාවක් අදහන ආගම බවට හින්දු ආගම පත්ව තිබෙන අතර එය 79.80%ක ප්‍රමාණයකි. මීට අමතරව ඉස්ලාම් ආගම 14. 23%ක්ද, ක්‍රිස්තියානි ආගම 2.30%ක්ද, සිකීම් ආගම 1.72%ක්ද, බුද්ධාගම අදහන ප්‍රජාව 0.37%ක් ලෙස ද අනෙකුත් ආගම් අදහන 0.66% පමණ ප්‍රජාවක් ද වන බව ඇස්තමේන්තු ගත කර තිබේ (Religion Census, 2011). මෙලෙස පවත්නා ආගම් සමස්තයක් ලෙස ශ්‍රී ලංකා මෙන්ම ඉන්දියානු සමාජයන් තුළ ව්‍යාප්තව ඇති ආකාරය විමසා බැලීමෙන් එක් එක් ආගම් ව්‍යාප්ත වී ඇති විෂමතාව හා ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවබෝධ කර ගත හැකි ය.

මේ අනුව, විමසා බැලීමේ දී ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආගමික විවිධත්වය තුළ බහුතරය අදහන ආගම මඟින් සමාජ පාලනය සඳහා දැඩි බලපෑමක් එල්ල කරනු දැකිය හැකි ය. එලෙසම සෙසු ආගම් ද ආගමික විශ්වාසයන් මත පදනම්ව සමාජය තුළ පාලනයක් ස්ථාපිත කරමින් සමාජ සංස්කෘතික ජීවන රටාව පවත්වා ගැනීම කෙරෙහි මූලික මැදිහත්වීමක් කරනු දැකිය හැකි ය. ඒ අනුව, මෙලෙස ගොඩනැගී ඇති ආගමික ව්‍යූහය පිළිබඳ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන්දියාව තුළ ව්‍යාප්තව ඇති බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමික ඉගැන්වීම් සමාජ පාලනයට

මැදිහත් වී තිබෙන ආකාරය අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වේ.

## 5. ආගමික ඉගැන්වීම් මත පදනම්ව අතීතයේ සමාජ පාලන ක්‍රමයක් ලෙස ආගම ක්‍රියාත්මක වූ ආකාරය.

### 5. 1. බෞද්ධ ආගම

ක්‍රි. පූ. 6වන සියවසයේ දී භාරතීය සමාජය තුළ ඇති වූ බුදුන් වහන්සේගේ ධර්මය එකල පැවති ආගමික ඉගැන්වීම් අභිබවා යමින් නව යුගයක සනිටුහන් කිරීමක් විය. මෙය බෞද්ධ ආගමේ උපතයි. මෙම බුදු දහමේ මූලික පරමාර්ථය වනුයේ නිර්වාණය අවබෝධ කර ගැනීමයි. ඒ අනුව, මෙලොව පරලොව ශාන්තිය උදෙසා කුසල් රැස්කර අකුසල් දුරු කරමින් පරලොව දියුණුව සලසාලමින් අවසානයේ නිවන සාක්ෂාත් කරගැනීමට මඟ පෙන්වයි. එම නිවන කරා යොමු කරන්නා වූ මාර්ගය වන දුක, දුකට හේතුව, දුක නැති කිරීමේ මාර්ගය සහ දුක නැති කිරීම වශයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමට මඟ පෙන්වීම මෙමඟින් සිදුවේ. බෞද්ධ ආගම් ප්‍රධාන ශාස්තෘවරයා බුදුන් වහන්සේ වන විට එතුමන් අනුගමනය කරමින් පැවිදි ජීවිතයට පිවිසි භික්ෂු, භික්ෂුණීන් සිය අනුගාමික ගිහි පැවිදි දෙපාර්ශවය යහපත සහ නිවන කරා යොමු කිරීමේ කටයුත්තෙහි නිරත වේ. මේ අනුව, බෞද්ධ ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස අවධානව යොමු කිරීමේ දී විශේෂයෙන් ම බෞද්ධ ආගමික මූලධර්ම සමාජ පාලනය සඳහා මඟ පෙන්වනු දැකිය හැකි ය. ඒ අනුව, මෙමඟින් ආගම පුද්ගලයා තුළ ස්වයං පාලනයක් ඇති කිරීම තුළින් සමාජය තුළ පාලනයක් ඇති කරයි.

බුදු දහම තුළ සමාජ පාලනය සඳහා මුල්ම මඟ පෙන්වීම ලබා දී ඇත්තේ පන්සිල් සහ අටසිල් මඟිනි. විශේෂයෙන් බෞද්ධයෙකු වශයෙන් පංශීලය සුරැකීම යහපත් දිවියක් සඳහා බලපෑම සිදු වේ. එනම්, පරපණ නැසීමෙන් වැළකීම ජීවිත හානි සිදුකිරීමට පෙළඹීම අවම කිරීමට හේතුවකි. අන්සතු දේ සොරකම් නොකිරීම මංකොල්ලකෑම් අල්ලස් අවම වීමට හේතුවකි. කාමය වරදවා හැසිරීමෙන් වැළකීම අනියම් සබඳතාවලට පෙළඹීම අවම වීමට හේතුවකි. මුසාවාදයෙන් තොරවීම තුළ අසත්‍ය ප්‍රකාශයට බාධා පැමිණ වීමක් සිදු වේ. එසේම මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොරවීම දුරාචාරය අවම වීමට හේතුවකි. ඒ අනුව, බුදුදහමේ මෙම මූලික ඉගැන්වීම් මෙහෙයවීමේ ප්‍රධාන සාධකය බවට 'කර්මය' දැක්විය හැකි

ය. මෙහි දී කර්මය පිළිබඳ ඉගැන්වීම් පුද්ගලයා අපගාමී චර්යාවන් ගෙන් මිදී සදාචාර ගති පැවතු ඇති කරගැනීම සඳහා යොමු කිරීම සිදු වේ. බෞද්ධ ධර්මයට අනුව කර්මය යනුවෙන් හැඳින්වෙනුයේ අප විසින් හිතාමතා කරනු ලබන ක්‍රියාවයි. මෙම සිත, කය, වචනය යන තිදොරින් සිදුවන කර්මය කුසල් හෝ අකුසල් විය හැකි ය. යමෙකු නිවන සාක්ෂාත් කර ගැනීම සඳහා කුසල් වැඩිය යුතු අතර අලෝභ, අදෝස, අමෝහ විය යුතු ය. එලෙසම බුදුදහමට අනුව අනුන්ට අයහපත් දේ කරමින් අකුසල් කිරීම පාපයක් ලෙස ධර්ම කරුණුවල සඳහන් වේ. එනම් "අකුසලය පීඩාකාරීය. කරන්නාටත් විඳින්නාටත් වේදනාකාරීය... අකුසලය 'ගොනු පසුපස ඇදෙන කරත්තය මෙන්' දුක් විපාකය දෙන බව ධම්මපදයේ විග්‍රහ වේ" (සුමිත්ත, 2011). ඒ අනුව, බුදුදහමේ කර්මය සහ හේතුඵල දහමට අනුව අකුසල කර්ම කිරීමෙන් අයහපත් ලෝකයන්හි ඉපදීම, අපාගත වීම, මිනිස්බව ලැබීමට නොහැකි වීම වැනි ප්‍රතිවිපාකයන්ට බිය වූවන් අකුසල් ක්‍රියාවන්ගෙන් ඈත් වේ. එලෙසම කුසල් කිරීමෙන් යහපත් භවයක උපත ලැබීම, දිව්‍ය සම්පත් ලැබීම හේතුවෙන් පව්පින් සංකල්පය මත කුසල් ක්‍රියාවෙහි නිරත වේ. මෙහි දී පුද්ගලයා සිදුකරන සෑම ක්‍රියාවක දී ම පව්පින් ඉස්මතු වන අතර එමඟින් ස්වයං පාලනයක් ඇති කර ගැනීම සිදු වේ. මෙයට නිදසුනක් ලෙස බුදුදහමේ ඉගැන්වීම් අනුව සියදිවි නසාගැනීම කල්ප ගණනාවක් යනතුරු මිනිස් භවයන් නොලැබීමට හේතුවක් යැයි ඉගැන්වීම තුළ සියදිවි නසාගැනීමට දරනු ලබන උත්සාහයන් තුළ පාලනයක් ඇති වීම දැක්විය හැකි ය.

එලෙසම බෞද්ධ ආගම මඟින් සදාචාරවත් සමාජයක් ගොඩනැංවීම සඳහා මඟපෙන්වීමක් ලබාදෙන අතර සමස්ත බුදුදහමම ආචාරධර්ම අන්තර්ගත වූවකි. මෙහි දී සිඟාලෝවාද සූත්‍රය, වසල සූත්‍රය, මංගල සූත්‍රය වශයෙන් සෑම දහමකම යහපත් ජීවිතයකට මඟපෙන්වයි. ඒ අනුව බුදුදහම මඟින් අන්තර් සම්බන්ධතා පවත්වමින් ඉටු කළ යුතු යුතුකම් වගකීම් පිළිබඳ සඳහන් කරමින් සමාජය යහපතට යොමු කරයි. ඒ අනුව, සිඟාලෝවාද සූත්‍රයෙහි සිඟාලක නම් ගෘහපතියාගේ සදිසා නමස්කාරය අර්ථාන්විත කරමින් සමාජයේ පුදගලයන් කොටස් 6කට බෙදා දෙමව්පියන්-දූදරුවන්, ගුරුවරුන්- ශිෂ්‍යාවන්, භාර්යාවන්- ස්වාමිපුරුෂයන්, මිත්‍රජනයා-කුලපුත්‍රයන්, ස්වාමියා- දාසයන් සහ බමුණන් දායකයන් වශයෙන් අන්‍යෝන්‍ය වශයෙන් ඉටුකළ යුතු යුතුකම් වගකීම් පෙන්වා දී තිබේ.

නිදසුනක් ලෙස දෙමව්පිය දූදරු සබඳතා විමසීමේ දී ප්‍රධාන ලෙස දරුවන් විසින් දෙමව්පියන්ට ඉටු කළ යුතු යුතුකම් පෙන්වා දී ඇත. එනම්, දෙමව්පියන් ආහාරපානයෙන් පෝෂණය කිරීම, දෙමව්පියන්ගේ කටයුතු ඉටුකරදීම, කුල වංශය රැකගැනීම,දායාද ආරක්ෂා කිරීම මාපියන් මියගිය කල්හි දක්ෂිණා සිදුකොට පින් අනුමෝදන් කරවීම ලෙස ය (සිඟාලෝවාද සූත්‍රය, 2016).

මෙලෙස දරුවන් විසින් දෙමව්පියන් රැකබලා ගතයුතු ධාර්මික පිළිවෙත ලෙස කුඩා කල සිට දරුවන් රැකබලා ගැනීමෙන් කළ කැපවීමට කෘතගුණ සැලකීම මතක් කරනුයේ ආගම තුළිනි. ශ්‍රී ලංකාව පිළිබඳ අවධානයේ දී වයස්ගත දෙමව්පියන් මහමඟ දමායන සිදුවීම් නොයෙක්වර අසන්නට ලැබී ඇත. එනමුත් බොහෝ නිවෙස්වල අතීතයේ පටන් දෙමව්පියන්ට, වැඩිහිටියන් ගරුකිරීම බුලත් දී වැඳීම, සම අසුනේ ඉඳගැනීමෙන් වැළැකී දැඩි ගෞරවයකින් ක්‍රියාකරනු දැකිය හැකි ය. එලෙසම මියගිය දෙමව්පියන් වෙනුවෙන් පින් අනුමෝදන් කළ යුතු යන වගකීම ආගම මඟින් ඇති කරනුයේ ද ආගම මඟිනි. අනෙක් අතට දෙමව්පියන් විසින් දරුවන් රැකබලා ගැනීමට අවශ්‍ය යුතුකම් වගකීම් ඉටුකරලීමට දරුවන් කෙරෙහි දෙමව්පියන් බැඳ තබමින් ඔවුන් වෙත යහපත් සමාජානුයෝජනයක් පවුල තුළින් ලබාදීමට ආගම මඟ පාදා තිබේ. එලෙසම ගුරුවරුන් සහ ශිෂ්‍යයන් අතර යුතුකම් වගකීම ඔස්සේ ගුරු ගෞරවය ආචාරශීලීත්වය ඇති කරන අතර ගුරුවරයා පැමිණෙන විට අසුනින් නැගිටීම, ඇහුන්කන්දීම, ශිල්පය මැනවින් ප්‍රගුණ කිරීම බුදුන් වැඩසිටි කල සිට පැවත එන්නා වූ පිළිවෙත් බවට පත්ව ඇත. එලෙසම ගුරුවරයා ද සිය තත්ත්වය ආරක්ෂා කරමින් ගුරුමුෂ්ටියෙන් තොරව ශිෂ්‍යයන් ශිල්පයන්ගෙන් ප්‍රගුණ කරවීමට යොමු කිරීමට පවා ආගම දායක වී තිබේ.

එලෙසම මිනිසාගේ පිරිහීමට හේතුවන කරුණු දක්වමින් ඉන් මිදීම සඳහා පුද්ගලයින් අවදි කිරීමට නිසි මැදිහත්වීම ආගම මඟින් ලබා දෙයි. මෙහි දී ව්‍යස්සපජ්ජ සූත්‍රයේ පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු ලෙස මත්පැන් පානය, සූදුව, ස්ත්‍රීන් කෙරෙහි ලොල්වීම, නරක මිතුරන් ඇසුර ආදියෙන් ඈත්විය යුතු බව දක්වා තිබේ. සමාජයේ මෙවැනි ක්‍රියාවන්හි නිරත වෙන්නන් අපකීර්තියට ලක්වේ. අතීත භාරතීය සමාජය තුළ ගණිකා වෘත්තිය සුප්‍රසිද්ධ වෘත්තියක් වූ අතර එනමුත් බුදුන්වහන්සේගේ ධර්මය තුළ එය ප්‍රතික්ෂේප කරමින් ඔවුන් සුගතියෙහි යෙදවීමට කටයුතු කරන ලදී.

නිදසුනක් ලෙස නගර සෝභනියක වූ අම්බපාලි කාන්තාව බුදුදහමේ පැවිදිව රහත්භාවයට පත්වීම දැක්විය හැකි ය. එලෙසම ශ්‍රී ලාංකීය සමාජය තුළ ද ගණිකා වෘත්තියේ යෙදීම නීති විරෝධී රැකියාවක් වන අතර ඇතැම් සමාජවල ගණිකා වෘත්තිය නීතිගත වන විට ශ්‍රී ලංකා සමාජය තුළ තවමත් එය ප්‍රතික්ෂේප වනුයේ බුදුදහම මූලික කරගත් සමාජයක් වීම නිසා ය. ඒ අනුව, බෞද්ධ ආගම යහපත් සමාජයක් ඇති කිරීමට දායක වී ඇති ආකාරය හඳුනාගත හැකි ය.

එලෙසම බුදුදහම තුළින් ආර්ථික කළමනාකරණය සඳහා ද මඟපෙන්වීම් සිදුකර තිබේ. 'ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය' යන ගාථාවෙන් මේ බව පැහැදිලි කර තිබේ. එයට අනුව තමන්ට ලැබෙන ආදායමෙන් කොටසක් පරිභෝජනයට ද කොටස් දෙකක් ආයෝජනය සඳහා ද අනිත් කොටස ආපදාවක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා සුරක්ෂිතව තැබිය යුතු බවට සඳහන් කර තිබේ (ධම්මින්ද, 2015). ඒ අනුව, තමන් විසින් උපයන ලද ධනය නාස්තියෙන් තොරව නිසි කළමනාකරණය ආර්ථික අපහසුතා ඇති නොවීමට හේතුවක් බව පෙන්වා දී තිබේ. එපමණක් නොව සෞඛ්‍යය සහ ආහාර රටාව සඳහා ද ආගම මඟින් පාලනයක් ඇති කිරීම සිදු වේ. බුදුදහම අනුව, ප්‍රාණඝාතය අකුසල කර්මයකි. හිංසාවට ලක්වන සත්ත්වයාට වේදනාවක් ලෙස සලකා පරපණ නැසීමෙන් මස් මාංශ අනුභව නොකරමින් ශාක පමණක් හෝ කිරි ආහාර සමඟ ආහාර ගැනීමට බෞද්ධයන් පෙළඹී සිටී. එලෙසම ආහාරරටාව තුළ පාලනයක් ඇති කිරීම ද ආගම මඟින් සිදු වේ. පමණට වඩා ආහාර නොගත යුතු බව බුදුදහමේ උගන්වා තිබේ. එමඟින් අධික ලෙස ආහාර පරිභෝජන කිරීමට යාමේ දී මෙය සිතට නැඟීමෙන් ආහාරවල පාලනයක් ඇති කරගන්නා ඇතැම් පුදගලයන් ද සිටී. ඇතැම් විට වයස්ගත පිරිස් සිල් සමාදන් වීමට පෙළඹීමත් සමඟ ඔවුන්ගේ ජීවන රටාව පාලනයකට නතු කරගන්නා අතර සරල දිවිපැවැත්ම, අල්පේච්ඡ ජීවිතයට ඇතැමුන් පෙළඹෙනුයේ මෙම පදනම මතය.

එලෙසම බෞද්ධ ආගම මඟින් කාන්තාව පාලනයට ද හේතුවන ඉගැන්වීම් පවතිනු හඳුනාගත හැකි ය. එහි දී භාර්යාවන් වර්ග හතක් පිළිබඳ බුදුදහමේ දැක් වේ. ඒ අනුව, කාන්තාව වධක භාර්යා, චෞර භාර්යා, ස්වාමි භාර්යා, මාතෘ භාර්යා, භගිනි භර්යා, සඛී භාර්යා සහ දාසි භාර්යා අතරින් මාතෘ භාර්යා, භගිනි භාර්යා සහ සඛී භාර්යා ලෙස දරුවන් රකින මවක් ලෙස ස්වාමියාට උපස්ථාන

ගෞරව කරන භාර්යවක් වියයුතු බව දක්වයි (මහලේකම්, 2016). මෙලෙස කාන්තාවන්ගේ ජීවිතය හැඩගසා ගැනීමට දහම් කරුණු රාශියක් ඇතුළත් වේ. එලෙසම පැරණි බෞද්ධ සාහිත්‍ය තුළ කාන්තාවන් විනීත විය යුතු බව සංවරව ඇඳිය යුතු බව විවිධ අවස්ථාවල සඳහන් කර තිබේ. නිදසුනක් කාව්‍යශේඛරයේ එන 'පෙකනිය නොදක්වා, සළු ඇඳ බොලට දක්වා, නොපව තන සක්වා, සිනා නොමසෙන් දසන් දක්වා' යනුවෙන් සිංහල කාන්තාවගේ ඇඳුමෙන් පැළඳුමෙන් හැසිරීමෙන් පවත්වා ගත යුතු විනීතභාවයෙන් එදා සිංහල කාන්තාව සමන්විත වීම දැක්විය හැකි ය.

තවද, ලාංකීය ගැමි සංස්කෘතිය නිර්මාණයට ද බෞද්ධ ආගම පදනම් වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. සිංහල බුදුදහම තුළ බුදුන් වහන්සේ ප්‍රමුඛ කරගත් දේව මණ්ඩලය වැඳුම් පිඳුම් කරමින් සෙත් ශාන්තිය ලබා ගැනීම පැරණි ගැමියේ කටයුතු කළහ. ඒ අනුව, මහා සම්ප්‍රදාය සහ චූල සම්ප්‍රදාය පිළිබඳ සිංහල බෞද්ධ විග්‍රයක් කරන ගනනාථ ඔබේසේකරයන් විසින් බුදුන් වහන්සේට සහ දෙවියන්ට වැඳුම් පිඳුම් කිරීමේ විශ්වාසන් පිළිබඳ පෙන්වා දෙයි. ඒ අනුව,ආරක්ෂක දෙවිවරු විසින් මානවයාගේ ලෞකික ජීවිතය තුළ සමෘද්ධිය මෙන් ම අයහපත් ක්‍රියාවන් සඳහා දඩුවම් ලබාදීම සිදුකරන බව දක්වයි. එලෙසම ප්‍රාදේශීය දෙවිවරු විසින් පිහිට ආරක්ෂාව ලබාදීම සිදු වේ. එලෙසම බුදුන්වහන්සේට වන්දනා කිරීමේ දී ද පවිත්‍ර චේතනාවෙන් යුතුව සිදුකරන බුදුන් වහන්සේට මෙන් ම දෙවියන්ට නිර්මාංශ පිරිසිදු ආහාර ලබාදීමෙන් සිදු කරන වන්දනාවන් මඟින් පිහිට ආරක්ෂාව ලබා ගැනීමට සිංහල බුදුදහම සමඟ ජනයා ඒකාබද්ධ වී ඇති ආකාරය දැක්වීමෙන් මෙය මනාව පැහැදිලි වෙයි (Obeysekere, 2013).

එලෙසම අතීතයේ දී 'ගමයි පන්සලයි වැවයි දාගැබයි' යන පදනම මත ජනයා පන්සල සමඟ සමීප ජීවිතයක් ගත කර තිබේ. දෙවියන්ට බුදුන්ට වැඳ කුඹුරේ කටයුතු ආරම්භ කිරීම, ගොයම් කැපීම, පෑගීම, අලුත් සහල් මංගල්‍ය පවත්වමින් බුදුන්ට, දෙවියන්ට පූජා කිරීම සිරිත විය. එලෙසම ජීවිතයේ වැදගත් සෑම අවස්ථාවක දී ම ආගම සම්බන්ධ විය. එනම්, ගර්භනී මාතාවන්ට නිරෝගී දරු උපතකට පිරිත් නූල් බැඳීම, අංගුලිමාල පිරිත ශ්‍රවණයට සැලසීම සිදුවන්නකි. එලෙසම දරුවන්ට නම් තැබීමේ දී පවා බුද්ධදාස, ධර්මදාස, ධර්මරත්න ආදි ලෙස බෞද්ධ නාමයන් තැබීමට කටුයතු කිරීම සිදු විය. අවාහ විවාහ කටයුතුවල දී ද බෞද්ධ ආගමික

පිළිවෙත් මධ්‍යයයේ සංඝයා වහන්සේලාගේ ආශිර්වාදය ලබා ගැනීම, පෝරු මණ්ඩපයේ පිරිත් කීම වැනි තත්ත්වයන් දැකිය හැකි ය. එලෙසම ජීවිතයේ නව කටුයතු ඇරඹෙන සෑම අවස්ථාවක දී ම බුදුන් වැඳීමෙන් කටයුතු ඇරඹීම සිදු වේ. එලෙසම සිංහල බෞද්ධ අවමංගල්‍ය කටයුතු අවස්ථාවල දී ද ආගමික පිළිවෙතට අනුකූලව අවසන් කටයුතු සිදු වේ. මරණාසන්න පුද්ගලයෙකුට වුව ද පිරිත් ඇසීමට සැලසීම යහපත් මනසකින් යුතුව මරණයට පත්වීමට ඉවහල් වන බව බෞද්ධයන්ගේ විශ්වාසය වී තිබේ. මෙහි දී අවමංගල්‍ය නිවසේ දී වෙස්සන්තර ජාතකය කියවීම ද සිරිත වී ඇත. අවසාන කටුයතු සිදු කිරීමේ දී ද මතක වස්ත්‍ර පූජා කිරීම, පාංශකූලය සමාදන්ව පැන් වඩා මියගිය ඥතීන්ට පින් අනුමෝදන් කිරීම පමණක් නොව මියගොස් හත්දවස, තුන්මස, අවුරුද්ද පාසා හෝ මසකට වරක් දන්දීම් කටයුතු සිදු කිරීමෙන් මියගිය ඥාතීන් ට පින්දීම සිදු වේ. ඒ අනුව, සිංහල සමාජයම බෞද්ධ ධර්මය මත ගොඩනැඟී ඇති බව පැහැදිලි ය.

සමාජ පාලන ක්‍රමයක් ලෙස බෞද්ධ ආගමේ ක්‍රියාකාරීත්වය විමසීමේ දී අතීත රාජ්‍ය පාලනය තුළ උපදෙස්, අනුශාසනා ලබාදෙමින් මැදිහත්කරුවෙකු ලෙස ආගම ක්‍රියාකළ අයුරු හඳුනාගත හැකි ය. බුදුදහම මඟින් දැහැමි රාජ්‍යය පාලනය සඳහා මඟපෙන්වීම සිදුකරන අතර රජ ධාර්මික පාලනයක් ගෙන යායුතු ආකාරය පෙන්වා දෙයි. එනම් "දේවෝ වස්සතු කාලේන, සස්ස සම්පත්ති හෝතුච, පීතෝ භවතු ලෝකෝච, රාජා භවතු ධම්මිකෝ" යනුවෙන් නිසි කලට වැසි ලැබීම, භෝග සම්පත් නිසි පරිදි ලැබීම සහ ස්වයංපෝෂිත වීම පාලනයෙ යහපත මත සිදුවන බව බෞද්ධ ධර්මයේ නොයෙක්වර සඳහන් කර තිබේ. ගණ්ඩතින්දු ජාතකයෙහි පවා දක්වා ඇත්තේ රජුගේ අධාර්මික පාලනයට රටේ ව්‍යසනයට හේතුවන බවයි (ධම්මින්ද, 2015). ඒ අනුව, රජු දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලනය කළ යුතු ය. චක්‍රවර්ති රජෙකු සතු උදාර ගති පැවතුම් දස සක්විතිවත්, පංචශීලය, සතර සංග්‍රහ වස්තූන්ගෙන් සංග්‍රහ කිරීම සප්ත අපරිහානි ධර්මයන්ගෙන් අනුගමනය රටට යහපත සලසන්නකි. එලෙසම බුදුදහම රාජ්‍ය පාලනයට මැදිහත් වූ ආකාර විමසීමේ දී බුදුන්ගේ දවස වජ්ජී ජනපදයේ ලිච්ඡවී රජදරුවන් සප්ත අපරිහානීය ධර්මයන්ගෙන් රට පාලනය කළ බව සඳහන් වේ. ඔවුන්ගේ මෙම සමූහාණ්ඩු පාලනය පිරිහීම තුළ බුදුරදුන් මැදිහත් වී සප්ත අපරිහානීය ධර්මයන් ප්‍රගුණ කිරීමට උපදෙස් දීමෙන් සාර්ථක

පාලනයක් ගෙන ගිය බව වංශකථාවල සඳහන් වේ. බුදුරදුන්ගේ දවස මගධාධිපති බිම්බිසාර, කොසොල් රජු අනේපිඬු සිටුතුමන්, විශාඛා, මල්ලිකා උපාසිකාවන් අනුශාසනා ලබමින් දැහැමි ජීවිත ගත කළ ආකාරය ප්‍රචලිත ය.

එලෙසම පසුකාලීන ඉන්දියාව තුළ ද රාජ්‍ය පාලනය තුළ රජුට උපදෙස් ලබාදෙමින් භික්ෂූන් වහන්සේලා අනුශාසනා කාර්යයෙහි නිරත වී තිබේ. නිදසුනක් ලෙස ධර්මාශෝක රජු පිළිබඳ අවධානයේ දී චණ්ඩාශෝක ලෙස නම් ලද ඔහු නිග්‍රෝධ සාමණේර හිමිනම කෙරෙහි පැහැද ධර්මානුකූල රාජ්‍ය පාලනයක් ගෙනගිය බව සඳහන් වේ. එතුමන් බෞද්ධ ආගම වැළඳගැනීමෙන් පසු මුව දඩයමේ යෑම, විනෝද ගමන් යෑම නතර කර ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ගොස් දන්දීම සිදුකළ බව අටවන ගිරිලිපියේ සඳහන් වේ (මහතන්ත්‍රිගේ, 2013: 70). මෙහි දී අවිහිංසාවාදී ප්‍රතිපත්ති අනුගමනය කරමින් කුකුළන් පොර කෙටවීම්, යාගහෝම බිලිපූජාවන්, මුව දඩයම තහනම් කර වෙහෙර විහාර ඉදිකිරීමට ගම් දියුණු කිරීමට කටයුතු කර තිබේ (මහතන්ත්‍රිගේ, 2013: 80).

එලෙසම ශ්‍රී ලංකාව වෙත අවධානය යොමු කිරීමේ දී අශෝක රජු සහ දේවානම්පියතිස්ස රජුගේ මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස ලැබුණු බුදුදහම දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිස වැළඳ ගැනීමෙන් ශ්‍රී ලංකා සමාජය නව සමාජයක් දක්වා පරිවර්තනය වූ අයුරු දැකිය හැකි ය. එතෙක් ගස් ගල් වන්දනය අභිචාරවල නිරත සිටි ජනතාව බුදුදහම වැළඳ ගැනීම තුළ විධිමත් සදාචාර සමාජයක් ස්ථාපිත වීම සිදුවිය. මෙහි ඵලය ලෙස මෙරට තුළ ද මුව දඩයම, සත්ත්ව හිංසාව තහනම් කිරීම සිදු වූ අතර වෙහෙර විහාර ඉදිවීම සිදුවිය. එකල පැවති මළවුන් ඇඳහීම වෙනුවට මළවුන්ට පින් අනුමෝදන් කිරීම කිරීම සිදු වූ අතර විවිධ වෘක්ෂ වන්දනා වෙනුවට සංඝමිත්තා තෙරණියගේ මූලිකත්වයෙන් වැඩම වූ ශ්‍රී මහාබෝධීන් වහන්සේ වන්දනයට ප්‍රජාව යොමු විය.

විශේෂයෙන්ම රාජ්‍ය පාලනයට සහ ප්‍රජා ජීවිතයට දැඩි බලපෑමක් භික්ෂූන් වහන්සේලාගෙන් සිදුවිය. බුදුදහම කෙතරම් රාජ්‍ය පාලනයට මැදිහත් වූයේ ද යත් බුදුදහම රාජ්‍යයේ ආගම බවට පත් වූ අතර රාජයත්වයට පත්වීමට සිංහල බෞද්ධයෙකු වියයුතු විය. ඔහු රාජ්‍ය පාලකයා පමණක් නොව බුදුදහමේ ආරක්ෂකයා බවට ද පත්විය. නිදසුනක් ලෙස අභයගිරි දෙවන ලිපියෙහි හතරවන මිහිඳු

රජු දක්වා ඇති ආකාරයට "ක්ෂත්‍රියෙකු රජෙකු වන්නේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය සහ සිවුර ආරක්ෂා කිරීමටය"යනුවෙනි (මහතන්ත්‍රිගේ, 2013: 150). ඒ අනුව බුදුදහම ආරක්ෂා කිරීම රජුගේ වගකීමක් බවට පත්වේ. මෙම තත්ත්වය තුළ අබෞද්ධයෙකු බලයට පත් වුව ද එම පාලනයට එතරම් ආයුෂ නොවී ය. සංඝයා වහන්සේලා විසින් රජු ඇතුළු සිංහල ජනයා මෙහෙයවා භික්ෂූන්ට පක්ෂග්‍රාහී පාලකයෙකු පත් කිරීමට උත්සාහ ගෙන තිබේ. නිදසුනක් ලෙස දුටු ගැමුණු රජු සහ එළාර අතර යුද්ධයේ දී සංඝයා වහන්සේලාගේ සහය සහිතව දුටු ගැමුණු රජු ජයග්‍රහණය කිරීම දැක්විය හැකි ය. එලෙසම දුටු ගැමුණු සහ සද්ධාතිස්ස රජු අතර පැවති කලහය සන්සිඳු වීමට භික්ෂූන් ක්‍රියාකළ බව වංශකථාවල සඳහන් වේ. එසේම එකල ද්‍රවිඩ පාලකයන්ගෙන් රට මුදා ගැනීම සඳහා ධාතුසේන කුමරුන්ට සේ ම පළවන විජයබාහු රජුට සේනා සංවිධානය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා සහය දක්වා තිබෙන අතර ථූපාරාමය, අභයගිරිය, රුවන්වැලි මහාසෑය වැනි පූජා රාජ්‍ය අනුග්‍රහයන් ද එකල සිදු වී තිබේ.

එලෙසම දළදා වහන්සේ ද රාජ්‍ය පාලනය හා සම්බන්ධ විය. දළදා වහන්සේ සහ පාත්‍රා ධාතුව හිමි පුද්ගලයා රජු ලෙස පිළිගැනිණ. එම නිසා එය අත්පත් කර ගැනීම රජවරුන් අතර බොහෝ යුද්ධ පවා සිදුවිය. නිදසුනක් ලෙස පළමුවන පරාක්‍රමබාහු රජු සමයේ පාත්‍රා ධාතුව පැහැර ගැනීමට උත්සාහ කළ බව රජු විසින් දක්වා ඇත්තේ " ධාතු දෙනම නැති වුවහොත් මේ සා පරිශ්‍රමයෙන් රට එක්සත් කරනු සඳහා ගෙනයන සටන නිශ්ඵල වන්නේයැ යි" (මහතන්ත්‍රිගේ, 2013: 153). එලෙසම මෙකල පොහොය දින ඇති කිරීම, පොහොය දින ඝාතනයන් වළකාලීම, භාවනා කටයුතුවල යෙදීම වැනි සමාජ වෙනස්වීම් රැසක් ද සිදු වී තිබේ.

එපමණක් නොව ඉන් පසුකාලීනව බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය වනවිට ද බෞද්ධ ආගම දැඩි මැදිහත්වීමෙන් යුතුව ක්‍රියාකළ ආකාරය හඳුනාගත හැකි ය. නිදසුනක් ලෙස 1815 ගිවිසුම වෙත අවධානයේ දී භික්ෂූන් වහන්සේලා මැදිහත් වී කටයුතු කළ ආකාරය පිළිබඳ සඳහන් වේ. විශේෂයෙන් උඩරට ගිවිසුම සැකසීමේ දී සිංහල බෞද්ධ ප්‍රජාවට වාසි අත්වන ලෙස තැනීමට භික්ෂූන් වහන්සේලා ගත් උත්සාහයත්, රොබට් බ්‍රවුන්රිග් ප්‍රමුඛ බ්‍රිතාන්‍යයන් සමඟ 1815 මාර්තු 2වන දින උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර ශ්‍රී ලංකා කොඩිය බිම දැමීමෙන් කෝපයට පත් වාරියපොළ ශ්‍රී සුමංගල

හිමියන් බ්‍රිතාන්‍ය කොඩිය බිමදමා පඟා සිංහ කොඩිය එසවීමෙන් කළ වීරක්‍රියාව එකල භික්ෂූන්ගේ බලය කියාපෑමකි (ද සිල්වා, දිනය සඳහන් නොවේ). එලෙසම උඩරට ගිවිසුමේ 5වන වගන්තියට ප්‍රකාරව බ්‍රිතාන්‍යයන් විසින් බුදුසසුන ආරක්ෂා කිරීමට සහ පවත්වා ගැනීමට අනුග්‍රහය දැක්වීම යන වගන්තිය කඩකිරීම සමඟ 1818 කැරැල්ල සඳහා ගිහි පැවිදි දෙපාර්ශවයම නායකත්වය ලබාදීම සිදුවිය. ඉන්පසුව ද සිංහල ජනයාට එරෙහිව කටයුතු කිරීම, ටොරින්ටන් ආණ්ඩුකාරවරයා දළඳා මාළිඟාවට ආධාර පවා නතර කිරීම යන හේතූන් මත 1848 දෙවැනි කැරැල්ල ඇති වූ අතර මෙහි දී කුඩාපොළ හිමියන්ගේ මූලිකත්වයෙන් යුතුව වීරපුරන් අප්පු, ගොංගාලේ ගොඩබණ්ඩා ඇතුළු පිරිස මාතලේ කැරැල්ල මෙහයවීම ද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම පෙන්නුම් කරන්නකි (ධම්මරක්ඛිත 2021).

එලෙසම බ්‍රිතාන්‍ය පාලනයෙන් ශ්‍රී ලංකාව මුදවා ගැනීම දරන ලද උත්සාහය තුළ ද භික්ෂූන් වහන්සේලා ඇතුළු ආගමික නායකයින් ක්‍රියාකළ ආකාරය ඉතිහාසය තුළ සඳහන් වේ. එහි දී බ්‍රිතාන්‍යයන් ගෙන ගිය ක්‍රිස්තියානි ආගම ප්‍රචාරයට එරෙහිව බෞද්ධ ආගම නඟා සිටුවීමේ භික්ෂූන් වහන්සේලා කැපවී ක්‍රියා කළහ. මේ සඳහා භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙන, මාළිඟාකන්ද විද්‍යෝදය පිරිවෙන, පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් පිහිටුවමින් බුදුදහම පැතිරවීම, සිංහල ජනයා ඒකාබද්ධ කිරීම සිදුවිය. මිට අමතරව ලක්මිණි පහණ , සරසවි සඳරැස, සිංහල බෞද්ධයා පුවත්පත්ද බුදුදහමේ ප්‍රගතිය සඳහා යොදා ගැනීම සිදුවිය. මේ අතර බෞද්ධ සහ ක්‍රිස්තියානි ආගම අතර පංචමහාවාද පවත්වමින් බුදුදහමේ වැදගත්කම, සදාචාරවත්බව පෙන්වාදීම සිදුවිය. විශේෂයෙන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිගේ මූලිකත්වයෙන් පවත්වන ලද පානදුරාවාදය බෞද්ධ සහ ක්‍රිස්තියානි ආගම්වල සැබෑ තත්ත්වය හෙළි කරමින් බුදුදහම ප්‍රචලිත කිරීමට හේතු විය. මෙහි ඵලය ලෙස මෙරටට පැමිණෙන හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමන්, බ්ලැවිස්කි සහ මියුසියස් හිගන්ස් බුදුදහමේ පුනර්ජීවනයට කටයුතු කළ අතර ක්‍රිස්තියානි ආගමට එරෙහිව ඒ හා අනුව යමින් ප්‍රොතෙස්තන්ත්‍ර බුද්ධාගම ඇති කරමින් සමාජ වෙනසක් ඇති කිරීමට කටයුතු කරන ලදී. මීට අමතරව ආනන්ද, ධර්මරාජ, මහින්ද, විශාඛා වැනි පිරිමි සහ කාන්තා පාසල් ඇති කිරීම බෞද්ධ ආගම ජනතාව තුළට ගෙනයාමට පිටුවහලක් විය (මොරගොඩ, 2018).

මෙහි දී හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමන් බුදුදහම වැළඳ ගැනීමත් සමඟ බෞද්ධ ගිහි පැවිදි දෙපිරිසටම කටයුතු කළ හැකි පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම, ඉරුදින දහම් පාසල් ඇති කිරීම, වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කිරීම සමාජයේ වෙනස්කම් රැසක් ඇති කිරීමට හේතුවිය. මීට අමතරව අනගාරික ධර්මපාලතුමන්, ඩී.බී. ජයතිලක, පියදාස සිරිසේන වැනි උගතුන් ද මේ සඳහා මැදිහත් වූ අතර විශේෂයෙන් ධර්මපාලතුමා වෙත අවධානයේ දී බ්‍රිතාන්‍ය සංස්කෘතියට එරෙහිව ජනමතයක් ඇති කිරීමට කටයුතු කරන ලදී. 1906 දී සිංහල බෞද්ධයා පුවත්පත ඇරඹීම, 1891 මහාබෝධි සමාගම පිහිටුවීම තුළින් බුද්ධගයාව මහාබෝධි සංගමය යටතට පත්කර ගැනීම පමණක් නොව ආගමේ නාමයෙන් දේශීය සිරිත්වලට යොමු කිරීමට කටයුතු කරන ලදී. එතුමාගේ ශෝභන මාළිගාව රථයේ ගවමස් නොකෑම මත්පැන් පානය නොකිරීම සඳහා පාඨ පල කරමින් සිංහලයන් එයින් මිදවීමට කටයුතු කිරීම සිදුවිය. එහි දී බුද්ධාගම ආරක්ෂා කිරීමට උපන් ජාතිය සිංහල ප්‍රජාව බවත් විස මත්පැන් බොන්ට දී සිංහලයන් නැති කරන සුද්දා පරම්පරා සතුරෙක් ලෙස සලකන ලදී (ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, 2019). මෙලෙස ජාතික ව්‍යාපාරය, අමද්‍යප ව්‍යාපාර ඔස්සේ සමාජ වෙනසක් ඇති කිරීම සඳහා බෞද්ධ ආගම ක්‍රියාකළ ආකාරය හඳුනා ගත හැකි ය. මේ අනුව, පැහැදිලි වනුයේ බෞද්ධ ආගම තුළ පුද්ගලයාට යහපත් ජීවිතයක් සඳහා මඟ පෙන්වන ඉගැන්වීම් ඇතුළත්ව ඇති බවත් විශේෂයෙන් සිංහල සංස්කෘතිය ගොඩනැඟීමේ සාධකය ලෙස ආගම ක්‍රියාකර ඇති බවය. එලෙසම පසුකාලීනව භික්ෂූන් නැඟී සිටීම තුළ රාජ්‍ය පාලනයට උපදෙස් දීමෙන් ආරම්භ වූ මැදිහත් වීම ඉන් පසුකාලීනව සමාජ ප්‍රතිරෝධකයන්ට එරෙහිව සමාජය ඒකාබද්ධතාව ඇති කිරීමේ මෙවලමක් ලෙස බෞද්ධ ආගම ක්‍රියාකර ඇති බව මෙමඟින් පැහැදිලි වේ.

### 5. 2. හින්දු ආගම

ඉන්දියාවට සංක්‍රමණය වූ මුල් ආර්යයන් විසින් විවිධ ආගමික අදහස් මත පැමිණ තිබූ බවත් ඔවුන්ගෙන් හින්දු ආගම ප්‍රභවය වීම සිදුව ඇති බවත් හින්දු ආගමේ මූලාරම්භය පිළිබඳ පැහැදිලි කරන විද්වතුන්ගේ අදහස වී තිබේ. මේ අනුව, හින්දු ආගම සෙසු ආගම්වලින් වෙනස්ව බහුදේවවාදී ආගමක් ලෙස විවිධ දෙවිවරු මූලික කරගනිමින් ඇදහීම් සිදුකරනු දැකගත හැකි ය. මෙහි දී හින්දු

ආගමේ ත්‍රිමූර්තිය පිළිබඳ විශ්වාසය පවතින අතර මහාබ්‍රාහ්මයා ලොව මැවුම්කරුවා ලෙස මුල් ස්ථානය ගනිමින් විෂ්ණු ලොව පැවැත්ම තහවුරු කරන්නා ලෙස ද ශිව දෙවියන් විනාශය පමුණුවන්නා ලෙස ද වන්දනාවට පාත්‍ර වේ. මීට අමතරව ලක්ෂ්මී, කාලි, සරස්වතී, ඝනදෙවි වශයෙන් ධනය සම්පත් කීර්තිය, නුවණ සඳහා සඳහා පමණක් නොව ජීවිතයේ සියලු කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පුදපූජා පැවැත්වීම මෙහි දී සිදු වේ.

මේ අනුව හින්දු ආගමේ සමාජ පාලනයට දායක වන ඉගැන්වීම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, හින්දු ධර්මයේ මූලික පරමාර්ථය බවට පත්කරගෙන ඇත්තේ මෝක්ෂය වන අතර මෙය අහිම්සාව මුල්කොටගත් ආගමක් ලෙස දැක්විය හැකි ය. එනම්, නැවත උත්පත්තියක් නොලබා ඉහළම ආත්මය වන මහා බ්‍රාහ්මයා සමඟ එක්වීම මෙමඟින් බලාපොරොත්තු වේ. එසේම පුනරුප්පත්තිය පිළිගන්නා ඔවුන් ජීවී ආත්මය නැවත නැවත උපත ලබන බව විශ්වාස කරයි. එසේ ම කර්ම, ධර්ම, අහිම්සා යන මූලධර්මයන් මඟින් ජීවිතය පවත්වා ගැනීමට මඟ පෙන්වීමක් හින්දු ආගම තුළින් ද ලැබේ (සේරම්, 2015). එපමණක් නොව සෙසු ආගමික ඉගැන්වීම් තුළ සේම හින්දු ආගම තුළ ද දසවැදෑරුම් පනත මඟින් යහපත් ජීවිතය සඳහා මඟපෙන්වීම සිදු වේ. එනම්, සත්‍ය- සත්‍ය ප්‍රකාශ කිරීම, අහිම්සා- අවිහිංසාව, සතුන් නොමැරීම, කිසිවෙකුට හිංසා නොකිරීම, බ්‍රහ්මචාරී කාම සේවනයෙන් වැළකී සිටීම, වැරදි කාමසේවනයෙහි වැළකීම, අස්තෙයා- අනුන් සතු දේ ගැනීමෙන් වැළකීම, අපරිග්‍රහ තණ්හාවෙන් වැළකීම, දූෂණයෙන් වැළකීම, සෞචා- සිතෙහි සහ කයෙහි පවිත්‍රත්වය, සන්තෝෂ්- ලද දෙයින් සතුටුවීම, ස්වාධ්‍යා- ධර්ම ග්‍රන්ථ පරිශීලනය, තපා/සාධානය- නියමිත ලෙස ආගමික කටයුතුවල යෙදීම, පැවරුණු කාර්යය නිසි ලෙස ඉටුකිරීම වේ (සේරම්, 2015).

ඒ අනුව, හින්දු ආගම මඟින් සිදුවන සමාජ පාලනයට කදිම නිදසුනක් ලෙස ඉන්දියානු සමාජයේ කුල ක්‍රමය දැක්විය හැකිය. හින්දු ආගමේ පාරිශුද්ධත්වය මත ගොඩනැගුණු මෙම කුල ක්‍රමය තුළ අතීතයේ සිට හින්දු ජන සමාජයේ සෑම නහරයක් පාසාම ගිලාබැස ඇති අයුරු හඳුනාගත හැකි ය. ඒ අනුව, මනුස්මෘතියේ සඳහන් ආකාරයට සමාජය බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර සහ අසපර්ෂණීය කුලයන්ට බෙදී පවතින අතර මෙම කුලයන්ගේ උපත සිදු වී ඇත්තේ මැවීමේ දෙවියා වන මහාබ්‍රහ්මයාගෙනි. ඒ අනුව, මහාබ්‍රහ්මයාගේ හිසින් බ්‍රහ්මණයන් ද, බාහුවෙන් ක්ෂත්‍රීයන් ද., කලවාවලින්

වෛශ්‍යයන් ද, යටිපතුලෙන් ශූද්‍රයන් ද උපත ලබා තිබේ. ඒ අනුව, ඔවුන්ට අයත් කාර්යයන් ද ආගම මඟින් ම පෙන්වා දී තිබේ. මෙහි දී බ්‍රාහ්මණයන්ට පැවරුණු කාර්යයන් ලෙස ආගමික කටයුතු සිදුකිරීම, ක්ෂත්‍රියන් සඳහා අධ්‍යාපනය ලබාදීම, උපදේශ ලබාදීම වශයෙන් පැවරී තිබේ. එලෙසම ක්ෂත්‍රියන් ද රාජ්‍ය පාලනය, රණ ශූරත්වය, ඉඩම් කළමනාකරණය වැනි කටයුතු බ්‍රාහ්මණ උපදේශ මත සිදු කරන ලදී. ඒ අනුව රාජ්‍යයත්වය දැරීමේ අයිතිය ක්ෂත්‍රියට පමණක් හිමිවිය. එසේම වෛශ්‍යයන් විසින් වෙළඳ කටයුතු, ගොවිතැන් කටයුතු, කර්මාන්ත කටයුතු සිදු කරන ලද අතර ශූද්‍ර කුලයට අයත් පිරිස් ඉහළ කුලයන්ගේ කටයුතු කරමින් කම්කරුවන් ලෙස කටයුතු කිරීම සිදුවිය. මෙහි දී අස්පර්ෂණීය කුලයට අයත් දළිද්වරු ඇතුළු ප්‍රජාවන් කාණු වැසිකිලි පවිත්‍ර කිරීම, මියගිය මළකුණු ඇදීම වැනි ඉතා පහත් රැකියාවල නිරත වෙමින් සමාජය තුළ දැඩි පීඩාවට ලක්වීමට සිදුවිය (විජයරත්න, 2018). එලෙසම වර්තමානය වන විට ද ඉන්දියාවේ මෙම කුල ක්‍රමය පිළිලයක් ලෙස වර්ධනය වී ඇත්තේ මෙම ආගමික පසුබිම බව පැහැදිලි ය. ඒ අනුව, ඉන්දියානු සමාජය ස්ථරගත කිරීමට ආගම පදනම් වූ කුලය සමත් වී ඇති අතර ආවාහ විවාහ කටයුතු, ශිල්පය හැදෑරීමේ කටයුතු පමණක් නොව රැකියා අවස්ථා ලැබීම සියල්ල කුලය මත පදනම් වී තිබීම තුළ ආගම වක්‍ර ලෙස සමාජ පාලනයට නතු කර ඇති අයුරු පැහැදිලි ය..

එපමණක් නොව මෙහි දී හින්දු ආගම ජීවිතයේ සෑම කටයුත්තක් සමඟම බැඳී පවතිනු හඳුනාගත හැකි ය. සෙසු ආගම්වල සේ ම පුද්ගලයාගේ උපතේ සිට සෑම අවස්ථාවක දී ම දෙවියන්ගේ ආශිර්වාදය ලබාගැනීම සමඟ සම්බන්ධ ය. හින්දු ලබ්ධිකයන් නිරතුරුවම කෝවිලේ උත්සවයන් සඳහා සහභාගී පලතුරු වට්ටි පූජා කරමින් ආශිර්වාද පූජෝත්සව පැවැත්වීමෙන් ශාන්තිය ප්‍රාර්ථනය කිරීම සිදු වේ. ඒ අතර විශේෂයෙන් ම ශිවලිංග වන්දනය, ලක්ෂ්මී වන්දනය, පත්තිනි ඇදහිල්ල, සනදෙවියන් කිරිකළවලින් නෑවීම අතීතයේ සිට පැවත එන්නා වූ පුද පූජාවන් සිරිත් බවට පත් වී තිබේ. එලෙසම හින්දු ආගම හා බැඳුණු චාරිත්‍රයන් ඔවුන් තුළ වේ. එහි දී හින්දු භක්තිකයන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථාවක් ලෙස උපනයන උත්සව පැවැත්වීම දැක්විය හැකි ය. විශේෂයෙන් ම ඉහළ කුලවලට අයත් පුරුෂයන් ට ආගමික වගකීම් පිළිබඳ ඒත්තු ගැන්වීම සඳහා දෙවන උපතක් ලෙස පිරිමි දරුවාගේ වම් උරහිසෙහි නූලක් පළඳවා ආශිර්වාද ලබාදීමෙන් ජීවිත සාර්ථක කර ගැනීමට මඟ පෙන්වීම

මෙමඟින් සිදු වේ (කොංග්‍රස් පුස්තකාලය, දිනය සඳහන් නොවේ). එලෙසම සෑම විවාහ කටයුත්තක් ම හින්දු පූජක මූලික්තවයෙන් යුතුව පවත්වනු දැකිය හැකි ය. මෙහි චාරිත්‍ර සලකා බැලීමේ දී ද පුරාණයේ සිට පැවත එන චාරිත්‍රයන් සියල්ල ම පාහේ හින්දු ආගමේ අර්ථයන් සමඟ සම්බන්ධ වේ. ඒ අනුව, ගින්නට පවත්වනු ලබන පූජාවන්, ගනේශ් පූජාවන්, මෙන්ම පූජා මණ්ඩපයේ වට හතක් ගමන් කිරීමෙන් ආශිර්වාදය ලබා ගැනීම වැනි චාරිත්‍රයන් ආගමික පදනම මත සිදුවනු හඳුනාගත හැකි ය.

එලෙසම හින්දු ප්‍රජාවගේ අවමංගල්‍ය කටයුතු හින්දු ආගමික පිළිවෙත් අනුව සිදුකරනු හඳුනාගත හැකි ය. මෙහි දී ඉන්දියාවේ සති පූජාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සැමියා මියගිය පසු බිරිඳ දර සෑයට පැන මියයාම හුදෙක් ඍජු ලෙසම ආගම මත පදනම් වූ චාරිත්‍රයක් නොව සමාජ අවශ්‍යතාවයේ පදනම මත ගොඩනැගුන ද පූජක මැදිහත්වීමෙන් යුතුව සති පූජාව සිදුකර තිබෙන බවට කරුණු හෙළි වේ. මෙහි දී විශේෂ අවස්ථාවක් ලෙස දරසෑයට ගිනි ඇවිලවීමේ කටයුතු පූජකවරුන් වෙතින් සිදුකර තිබේ. එලෙසම මේ ගින්නට කැපු වූ කාන්තාව සතිමාතා යන ගෞරවයෙන් පිදීම එකල සමාජය තුළ මෙය අගය කරන පිළිවෙතක් බවට පත්ව තිබී ඇති බවට හඳුනාගත හැකි ය (ලියනගේ, 2015). එලෙසම හින්දු බැතිමතුන්ගේ මියගිය පුද්ගලයන් ආදාහන කටයුතු සිදුකරනුයේ ද හින්දු පූජා විදි මධ්‍යයේ ය. එහි දී මෘතදේහ ගංගානම් නදිය අසබඩ ආදාහනය කිරීම සිරිත වී ඇති අතර ගංගානම් නදියට ආසන්න ස්ථානවල ඉහළ කුල පිරිස් ද නුදුරුන් පහළ කුලවල පිරිස් ද ආදාහනය කිරීම සිදුව තිබෙන අතර වත්මන වන විට ද මෙම තත්ත්වය පවතී (ලියනගේ, 2015). මෙහි දී හින්දු අවමංගල්‍ය උත්සවය සිදුකරන්නේ ද පූජක මැදිහත්වීමෙන් වන ලෙසම එහි දී යචේඤා කිරීම, මන්ත්‍ර ගායනය සිදුවේ. මෙහි දී මියගිය දේහය පුළුස්සා එම අළු ජලකඳක පාකර හැරීම මොවුන්ගේ සිරිතයි. ඒ අනුව, හින්දු ආගම අනුව ජීවිතයේ වැදගත් අවස්ථාවන් පාලනය වී තිබෙනු හඳුනාගත හැකි ය.

එලෙසම ඉන්දියානු ජාතික ව්‍යාපාරය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ද හින්දු ආගම සමාජය පාලනය කිරීමේ බලවේගයක් ලෙස ක්‍රියා කළ ආකාරය පැහැදිලි ය. එහි දී හින්දු ආගමික පසුබිමක් සහිත ප්‍රජාවන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව දැඩි ජාතිකවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ ආකාරය දැකිය හැකි ය. ඒ

අනුව, හින්දු ආගමික ලබ්ධිකයෙකු වන මහත්මා ගාන්ධිතුමන් මස් මාංශ අනුභවයෙන් තොර ජීවිතයක් ගත කර ඇති අතර ඉන්දියාව තුළ අවිහිංසාවාදය පැතිරවීමට විශාල පරිශ්‍රමයක් දරන ලදී. එතුමන් අප්‍රිකාවේ කළු සුදු වර්ණ භේදයට එරෙහිව පමණක් නොව බ්‍රිතාන්‍යයන්ගෙන් රට මුදවා ගැනීමට ගෙන ගිය සත්‍යග්‍රහ ව්‍යාපාරයන් සේම දේශීය සංස්කෘතිය නඟා සිටුවීමට ගෙන ගිය පිළිවෙතට හින්දු ආගම මූලික පදනම සපයන ලදී. මේ අනුව, හින්දු ආගම ද සමාජය තුළ ඉහළින් සිට සමාජය තුළ පාලනයක් ඇති කිරීමට ක්‍රියා කර ඇති ආකාරය පැහැදිලි ය.

## 5. 3. ඉස්ලාම් ආගම

ඉස්ලාම් ආගම වූ කලී සර්ව බලධාරී අල්ලාහ් දෙවියන් ලොව මැවුම්කරුවා ලෙස ඇදහීමට පාත්‍රවන ඒකදේවවාදී ආගමකි. මහද්මද් නබිතුමා අල්ලාහ්ගේ දූතයෙකු වන අතර ඔහු ද ඉස්ලාමීය ප්‍රජාව අතර ගෞරවයට පාත්‍ර වන්නකි. මේ අනුව, සමස්ත මුස්ලිම් සංස්කෘතියම ඉස්ලාම් ආගමට නතුව ක්‍රියාත්මක වන්නා වූ ආකාරය හඳුනාගත හැකි ය. මෙහි දී ඉස්ලාම් ආගමේ මූලික ධර්ම ග්‍රන්ථය වන ශුද්ධ වූ අල්කුරාණය මස්තකයේ තබමින් ඒ අනුව ඔවුන් සිය ජීවිතය හැඩගසා ගැනිම සිදු වේ.

මේ අනුව, ඉස්ලාම් ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වන ආකාරය විමසා බැලීමේ දී ඒ සඳහා බලපාන ඉගැන්වීම් විමසා බැලීම වැදගත් වේ. මෙහි දී ඉස්ලාම් ආගමේ ප්‍රධාන කුළුණු 5වන ඊමාන්, සලාත්, සව්ම්, සකාත්, හජ් ඔවුන්ගේ ජීවිතයේ කොටසක් බවට පත්කර ගනී. ඒ අනුව, ඊමාන් යනු භක්ති ප්‍රකාශනයයි. සලාත් යනුවෙන් නමැඳුම අර්ථවත් වේ. එනම් දිනකට පස්වතාවක් අල්ලාහ් නැමදීම සිදුකළ යුතු අතර එමඟින් මුස්ලිම් ජනයා තුළ නිරතුරුවම ආගම පිළිබඳ සිහියක් ඇති කිරීම සිදු වේ. එසේම සව්ම්- රමළාන් මාසයේ උපවාස සිදුකිරීම ඉස්ලාම් ජීවිතයේ වැදගත් කටයුත්තකි. සකාත්- දිළිඳු ජනකොටස් වෙනුවෙන් වාර්ෂිකව ඉතිරි කරන ධනයෙන් සියයට දෙකහමාරක් දන්දීම වගකීමක් බවට පත් වේ. එලෙසම ඉස්ලාම් ආගමේ තවත් මූලධර්මයක් ලෙස හජ්- ජීවිතය තුළ එක්වරක් හෝ මක්කම පූජා ගමනට යායුතුය යන පිළිවෙත් සමඟ මුස්ලිම් බැතිමතුන් බැඳී පවතී (මන්සූර්, 2017).

මෙහි දී ඉස්ලාම් ආගමේ පවතින උපවාස කාල සීමාව පිළිබඳ අවධානයේ දී පුද්ගලයා තුළ ස්වයං පාලනයක් ඇති කිරීම සඳහා

දිරිමත් කරනු දැකගත හැකි ය. මෙහි දී රමලාන් උත්සවය පැවැත්වීමට පෙර දින විසි නවයක් හෝ තිහක කාලයක් රමලාන් උපවාසය සිදුකරනු දක්නට ලැබේ. එහි දී 'සව්ම්' යන අදහස භාවිත වන අතර සව්ම් යන්නෙහි අර්ථය ලෙස දක්වනුයේ අතහැර සිටීම හෙවත් වැළැකී සිටීමයි. (සමරවීර, 2014). මෙම උපවාස සමයේ දී හිරු උදාව ඇරඹෙන වේලාවේ සිට ආහාරපාන ගැනීමෙන් වැළැකී සිටිය යුතු සේ ම එම කාලය තුළ එකදු කෙළ බිඳක් හෝ ජල බිඳක් ගැනීම අකැප වන අතර ලිංගික ක්‍රියාවන්ගෙන් සහ වැරදි ක්‍රියාවෙන් වැළකීම ද සිදු වේ. උපවාසය නිසි ලෙස සිදු නොකිරීම අල්ලාහ් දෙවියන්ගෙන් ඇත්වීම සිදුවන බවට වන විශ්වාසය මත බිය සහ භක්තිය පදනම් කරගනිමින් ආගමික පිළිවෙතට යටත්වනු හඳුනාගත හැකි ය. මෙහි දී ඉවසීම, පරිත්‍යාගය ප්‍රමුඛ වන අතර දන්දීම සඳහා පුරුදු පුහුණු කිරීම සිදු වෙයි (සමරවීර, 2014).

එලෙසම ඉස්ලාම් ආගමේ හජ් වන්දනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ද ආගමේ බලපෑම පැහැදිලි ය. ඒ අනුව, අල්කුරාණයේ සඳහන් ආකාරයට හජ් වන්දනාව සිදුකිරීමේ පිළිවෙත් තුළ දක්වා ඇත්තේ ද " කායික නිරෝගීතාවන්, ආර්ථික පහසුකම් ආදිය තිබියදීත් හජ් වගකීම ඉටු නොකරන්නේ නම් ඔහු පාපයක් කරන්නෙක් වේ" යනුවෙනි (විජේතුංග, 2007: 4). මේ අනුව පැහැදිලි වනුයේ විවිධ ආගම් තුළින් පවිපින් යන විශ්වාසයන් විවිධ අර්ථ ගන්වමින් ලබ්ධිකයන් පාලනයට නතු කරගන්නා බවයි. එලෙසම ඉස්ලාමීය ධර්මය තුළ ඊමානීය ගුණාංග තුළ ද යුක්තිය, සාධාරණත්වය අගය කිරීම යටහත්පහත්භාවය අගය කිරීම වැනි ගුණාංගයන් අවශ්‍ය බව ද සඳහන් කර තිබීමෙන් පැවතිය යුතු තත්ත්වය පිළිබඳ ආගම මඟ පෙන්වන බව පැහැදිලි ය (අල්-අහ්ලාකුල් ඉස්ලාමියියා, 2015).

එපමණක් නෙවෙ ඉස්ලාම් ආගම තුළ දානය සඳහා ද නිරතුරුවම පෙළඹවීමක් සිදු වේ. අල්කුරාණයේ 2: 274 සඳහන් ආකාරයට රහසිගතව හෝ ප්‍රසිද්ධියේ ලබාදෙන දානපතියන් පෙරළා ප්‍රතිලාභ ලබා ගන්නා බවයි. "කවරෙක් තමන්ගේ ධනය (දානයක් වශයෙන්) රාත්‍රියේත්, දහවලේත්, රහසිගතවත්, ප්‍රසිද්ධියේත්, වියදම් කරන්නේ ද ඔවුන්ගේ කුලිය ඔවුනගේ දෙවියන් වෙත ඇත. ඔවුන්ට (පරලොවේ දී) කිසිදු බියක් නැත. ඔවුන් වේදනාවට පත්වන්නේ ද නැත" (අල්- අහලාකුල් ඉස්ලාමියියා, 2015: 14). මේ අනුව, ඉස්ලාම්

ආගම තුළින් ද යහපත් මගපෙන්වීමක් ජීවිතයට ලබා දී තිබෙනු පැහැදිලි ය.

එලෙසම ඉස්ලාම් ආගම තුළින් සමාජය තුළ ආචාර සමාචාර පිළිවෙතක් ද ගොඩනැගී ඇති අයුරු හඳුනාගත හැකි ය. ඒ අනුව, යමෙකු මුණගැසුණ විට "අසලාම් අලෛක්කුම්" යනුවෙන් ශාන්තිය සමාදානය උදා වේවා යනුවෙන් එකිනෙකාට හිසනමා සුභපැතීම අල්කුරාණයේ සඳහන් ආගමික උපදේශයකි (අල්-අහ්ලාකුල් ඉස්ලාමිය්යා, 2015). මේ අනුව, පැහැදිලි වන්නේ ඉස්ලාම් ආගම මඟින් ප්‍රජාව අතර සුහදත්වය, මිත්‍රශීලීත්වය ගොඩනැගීමට මෙමඟින් කටයුතු කර ඇති බවයි. එලෙසම සැම විටම පුද්ගලයා අල්ලාහ් දෙවියන් යටතේ පිහිට සමාදානය ලබමින් සිටින බවට මතක් කර දීමක් සිදුවන්නේ ආගමේ පාලනය සිහිපත් කරමිනි. තව ද ඉස්ලාම් ආගමේ දෛනික ජීවිතයේ පවත්වා ගත යුතු ගුණාංග පිළිබඳව ද සඳහන් කර තිබේ. සත්‍ය කතා කිරීම ස්වර්ගය කරා යොමු කරන බව දක්වන අතර බුදුදහමට සමානව ඉස්ලාම් ධර්මයේ ද සත්‍ය කතා කිරීමේ ආකාර ලෙස චේතනාව, වචනය, ක්‍රියා ලෙස දක්වා තිබේ. එහි දී යහපත් සිතිවිලි පවත්වා ගැනීම, සත්‍ය වදන් පවත්වා ගැනීම, නිවරදි ලෙස ක්‍රියාකිරීම ඉස්ලාම් ආගමේ අවධාරණය කර තිබේ (අල්-අහ්ලාකුල් ඉස්ලාමීයා, 2015). එපමණක් නොව ඉස්ලාම් ආගම තුළින් ද සෙසු ආගම් පරිද්දෙන් සමාජ වගකීම, සම්බන්ධතා පවත්වා ගත යුතු අයුරු පෙන්වා දී තිබේ. එහි දී දෙමව්පියන්ට කරුණාව දැක්වීම, සැලකීම සිදුකළ යුතු බවට උපදෙස් ලබාදෙයි.

එලෙසම සෙසු ආගම් සේ ම ඉස්ලාම් ආගම ද උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් සෑම අවස්ථාවක දී ම මැදිහත් වනු දැකිය හැකි ය. ඒ අනුව, මුස්ලිම් සංස්කෘතිය තුළ උපත විමසා බැලීමේ දී අලුත උපන් දරුවෙකුගේ දකුණු කනට ඇසෙන සේ " අසාන්" යනුවෙන් සලාතය සඳහා ආරාධනා කිරීම පමණක් නොව දරුවා ඉපිද හත්වන දින හිස කෙස් කපා, කෙස්වලට සමාන බරට රිදී හෝ මුදල් දීම. එසේම එළුවෙකු කපා මාංශ දුප්පතුන්, අසල්වැසියන් සහ නිවසේ පරිභෝජනය සඳහා බෙදා දීම අල්කුරාණ ඉගැන්වීම් මත සිදුවන්නකි (මන්සූර්, 2017). එලෙසම ඉස්ලාම් ආගම තුළ පුද්ගලයෙකු මියගිය විට ද ඉස්ලාම් ධර්මයට අනුව අවසන් කටයුතු සිදු වේ. ඒ අනුව, මෘතදේහය පැය 24 තුළ භූමිදානය කිරීම අත්‍යවශ්‍ය වන අතර එය ස්වර්ගයට යාමට පහසු කරවීමකි. එලෙසම මෘතදේහයන් දැකීම සඳහා ද සීමාවන් පවතින අතර මෘතදේහයන් සඳහා ඉටුකළ යුතු

යුතුකම් ලෙස 'මයිතයන්' පවතී. එනම් මෘතදේහය නාවා 'කෆන්' ලෙස සුදු පැහැති වස්ත්‍ර ඇන්දවීම, මෘතදේහයට දෙවියන්ගේ ආශිර්වාද ලබාදෙමින් සලාතය ඉටුකිරීම සහ සාදා ගන්නා ලද සුවිශේෂී වලක මෘතදේහය භූමිදානය යන සියල්ල ආගමික පදනම මත සිදු වේ (ඉස්ලාම් ධර්මය 9ශ්‍රේණිය, වර්ෂය සඳහන් නොවේ). මෙය ද ආගම සමාජය පාලනය කරන්නා වූ ක්‍රමයක් ලෙස දැකිය හැකි ය.

එලෙසම මුස්ලිම් ආගම තුළ විවාහය පිළිබඳ අවධානයේ දී ද ආගම සමඟ බද්ධව පවතිනු හඳුනාගත හැකි ය. ඒ අනුව, ඉස්ලාම් ආගම තුළ 'මහ්රම්' යනුවෙන් විවාහ විය නොහැකි ඉතා කිට්ටු ඥාතීන් පිළිබඳ දක්වයි. එහි දී රුධිර සබඳතා, විවාහ සබඳතා, කිරි බී වැඩීම නිසා ඇතිවන සබඳතා අතර මව, මවගේ මව ලෙස ඉහළ යන ඥාති සබඳතා, දරුවන්, දරුවන් ලෙස පහළ යන ඥාති සබඳතා වශයෙන් විවිධ ඥාති විවාහයන් ප්‍රතික්ෂේප කර තිබේ (ඉස්ලාම් ධර්මය නව නිර්දේශය 11 ශ්‍රේණිය, වර්ෂය සඳහන් නොවේ). විශේෂයෙන් ඉස්ලාම් ආගමේ ෂරියා නීතිය තුළ ද මුස්ලිම් පුරුෂයෙකුට භාර්යාවන් සිව්දෙනෙකු දක්වා විවාහ කර ගැනීමේ හැකියාව පවතින අතර එය ද ආර්ථික හැකියාව මත තීරණය වීම සිදු වේ. මෙමඟින් ඉස්ලාම් ප්‍රජාවේ සමස්ත සංස්කෘතියම ආගමේ පාලනයට නතුව ඇති ආකාරය පැහැදිලි ය.

තවද, ඉස්ලාම් ආගමේ ආර්ථික මඟපෙන්වීම විමසා බැලීමේ දී අතීතයේ සිටම මුස්ලිම් ප්‍රජාව ආර්ථික සහ වෙළඳ කටයුතුවලින් ප්‍රමුඛත්වය ලබා තිබීමට ආගමික ඉගැන්වීම් ද බලපා හැකි ය. මෙහි දී විශේෂයෙන් ම වෙළඳ කටුයතු පවත්වා ගත යුතු ආකාරය සඳහන් කරන අතර වෙළඳාමේ දී පාරිභෝගිකයා රැවටීම, ව්‍යාජ ලෙස දිවුරුම් දීම, භාණ්ඩ සඟවා තැබීම, පොලිය ගැනීම, හරාම් භාණ්ඩ මිල දී ගැනීම විකිණීම වැනි අසාධරණ ක්‍රියාවන්ගෙන් වැළකී සිටිය යුතු බව දක්වා තිබේ. එලෙසම අවශ්‍ය ඇතත්වුනට ණය දීම, ණය නැවත පියවීමට උදව් කිරීම, මූල්‍ය ක්‍රියාකාරකම්වල දී උකස් සහ බඳුදීම මෙන් ම ඉපැයීමේ දී සාමූහික ප්‍රයත්න ඉස්ලාම් ආගම තුළ අගය කරයි (ඉස්ලාම් ධර්මය නව නිර්දේශය, වර්ෂය සඳහන් නොවේ). ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ මෙන් ම ඉන්දියාව තුළ තොග මෙන්ම සිල්ලර වෙළඳාම කුළුබඩු, ඇඳුම්, රත්රන් අපනයන ආර්ථිකය තුළ මුස්ලිම් ප්‍රජාව පූමුඛත්වය ලබා ගැනීමට එක් අතකින් ආගම බලපා ඇති ආකාරය හඳුනාගත හැකි ය.

එලෙසම ඉස්ලාම් ආගමේ දී සමාජ පාරිසරක තත්ත්ව යටතේ සිදුවන ආපදා තත්ත්වයන්ගෙන් මිදීමට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ උපදේශන ලබා දී ඇති අයුරු හඳුනාගත හැකි ය. එයට අනුව, ජනතාව ආපදාවලින් මුදවා ගැනීම ක්‍රියාවලීන් දෙකක් මඟින් සිදු වේ. එනම්, උපදේශන සේවා මඟින් මුදා ගැනීම, ජීවනෝපාය නිවාරණ සේවා මඟින් මුදා ගැනීම ලෙස ය (අල්- අහ්කුල් ඉස්ලාමියා, 2015). ඒ අනුව, ඉස්ලාම් ආගම තුළ පල්ලිය කේන්ද්‍ර කර ගනිමින් ජනතාවට ආපදා සහනශීලීත්වයන් සැපයීම, දිළිඳු ප්‍රජාව නඟාසිටුවීමට කටුයතු කිරීම මෙන් ප්‍රජාව අතර සහෝදරත්වය ඇති කරනු දැකිය හැකි ය.

එපමණක් නොව ඉස්ලාම් ආගම සහ රාජ්‍ය පාලනය පිළිබඳ විමසීමේ දී ද ඉන්දියාව තුළ බොහෝ කලක් මුස්ලිම් රජවරු පාලනය කළ බව සඳහන් වේ. නිදසුනක් ලෙස ඉන්දියාවේ මෝගල් පාලනය තුළ හින්දු පාලනය ඉවත් කර මුස්ලිම් පාලනයක් ගෙන ඒමට කටයුතු කර තිබෙන අතර මහා අක්බාර් රජු සමයේ දී ද ඉස්ලාම් ආගමට ගැතිව සෙසු ආගම් සඳහා ද සහනශීලී ප්‍රතිපත්තියක් ගෙන ගිය බව සඳහන් වේ (ද සිල්වා, 2021). එලෙසම දිල්ලි සුල්තාන ආදී පාලනයන් සමඟ ඉන්දියාව දැඩි මුස්ලිම් පාලනයකට නතු වූ ආකාරය කිව හැකි ය. ඉස්ලාම් ආගම සහ පාලන තන්ත්‍රය පිළිබඳ අවධානයේ දී ශ්‍රී ලංකාව තුළ අතීතයේ මුස්ලිම්වරු රාජ්‍ය පාලනයට මැදිහත් වීම ඉතා අල්ප ය. එනමුත් එකල අරාබි වෙළෙඳුන් ලංකාවට පැමිණීමත් සමඟ වෙරළබඩ ප්‍රදේශයන් ආශ්‍රිතව ස්ථාපිත වූ ඉස්ලාම් ආගම ව්‍යාප්ත කිරීමට ප්‍රජාව කටයුතු කළ අතර යටත්විජිත සමයේ දී පැමිණි ක්‍රිස්තියානි ආගමට එරෙහිව ඉස්ලාම් ආගමික පුනර්වනය සඳහා සිද්ධි ලෙබ්බේ ප්‍රමුඛ මුස්ලිම් ප්‍රජාව ක්‍රියාකර තිබේ. එහි දී මුස්ලම් නේෂන් වැනි පුවත්පත් මඟින් දැනුවත් බව ඇති කිරීම පමණක් නොව ඉස්ලාම් පාසල් බිහිවීම, මුස්ලිම් කාන්තාවන් අධ්‍යාපනයට යොමු කරවීම මඟින් විශාල සමාජ වෙනසක් ඇති කරන ලදී (ඉස්ලාම් ධර්මය නව නිර්දේශය 11 ශ්‍රේණිය, වර්ෂය සඳහන නොවේ). මේ අනුව ඉස්ලාම් ආගම මඟින් ද මුස්ලිම් ප්‍රජාවට යහපත් ජීවිතයක් සඳහා මෙන් ම සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමට මඟ පෙන්වා තිබීම සේ ම සමස්ත මුස්ලිම් සංස්කෘතියම ඒ අනුව ක්‍රියාකරනු හඳුනාගත හැකි ය.

## 5. 4. ක්‍රිස්තියානි ආගම

බටහිර සමාජය තුළ බිහි වූ ආගමක් ලෙස ක්‍රිස්තියානි ආගම ද ඒකදේවවාදී ආගමක් වන අතර දෙවියන් වහන්සේ ඇදහීමේ දී එතුමන්ගේ නියෝජිතයා ලෙස ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට පාත්‍ර වේ. මෙහි දී ජේසුස් වහන්සේගේ මව වන කන්‍යා මරියතුමිය ද දේවත්වයෙන් තබා වන්දනාමානයට පාත්‍රවීම ද දැකිය හැකි ය. ඒ අනුව, කතෝලික ආගමේ විවිධ නිකායන් පවතින අතර ඇංගලිකන්, දෙවියන් වහන්සේගේ සභාව, බැප්ටිස්ට්, ලූතරන්, මෙතෝදිස්ත, රෝමාන කතෝලික වශයෙන් ඒවා දැක්විය හැකි ය (ෆාර්වල්ඩ්, දිනය සඳහන් නොවේ). මෙහි දී ආගමේ ප්‍රධාන ග්‍රන්ථය වන ශුද්ධ වූ බයිබලය අඩංගු කරුණු අනුව බැතිමතුන්ගේ ජීවිත පාලනය වීම සිදු වේ. මේ අනුව, ක්‍රිස්තියානි ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකරන ආකාරය විමසීමේ දී එතුළ පවතින මූලධර්මයන් ඒ සඳහා බලපාන ආකාරය වටහා ගැනීම වැදගත් වේ.

එහි දී දස පනත පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සෙසු ආගම්වල සේ ම එමඟින් යහපත් ජීවිතයකට මඟ පෙන්වා දී තිබේ. එම දස පනත නම් " සැබෑ වූ එකම දෙවියන්ට නොදිවුරව, ඉරුදිනත් ඝෘය මංගල්‍ය දිනත් නිවාඩු වලංගු කරව, මව්පියන්ට සංග්‍රහ කරව, ජීවිත විනාශ නොකරව, කාම මිථ්‍යාචාරය නොකරව, සොරකම් නොකරව, බොරු සාක්ෂි නොකියව, පරදාර ආලය නොකරව, අන්වස්තු ආසා නොකරව" යනුවෙන් දක්වා තිබේ (කතෝලික ධර්මය 6 ශ්‍රේණිය, වර්ෂය සඳහන් නොවේ: 59). ඒ අනුව කතෝලිකයන්ට නියම වු ඝෘය මංගල්‍ය දිනයන් තුළ දේව මෙහෙයන්ට සහභාගී වීම අනිවාර්ය කොට තිබේ. ඒ අනුව මෙදිනට නිවාඩු ලබාගැනීම, අනිවාර්ය දේව මෙහෙයන්ට සහභාගි වීම, බැතිමතුන් ඒකරාශී වී කටයුතු කිරීම මඟින් කිතුණු ප්‍රජාව තුළ ඒකාබද්ධතාව ඇති කිරීමට ආගම සමත්වනු හඳුනාගත හැකි ය. එලෙසම ක්‍රිස්තියානි ආගම තුළ ද සෙසු ආගම් සේ ම ශාරීරික පුණ්‍යා ක්‍රියා සහ ආත්මීය පුණ්‍ය ක්‍රියා ලෙස සාගිනි වූවන්ට ආහාරදීම, රෝගීන් බැලීමට යාම, පව්කාරයන් පාපයෙන් මිදවීම, වැරදි කමා කිරීම් ආදිය සිදු කළ යුතු බවට යහපත් මඟපෙන්වීමක් ක්‍රිස්තියානි ආගමෙන් ද ලැබේ. ඒ අනුව, ක්‍රිස්තියානි ආගම තුළ ද අතීතයේ සිට ජීවිතයේ වැදගත් සෑම අවස්ථාවක දීම මැදිහත් වීම් සිදු කර තිබේ. ඒ අනුව ක්‍රිස්තියානි ආගම තුළ සිදුවන බෞතීස්ම කිරීම් පමණක් නොව විවාහය ද මුළුමනින්ම සිදු වන්නේ දේව ආශිර්වාදය මැද දිවුරුම් දීමෙන් දේවස්ථාන පියතුමන්ගේ

මූලිකත්වයෙනි. එසේම ක්‍රිස්තියානි කතෝලික අවමංගල්‍ය උත්සවයන් ද දේව ආශිර්වාදය මධ්‍යයේ පල්ලිය තුළම සිදු කිරීම වැදගත් වේ. එලෙසම දේවස්ථාන තුළ ද පුද්ගලයන් සාමූහිකත්වය වර්ධනය කිරීම, දිළිඳු ප්‍රජාවට පිහිටවීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් යහපත් සමාජයක් ඇති කිරීම සඳහා කටයුතු කරනු දැකිය හැකි ය.

ශ්‍රී ලංකා සමාජය ඇසුරින් මේ පිළිබඳ අතීතයේ දී සමාජය වෙනස් කිරීමේ මෙවලමක් ලෙස ආගම භාවිතා කර තිබෙනු හඳුනාගත හැකි ය. ඒ අනුව, ක්‍රිස්තියානි කතෝලික ආගම් මෙරට ස්ථිර ව්‍යාප්තිය ඇරඹෙන්නේ යටත්විජිතවාදී පාලන සමය තුළ ය. යටත්විජිත රාජ්‍යයන්ගෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම් පමණක් නොව මිෂනාරි ආගම පැතිරවීම ද බටහිර ජාතීන්ගේ මූලික අභිප්‍රාය විය. එම ආගමට පුද්ගලයින් හරවා ගැනීම තුළ සමාජය පාලනයකට නතු කළ හැකි යන අභිප්‍රාය ඔවුන් තුළ පැවතිණ. ඒ අනුව, 1505 දී ලොරෙන්සෝ ද අල්මේ දා ප්‍රමුඛ පෘතුගීසීන් පැමිණෙන විට කතෝලික ආගමික පූජකවරු ද පැමිණි බව සඳහන් වේ. එකල කෝට්ටේ රාජධානියේ අසමගිය ආගම ප්‍රචාරයට මනා පිටුවහලක් වූ අතර ධර්මපාල කුමරු 1557දී රෝමානු කතෝලික ආගමේ බෞතීස්ම ලැබීම සමඟ ඒ යටතේ තිබූ ප්‍රදේශයන් ද පෘතුගීසි පාලනයට නතු වී ඇති අතර එකල ප්‍රැන්සිස්කානු පූජකවරුන් කිහිපදෙනෙකු ද ලංකාවට පැමිණි බව සඳහන් වේ (පෘතුගීසීන් කතෝලික ආගම ප්‍රචාරය කිරීම, 2018). එකල ඇතැම් රාජකීයන් ද කිතුදහම වැළඳ ගැනීම සිදුවිය. යමසිංහ බණ්ඩාර, කුසුමාසන දේවිය බෞතීස්ම ලබා ගත්හ. මෙකල සැබවින්ම සමාජ පාලන මෙවලමක් ලෙස ආගම භාවිත විය. කතෝලික ආගම වැළඳගත් පිරිස් බඳුවලින් ඉවත් කිරීම, එවැනි පිරිස්ගේ කුල භේදය නොසලකා හැරීම, උසස් තනතුරුවලට පත්කිරීම සහ කිතුණු ආගම වැළඳගත් පුරුෂයන්ට පෘතුගීසි කාන්තාවන් විවාහ කරගැනීමට හැකිවීම වැනි වාසි සහගත තත්ත්වයන් අත්කරදෙන ලදී (කතෝලික ආගම ප්‍රචාරය කිරීම, 2018).

ඉන්පසුකාලීනව පැමිණි ලන්දේසීන් ද පෘතුගීසි පූජකයන් සඳහා අභියෝග කරමින් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීමට උත්සාහ දැරිණ. මෙම ආගම ද පැවති පෘතුගීසි පාසල් මඟින් ව්‍යාප්ත කළඅතර ප්‍රෙඩිකන්ට් නැමති තනතුරු මඟින් එය පරීක්ෂා කළ බව සඳහන් වේ (මදුරප්පෙරුම, 2007). එහි දී එම පාසල්වලට දරුවන් නොයවන දෙමව්පියන්ට දඩ නියම වී ඇති අතර රෙපරමාදු දේවස්ථානවල සිදු නොකරන විවාහ සහ බෞතීස්ම පිළිනොගැනීමේ තත්ත්වයක් උදා වී

තිබේ. මේ තත්ත්වය තුළ වියැකී යන පෘතුගීසී කතෝලික ආගම නඟා සිටුවීමට ද ජූසේ වාස් පියතුමන් වැන්නවුන් ක්‍රියා කර තිබේ (කතෝලික ධර්මය 10 ශ්‍රේණිය, 2020). එනමුත් පෙර පරිදි රෙපරමාදු ආගමේ බලය ව්‍යාප්ත කිරීම සඳහා ලන්දේසීන් ආගම වැළඳගත් පිරිස් වෙත වරප්‍රසාද ලබාදීම සිදුකර ඇති අතර එමගින් සෙසු බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගම් යටපත් කිරීම ඔවුන්ගේ අභිප්‍රාය විය. එහි දී 1767 සැප්තැම්බර් 15 දින ලස්දේසීන් විසින් මෙයිඩන් නියෝග නියෝග නිකුත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ ක්‍රිස්තියානි උත්සව දිනවල දී වෙළඳාම් කිරීම , කර්මාන්ත කිරීම තහනම් බවත් එසේ ක්‍රියාකිරීම දඩ ගෙවීමට සහ සිර වැදීමට හේතුවක් බව දැක් වූ අතර ආගම වැළඳගත් පිරිස් වෙත ඉඩම් ප්‍රදානය, වහලුන් මිල දී ගැනීමට සහ ළඟ තබා ගැනීමට අවස්ථාව උදා විය (තිලකරත්න, 2018).

ඉන් අනතුරු ඉංග්‍රීසී ජාතීන් මෙරටට පැමිණීමත් සමඟ ඔවුන්ගේ ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය සඳහා දැඩි පරිශ්‍රමයක් දැරූ අතර ලන්ඩන් මිෂනාරි සමාගම, බැප්ටිස් මිෂනාරි සමාගම,වෙස්ලියන් මිනාරි සමාගම, ඇමරිකන් මිෂනාරි සමාගම සහ චර්ච් මිෂනාරි සමාගම වැනි සමාගම් මගින් ආගම ප්‍රචාරය සඳහා දැඩි පරිශ්‍රමයක් දරා ඇත (Hettiarachchi, 2016). එහි දී බයිබලය සිංහලයට පර්වර්තනය කිරීම, මාසික තැග්ග, ලංකා නිධානය වැනි සඟරා නිකුත් කිරීමෙන් පමණක් නොව මිෂනාරි පාසල් ආරම්භ කිරීම මගින් ද ඉංග්‍රිසි සංස්කෘතිය කාවැද්දීමට උත්සාහ දැරිණ. මෙම ආගම වැළඳගත් පිරිස් වෙත ද රජයේ ඉහළ තනතුරු ලබාදීම, සිවිල් සේවා නියෝජිත තනතුරු ලබාදීම විය. එහි ප්‍රතිඵලය ලෙස සිංහල, ද්‍රවිඩ ප්‍රජාවට මිෂනාරි පාලස්වලට යාමට සිදු වූ අතර එමගින් ඉංග්‍රීසි භාෂාව කතා කිරීමට, නම් භාවිත කිරීමට, ඉංග්‍රීසි සංස්කෘතිය අනුව හැසිරෙන ඇඳුම පැළඳුම පවත්වාගෙන යන ඉංග්‍රීසීන්ට ගැති කළු සුද්දන් පිරිසක් ද බිහිවීමට ඉංග්‍රීසීන්ගේ මෙම ආගම ප්‍රචාරය හේතු විය. ඒ අනුව, බටහිර සංස්කෘතිය ලංකාව තුළ ස්ථාපිත වීමට මිෂනාරි ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකර ඇති අයුරු පැහැදිලි ය.

එලෙසම ඉන්දියාව පිළිබඳ අවධානයේ දී යුරෝපා බලපෑමට යටත්වීමෙන් ක්‍රිස්තියානි ආගමේ බලපෑමට ලක්විය. මෙහි දී ක්‍රිස්තියානි ආගම ඉන්දියාවේ පැතිරීම ආරම්භ වන්යේ පෘතුගීසී ආගමනයත් සමඟ ය. 1498දී පෘතුගීසී ජාතික වස්කෝ ද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබැසීමත් සමඟ ඔහු පවසා ඇත්තේ " ... අපි ක්‍රිස්තු භක්තිකයන් සහ කුළු බඩු සොයා ආවෙමු

ලෙසය" (සූරියප්පෙරුම, 2018). ඒ අනුව පැහැදිලි වනුයේ යම් රටක පාලන ආධිපත්‍ය පැතිරවීම සඳහා සිය අණසක පැතිරවීමට වඩාත් සුදුසුම ක්‍රමවේදය ආගම සමඟ මුසුව සිය මූලධර්ම ප්‍රචාරය කිරීම බව ඔවුන් දැන සිටි බවයි. ඒ අනුව, මෙලෙස පැමිණ පෘතුගීසීන් 1510දී ගෝව අල්ලා ගනිමින් සිය අණසක පැතිර වූ අතර ඉන් අනතුරුව ලන්දේසීන් මූගල් අධිරාජ්‍යයෙන් පසු ඉන්දියාවේ අහමදාබාද්, අග්‍රා, මදුරාසි වැනි ප්‍රදේශ පාලන යටතට පත් කරගන්නා ලදී (ඉන්දියාන් සටන් ව්‍යාපාරය, වර්ෂය සඳහන් නොවේ). මෙහි දී ඉංග්‍රීසි ජාතිකයින් ද සිය ආගම ප්‍රචාරය කරමින් ශ්‍රී ලංකාව තුළ සේ ම ඉන්දියාව තුළ ද වරප්‍රසාද ලබාදෙමින් බටහිර සංස්කෘතිය ස්ථාපිත කිරීමට දැඩි උත්සාහයක් දැරුව ද ඉන්දියානු ජාතික ව්‍යාපාරය හමුවේ හින්දු ආගම බලවත් වුව ද යම් අකාරයක බලපෑමක් සමාජයට සිදු කිරීමට ක්‍රිස්තියානි ආගම හේතු විය. ඒ අනුව පැහැදිලි වනුයේ අතීතයේ දී ක්‍රිස්තියානි ආගම සමාජය බටහිරකරණයට ලක්කිරීමේ උපාය මාර්ගයක් ලෙස ආගම ක්‍රියාකර ඇති බවයි.

මේ අනුව පැහැදිලි වනුයේ සැබැවින්ම සෑම ආගමක් ම සමාජ පාලනය සඳහා අවශ්‍ය මූලධර්මවලින් සමන්විත බවයි. එය කෘත්‍යාත්මකව විමසීමේ දී අතීතයේ සිට ම ආගම මඟින් සිදුකරන ප්‍රධාන කෘත්‍ය බවට සමාජ පාලනය පත්ව ඇත. එහි දී සමාජය ඒකාබද්ධ කිරීමට පමණක් නොව සමාජය තුළ විනයක් ඇති කිරීමට සේ ම සමාජ වෙනසක් ඇති කිරීමට ආගම මැදිහත් වී තිබේ.

## 6. නූතනයේ ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකිරීමේ නව ප්‍රවණතා.

නූතනයේ ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස අතීතයට සාපේක්ෂව සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම පාහේ දැඩි මැදිහත්වීමක් සිදු කරනු හඳුනාගත හැකි ය. ඒ අනුව සමාජ පාලනයේ දී මෙලෙස ආගමේ වෙනස්වීම කෘත්‍යාත්මකව විමසා බැලීමේ දී ආගම නමැති සමාජ ආයතනය මඟින් සිදුවන කාර්යභාරය පවුල, දේශපාලනය, අධ්‍යාපනය, සෞඛ්‍යය වශයෙන් අනෙකුත් ආයතනවල ක්‍රියාකාරීත්වයට වන බලපෑම තුළ සිදුවන වෙනසක් ලෙස හඳුනාගත හැකි ය. එලෙසම මෙය සමාජ ආයතන අතර ක්‍රියාකාරීත්වයේ සට්ටනකාරී තත්ත්වයක් ලෙස ද හඳුනාගත හැකි ය. ඒ අනුව, නූතන තත්ත්වය වනුයේ ආගම ද්විත්ව රංගනයක නිරත වීමයි. එක් අතකින් සංස්කෘතික මුහුණුවරකින් සමාජය මෙහෙයවීම සිදු කරන විට

අනෙක් අතට දේශපාලන මුහුණුවරකින් මුළු සමාජයම පාලනයකට නතු කරගනී. මෙලෙස සිදුවන සමාජ පාලනයේ ප්‍රතිඵලය සමාජය කෙරෙහි යහපත් අයුරින් සමාජ ඒකාබද්ධතාවයට ඇති කිරීමට සේ ම සමාජය තුළ මර්දනාකාරී තත්ත්වයන් ඇති කිරීමට ද හේතු වී තිබේ.

## 6. 1. ආගමේ සංස්කෘතික මුහුණුවර

නූතනය වන විට ශ්‍රී ලංකාව තුළ ආගම සමාජ පාලනය සඳහා සංස්කෘතික පදනම මත මැදිහත්වෙන ආකාරයේ වෙනස්කම් පවතින බව හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම බුදුදහම නවීකරණයට, වාණිජකරණයට ලක්වීම තුළ නව මුහුණුවරකින් සිංහල සංස්කෘතිය වෙනස් මාවතක් කරා ගමන් කිරීමට සමත් වී තිබේ. මෙහි දී ක්‍රිස්තියානි ආගමේ බලපෑම මත එය අනුකරණය කිරීමට උත්සාහ දැරීමත්, එම ආගම් අභිබවා යෑමට උත්සාහ දැරීමත් හේතුවෙන් ථේරවාදී බුදුදහමින් ඈත්ව නවාංග රැසක් එකතු වීමෙන් ජනප්‍රිය බුදුදහම නූතනය වනවිට පැමිණ තිබේ. එහි දී බුදුදහමේ සිරිත් විරිත් තුළට විචිත්‍ර බවක් එකතුවීමෙන් දේශපාලනය සමග ද ඒකාබද්ධව යන්නා වූ අයුරු දැකිය හැකි ය. ඒ අනුව නූතනයේ දී ජනප්‍රිය බුදුදහම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකරන අයුරු විමසීමේ දී අතීතයේ මෙන් ම නූතනය වන විට ද බුදුන්ගේ ආශිර්වාදය ලබා ගැනීමේ අරමුණින් වැඳුම් පිදුම් කිරීම දක්නට ලැබුණ ද ඒ සඳහා වාණිජ අරමුණු එකතු වී තිබෙනු හඳුනා ගත හැකි ය. නිදසුනක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක බෝධි පූජා සංකල්පය විමසා බැලීමේ දී මෙම තත්ත්වය වඩාත් දැකගත හැකි ය. ඒ අනුව, බෝධි පූජාවල මානව විද්‍යාත්මක ලක්ෂණ පැහැදිලි කරන එස්. බී. එච්. ප්‍රභාත් ඉන්දික පෙරේරා සඳහන් කරන ආකාරයට ආරම්භයේ දී බෝධි වන්දනය බෝධියට අරක්ගත් දේවතාවෙකුගේ විශ්වාස මත විග්‍රහ කළ ද අද වනවිට බුදුන් වහන්සේ සම්බන්ධ කරමින් බෝධි වන්දනය සිදු වේ. එලෙසම ඔහු තවදුරටත් දක්වන්නේ එය බෞද්ධයන්ට නිවන සාක්ෂාත් කර ගැනීමට නොව ලෞකික අරමුණු පෙරදැරි කරගත් පූජා ක්‍රමයක් බවට පත්ව ඇති බවයි (පෙරේරා, 2011: 524).

ඒ අනුව, ජීවිතයේ වැදගත් සෑම අවස්ථාවක දී ම බෝධි පූජා තබමින් ආශිර්වාද ලබා ගැනීම උසස් මෙන් ම පහළ ප්‍රාන්තික ලොකු කුඩා වැඩිහිටි ජනයාගේ පුරුද්දක් බවට පත්ව ඇත. ගර්භනී කාන්තාවකට යහපත් දරු උපතක් සඳහා ආශිර්වාද ලබා ගැනීමට,

අලුත උපන් දරුවෙකුට ග්‍රහ අපල දුරු කරමින් නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීමට, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගනිමින් විභාගයේ දී ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට, රැකියා කටයුතු සාර්ථක කරගැනීමට, නිවසේ කටයුතු සාර්ථක කර ගැනීමට පමණක් නොව මරණින් දිවිගලවා ගැනීමට වශයෙන් එකී මෙකී ලෞකික කාරණා සියල්ල ඉටු කරගැනීම සඳහා බෝධි පූජාවන් කිරීම සුලභ දසුනක් බවට පත්ව ඇත. නිදසුනක් ලෙස නූතනය වන විට විභාග සමත්වීම අරමුණු කරගනිමින් මහා පරිමාණයෙන් සිදුකරන ආශිර්වාද ලබාදීමේ වැඩසටහන්, මතුරන ලද පෑන් ලබාදීමේ වැඩසටහන්, සතිපතා පවත්වන බෝධි පූජා මත විශ්වාසය තැබීමට පුරුදුව සිටී. මෙහි දී ඇතැම් උපාසකයන් මෙය මුදල් උපයන මාර්ගයක් බවට පත්කරගනිමින් මුදලට බෝධි පූජා තැබීමේ ප්‍රවණතාව මතුව තිබේ. එලෙසම දේවාල තුළ ද ලබාදෙන මුදල මත එනම් වැඩි මුදලක් ලබා දෙන්නේ නම් වැඩි වශයෙන් යාච්ඤා කිරීමටත් අඩු මුදලක් ලැබේනම් අඩු වශයෙන් යාච්ඤා කිරීම හෝ එසේ නොකිරීම පවතී. එසේම පලතුරු වට්ටි පූජාවන් තුළ වුව ද විශාල පලතුරු වට්ටි ගෙන එන පුද්ගලයාට වැඩි ගෞරවය ලබාදෙන තත්ත්වයට නූතන සමාජය නිර්මාණය කර තිබේ. එපමණක් නොව නූතනය වන විට පවත්වනු ලබන මහා පරිමාණ පූජාවන් තුළ ද මෙම තත්ත්වය දැකගත හැකි ය. කඨින චීවර පූජා, කඤ්චුක පූජා, පිච්චමල් පූජා, දාස්පෙතිමල් පූජා, නෙළුම් මල් පූජා වශයෙන් සුප්‍රසිද්ධිය පදනම් කරගත් පූජාවන් ආඩෝප තත්ත්වයට පත්ව වී තිබීමෙන් ආගමේ කීර්තිය ලොවට ප්‍රකාශ කිරීමට දරනු ලබන උත්සාහයක් ලෙස දැකිය හැකි ය.. මෙහි දී මෙම පූජාවන් සඳහා දායකත්වය ලබාදෙන ඉහළ ධනවත් පිරිස් සිය සමාජ තත්ත්වය නිර්මාණය කර ගැනීම සඳහා ආගම භාවිත කරනු දැකිය හැකි ය. බුදුන්ගේ දෙවියන්ගේ ඉහළ ආශිර්වාදය ලබාගත හැක්කේ ද පූජාවන් ඉදිරියේ බැබළෙන්නේ ද ආගමික නායකයන්ගේ ඉහළ ගෞරවාදයට පත්වෙන්නේ ද ඉහළ ප්‍රාන්තික ප්‍රජාව බවට පත් වී තිබේ. ඒ අනුව, ආගම නුතනය වන විට සමාජ අසමානතාව ඇති කරන සාධකයක් බවට පත්වී තිබෙනු දැකිය හැකි ය.

මෙහි දී නාගරික බුදුදහම පිළිබඳ සඳහන් කරන රිචඩ් ගොම්බ්‍රිච් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව තුළ පැහැදිලි ලෙස නගරය කේන්ද්‍ර කරගත් බුදුදහමක් පවතින බවයි. එහි දී නගරය තුළ පවතින වාණිජවාදී ලක්ෂණ බුදුදහමට එක්වී ඇති බවත් එය නගරයේ පන්ති ස්ථර නිර්මාණයට හේතු වී ඇති බවයි. ඒ අනුව, නගරයේ ධනපති,

මධ්‍යම, කම්කරු ප්‍රජාව අතරින් ප්‍රභූ පන්තිය ප්‍රධාන දායකයන් ලෙස මුදල් වියදම් කරමින් සිය තත්ත්වය ගොඩනගා ගනිමින් සිටින බවයි (පෙරේරා, 2011). එලෙසම බොහෝ භික්ෂූන් වහන්සේලා ද වාණිජත්වය මත පදනම්ව ලෞකික සම්පත් පසුපස හඹා යමින් සිටින අතර ලොකු කුඩා දායකයන් ඇසුරු කරගනිමින් මුදල් රැස් කිරීමට පෙළඹී තිබේ. එලෙසම ධර්ම දේශනාවන් පිළිබඳ අවධානයේ දී ද මුදලට දහම් දෙසීමේ තත්ත්වයක් උදා වී ඇති අතර එමඟින් රූපවාහිනී නාලිකා පමණක් නොව ආගමික නායකයින් ද මුදල් ඉපැයීම නූතන ප්‍රවණතාවයකි. එලෙසම බොහෝ කාලීන ධර්ම දේශනාවන් තුළ ද දේශපාලන කරුණු අන්තර්ගත කරමින් සිය මතය කරා අනුගාමිකයන් මෙහෙයවීමේ තත්ත්වයක් උදා වී ඇති අතර නිර්මල බුදුදහමේ උපදේශන වියැකෙමින් පවතී. එලෙසම වත්මන බුදුදහම මූලික කරගනිමින් පවත්වන වෙසක්, පොසොන් වැනි ආගමික උත්සවයන් තුළ ද දැකගත හැක්කේ ආධ්‍යෝප ජීවිතය සඳහා පුද්ගලයන් මෙහෙයවීමකි. මහා පරිමාණයෙන් සිදුකරන ආලෝක පූජාවන්, තොරණ සහ වෙසක් කුඩු තරඟ බාහිර විචිත්‍රත්වය සහ වාණිජ අරමුණු කරා පුද්ගලයා මෙහෙයවා තිබේ.

තවද, හින්දු ආගම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ද හින්දු ආගම සෙසු ආගම් තුළ ඇති මූලධර්මයන් ද උරා ගනිමින් සිය ලබ්ධිකයන් පාලනයට නතු කරගෙන තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාව වෙත අවධානයේ දී හින්දු දේවස්ථාන පුදබිම තුළ සිදුවන උත්සව තුළ හින්දු මෙන් ම සිංහල ජනයා ද පාලනයට නතු වී ඇති බව පැවසිය හැකි ය. ඒ අනුව, හින්දු ආගමික පුදබිම් ආශ්‍රිතව සිදුවන ගිනි පෑගීමේ උත්සව, බිලි පූජා සම්ප්‍රදායන් මඟින් බලාපොරොත්තු ඉටු කරගැනීමට දරන උත්සාහයන් මඟින් පුද්ගලයා පාලනයට ලක් වී ඇති ආකාරය දැකිය හැකි ය. මෙහි දී හින්දු ආගම ආශ්‍රිත සිදුවන බිලි පූජා මඟින් දෙවියන්ගේ බලපෑමට ලක්වන ආකාරය දැකිය හැකි අතර එම තත්ත්වය තුළ සමාජයේ අර්බුදතා රැසක් ද නිර්මාණය වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. නිදසුනක් ලෙස මුන්නේශ්වරම් ශ්‍රී භද්‍රකාලී අම්මාන් දේවාලය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දේව මෑණියන් සඳහා බිලිපූජා පැවැත්වීම නිරතුරුවම සිදුවන කටයුත්තකි. මෙහි පූජකවරයෙකු දක්වන ආකාරයට පසුගිය යුද සමයේ දී දකුණේ සිංහල පවුල්වල බොහෝ දෙමව්පියන් යුද්ධයට ගොස් සිටි තම දරුවන් ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා ඔවුන් නැවත පැමිණි පසු කුකුළන් සහ එළුවන් යොදා සත්ත්ව බිලිපූජා පැවැත් වූ බවයි. එහි දී

1979 ජූනිමස කැබිනට් තීරණ මඟින් බිලි පූජා තහනම් කළ ද 2011 වසරේ දී ද නියෝග පනවා තිබුණ ද නූතනය වනවිට ද බිලි පූජාවන් ක්‍රියාත්මක වන්නේ මෙම ආගමික මූලධර්මයන් අධිකරණය ඉක්මවා නැගී සිටින බව පැහැදිලි කරමිනි (ප්‍රනාන්දු, 2007). එලෙසම කොළඹ පැවැත්වෙන හින්දූන්ගේ වේල් උත්සවය තුළ සේ ම කතරගම පවත්වනු ලබන උත්සවයන් විමසීමේ දී ද උත්සව අවස්ථාවන්වල සිදු කරන කිරිකල හිස තබා යෑම, වේල් කටුවලින් දිව විදීමෙන් හෝ ශරීරයට කොකු සවිකිරීමෙන් සිදු කරන වේල් රථ ඇදීමේ උත්සවයන් ද පුද්ගලයා භක්තිය මත ආගමට නතු වන ආකාරය පිළිඹිබු කරයි (වීරසිංහ, දිනය සඳහන් නොවේ).

එලෙසම ඉන්දියාව වෙත අවධානය යොමු කිරීමේ දී ද ශරීරයට දුක්දෙමින් සිදුකරන පුදපූජා පිළිවෙත් තවදුරටත් වර්ධනය වී ඇත. මෙම පූජා විධි නිදසුන් ඇසුරින් විමසා බැලීමේ දී වසරකට වතාවක් මහාලක්ෂ්මි දේවස්ථානයට පැමිණ වාසානාව සහ නිරෝගීබව ලබා ගැනීමට පූජකයන් විසින් බැතිමතුන්ගේ හිසට පොල් ගැසීම සිදු කිරීම දක්නට ලැබෙන අතර එමඟින් හිස තුවාල වී ලේ ගලන තත්ත්වයට පත්වීම සිදුවේ. එලෙසම දකුණු ඉන්දියානුවන් විසින් මකරා හරණී හා කුම්භ හරණී දින විෂ්ණු දෙවියන්ගේ වාහනය ලෙස සැරසී සිට නර්තන අංගයකින් පසු පිටේ මස්වලින් එල්ලා මරා දැමීම ඉතා අමානුෂීය ය. තවද කාර්තිකෙයා දෙවියන් පිණිස සිදු කරන ලද දින 48 උපවාසයෙන් පසු ශරීරයට කොකු දමා රථ ඇඳගෙන යන සිදුවීම් ද වාර්තා වේ. එලෙසම දීපවාලි උත්සවයට පසු දින ගවයන් සරසා පුද්ගලයන් බිම වැතිරී සිට ගවයන්ට යෑමට සැලසීම සේ ම බනී උත්සවයේ දී හිසට පොලුවලින් පහරදීම වැනි පූජා ක්‍රමයන් තුළින් හින්දු භක්තිකයන් ශාන්තිය උදා කරගැනීමට පුරුදුව සිටී (Singh,2016). එලෙසම ඉන්දියාවේ දහස් ගණන් මිනිසුන් එක්රැස් වී කරන උත්සවයන් හේතුවෙන් විශාල පිරිසක් ජනයා මියයාම ද ගැටලුවක් බවට පත් වී තිබේ. ඒ අනුව, නූතනය වන විට මෙලෙස ආගම මඟින් සිදු කරන ඇතැම් මෙහෙයවීම් පුද්ගල විනාශය සඳහා හේතුවන බව හඳුනාගත හැකි ය.

එලෙසම සමාජ පාලන ක්‍රමයක් ලෙස ආගම ක්‍රියාකරන ආකාරය විමසා බැලීමේ දී ආගම කාන්තාව පාලනයට ලක් කරන ආකාරය නූතනයේ දී ද දැකිය හැකි ය. ඒ අනුව, බෞද්ධ ආගම තුළ කාන්තාව අසාධාරණයට ලක්වන අවස්ථා දක්නට ලැබේ. මෙහි දී කාන්තාවගේ පවිත්‍රත්වය පදනම් කරගෙන ඇතැම් ආගමික

ස්ථානයන් සඳහා කාන්තාවට පිවිසීම සීමා කරන්නේ ආගම සමාජ පාලන මෙවලමක් ලෙස ක්‍රියා කරමිනි. ඒ අනුව, සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම කළ ද කාන්තාවන්ට උඩ මළුවට යෑමට ඉඩ ලබා නොදීම, දළඳා මාළිගා පත්තිරිප්පුවට යාමට අවස්ථාව හිමිනොවීම තුළ කාන්තාව අසාධාරණයට ලක්ව ඇති ආකාරය හඳුනාගත හැකි ය. එලෙසම හින්දු ආගම වෙත අවධානයේදී ද ඇතැම් කෝවිල් සඳහා කාන්තාවන්ට යාමට අවසර නොමැති අතර මේ තත්ත්වය ඉන්දියාවේ බෙහෙවින් දක්නට ලැබේ. නිදසුනක් ලෙස ඉන්දියාවේ දකුණු කේරළයේ පවතින සබරිමාලා නම් හින්දු කෝවිල පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඔසප් වයස් කාලසීමාව තුළ සිටින කාන්තාවන්ට එම කෝවිලට ඇතුළුවීම තහනම් කර තිබිණ. නමුත් ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම තහනම ඉවත් කළ අතර ප්‍රතිඵලය වූයේ සමාජය තුළින් ම ඊට ප්‍රතිවිරෝධතා ඇති වීම ය (බීබීසී පුවත්, 2018). ඒ අනුව, පැහැදිලි වන්නේ ආගම මඟින් වන මෙම මෙහෙයවීම නීතියට පවා පාලනයට දුෂ්කර බවයි.

එලෙසම ඉස්ලාම් ආගම වෙත අවධානයේ දී ද කාන්තාවන් සඳහා වාරණ පනවා ඇති ආකාරය හඳුනා ගත හැකි අතර කාන්තාවන්ට පල්ලියට සහභාගී විය හැක්කේ ද විශේෂ අවස්ථාවල දී පමණි. එලෙසම ඉස්ලාම් ආගම පදනම් කරගත් ෂරියා නීතිය තුළින් ද කාන්තාව බලපෑමට ලක් වූ අවස්ථා හඳුනාගත හැකි ය. මෙහට නිදසුනක් ලෙස ශ්‍රී ලංකාව තුළ ඇති වූ ෂරියා නීතිය සම්බන්ධ මුස්ලිම් ළමා විවාහ ගැටලුව දැක්විය හැකි ය. එහි දී ෂරියා නීතිය අනුව, දෙමව්පියන්ගේ කැමැත්ත පවතී නම් වයස අවුරුදු 12ට වැඩි මුස්ලිම් කාන්තාවක වුව ද විවාහ කර ගත හැකි බව සඳහන් වන අතර වයස අවුරුදු 12ට අඩු ගැහැනු දරුවෙකු වුව ද ක්වාසි උසාවි විනිසුරුවන්ගේ අවසරය මත විවාහ කර ගැනීමට අවස්ථාව හිමි වේ. මේ තත්ත්වය මත වත්මන වන විට මෙම ළමා විවාහයන්හි වයස් මට්ටම 18 දක්වා වැඩි කිරීමට අධිකරණ ඇමති අලි සබ්රිගේ මූලිකත්වයෙන් උත්සාහ දැරුව ද මුස්ලිම් කාන්තාවන් පවා මෙයට විරෝධය පල කරනුයේ ආගමික මූලධර්මයන්ගේ බලපෑම පැහැදිලි කරමිනි (බීබීසී පුවත්, 2016).

එලෙසම ආහාර සංස්කෘතිය තුළ ද ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකරන ආකාරය දැකිය හැකි ය. ඒ අනුව, බෞද්ධ ආගමට සාපේක්ෂව හින්දු ආගමික ලබ්ධිකයන් මාංශවලින් තොරවීමේ ප්‍රවණතාව ඉහළ ගොස් තිබේ. විශේෂයෙන් හින්දු

බහුතරය පදනම් වූ ඉන්දියාව ලොව නිර්මාංශ රටවල් අතර ප්‍රමුඛත්වය ගන්නා අතර මුළු ජනගහනයෙන් 38% පමණ නිර්මාංශ බව පැවසේ. ඇතැමුන් කිරි ආහාර සහ ශාක ආහාර ගැනීම ට පමණක් පුරුදුව සිටී (Sawe, 2019). විශේෂයෙන් හින්දු ආගමේ අහිම්සා සංකල්පය මෙයට බලපා ඇති අතර ගවයා පූජනීයත්වයේලා සලකන ආගමක් බවට පත්වීම ද මෙම නිර්මාංශත්වයට බලපා තිබේ. එලෙසම ක්‍රිස්තියානි ආගම තුළ ද ආහාර සම්බන්ධව පැවතුම් දක්වා තිබේ. එහි දී පාස්කු ඉරිදාට පෙර නිරාහාරව සිටීමේ උපවාසය පිළිබඳ දක්වන අතර එහි දී මස්, කිරි, බිත්තර වැනි සත්ත්ව ආහාර මත්පැන්, රසය වැඩි කරන කුළු බඩු නොගත යුතු බව දක්වයි (නාපාවල, 2009). එලෙසම ඉස්ලාම් ආගම තුළ ද ආහාර සඳහා ආගමේ උපදෙස් ලබා දී ඇති අතර එම තත්ත්වය තුළ ආහාර සම්බන්ධව ද කතිකාවතක් ගොඩනැගී තිබේ ඒ අනුව, ඉස්ලාම් අල්කුරාණයේ 'හරම්' යනුවෙන් තහනම් කළ ආහාර පිළිබඳ දක්වා තිබේ. ඒ අනුව, දැනටමත් මියගිය සතෙකුගේ මස්, ඌරුමස්, මත්පැන් පානය, රූපවලට පූජා කළ සත්ත්ව ආහාර හරම් වශයෙන් දක්වා තිබේ. එසේම 'හලාල්' අවසර දෙන ලද ආහාර ලෙස තහනම් කරන ලද ආහාර හැර සෙසු හිතකර පෝෂදායී ආහාර ලෙස දක්වා තිබේ (අජ්වාඩ්, 2019). මෙම ආහාර පිළිවෙත හේතුවෙන් ශ්‍රී ලංකා සමාජය තුළ මේ පිළිබඳ නිසි පරිදි වටහා නොගැනීම තුළ ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වීම ආගමෙන් සිදුවන පාලනය අර්බුද ඇති වීමට හේතුවක් බව පැහැදිලි වන්නකි.

එලෙසම කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ ද ආගම සමාජ පාලන ක්‍රමයෙක් ලෙස ක්‍රියා කරන ආකාරය හඳුනා ගත හැකි ය. ඒ අනුව, එක් අතකින් කොවිඩ් වසංගත තත්ත්වය තුළ රෝග උවදුරෙන් බේරීම සඳහා ආගමේ පිහිට පතා තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ කොවිඩ් වසංගතය තුළ ආගමික සිද්ධස්ථාන රුවනවැලි සෑය මූලික කරගනිමින් රතන සූත්‍ර සජ්ජායනයන් සිදු කිරීමෙන් රෝග නිවාරණය සඳහා පිහිට පැතීය. කෝවිල්, දේවස්ථාන ආශ්‍රිත පූජා දේව මෙහෙයන් පැවැත්විණ. මෙලෙස අධ්‍යාත්මික වශයෙන් ආගම පිහිට ලබා දෙන්නා සේම කොවිඩ් වසංගත තත්ත්වය වර්ධනයට ද ආගම බලපා ඇති අවස්ථාවන් හඳුනාගත හැකි ය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ යාපනයේ ශ්‍රී කමාච්චි අසබාල් හින්දු කෝවිල, මුණියප්පර් කෝවිල ආදි වශයෙන් විවිධ කෝවිල් ආශ්‍රිතව නිරෝධායන නීති නොතකා පිරිස් රැස් කිරීම කොවිඩ් රෝගය පැතිරීමට හේතුවක් බව

සඳහන් විය (අමරසිංහ, 2021). මෙලෙස කොවිඩ් පැතිරීමට ආගම බලපා ඇති බොහෝ අවස්ථාවන් දක්නට ලැබුණේ ඉන්දියාවෙනි. නිදසුනක් ලෙස ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව මෙවර පවත්වනු ලැබූ කුම්බමේලා උත්සවය තුළ සිදුකරන පුදපූජාවන් සේ ම ගංගා නම් ගඟේ පව් සේදීමේ චාරිත්‍රයන් තුළ මිනිසුන් එකට ඒකරාශී වීම ඉන්දියාවේ කොවිඩ් ප්‍රභේද සීඝ්‍ර ලෙස ඉහළ යාමට බලපෑ බව වාර්තා කර තිබේ. එපමණක් නොව ඉන්දියාව තුළ කොරෝනා උවදුරෙන් මිදීම සඳහා හඳුන්වා දුන් කොයිම්බමෝර් කෝවිලේ 'කොරෝනා දේවිය' පිහිට පතා ආ ජනී ජනී ජනයා හේතුවෙන් කොරෝනා සුවවීම විනා රෝග ව්‍යාප්තිය වර්ධනයට හේතු වී තිබේ (මවිත, 2021). එලෙසම කොවිඩ් තත්ත්වයන් නොතකා පූජාවන්ට සහභාගී වීම, මියගිය පූජකයන්ගේ අවමංගල්‍ය අවස්ථාවන් සඳහා සහභාගී වීම් හේතුවෙන් රෝග ව්‍යාප්තිය වැඩි වීම කෙරෙහි දැඩි ලෙස බලපා තිබේ. ඒ අනුව, ආගම සෙසු සමාජ සංස්ථාවන්ගේ කාර්යභාරයන් හා ගැටීමෙන් ගැටලු ඇති වීමට හේතු වී ඇති බව ආගමික ක්‍රියාපිළිවෙත තුළින් ඇති වී තිබෙන සෞඛ්‍යය තර්ජන තුළින් පැහැදිලි වේ.

මේ අනුව විමසා බැලීමේ දී නූතනය විට ආගම් තුළ සංස්කෘතික මුහුණුවර වෙනස් වී තිබේ. මෙහි දී ආගම අතීතයේ සේ ම වර්තමානය තුළ ද සිය අනන්‍ය වූ අනුගාමිකයන්ගේ ඒකාබද්ධතාව ඇති කරන මෙවලමක් ලෙස ක්‍රියා කළ ද සෙසු ආගමික මත නෛඉවසන තත්ත්වයට පත්ව තිබෙනු දැකිය හැකි ය. එලෙසම ආගම් නවීකරණයට, ගෝලීයකරණයට ලක්වීම නිසා ඒවායේ මුහුණුවර වෙනස් වී ඇති අතර වාණිජත්වය පදනම්ව ඇත. එලෙසම ආගම් මූලධර්මයන් සහ දැඩි භක්ති පූර්වක බව පවතින සමාජ ක්‍රමයට නොගැලපෙන තත්ත්වයක් ඇති වීම හේතුවෙන් සමාජය අර්බුදය කරා මෙහෙයවීමට එය හේතු ඇති අයුරු හඳුනා ගත හැකි ය. ඒ අනුව, ආගම සංස්කෘතික මුහුණුවරින් ක්‍රියාත්මක වීමේ ප්‍රවණතා තුළ ගැටලුසහගත තත්ත්වයන් බහුල ය.

### 6. 2. ආගමේ දේශපාලන මුහුණුවර

නූතනය වන විට ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකිරීමේ දී ආගමික ඉගැන්වීම්වලට සාපේක්ෂව දේශපාලන මුහුණුවරින් ආගම සමාජ පාලනයට දායක වන ආකාරය ඉහළ ගොස් තිබෙන අතර මෙහි දී නූතන ප්‍රවණතා රැසක් ශ්‍රී ලංකා සහ

ඉන්දියානු සමාජ තුළින් හඳුනාගත හැකි ය. මෙහි දී මූලික වශයෙන් ශ්‍රී ලංකාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙම තත්ත්වය වඩාත් පැහැදිලි කර ගත හැකි ය. ඒ අනුව, නූතනය වන විට ශ්‍රී ලංකාවේ ආගමික නායකයින්, දේශපාලන ජනතා නියෝජිතයින් වශයෙන් සේ ම බාහිර මැදිහත්කරුවන් වශයෙන් දේශපාලන කටයුතුවලට බලපෑම් කිරීම ඉහළ ගොස් තිබේ. නූතනය වන විට ආගම දේශපාලනීකරණයට ලක්වී පවතින අතර ආගම දේශපාලනයේ කොටස්කරුවෙකු ලෙස කටයුතු කරමින් සමාජය පාලනය කිරීමේ අවිය සියතට ගෙන ඇති අයුරු හඳුනාගත හැකි ය. ඒ අනුව, ආගමික නායකයින් විශේෂයෙන්ම බෞද්ධ භික්ෂු වහන්සේලා ප්‍රාදේශීය සභා, පළාත් සභා මන්ත්‍රීවරු ලෙස කටයුතු කිරීම සුලබ සිදුවීමක් බවට පත්ව ඇත. එපමණක් නොව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලෙස ඍජු ලෙසම ප්‍රතිපත්ති සම්පාදනයට මැදිහත් වෙමින් සමාජ පාලනයට දායක වෙමින් සිටින අයුරු හඳුනාගත හැකි ය. ඒ කෙසේ ද යත් රටක් පාලනය වනුයේ දේශපාලනය මඟිනි. රාජ්‍ය පාලනය තුළ සමාජයේ පවතින සෑම අංශයක්ම එනම්, කෘෂිකර්ම සහ ඉඩම් කටයුතු, ආර්ථික කටයුතු, සංවර්ධන කටයුතු, ජනමාධ්‍ය සහ සන්නිවේදන වශයෙන් සෑම කටයුත්තකම බලය ඒකරාශී වී පවතී. මෙම තත්ත්වය තුළ භික්ෂූන් පාර්ලිමේන්තුවට පිවිසීම රාජ්‍යයේ සියලු කටයුතුවල පාලනයට මැදිහත්වීමකි.

ඒ අනුව, ශ්‍රී ලංකා පාර්ලමේන්තුව වෙත අවධානය යොමු කිරීමේ දී 2001 වසරේ දී ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙකු ලෙස දේශපාලනයට පිවිසි බද්දේගම සමිත හිමි ප්‍රථම පාර්ලිමේන්තු මන්ත්‍රී හිමිනම බවට පත්වේ. ඉන් අනතුරුව පැමිණි විශේෂ අවස්ථාවක් ලෙස 2004දී ජාතික හෙළ උරුමය පක්ෂය යටතේ භික්ෂූන් වහන්සේලාට පමණක් නාමයෝජනා ලබාදීමේ ප්‍රතිඵලය වශයෙන් භික්ෂු මන්ත්‍රීවරු නවදෙනෙකු පාර්ලිමේන්තුවට තේරීපත්වීම සැලකිය යුතු කරුණකි (රතුවිතාන, 2019). ඒ අනුව, එදා සිට මේ දක්වා ඕමාල්පේ සෝභිත හිමි, අලව්වේ නන්දාලෝක හිමි, උඩවත්තේ නන්ද හිමි වශයෙන් බොහෝ භික්ෂූන් වහනසේලා පැමිණි ගමන් මඟ තුළ මෙවරද 2020 පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය තුළ අපේ බොදු ජන පක්ෂය යටතේ ආසනය සඳහා අතුරලියේ රතන හිමියන් පාර්ලිමේන්තුවට පිවිසි සිටින අතර උන්වහන්සේ කලාන්තරයක් තිස්සේ රටේ වැදගත් තීරණ සඳහා දායකත්වය දක්වමින් විශාල කාර්යභාරයක් ඉටු කරනු දැකිය හැකි ය. මෙලෙස භික්ෂූන්

වහන්සේලා පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ අසුන් ගනිමින් ආණ්ඩු තීරණ සඳහා මඟ පෙන්වීමක් සේ ම රටට අහිතකර තීරණ සඳහා සංරෝධක ලෙස ක්‍රියාකරමින් පනත් කෙටුම්පත් සැකසීම සඳහා සේ ම වැදගත් තීරණ ගැනීම සඳහා මැදිහත්වීම සිදු කරන අයුරු දැකිය හැකි ය. මෙහි ඉහළම අවස්ථාව ලෙස මෑතකාලීන වන විට ශ්‍රී ලංකාව තුළ ජනාධිපති අපේක්‍ෂකයෙකු ලෙස භික්ෂූන් වහන්සේ නමක ඉදිරිපත් වීම දැක්විය හැකි ය. එනම්, 2019 පැවති ජනාධිපතිවරණයේ දී අපේක්ෂකයන් 35 දෙනා අතරින් ස්වාධීන අපේක්ෂකයෙකු වශයෙන් අපරැක්කේ පුණ්‍යානන්ද හිමි නාමයෝජනා භාරදීම විශේෂ සිදුවීමක් විය (බීබීසී පුවත්, 2019). එහි දී මෙම භික්ෂු නමට සැලකිය යුතු මනාප ප්‍රමාණයක් ලබා ගත නොහැකිව පරාජයට පත්වුව ද මෙමඟින් පැහැදිලි වනුයේ නූතනය වන විට රටේ ඉහළම පාලන තන්ත්‍රය වන විධායක ජනාධිපති ධූරයට පවා තමන් සුදුසු බවට ආගමික නායකයින් ජනමතයක් ගොඩනඟමින් සිටින බවයි.

එලෙසම නූතනය වන විට ආගමික නායකයින් අතර දේශපාලන අදහස්වල බේදීම මත එකිනෙකට වෙනස් අරමුණු ක්‍රියාවට නැංවීමට උත්සාහ දැරීම දැකිය හැකි ය. ඒ අනුව, ආගමික නියෝජිතයින් විශේෂයෙන් භික්ෂූන් වහන්සේලා කාලාන්තරයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ ලෙස ජනතා විමුක්ති පෙරමුණ, සම සමාජ පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු විවිධ පක්ෂයන් තුළ සමාජිකත්වය දරමින් කටයුතු කරනු දැකිය හැකි ය. එලෙසම ඉස්ලාම් ආගමේ ආශිර්වාදය මත ක්‍රියාත්මක වන සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය, ශ්‍රී ලංකා මුස්ලිම් ජාතික කොංග්‍රසය ආදි පක්ෂ මෙන්ම හින්දු ආගමේ ආශිර්වාදය මත ක්‍රියාත්මක ඉලංකෙ තමිල් අර්සු කච්චි, ඊලාම් ජනතා ප්‍රජාතාන්ත්‍රවාදී පක්ෂය වැනි පක්ෂ ද සමාජය තුළ ඔවුන්ගේ ඉල්ලීම් දිනා ගැනීම සඳහා නිරතුරුව ක්‍රියාකරනු දැකිය හැකි ය. මේ සඳහා ඍජු ලෙසම ඔවුන්ගේ ආගමික නායකයන් දායකත්වය නොදැක් වුව ද බාහිර ලෙස මැදිහත්වීම දැකිය හැකි ය.

එපමණක් නොව බෞද්ධ සිංහල පමණක් මූලික කරගත් ජාතික හෙළ උරුමය, පිවිතුරු හෙළ උරුමය, අපේ ජන බල පක්ෂය වශයෙන් පක්ෂවලට නායකත්වය ලබා දෙමින් පක්ෂ නාම වෙනස් කරමින් අරමුණ වෙනස් කරමින් මතවාදී දේශපාලන ක්‍රියාකලාපයක නිරත වේ. මෙහි දී සැලකිය යුතු කරුණක් වනුයේ පක්ෂ අභ්‍යන්තරය

තුළ ද නිරතුරුව ගැටුම්කාරී තත්ත්වයන් ඇති වීමයි. මේ සඳහා සමීප නිදසුනක් ලෙස අපේ ජන බල පක්ෂය වෙත අවධානය යොමු කළ හැකි ය. ඒ අනුව, පසුගිය 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ගලගොඩ අත්තේ ඥානසාර හිමියන් සහ අතුරලියේ රතන හිමියන්ගේ මූලිකත්වයෙන් ගොඩනඟාගත් අපේ ජන බල පක්ෂයට හිමි වූයේ එක් මන්ත්‍රී ආසනයක් පමණක් වන අතර එය ද ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයකි. නමුත් මෙම එක් ආසනය සඳහා නම් කිරීමේ දි පක්ෂය තුළ ගැටුම් රැසක් උද්ගත විය. එක් අතකින් ප්කෂ මහලේකම් ලෙස සිටි වේදිනිගම විමලතිස්ස හිමියන් මේ සඳහා නම් කරන විට අතුරලියේ රතන හිමියන් මෙයට එරෙහිව බලපෑම් කිරීම සිදුවිය. එසේම තවත් පාාර්ශවයක් ගලගොඩ අතතේ ඥානසාර හිමියන් මේ සඳහා යෝජනා විය. මේ තත්ත්වය හමුවේ පක්ෂ මහලේකම් විමලතිස්ස හිමියන් කලක් සැඟවී සිටීම ආන්දෝලනාත්මක සිදුවීමක් බවට පත්විය. මෙහි ප්‍රතිඵලය ලෙස අතුරලියේ රතන හිමියන්ගේ තීරණය වූයේ මෙම ආසනය සම්බන්ධව තීන්දු ගැනීමට උසාවියට යාමය (UCA News Reporters, 2020). මේ අනුව එම සිද්ධිය පිළිබඳ ජනමතය වූයේ පක්ෂ දේශපාලනය තුළ කෑදර බවින් යුතුව මාධ්‍ය තුළ ආන්දෝලනාත්මක ලෙස කටයුතු කරන්නන් බවට භික්ෂූන් වහන්සේලා පත්ව ඇති බවයි. එය සමාජයේ පවත්නා අතිකුත් ප්‍රශ්න අභිබවා යමින් රට වැසියා වෙනත් මාවතකට යොමු කිරීමට ද මෙම ආගමික දේශපාලනය සමත් බව මෙමඟින් පැහැදිලි ය.

එලෙසම ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකිරීමේ නූතන ප්‍රවණතාවක් වනුයේ ආණ්ඩුවක් බලයට පත්කිරීම පමණක් නොව එම ආණ්ඩුව බලයෙන් පහ කරමින් වෙනත් පක්ෂ බලයට පත්කිරීමට ආගම ක්‍රියාකිරීමයි. ඒ අනුව, අතීත රාජ්‍ය පාලනය තුළ සේ ම නිදහස ලැබීමෙන් පසු වර්තමානය දක්වාම අගමැති, ජනාධිපතිවරු, ආණ්ඩු බලයට පත් කිරීම සඳහා ආගම ක්‍රියාකර ඇත. ඒ අනුව, ආගමික නායකයින් පිල් බෙදී කටයුතු කළ සිද්ධි ගණනාවක් වාර්තා වේ. මෙහි දී මෑතකාලීන සිදුවීම් වෙත අවධානයේ දී 2015 යහපාලන ආණ්ඩුව බලයට පත්කිරීම සඳහා ආගමික නායකයින්ගේ මැදිහත්වීම දැක්විය හැකි ය. ඒ අනුව, මෙහි දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති බලයට පත් කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ සුළු ජන කණ්ඩායම් පමණක් නො ව භික්ෂූන් වහන්සේලා ද කැප වී ක්‍රියාකරන ලදී. විශේෂයෙන්ම සෝභිත හිමියන් ප්‍රමුඛ සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය මෙන්ම පුරවැසි බලය

සංවිධානය මැදිහත් වී ක්‍රියාකළ අතර රාජපක්ෂ ආණ්ඩුවෙහි පැවති මර්දනකාරී පාලනය හෙළා දකිමින් සුළු ජාතීන් වෙනුවෙන් ප්‍රගතශීලී ප්‍රතිපත්තියක් ඇති කිරීමට සමස්ත දේශපාලන ප්‍රවාහය මෙහෙය වන ලද්දේ සෝභිත හිමියන් විසිනි (සන්නිවේදන සරසවිය, 2018).

එලෙසම පැවති ආණ්ඩුව බලයෙන් පහ කරමින් වර්තමාන ආණ්ඩුව බලයට පත්කිරීම සඳහා ද භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ කතෝලික, හින්දු පූජකයන් ක්‍රියාකරන ලදී. 2019 ජනාධිපතිවරණය තුළ ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත්වී ජනාධිපත් ධූරයේ දිවුරුම් දීමෙන් අනතුරුව ජාතිය අමතා සිදු කළ කතාවෙන්ම මේ බව පැහැදිලි වේ. ඒ අනුව, එතුමන් පවසන ලද්දේ "තමන්ට ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමේ සුවිශේෂීමය පිටුවහල වූයේ ශ්‍රී ලංකාවේ 'සිව්දිග වැඩසිටින ගරුතර මහා සංඝරත්නය තමන්ට ලබාදුන් ආශිර්වාදයයි... තම ජයග්‍රහණයේ ප්‍රධානතම සාධකය වන්නේ රටේ බහුතර සිංහල ජනතාව බව තමන් මුල සිට දැන සිටි බව නව ජනාධිපතිවරයා මෙහි දී කියා සිටියේය" (බීබීසී පුවත්, 2019). ඒ අනුව, ආගම සමාජ පාලනය කිරීමේ බලවේගයක් ලෙස ක්‍රියාකර ඇති බව මෙමඟින් වඩාත් පැහැදිලි ය.

නූතනය වනවිට ආගමික නායකයින් පාලකයින් සඳහා උපදේශන අනුශාසනා ලබාදෙන අතර ඔවුනගේ ඇතැම් ප්‍රකාශ සමාජ ආන්දෝලනාත්මක තත්ත්වයට තුඩු දීම සිදු වී තිබේ. නිදසුනක් ලෙස අස්ගිරි පාර්ශවයේ අනුනායක ධූරය දැරූ වෙඩරුවේ උපාලි අනුනාහිමියන් සිටි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධූරයට ඉදිරිපත් වීමට ආශිර්වාදය ලබාදෙමින් ප්‍රකාශ කරන ලද්දේ "ඔබතුමා හිට්ලර්වරයෙක් විදියටත් හඳුන්වල තියෙනවා. ඉතින් අපි මතක් කරනවා හිට්ලර් කොනක් වෙලා හරි මේ රට හදන්න කියන එක තමයි මහා සංඝ රත්නය අවසාන වශයෙන් මතක් කරන්නේ"(බීබීසී පුවත්, 2018). මීට විරෝධය පල කරමින් භික්ෂූන් වහන්සේලා ඇතුළු බොහෝ පාර්ශව කියා සිටියේ ශ්‍රී ලංකාවට මිලිටරි පාලනයක් කිසිසේත්ම නුසුදුසු බව ය. ඒ අනුව, මේ වනවිට ජනතාවගේ අවශ්‍යතාවය මත මිලිටරීකරණය නිර්මාණය වී ඇති බව චෝදනා එල්ල වීමෙන් පැහැදිලි වන්නේ ආගම සමාජ මතවාද ඇති කිරීමේ ගාමක බලවේගය ලෙස ක්‍රියා කරමින් සිටින බවයි.

දේශපාලකයින්ගේ පිටුපස සිට ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකරනු දැකිය හැකි ය. බලයට පත්කිරීමේ අල්ලස වශයෙන්

පාලකයින්ට නිරතුරුව ආගමික නායකයින්ගේ උපදේශනයන්ට කීකරු වීමට සිදු වේ. ජනාධිපතිවරුන් ආගමික ස්ථානවල සිය දිවුරුම් කටයුතු සිදුකිරීම මෙන් ම නිරතුරුවම උපදෙස් ලබා ගැනීමෙන් මේ බව වඩාත් පැහැදිලි ය. මෙයට තවත් නිදසුනක් ලෙස 2019 ජනාධිපතිවරණය තුළ ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත්වූ විගස පවසා සිටියේ බෞද්ධ දර්ශනය ආරක්ෂා කොට පෝෂණය කිරීමටත් සිංහල සංස්කෘතිය සහ උරුමයන් ආරක්ෂා කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබාදෙන බවට ප්‍රතිඥා දීමයි (බීබීසී පුවත්, 2019). මෙම ප්‍රකාශය තුළින්ම පැහැදිලි වන්නේ බලයට පත්වන රටේ ඉහළම පාලකයා පවා බෞද්ධ ආගමේ පාලනයට නිතැතින්ම නතු වී ඇති බවයි. එලෙසම අනෙකුත් ආගමික මූලධර්මයන්ට ද ඇහුන්කන් දීම පාලකයාගේ වගකීමක් බවට පත්වේ.

ඒ අනුව, නූතනය වනවිට දේශපාලන තීරණ කෙරෙහි ආගමික නායකයින් බලපෑම් කිරීම ඉහළ ගොස් තිබේ. මෙලෙස සිදුවන මැදිහත්වීම් ප්‍රගතිශීලී මෙන් ම ප්‍රගතිශීලී නොවන මැදිහත්වීම් බවට පත්විය හැකි ය. විශේෂයෙන් ශ්‍රී ලංකා ව්‍යවස්ථාව තුළ පනත් කෙටුම්පත් සැකසීමේ දී ආගමික නායකයින් දැඩි ලෙස බලපෑම් එල්ල කරනු දැකිය හැකි ය. නිදසුනක් ලෙස නූතන 20A ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයෙකුට පැවතිය හැකි තත්ත්වයක් ලෙස ද්විත්ව පුරවැසි බව ස්ථාපිත කිරීමට යාමේ දී භික්ෂූන් වහන්සේලා, හින්දු, කතෝලික ප්‍රජාවන්ගෙන් දැඩි විරෝධතා එල්ල වීම දැක්විය හැකි ය. මෙහි දී මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා ප්‍රකාශ කරන ලද්දේ " ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා පෙරමුණ ගත්තේ සංඝරත්නය බවත් සංඝරත්නයේ හඬට ඇහුන්කන් නොදී කටයුතු කරනවා නම් එය පරාජය කිරීමට ද සංඝරත්නය පියවර ගන්නා බව ය (සිරිලාල්, 2020). ඒ අනුව, මෙරට ව්‍යවස්ථා සංශෝධනය තුළ ද්විත්ව පුරවැසිබව ස්ථාපිත වුවද නව ව්‍යවස්ථාව යටතේ එය ඉවත් කිරීමට හෝ පොරොන්දු වූයේ ආගමික නායකයින් කළ කැපවීම හේතුවෙනි. මෙමඟින් ආගම රටේ අභිවෘද්ධිය සඳහා මැදිහත්වෙනු දැකිය හැකි ය. එනමුත් 2015 යහපාලන ආණ්ඩුව බලයට පත්කිරීමේ දී ඇතැම් ආගමික නායකයින් ඇතුළු කණ්ඩායම්වල මූලික ඉල්ලීම වූයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තුවට බලතල පැවරීමයි. මෙය රටේ පාලනයට අහිතකර ලෙස මැදිහත් වූ අවස්ථාවක් ලෙස දැක්විය හැකිය.

එලෙසම නූතනය වන විට ආගමික මූලධර්මයන්ට එරෙහිව යන පක්ෂ දේශපාලනඥය ක්‍රියාකලාපය හෙළා දකිනු දක්නට ලැබේ. නිදසුනක් ලෙස හිටපු පාර්ලිමේන්තු ඇමතිවරයෙකු වූ මංගල සමරවීර විසින් 'ලංකාව සිංහල බෞද්ධ රටක් නොවේ' යනුවෙන් කළ ප්‍රකාශය සමාජය තුළ දැඩි මතවාදයට තුඩු දුන් කරුණක් විය. ඇතැම් පාර්ශව මෙයට සහය දැක්වීම සිදුවිය. ඒ අනුව, උතුරු පළාත් හිටපු අමාත්‍යවරයෙකු වන සී. වී. විග්නේශ්වරන් ප්‍රකාශ කරන ලද්දේ ශ්‍රී ලංකාව බෞද්ධ රටක් ලෙස අර්ථ ගැන්විය නොහැකි බවත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා සිංහල ප්‍රජාවට පාලි බසින් ප්‍රබන්ධ කතා නිර්මාණය කර අර්ථ ගන්වා ඇති බවයි (හිරු පුවත්, 2019). මේ සඳහා අස්ගිරි මල්වතු පාර්ශවයේ භික්ෂූන් වහස්සේලා ඇතුළු සංඝයා වහන්සේලාගේ විරෝධය පල වූ අතර මෙහි දී ඉත්තෑපානේ ධම්මාලංකාර හිමියන් ප්‍රකාශ කළේ "කවුරුහරි කියනවා නම් මේ රටේ පය ගහපු මනුස්සයෙක් මේක සිංහල බෞද්ධ රටක් නොවේ කියලා, ඒ මනුස්සයා මන් හිතනවා මේ රටට ගැලපෙන පුද්ගලයෙක් නොවෙයි"යනුවෙනි (ශ්‍රී ලංකා ගාඩියන්, 2019). එලෙසම කතෝලික ප්‍රධානී මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් පවා කියා සිටියේ ලංකාව සිංහල බෞද්ධ රටක් බවත් එය ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කිරීම අගය කළ යුතු තත්ත්වයක් බවයි. මේ අනුව මෙම ප්‍රකාශයන් හකුළුවා ගැනීමට වූයේ ආගමේ බලය මැනවින් විදහා දක්වමිනි.

මෙලෙස ආගමික මූලධර්මවලට එරෙහිව යා නොහැකි බව පෙන්වන තවත් නිදසුනක් ලෙස මුස්ලිම් කොවිඩ් මෘතදේහ ආදාහනය භූමිදානය ගැටලුව දැක්විය හැකි ය. මෙරට සෞඛ්‍යය අමාත්‍යශයේ සහ රජයේ නිර්දේශය වූයේ කොවිඩ් මෘතදේහයන්ගෙන් වෛරස් පැතිරීම වැළැක්වීම සඳහා අනිවාර්යයෙන්ම ඒවා ආදාහනය කළ යුතු බවයි. එනමුත් ඉස්ලාම් ආගමික මූලධර්ම අනුව මියගිය පුද්ගලයන් අනිවාර්ය භූමිදානය කළ යුතු අතර එසේ නොකිරීම ස්වර්ගයට යෑමට බාධාවකි. මෙම තත්ත්වය හේතුවෙන් සමාජය තුළ ඉස්ලාම් ආගමික විරෝධතා දැඩි ලෙස මතු වූ අතර මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ මුස්ලිම් මෘතදේහයන් මන්නාරම ඔඩ්ඩමාඩාවි ප්‍රදේශයේ භූමිදානයට අවසර දීමයි (බීබීසී පුවත්, 2021).

මීට අමතරව ආගමේ දේශපාලන මුහුණුවර පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ආගමික නායකයන් දේශපාලන අරමුණු, පක්ෂ අරමුණු ඉටු කර ගැනීම සඳහා රැඩිකල් ලෙස ක්‍රියාකිරීම නූතන ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැකි ය. මෙහි දී ඔවුන් භාවිත කරන ප්‍රධාන

උපායමාර්ග ලෙස උද්ඝෝෂණ ව්‍යාපාර, වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරතවීම, උපවාස කිරීම දැක්විය හැකි ය. උද්ඝෝෂණ ව්‍යාපාරවල නිරතවීම පිළිබඳ අවධානයේ දී සෑම උද්ඝෝෂණ ව්‍යාපාරයක ආගමික නායකයින් පෙරමුණේ තැබීම සාමාන්‍ය සිරිත බවට පත්වී තිබේ. ඒ අනුව, භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛව සෙසු ඉස්ලාම්, කතෝලික, හින්දු පූජකයන් ඉල්ලීම් දිනා ගැනීම සඳහා කලහකාරී ලෙස හැසිරුණු අවස්ථා බොහෝ ය. එලෙසම භික්ෂූන් වහන්සේලා වෘත්තීය සමිති හා ඒකාබද්ධව වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරත වන අතර මෑතකාලීන සිදුවීම් සලකා බැලීමේ දී වැටුප් විෂමතා මුල් කර ගනිමින් වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරත භික්ෂූන් රැසකි. එහි දී සමස්ත ලංකා එක්සත් ගුරු සංගමයේ ලේකම් ලෙස යල්වෙල පඤ්ඤාසාර හිමියන් කටයුතු කිරීම දැක්විය හැකි ය (ජයරත්න, 2021). එලෙසම හෙද සංගමයේ සභාපති වශයෙන් කටයුතු කරන මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් ද නූතනය වන විට දැඩි විවේචනයට භාජනය වී තිබෙනු දැකිය හැකි ය.

එලෙසම උපවාස සත්‍යග්‍රහ ව්‍යාපාරවල නිරතවීම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මාළඹේ සයිටම් විශ්වවිද්‍යාල වෛද්‍ය උපාධි තහනම උදෙසා, බෞද්ධ දර්ශන විෂය උසස් අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමට එරෙහිව සේ ම දේශපාලන බලය යටපත් කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා විසින් විවිධ අවස්ථාවල උපවාසයන්හි නිරතවීම දැකගත හැකි ය. නිදසුනක් ලෙස 2019දී අතුරලියේ රතන හිමියන් විසින් ඉස්ලාම් අන්තවාදය පැතිරවීම, රට විනාශ කිරීමට උත්සාහ දරනවා යැයි චෝදනාව මත අසාද් සාලි, එම්. එල්. එම්. හිස්බුල්ලා ආණ්ඩුකරු, රිෂාඩ් බදූජීන් ඇමතිවරයා ඇතුළු මුස්ලිම් මන්ත්‍රීවරුනිට තනතුරුවලින් ඉල්ලා අස්වන ලෙස බලකරමින් දින ගණනාවත් දළදා මාළිගය ඉදිරිපිට සිදු කළ උද්ඝෝෂණයේ ප්‍රතිඵලය වූයේ ඔවුනට සිය තනතුරවලින් ඉල්ලා අස්වීමට සිදුවීමයි (Newsfirst, 2019). මෙලෙස ආගමික නායකයින් කලහකාරී හැසිරීම වත්මන විට විවේචනයට භාජනය වී ඇති අතර ඇතැම් භික්ෂූන් වහන්සේලා, කතෝලික, හිනදු පූජක මතය වූයේ ආගමික නායකයින් සඳහා දේශපාලනය නුසුදුසු බවත් ආගම පැවතිය යුත්තේ දේශපාලනයට ඉහළින් සිට උපදෙස් ලබාදීමේ තත්තවයක බවයි. මෙයට පක්ෂව අදහස් ඉදිරිපත් කරන බෞද්ධ දර්ශනය පිළිබඳ මහාචාර්ය අසංග තිලකරත්න පවසා සිටින්නේ " පෙරහැර දිහා බලා ඉදලා උපදෙස් දෙන්න පුළුවන්. නමුත් පෙරහැරේ යන්න පටන්

ගත්තම තමන්ට පෙරහැර පෙනෙන්නේ නැහැනේ. එතකොට එයත් පෙරහැරේ යන අනිත් අයගෙන් එක්කෙනෙක් විතරයි" (රතුවිතාන, 2019). ඒ අනුව, මෙලෙස කතිකාවත ගොඩනැගූ ද තවමත් දේශපාලනය තුළ මතධාරී ලෙස ක්‍රියාකරන ආගමික නායකයින් සමාජ පාලනයට සම්බන්ධ වී සිටිනු දැකිය හැකි ය.

එපමණක් නොව ආගම සමාජ පාලනයට මැදිහත් වන තවත් ක්‍රමයක් ලෙස නූතනය වන විට ආගමේ නාමයෙන් අන්තවාදී කණ්ඩායම් බිහිවීම ජාතීන් අතර ගැටලු ඇති කිරීමට හේතු වීම දැක්විය හැකි ය. එහි දී පවතින ආගමික මූලධර්ම විකෘති කරමින් දේශපාලන අන්තවාදී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම සංවිධාන ක්‍රියාකරනු දැකිය හැකි ය. ඒ අනුව, බෞද්ධ සිංහල තත්ත්වය පදනම් කර ගනිමින් බිහි වූ දේශපාලන සංවිධාන ලෙස බොදු බල සේනා සංවිධානය, සිංහලේ, මහසෝන් බලකාය, රාවණා බලය වැනි සංවිධාන එදා මෙදාතුර දේශපාලන තීරණ කෙරෙහි බලපෑම් කර ඇත. මෙහි දී සිංහල ප්‍රජාව සඳහා ප්‍රගතිශීලී තීරණ ගැනීමට දායක වීම පමණක් නොව එයින් ඔබ්බට ගොස් සිංහල තරුණ තරුණියනගේ ලේ නහරයන් තුළට සිංහල ජාතිවාදය කාවැද්දීම සඳහා රැඩිකල් ලෙස කටයුතු කළ සංවිධානයන් ලෙස දැඩි මතවාදයට ලක්විය. එහි දී බොදුබල සේනා සංවිධානයේ ප්‍රධාන සංවිධායක ලෙස ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් ඇතුළු කණ්ඩායම් මතදාරී ක්‍රියාකරුවන් ලෙස සිරගත වූ අවස්ථා ද බහුල ය.

ආගම පදනම් කරගත් ජාතිවාදී අරගල පිළිබඳ විමසීමේ දී ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ බොහෝ ගැටුම් පිටුපස ආගමික මූලධර්ම පැවත තිබේ. ඒ අනුව, 1915දී සිංහල මුස්ලිම් කෝලාහලය තුළ පමණක් නොව ඉන් අනතුරු මෙරට තිස් වසරක් පුරුවට පැවති උතුරු නැගෙනහිර යුද්ධයේ දී ඊලාම් රාජ්‍යයක් ගොඩනැගීමේ අරමුණින් එල් ටී ටී ඊ කොටි සංවිධානය මඟින් සිදු කළ සිංහල බෞද්ධ ජනයා භික්ෂූන් මරා දැමීම සහ මුස්ලිම් පල්ලිවලට පහරදීමේ තත්ත්වය පමණක් නොව නූතනය වන විට මෙය බහුලව වාර්තා වේ. ඒ අනුව, නූතනය වන වි ආගම පදනම් කරගනිමින් ජනවර්ගයන් අතර ගැටුම් විමසීමේ දී 2014 අලුත්ගම බේරුවල සිංහල මුස්ලිම් ගැටුම, 2018 පෙබරවාරි 26 දින මුස්ලිම් ව්‍යාපාරියෙකුගේ ආපනශාලාවක ආහාරවලට වඳපෙති දමන බවට පැතිරීමෙන් ඇති වූ අම්පාර සිංහල මුස්ලිම් ගැටුම පමණක් නොව දිගන සහ තෙල්දෙණිය සිංහල මුස්ලිම් ගැටුම් ජාති භේද ඇති කිරීමට හේතු

විය. (බීබීසී පුවත්, 2018). ඒ අනුව, මෙහි දී තෙල්දෙණිය සිදුවීම තුළ මුස්ලිම් පල්ලි 17කට පහරදීමේ චෝදනාව සිංහල බෞද්ධ ප්‍රජාවට හිමි වූ අතර මේ සිද්ධිය සම්බන්ධයෙන් බාහිර පාර්ශවකරුවන්ගේ මතය වුයේ මේ සඳහා සිංහල බෞද්ධ ප්‍රජාවට චෝදනා නැගිය නොහැකි බවත් මෙම ගැටුම් පිටුපස බෞද්ධ අන්තවාදී පිරිස් පමණක් නොව ඉස්ලාම් මූලධර්මවාදය පදනම් කරගත් මුස්ලිම් අන්තවාදී පිරිස් ද සිටින බවයි. මෙහි ඵලය වූයේ මාවනැල්ල බුදු පිළිම කැඩීමේ සිද්ධිය මෙන්ම බිහිසුණු විනාශයක් ඇති කරමින් 2019 අප්‍රේල් 21 පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය වැනි සිද්ධීන් සිදු වීමයි. ඒ අනුව, මෙම ත්‍රස්ත ප්‍රහාරය ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ත්‍රස්තවාදය පැතිරීම තුළ ඉස්ලාම් රාජ්‍යයක් ගොඩනැඟීමේ අරමුණින් ආගම් පදනම් කරගත් බිහිසුණු බෝම්බ ප්‍රහාරයකි. එහි දී දේවස්ථාන කිහිපයක, හෝටල් සංකීර්ණ කිහිපයක සහ ලැගුම්හලක සිදු වූ පිපිරීම් හේතුවෙන් විශාල ගණන් ජීවිත අහිමි විය. මෙම ප්‍රහාරය අභ්‍යන්තරය විමසීමේ දී ද වහබ්වාදය පදනම් කරගත් අන්තවාදී ඉස්ලාම් කණ්ඩායමක් වන තවුහිත් ජමාත් සංවිධානය අයි එස් අයි එස් ත්‍රස්ත ක්‍රියා මූලික කර ගනිමින් මෙය සිදු කළ ක්‍රියාවක් බව හෙළි වී තිබේ (ගජනායක, 2021). ඒ අනුව, මෙවැනි විනාශකාරී ගැටුම් ප්‍රජාව තුළ ජාතිවාදය, වර්ගවාදය ඇති වීමට හේතු වී තිබෙන අතර මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ මෙම අන්තවාදී සංවිධාන තහනමට ලක්වීමයි.

ඒ අනුව, මෙම ගැටලුව අවම කිරීමේලා ආගමික මැදිහත්වීම දැකිය හැකි අතර විශේෂයෙන් ම මෙම පරිසරය තුළ සිංහල, කතෝලික, හින්දු ප්‍රජාව තුළ ඇති වූ ඉස්ලාම් විරෝධී දැක්ම තුළ ඇති වූ ගැටුම සමනයට මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරුතුමන් මූලිකත්වය ගෙන කටයුතු කළ අයුරු දැකිය හැකි ය. එතුමන් පවසන ලද්දේ "මරණ රාශියක් සිදුව ඇතත් සන්සුනව ක්‍රියාකරන ලෙස මම මහජනයාගෙන් ඉල්ලා සිටිනවා. බෞද්ධයන්ට හින්දුන්ට සහ මුස්ලිම් ආගමික නායකයන්ට ස්තුතියි කිරීම සඳහා මම මෙය අවස්ථාවක් කරගන්නවා යනුවෙනි...."(ගජනායක, 2021). මෙමඟින් රට තුළ උද්ගත වීමට තිබූ ගැටලු රාශියක් අවම කරගත හැකි විය. මේ අනුව, පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා සමාජය තුළ ගැටුම් ඇති කිරීමේ මෙන්ම ඒවා යටපත් කිරීමේ බලවේගය ලෙස ආගම ක්‍රියාකරන බවයි.

මීට වෙනස්ව ඉන්දියානු සමාජයේ ආගම දේශපාලන මුහුණුවරින් සමාජය පාලනයට නතු කරගෙන ඇති ආකාරය විමසීමේ දී බහු ආගමික රටක් ලෙස ඉන්දියාව තුළ හින්දු ආගමට

මූලිකත්වය දී කටයුතු කිරීම නූතනය වන විට දැඩි විවේචනයට ලක්වූවක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව, ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හින්දු ආගමට ගැතිව පවතින බව කාලාන්තරයක් තිස්සේ සමාජය තුළ උද්ගත වී ඇති මතවාදී කරුණකි. ඒ අනුව, ඔක්ස්ෆර්ඩ් බ්‍රැක් විශ්වවිද්‍යාලයේ ආචාර්ය ප්‍රීතම් සිං විසින් සිය Hindu Bias in India's secular Costitution: Probing Flaws in the Instruments of Governance යන ලිපියෙහි සඳහන් කරන්නේ ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1වන වගන්තියේ සඳහන් 'භාරත්' යන වචනයේ ම හින්දුත්වය ගැබ් වී ඇති බවයි. එලෙසම තවත් විවේචනයක් වනුයේ හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණ සම්බන්ධව ව්‍යවස්ථාව පක්ෂග්‍රාහී ලෙස ලියා ඇති බවයි. එලෙසම 48 වගන්තිය මඟින් ගවයන් සහ පැටවුන් මැරීම තහනම් කර දැක්වීම සහ නිල භාෂාව හින්දි භාෂාව ලෙස ද 343, 351 වගන්ති තුළින් හින්දි භාෂාව ව්‍යාප්ත කිරීමට අදාළව කරුණු දැක්වීම් විවේචනයට ලක්වේ (Siddiqi,2020). මෙලෙස ආගමට අදාළ කරුණු රටක ඉහළම ලියවිල්ලට ඇතුළත් කිරීම තුළ සමාජ පාලනය නිතැතින්ම සිදු වේ.

එලෙසම ඉන්දියාවේ ප්‍රාන්ත අතර හින්දු බලය ව්‍යාප්ත කිරීමට උත්සාහ දැරීම ද නිරතුරුව දක්නට ලැබේ. එලෙසම ඉන්දියාව තුළ ද ශ්‍රී ලංකාව තුළ සේ ම ආගම පදනම් කරගත් දැඩි පක්ෂ ක්‍රමයක් දැකගත හැකි අතර ඒ අනුව, හින්දු ආගම පදනම් කරගත් භාරතීය ජනතා පක්ෂය, සිව්සේනා පක්ෂය පමණක් නොව ඉස්ලාම් ආගම පදනම් කරගත් පක්ෂ රාශියක් ද ඉන්දියාව තුළ ප්‍රාන්ත දක්නට ලැබේ. ඒ අනුව, මෙම හින්දු මතදාරී බොහෝ පක්ෂ ඉස්ලාම් විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට චෝදනා එල්ල වන අතර මෙහි දී සිව් සේනා පක්ෂය ඉන්දියාවේ මරාතී සහ හින්දු ජාතිකවාදය වෙනුවෙන් ඉස්ලාම් ආගමික විරෝධී ක්‍රියවල නිරත වන බව සඳහන් වේ. එපමණක් නොව ඉන්දීය භාරතීය ජනතා පක්ෂය හින්දුන්ගේ ශක්තිය විදහාපාන ප්‍රධාන බලවේගය බවට පත්ව ඇත. ඒ අනුව ඉන්දියාව හින්දු රාජ්‍යයක් බවත් ඉන්දියානු සමාජය හින්දු බහුතර සමාජයක් බවත් පාලක පක්ෂය ද ඒ අනුව ක්‍රියාකරන බව මතය වී තිබේ. නූතන බලයේ සිටින මෙම පක්ෂය ඉස්ලාම් ආගමිකයන් සේ ම සෙසු ආගමික ලබ්ධිකයන් නොසලකා හැර කටයුතු කරන බවට චෝදනා එල්ල වෙමින් පවතී.

මෙයට නිදසුනක් ලෙස අයෝධ්‍යායාවේ 'බාබ්රි' නම් මුස්ලිම් පල්ලිය විනාශ කිරීමේ සිදුවීම දැක්විය හැකි ය. එහි දී හින්දු විශ්වාසය වනුයේ මෙම මුස්ලිම් පල්ලිය පිහිටා තිබුණේ හින්දු පුදබිමක බවයි. ඒ අනුව මෙම මුස්ලිම් පල්ලිය විනාශ කිරීමට ප්‍රහාරකයන් පෙළඹවීමේ චෝදනාව හිමිවූයේ භාරතීය ජනතා පක්ෂයට ය. එල්. කේ. අද්වානී, එච්. එම් ජෝෂි, උමා භාරතී එලෙස චෝදනාවන් ලැබූ අතර වත්මන වන විට ඔවුන් චෝදනාවෙන් නිදහස්භාවය ලබා සිටින්නේ හින්දු ආගමික බලය විදහා පාමිනි (බීබීසී පුවත්, 2020). මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වී ඇත්තේ 2014දී  භාරතීය ජනතා පක්ෂය තුළ නරේන්ද්‍ර මෝදි  අගමැති බලයට පත්වීම සමඟ ය. ඔහු විසින් අයෝධ්‍යාවේ හින්දු දේවස්ථානයක් ඉදිකිරීමට මුල්ගල තැබීමෙන් මෙම පක්ෂය ඉස්ලාම් විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට සනාථ කරන බව විදිවත් මතයයි. එලෙසම හින්දු ප්‍රජනීය සත්ත්වයා වන ගවයා මරා දැමීම සහ මස් වෙළඳාම තහනම් කිරීම් හේතුවෙන් ද ඊට එරෙහිව යන ප්‍රජාව මරා දැමීමට පවා ලක්වන අතර ඉන් බහුතරය මුස්ලිම් ප්‍රජාව බවට තහවුරුව පවතී (බීබීසී පුවත්, 2020). ඒ අනුව, නිරතුරුවම සිදුවන්නා වූ හින්දු මුස්ලිම් ගැටුම් පමණක් නොව අනෙකුත් ආගමික ලබ්ධිකයන් අතර ඇතිවන ගැටුම් සමාජය තුළ ජාතිවාදී අරගල නිර්මාණය කරමින් ජීවිත සහ දේපළ විනාශ කිරීමට බලපා තිබේ.

එලෙසම කාලාන්තරයක් තිස්සේ පවතින ඉන්දු කාශ්මීර ගැටුම් පිළිබඳ අවධානයේ දී ද ආගම ගැබ් වී පවතින අවස්ථාවන් හඳුනාගත හැකි ය. ඒ අනුව, ඉන්දු කාශ්මීර ගැටුම ජනතාව අතර 60% පමණ මුස්ලිම් ප්‍රජාව වන බවත් ඔවුන් භාරතීය ජනතා පක්ෂයේ හින්දූන්ට ගැතිව ක්‍රියාකිරීම හෙළා දකින බව වාර්තා වේ. එනමුත් එම ප්‍රදේශයේ හින්දු ප්‍රජාව ඉන්දියාවට පක්ෂව ක්‍රියාකිරීමත් නිසා ජාතිවාදී බෙදුම්වාදී තත්ත්වයක් මෙතුළ උද්ගත වී ඇති බව පැවසේ (බීබීසී පුවත්, 2019). තවද 'නව ඉන්දීය පුරවැසි සංශෝධන පනත' පිළිබඳ අවධානයේ දී ද ආගම පදනම් කරගනිමින් අර්බුදකාරී තත්ත්ව උද්ගත වී තිබෙනු හඳුනා ගත හැකි ය. මෙම පනත පිළිබඳ අවධානය යොමු කිරීමේ දී කලාපයේ මුස්ලිම් රටවල් තුනෙන් පැමිණෙන මුස්ලිම් නොවන ජනතාවට ඉන්දීය පුරවැසි බවට පත්වීමට මෙමඟින් අවකාශ සලසා ඇති අතර මෙමඟින් මුස්ලිම් ජනතාවට පීඩනය ඇති කිරීම සිදුවන බව විවේචනය වී තිබේ. එමඟින් ඉන්දීය ව්‍යවස්ථාවේ අනාගාමික තත්ත්වය ද උල්ලංඝනය වන බව තර්කය විය. නමුත්

භාරතීය ජනතා පක්ෂයෙන් යුතු ආණ්ඩුවේ අදහස වී ඇත්තේ ආගමික හේතූන් මත පීඩාවට පත් ජනතාවට සහන සැලසීම මෙමඟින් අරමුණු වන බැවින් මෙවැනි තත්ත්වයක් සිදු නොවන බවයි. කෙසේ වෙතත් මෙම ඉන්දීය පුරවැසි පනත ආගමේ නාමයෙන් ගැටලු රැසක් ඇති කිරීමට හේතු පාදක වී තිබේ (බීබීසී පුවත්, 2019). එලෙසම ඉන්දියාව තුළ ආගම බලෙන් වෙනස් කිරීමේ තත්ත්වයන් ද ඇති වී තිබෙන්නේ එහි මර්දනකාරී තත්ත්වය හෙළිරව් කරමිනි. මෙයට නිදසුනක් ලෙස දක්ෂිණාංශ හින්දු ආගමික කණ්ඩායම් ක්‍රිස්තියානි සහ ඉස්ලාම් භක්තික ප්‍රජාවන් බලහත්කාරයෙන් ආගමට හරවාගැනීමට උත්සව තැබීම සම්බන්ධව ඉන්දීය පාර්ලිමේන්තු තුළ පවා විවාදකාරී තත්ත්ව ඇති වී තිබේ (බීබීසී, 2014). මේ අනුව විමසා බැලීමේ දී ඉන්දියානු සමාජය තුළ ආගම දේශපාලන මුහුණුවරින් රට තුළ දැඩි අර්බුදකාරී වාතාවරණයක් ඇති කර තිබෙනු හඳුනා ගත හැකි ය. මේ අනුව, විමසා බැලීමේ දී ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන්දීය සමාජය තුළ ආගම දේශපාලන මුහුණුවරින් පාලනයට දායක වීම තුළ සමාජ ඒකාබද්ධතාවයට සාපේක්ෂව සමාජය තුළ අසමතුලිතතාවයට හේතු වී තිබේ.

## 7. නිගමන සහ යෝජනා

සමාජ සහ මානව විද්‍යාත්මක අධ්‍යයනයන් තුළ පෙන්වා දී ඇති පරිදි ආගම සමාජයට ඉහළින් සිට සමාජය පාලනය කරනු ලබන බව සත්‍යයකි. එනමුත් විවිධ සන්දර්භය මත ආගමේ මැදිහත් වීම විවිධත්වයක් උසුලයි. ඒ අනුව, ශ්‍රී ලංකා සහ ඉන්දියානු සන්දර්භය තුළ ව්‍යාප්ත වී ඇති බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආගම්හි මූලික ඉගැන්වීම් විමසීමේ දී සෑම ආගමක් ම යහපත් ජීවිතයකට මඟ පෙන්වීමක් ලබා දී තිබේ. මෙහි දී ආගම කෙරෙහි පවතින ගෞරවය, බිය හේතුවෙන් ආගම මඟින් පුද්ගලයා ස්වයං පාලනයකට නතු වන අතර ඒවා ජීවිතයේ සෑම අවස්ථාවක දී ම සම්බන්ධ වී තිබේ. ඒ අනුව, අතීතයේ ආගම සමාජ පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාකිරීමේ දී සමාජය තුළ ඒකාබද්ධතාව ඇති කරන්නෙක් ලෙස ආගම ක්‍රියාකර ඇති අතර ආගමට ඉතා ගැතිව ක්‍රියාකරන අනුගාමිකයන් පිරිසක් ද එහි දී හඳුනාගත හැකි ය. එලෙසම මෙකල ආගමික නායකයින් ඉදිරියට පැමිණෙමින් රාජ්‍ය පාලනය සඳහා උපදේශන මඟින් මඟ පෙන්වීමක් ලබා දී ඇති අතර ආගම්

එකිනෙකා පරයා නැඟී සිටිමින් සමාජ ක්‍රමය නිර්මාණයට දැඩි පරිශ්‍රමයක් දරා තිබේ.

එනමුත් නූතනය වන විට ද ජීවිතයේ සෑම අවස්ථාවක දීම ආගම මැදිහත් වීම සිදු කළ ද ආගම තුළ පවතින මෙම කෘත්‍යාත්මක වෙනස හේතුවෙන් සංස්කෘතික මුහුණුවරින් මෙන් ම දේශපාලන මුහුණුවරකින් සමාජ පාලනයට මැදිහත් වෙමින් සිටී. විශේෂයෙන් නවීකරණය, ගෝලීයකරණය වැනි තත්ත්වයන්ට නතුවීම තුළ ආගමේ ව්‍යූහයන් මෙන් ම පෙර පැවති අරමුණු වෙනස් වී තිබේ. එහි දී ජනප්‍රිය බුදුදහම සමාජ ස්ථරායනය ගොඩනඟන සාධකයක් බවට පත්ව ඇති අතර අන්තයට ගොස් පිළිවෙත් සිදු කරන හින්දු ආගම ප්‍රමුඛ කරගත් පූජා විධි ශාරීරික පීඩා මෙන් ම මරණයට ද හේතුවීම කනගාටුවට කරුණකි. එලෙසම ආගමේ පවතින ඇතැම් වත්පිළිවෙත් හේතුවෙන් කාන්තාව පීඩාවට ලක්වන අතර නීතියෙන් පවා එම වෙනස්කොට සැලකීම් පාලනය කළ නොහැකි වී ඇත්තේ ආගමේ බලවත් බව පෙන්වා දෙමිනි. එලෙසම ආගම සෞඛ්‍යය තත්ත්වය කෙරෙහි ද හේතු වී ඇති අතර විවිධ ආගම්වල වෙනස් අයුරින් අර්ථකථනය කරමින් ආහාර රටාව සම්බන්ධව පැවතිය යුතු තත්ත්වයන් සමාජ අර්බුදයන්ට ද හේතු වී තිබේ. එලෙසම නූතනය වන විට ආගමේ තවත් බලපෑමක් ලෙස කොවිඩ් වසංගත තත්ත්වය තුළ උවදුරෙන් බේරීම සඳහා ආගමේ පිහිට පැතුව ද සෞඛ්‍ය මාර්ගෝපදේශ නොසලකා සිදු කරන පිළිවෙත් රෝග ව්‍යාප්තිය වර්ධනයට හේතු වී තිබේ.

මිට සාපේක්ෂව ආගම දේශපාලන මුහුණුවර තුළ ආගමික නායකයින් බාහිර උපදේශකයන් සහ බලපෑම්කරුවන් ලෙස ක්‍රියාකිරීමට අමතරව විශේෂයෙන් බෞද්ධ භික්ෂූන් සෘජුවම දේශපාලනයට පිවිස සමාජය තුළ ජන මතය ගොඩනැඟීමේලා කටයුතු තරන අතර රටට යහපත සලසන ප්‍රතිපත්ති සඳහා සහය වීම යහපත් වන නමුත් පක්ෂ දේශපාන අරමුණු මත රැඩිකල් ලෙස අපේක්ෂා ඉටුකරගැනීම උත්සාහ දැරීම විවේචනයට ලක්වූවකි. එලෙසම ඉන්දියාව තුළ ද හින්දු ආගම ප්‍රමුඛ කරගනිමින් සිදුවන පාලනය හෙළා දැකීම ආරම්භ වී තිබීම විශේෂ තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි ය. මෙම සියලු තත්ත්වයන්ගේ වර්තමාන ප්‍රවණතාවය වී ඇත්තේ ආගමික අන්තවාදය පදනම් කරගත් ආගමික ගැටුම් සමාජය තුළ නිර්මාණය වීමයි. මෙම තත්ත්වය තුළ ඇති වී තිබෙන විනාශය රටේ අස්ථාවරත්වයට හේතු වී තිබෙන අතර ජාතීන්

අතර අසමඟිය වර්ධනයට බලපා තිබේ. මෙහි ප්‍රතිඵලය ලෙස පාලන කටුයතු නිසි පරිදි පවත්වා ගත නොහැකි වී ඇති අතර ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන්දියාව තුළ ද සංවර්ධනයට බාධා පමුණුවන්නා ලෙස මෙම ආගම ක්‍රියාකරනු හඳුනාගත හැකි ය. ඒ අනුව, ආගම සමාජය ඒකාබද්ධ කරන්නා සේ ම විනාශය පමුණුවන්නා බවට පත්ව තිබේ. ඒ අනුව, මෙම තත්ත්වය තුළ යහපත් සමාජයක් ගොඩනැඟිය හැක්කේ ද ආගම තුළින් ම බව මෙමඟින් පැහැදිලි ය.

මේ අනුව, රටේ ප්‍රගතිය ළඟා කරගැනීම සඳහා ආගම සංස්ථාව තුළ විධිමත්භාවයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. මේ සඳහා ප්‍රමුඛ වගකීම ආගමික නායකයින්ට හිමි වේ. පළමුකොට තමා තුළ ස්වයං පාලනයක් ඇති තර ගත යුතු සේ ම සිය ගෞරවය රැක ගැනීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය වේ. පෞද්ගලික අරමුණු වෙනුවෙන් කටයුතු නොකර බුද්ධියෙන් තීරණ ගෙන කටයුතු කිරීම අවශ්‍ය වේ. ආගමේ සමාජමය කාර්යය අවබෝධ කරගනිමින් සමාජය ධනාත්මක මෙහෙවීමක් කරා යොමු කිරීම වගකීමකි. ආගමික මූලධර්මයන් විකෘති නොකොට සිය අනුගාමිකයන් සඳහා යහපත් මඟපෙන්වීමක් ඇති කිරීම අවශ්‍ය වන අතර පාක්ෂික හෝ අන්තවාදී නොවී මැදිහත් බවින් යුතු සමාජයේ ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් විසඳුම් සඳහා යොමු කිරීම අවශ්‍ය වේ. එලෙසම සියලු ආගම් තුළ පවතින විරෝධී මූලධර්ම ඉවත් කළ යුතු අතර පාරිශුද්ධ ධර්මය පැතිරවීමට උත්සාහ දැරිය යුතු ය.

එලෙසම සමාජය දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම සිදු කළ යුතු අතර එය ආරම්භ කිරීම සිදු කළ යුතු වනුයේ පාසල් සහ ආගමික ස්ථාන තුළිනි. විශේෂයෙන් තරුණ තරුණියන් ජනවර්ගය මත අන්තවාදීව පෙළගැසීම වෙනුවට එකම රටක ජාතියක් වශයෙන් සිතීමට යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. රටක රජයක් වශයෙන් ආගමික සංහිඳියාව ජාතීන් අතර එකමුතු බව ඇති කිරීමට කටයුතු කළ යුතු අතර ආගමික නිදහස තහවුරු කරමින් ජාතියක් ලෙස නැඟී සිටීමට දිරිමත් කළ යුතු වේ. එලෙසම සෑම ආගමකටම සමකොට සැලකීම පමණක් නොව සියලු ආගම්වල අභිවෘද්ධිය සඳහා එක ලෙස කටයුතු කිරීම අවශ්‍ය වේ. එලෙසම නීති පැනවීමේ දී වගේ ම නීති ක්‍රියාත්මක කිරීමේ දී ද සමානාත්මතාවය අගය කළ යුතු ය. එලෙසම මෙම කර්තව්‍ය තුළ ජනමාධ්‍ය වෙත ද සුවිශේෂී වගකීමක් පවතින අතර ආගමික බෙදුම්වාදයට ඉඩ නොතබමින් එකමුතුබව ඇති කිරීමේලා ප්‍රජාව මෙහෙයවීම අවශ්‍ය වේ. එසේම අවසාන වශයෙන් මෙය

සමස්ත ප්‍රජාවටම පවතින වගකීමකි. එනම්, ආගමෙන් සිදුවන සමාජ පාලනය යහපත් වන්නේ ද අයහපතට හේතු වන්නේ ද යන්න තීරණය වනුයේ සමාජය විසින් ආගම භාවිතයට ගන්නා ආකරය අනුව ය. මේ අනුව, ආගම සමාජ අභිවෘද්ධිය කරා මෙහෙය වන මෙවලමක් බවට පත්කර ගත හැක්කේ අගතිගාමීත්වයෙන් තොරව තාර්කික ලෙස කටයුතු කිරීමෙනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරාල, ටී. (2016). ආගම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?. http://thulana-re-ce.blogspot .com/ 2016/11/ blog-post_10.html?m=1.

අමරසිංහ, එම්. (2021 අප්‍රේල් 28). නිරෝධායන නීති කැඩූ කෝවිලේ සභාපති හා ලේකම් අත්අඩංගුවට. ***අද***. http//www.ada.lk/breaking-news/නිරෝධායන-නීති-කැඩූ-කෝවිලේ-සභාපති-හා-ලේකම්-අත්අඩංගුවට-11-377755.

***අල්-අහ්කල් ඉස්ලාමියියා***. (2015). මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය. http://muslim affairs .gov.lk> Dowload-17.pdf.

ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය. (වර්ෂය සඳහන් නොවේ). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. http://www.e-thaksalawa.moe.gov.lk>sg9-his-chap4.pdf.

***ඉස්ලාම් ධර්මය 9 ශ්‍රේණිය***. (වර්ෂය සඳහන් නොවේ). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. https:// www .e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=144&lang+si.

***කතෝලික ධර්මය 10 ශ්‍රේණිය***. (2020). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. https://www/e-thaksalawa.moe.gov.lk/moodle/mod/resource/view/php/?id=5958.

කුමාර, එන්. වී. පී. ඒ. එච්. (2002). ***සමාජවිද්‍යාව: මූලික සංකල්ප, න්‍යාය සහ ක්‍රමවේදය***. මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

කොංග්‍රස් පුස්තකාලය. (දිනය සඳහන් නොවේ). හින්දු චාරිත්‍ර හා වාරිත්‍ර. https://si.eferrit.com/හින්දු-චාරිත්‍ර-හා/.

ගජනායක, යූ. (2021 අප්‍රේල් 22). පාස්කු ප්‍රහාරය සහ මුස්ලිවරු ජාතිවාදය සහ වෙනත් ජාතිවාදයක් පෝෂණය කිරීම ගැන පාඩමක්. ***බීබීසී පුවත්***. https://www-bbc-com.cdn.ampproject.org/v/s/www,bbc.com/sinhala/world-56800893.amp?=https%3A%2F%2F.

ජයරත්න, එස්. (2021 අගෝස්තු 7). ගුරු විදුහල්පති නොනිවෙන ගින්න. ***සිළුමිණ***. http://www/silumina /lk/2021/08/07/විශේෂාංග/ගුරු-විදුහල්පති-නොනිවෙන-ගින්න.

ද සිල්වා, ටී. එච්. ඊ. (දිනය සඳහන් නොවේ). වෙලාවට කලින් එස වූ ඉංග්‍රීසි කොඩිය බිම දැමූ වාරියපොළ හාමුදුරුවෝ. ***ලංකාදීප***. https://www.lankadeepa.lk/Rasawitha/වලාවට-කලන/එසව-ඉගසර-කඩය-බම-වරයපළ-හමදරව/57-566759.

ද සිල්වා, පී. එස්. (2021 ජූලි 19). අක්බාර් උත්තර භාරතය පුරා තම අණසක පතුරුවයි. ***ලංකාදීප***. https://www.lankadeepa.lk/Rasawitha/%E0%B6%85%EO%B6 %B6%EO%B6%BB%EO%B6%8B%EO%B6%BA/57-527950.

ධම්මින්ද, එස්. (2015 අගෝස්තු 7). රාජ්‍ය පාලන මූලධර්ම. ***බුදුසරණ***.. http://www.budusarana.lk/budu sarana /2015/08/07/tmp.asp?ID=vision05.

ධම්මින්ද, එස්. (2015 දෙසැම්බර් 3). ආර්ථික කළමනාකරණය හා සදාචාරය. ***බුදුසරණ***.. https://www. budusarana.lk/budusarana/2015/12/03/ tmp.asp?ID=feao 5.

නාපාවල, කේ. එම්. (2009). ඉස්ලාම් උෟරුමස් අනුභවය තහනම් කර ඇත්තේ ඇයි?. යායුතුමඟ. http://yayuthumaga.com/new/?p=6350.

පෘතුගීසීන් කාතෝලික ආගම ප්‍රචාරය කිරීම. (2018). පළමු හටන. http://plamuhatana.blogspot.com/ 2018/01/ blog-post-28.html?m=1.

පෙරේරා, එස්. බී. එච්. පී. අයි. (2011). සිංහල සමාජය කෙරෙහි බුදුදහමේ බලපෑම. විජිත වෙලගෙදර, එස්. බී. එම්. නිමල් ධර්මසිරි සහ සුසන්ත ලියනගේ (සංස්.), ***2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය ශාස්ත්‍රීය සංග්‍රහය,*** 515-802. ස්ථානය සඳහන් නොවේ: අධ්‍යාපන අමාත්‍යාංශය.

ප්‍රනාන්දු, ඕ. (2007). බිලි පුදදෙන භද්‍රකාලී දේවාලය. ***ලංකාදීප***. https://www.lankadeepa. lk/features/ බිලි- පුදදෙන-භද්%E2%80%8Dරකාලී-දේවාලයය2-6223.

බීබීසී පුවත්. (2016 මැයි 15). මුස්ලිම් ළමා විවාහ: මුස්ලිම් නීතිඥවරියකගේ අදහස්. https://www-bbc-com.cdn.amp.project.org/v/s/www.bbc.com/sinhala/sri-lanak-36295794.

බීබීසී පුවත්. (2018 මාර්තු 6). සිංහල, මුස්ලිම් සමගි ජාතීන් දෙක අතර හදිසි ගැටුමේ ඉතිහාසය. https://www-bbc-com.cdn.ampproject.org/v/s/www.bbc.com/sinhala/43303289.amp?-j-s-v=a6&amp-gsa=1&usqp=mq331AQKK=https%3A%2F%2F.

බීබීසී පුවත්. (2018 ජූනි 21). ගෝඨාභය රාජපක්ෂ හිට්ලර් කෙනෙකේ වෙන්න: වෛඩරුවේ උපාලි අනුනාහිමියන්ගේ ප්‍රතිචාරය. https://www-bbc-com.cdn.ampproject.org/v/s/www.bbc.com/sinh la/sri-lanka-44563729.amp?-js-v=a6&amp-gsa=1629194277724&referrer=https%3A%2F% 2F.

බීබීසී පුවත්. (2018 ඔක්තෝබර් 18). ඉන්දියාවේ සබරිනා කෝවිල: කාන්තාවන් කෝවිලට ඇතුළුවීමට එරෙහිව කාන්තාවනුත් උද්ඝෝෂණයේ. https://www-bbc-com.cdn.amp.project.org/v/s/www.bbc/ sinhala /world-45900566.a.

බීබීසී පුවත්. (2019 අගෝස්තු 9). කාශ්මීර: ඉන්දියාව සහ පකිස්ථානය අතර ගැටුමේ ඉතිහාසය. https://www-bbc-com-cdn.ampproject.org/v/s/www,bbc.com/sinhala/world-49292371.amp ?amp-js-v=a6&amp-gsa=1&usqp=mq331AQKKAFQARABIICAW%3D=16292806526567 &referrer=https%3A%2F%2F

බීබීසී පුවත්. (2019 නොවැම්බර් 18). නව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජාතිය අමතා කළ කතාවෙන් කරුණු 7ක්. https://www.bbc.com/sinhala/sri-lanaka-50457271.

බීබීසී පුවත්. (2019 දෙසැම්බර් 16). පුරවැසි පනතට එරෙහිව ඉන්දියාව පුරා විරෝධතා: සන්සුන වන මෙන් අගමැති මෝදිගෙන්

ආයාචනයක්. https://www.google.com/amp/s/www.bbc.com/sinhala/ world-50810156.amp.

බීබීසී පුවත්. (2020 ඔක්තෝබර් 1). අයෝධ්‍යා මුස්ලිම් පල්ලිය වැනසීම: සියළු හින්දු චූදිතයන් නිදහස්. https://www-bbc-com.cdn.ampproject.org/v/s/www.bbc.com/sinhala/world-54356253.amp-is-v=a6&amp-gsa=1&usqp=mq331AQKKAFQArABIIACAW%3D%3D#aoh=16292788590 053&amp.

බීබීසී පුවත්. (2021 මාර්තු 5). කොරෝනා වෛරසය: ආසාදිත මෘතදේහ නැගෙනහිර පළාතේ භූමිදානය කිරීම ඇරඹෙයි. https://www-bbc-com.cdn.ampproject.org/v/s/www/bbc.com/sinhala/sri-lank a-56290980.amp?.

මදුරප්පෙරුම, ඒ. (2007). පෘතුගීසි සහ ලන්දේසි ඉදිකළ මීගමුවේ පැරණි කතෝලික පල්ලිය, ***ලංකාදීප.*** https:lankadeepa/lk/Rasawitha/පතගස-සහ-ලනදස-ඉදකළ-මගමව-පරණගකතලක-පලල/57-539123.

මන්සූර්, ඉ. (2017). ඉස්ලාම් දහම සහ සංස්කෘතිය, යා යුතුමග. http://yayuthumaga.com/new/?p= 3820.

***මවිත***. (2021 මැයි 28). ඉන්දියාවට අලුත් දේවතාවියක වැඩලා. http://www.mawitha/2021/05 Cor ona-Devi.html?m=1.

මහතන්ත්‍රිගේ, පී. (2013). ***ශාසන ඉතිහාසය***. ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවේ: බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

මහලේකම්, එස්. (2016). ***බෞද්ධ සංස්කෘතිය***. ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවි: බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

මාදුළුවාවේ සෝභිත හිමියන් සහ සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය. (2018). සන්නිවේදන සරසවිය. http://sannivedanasarasaviya.blogspot.com/2018/07/1942.html?m=1.

මොරගොඩ, එම්. (2018 පෙබරවාරි 3). ජාතිය පිබිද වූ මිගෙට්ටුවත්තේ නාහිමි. ***දේශය.*** https://www. deshaya ./lk./article/42/columns/5569/ජාතිය-පිබිදවූ-මිගේට්ටුවත්තේ-නාහිමි.

ලියනගේ, ඒ. (2015). පතිවත සහ සති පූජා. http://kawuluva365.blospot.com/2015/06/blog-post-29.html?m=1.

විජයරත්න, එම්. (2018 අප්‍රේල් 21). මළකුණු මුදල්කරන්නෝ. ***සිළුමිණ.***. https://www.silumina.lk/2018/04/21/සිතමල්-යායරමළකුණුරමුදල්-කරන්නෝ.

විජේතුංග, ඕ. (2007 දෙසැම්බර් 18). අල්ලාහ් දෙවියන්ට යුතුකම් ඉටුකරන හජ් උත්සවය. ***විජය***, 4.

වීරසිංහ, පී. (දිනය සඳහන් නොවේ). දේව භක්තිය උතුරායන කොළොම්පුරේ වේල් සැමරුම. ***ලංකාදීප.*** https:///www.lankadeepa.lk/Rasawitha/EO%B6%AF%B7%80-%EO%B6%B7%EO%B6% AD %EO%B6%BA-%B8/57-552272.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා. (2021 සැප්තැම්බර් 26). ***මහාමේඝ.*** .https://mahamegha.lk/ 2019/09 /26/Srimath-angarika-dharmapalathuma/.

***ශ්‍රී ලංකා ගාඩියන්.*** (2019 මැයි 13). මේක සිංහල බෞද්ධ රටක් නොවේ කියන අය මෙරටට ගැළපෙන්නේ නැහැ. https://www.sinhala.slguardian.org/2019/05/blog-post-71.html?m=1.

ෂෙහාන්, ටී. (2018 අගෝස්තු 29). ලන්දේසි පාලනයයෙන් සමාජයට ඇති වූ බලපෑම. ***දිවයින.*** https://divaina.com/daily/index.php/visheshanga3/16197-2018-08-28-12-49-42.

සන්නිවේදන සරසවිය. (2018). මාදුළුවාවේ සෝභිත හිමියන් සහ සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය.

http://sannivedanasarasaviya.blogspot.com/2018/07/1942.html?m=1.

සමරවීර, පී. (2014 ජූලි 29). රාමලාන් උත්සවය. ***විජය***, 14.

සිඟාලෝවාද සූත්‍රය. (2016). අයි සී ටී ශ්‍රී ලංකා. http://ewaylanka.blogspot.com/2014/02/blog-post-post19.html?m=l.

සිරිලාල්, ආර්. (2020 ඔක්තෝබර් 22). විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මතයි: විපක්ෂ මන්ත්‍රීවරු අටදෙනෙකු සහය දෙති. ***බීබීසී පුවත්***. https://www-bbc-com.cdn.ampproject.org/v/s/www/bbc.com/sinhala/sri-lanaka-5462814.

සුමිත්ත, පී. (2011 අප්‍රේල් 11). කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්. ***බුදුසරණ***,. http://www.budusarana.lk/budusarana/2011/04/11tmp.asp?ID= vision02.

සූරියප්පෙරුම, එච්. (2018 දෙසැම්බර් 22). ක්‍රිස්තු භක්තිකයන් සොයන්නට ංපෙරදිගට පය තැබූ වස්කෝ ද ගාමාගේ ඓතිහාසික ප්‍රයාණය. ***සිළුමිණ***. https://www.silumina.lk/2018/12/22/විශේෂාංග/ක්%E2 %80%8රිස්තු-භක්ති%2%AD%C2%ADයන්-සොයා%2A%C2%2%ADවන්නට-පෙර%C2 %AD5 C2%AD%C2%ADපය-තැබූ-වස්කෝද්-ගාමාගේ-ඓති%C2%ADසික-ප්%C2%AD%C2%AD% E2%80%8Dවරයා.

සේරම්, ඩී. (2015 ජූනි 21). හින්දු දහම පිළිබඳ ඔබ දැනුවත්ද?. ***දිවයින***.. https://www.divaina. com/2015/06/21/naka05.html.

හිරු පුවත්. (2019 දෙසැම්බර් 14). ශ්‍රී ලංකාව, සිංහල බෞද්ධ රටක් නොවේ- ඉතිහාසය ප්‍රබන්ධයක් බව විග්නේශ්වරම් කියයි. https//www.hirunews.lk/230241%EO%B7%81%EO%B7%8A%80 %8D%EO%B6%BB.

ෆර්වල්ඩ්, එම්. (දිනය සඳහන් නොවේ). ක්‍රිස්තියානි නිකායන් 7කින් යුත් විශ්වාසයන් සසඳා බලන්න. https://si.eferrit.com/ක්රිස්තියානි-නිකායන්-7.

ෆර්වල්ඩ්, එම්. (දිනය සඳහන් නොවේ). බව්තීස්ම වීම යනු කුමක්ද?. https://si.eferrit.com/බව්තීස්ම-වීම-යනු-කුමක්ද?/

ෆාසි, ඒ. (2019). ෂරියා නීතියෙන් කරන්නේ කුමක්ද?. යායුතුමග. https://yayuthumaga.com/new/?p =6286.

Cristian, D. A. (2015). The Need for the Social Control Sociology Essay. Retrieved from https://www.ukessays.om/essays/sociology/the-need-for-the-social-control-soiologyessay .php.

Newsfirst. (2019 June 3). Ven.Athuraliye Rathana Thero Stps fast following governors' resignations. https://www.google.com/amp/s/www.newsfirst,lk/2019/06/03/ven-athuraliye-ra thana-thero-stops-fast-following-givernors-resignations/amp/.

Obeysekere, G. (2013). The Great Tradition and the Little in the Perspective of Sinhalese Buddhism. ***The journal of Asian Studies***, The Association for Asian Studies. Retrieved from http://www.jstor.org/stable/2050008.

Rao, C. N. S. (2012). Sociology. Rerieved from https://books.google.lk/books?id=jDsEA AAQBAJ&pq =PA456&Ipg=PA456&dq.

Religion Cencus. (2011). All India Religion Census Data. Retrieved from https://www.census 2011.co.in/religion.php.

Sawe, B. E. (2019). Countries with the highest Rates of Vegetarianism. Retrieved from https://www.worldatlas.com/articles/countroes-with -the-highest-rates-of-vegetarianism.html.

Siddiqi, H. O. (2020). Is there aHindi bias in India's secular Consitution? A2005 academic paper suggests as much. Retrieved from https://amp-scroll-in.cdn.ampproject.org/v/samp.

scroll.in/article/951661/is-there-ahindu -bias-in-indias-secular-constitution-a-2005-academic-paper-suggests-as-much?amp.

Singh, A. (2016). 10 Painful And Bizarre Rituals Followed In India. Retrieved from https://www.antiscoopwhoop.com/10-painful-bizarre-rituals-followed-india/.

United Nations Human Rights. (2019). Preliminary findings of Country Visit to Sri Lanka by the Special Rapporteur on Freedom of Religion or belief. Retrieved from https//www.ohchr .org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=24918.

# දකුණු ආසියානු කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය පිළිබඳව කලාපීය රටවල් කිහිපයක් ඇසුරෙන් සිදු කෙරෙන සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**ආර්. ඒ. වයි. ආර්. රණවීර**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය**

## 1. හැඳින්වීම

දකුණු ආසියානු කලාපය වූ කලී ලොව වෙසෙන කාන්තාවන් බහුතරයකට වාසස්ථානය වූ සුවිශේෂී කලාපයකි. විශේෂයෙන්ම ලෝක ජනගහනයෙන් පහෙන් එකක් පමණ ප්‍රමාණයක් දකුණු ආසියානු කලාපයේ ජීවත් වන අතර ඉන් හරි අඩක් පමණ කාන්තාවන් වේ. එය ලෝකයේ කාන්තා ජනගහනයෙන් හතරෙන් එකකට ආසන්නය. පොදුවේ ගත් කළ දකුණු ආසියාව සංස්කෘතිය, භාෂාව ජනවාර්ගික හා ආගමික විවිධත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව ද සුවිශේෂත්වයක් උසුලයි. මේ අනුව ලෝකයේ සෙසු රටවලින් දකුණු ආසියාව වෙනස් වීම උදෙසා කලාපීය කාන්තාවන්ට හිමි සමාජ - ආර්ථික තත්ත්වය වැනි කරුණු බලපා ඇති බව පෙන්වා දිය හැකිය. කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය පිළිබඳ විමසා බැලීමේදී එදා දකුණු ආසියානු රටවල කාන්තාවන්ට වඩා අද දකුණු ආසියානු රටවල කාන්තාවන් ආර්ථික වශයෙන් බලගැන්වී ඇති අයුරු දක්නට ලැබෙන නමුත් දකුණු ආසියාවේ ව්‍යාප්තව පවත්නා සංස්කෘතිය හා ආගමික සංකල්පවලින් පෝෂණය කරනු ලබන පීතෘමූලික සමාජ ව්‍යුහය තුළ කාන්තාවන් තවදුරටත් දෙවැනි තැන්හි ලා සැලකීම මෙන්ම වෙන් කොට සැලකීම දැකිය හැකිය. මේ කරුණුවලට විශේෂ අවධානය යොමු කරමින් දකුණු ආසියාතික කාන්තාවන් ආර්ථික සංවර්ධනයට දක්වනු ලබන දායකත්වය කෙසේද යන්න පිළිබඳව මින් ඉදිරියට විමසා බලමු.

අතීතයේ දී දකුණු ආසියාව පුරාම පැතිර පැවතුණේ ඉන්දියානු සංස්කෘතියයි. ක්‍රිස්තු පූර්ව 15 සහ එයට පෙර සිට ඉන්දියාවේ ස්ත්‍රිය උතුම් ය යන සංකල්පයට ප්‍රධාන තැනක් ලැබී තිබුණි. ජගත් මාතා නොඑසේනම් පොළොව නැමැති කාන්තාව එකල දේවත්වයෙන් පුදනු ලැබීය. බ්‍රාහ්මණ යුගයේදී ස්ත්‍රිය පිළිබඳ

අදහස වෙනස් වීම ආරම්භ විය. එතැන් සිට ස්ත්‍රිය විශ්වාසදායී, රාගික, කිලිටි හා වෙනස්වන සුළු සත්‍යයක් ලෙස සලකන ලදී. ඒ අනුව බ්‍රාහ්මණයන් විසින් සමාජීය ධුරාවලියේ එක් කොටසක් (පිරිමි ) ඉහළ, අනෙක් කොටස (ගැහැණු) පහල ලෙස ස්ථානගත කළ අතර ආගම් තුළින් එය සාධාරණීකරණය කළේය.මෙම තත්වය ක්‍රම ක්‍රමයෙන් සෙසු දකුණු ආසියාතික රටවල් කරා පැතිරී ගිය අතර වර්තමානයේ පවා බොහෝ සමාජවල ස්ත්‍රීන් දෙවැනි තැන්හිලා සලකති. දකුණු ආසියානු සමාජය පීතෘමූලික තීරය ලෙස සලකන අතර ඥාතීන් විසින් සකස් කරන ලද සමාජ ව්‍යුහයක් ද මෙහි දක්නට ලැබේ. ඒ අනුව පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ට හිමිව ඇත්තේ දෙවැනි තැනකි.

එමෙන්ම දකුණු ආසියාව තුළ පැතිරී පවත්නා මෙම පීතෘමූලික මතවාද මත පදනම් වූ සමාජ සංස්කෘතික සිරිත් විරිත් කාන්තාවන්ගේ චලනතාවය සීමා කර ඇති අතර ඔවුන්ගේ හැකියාවන් දියුණු කර ගත හැකි අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම වළකා තිබේ. මේ හේතුව නිසා බොහෝ දකුණු ආසියාතික කාන්තාවන්ට ශ්‍රම වෙළඳපොලේ අවකාශ සීමාවීම, අධ්‍යාපනයට සමාජ සංස්කෘතික බලපෑම ඇතිවීම මෙන්ම දේශපාලන සහභාගිත්වය යෙදීමට සමාන අයිතිවාසිකම් නොලැබීම දැක්විය හැකිය. දකුණු ආසියාතික කාන්තාවන් තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වනුයේ සමාජ කාර්යයන්ට ප්‍රමුඛත්වයක් ලබා දීම සහ අයිතිවාසිකම්වලට ස්ථානයක් ලබා නොදීම හෝ අඩු ස්ථානයක් ලබා දීමය.

එමෙන්ම කාන්තාවන් ස්වයං අවශ්‍යතාවලට වඩා පවුලේ අභිවෘද්ධිය සඳහා කැප වනු ලබන අතර එවැන්නන් යහපත් කාන්තාවන් ලෙස සමාජය විසින් පිළිගනී. මෙම පිළිගැනීම කාන්තාවන් තවදුරටත් දෙවැනි තැන්හි ලා තැබීමට හේතු වී ඇත. ඒ අනුව සිය පවුල කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට බොහෝ දකුණු ආසියාතික කාන්තාවන් පෙළඹී ඇත. මේ හේතුවෙන් අධික ලෙස ගෘහය සහ දරුවන් වෙනුවෙන් කැපවී වැඩ කිරීමටත් සෑම විටම නියමිත පරිදි ආහාර නොගැනීමටත්, විවේකය අඩු වීමටත්, සිය සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි අවධානයක් යොමු නොකිරීමත් සිදුවේ. මේ තුළින් ඇයගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට ලක්වී ඇත. මෙවැනි කැපකිරීම් කාන්තාවන් වෙතින් සිදු වෙමින් පැවතුනත් පිරිමින් බොහෝ විට ගෘහයේ මූලිකත්වය ගෙන ප්‍රධාන තීරණ ගනු ලබයි.

UNDP - United Nations Development Programme (1995) අනුව ස්ත්‍රී - පුරුෂ අසමානතාවය යනු විශ්වීය ප්‍රපංචයක් වන අතර එහි වෙනස ඇත්තේ වෙන්කොට සැලකීම් ප්‍රමාණයන්ගේ පවත්නා වෙනස්කම් තුළ පමණි (මේ අනුව පුරුෂාධිපත්‍ය මූලික වූ දකුණු ආසියාතික සමාජවල කාන්තාවන් වෙන් කොට සැලකීමේ ප්‍රමාණය වැඩි හෙයින් ස්ත්‍රී පුරුෂ අසමානතාවය ද වැඩි වී ඇත. එය බලය සහ අධිකාරීත්වය, පන්තිය හා ආගම, කුල හා ජනවාර්ගික ධූරාවලි හා සමාජ සංස්කෘතික සම්ප්‍රදායන්, රීති සහ ප්‍රතිමාන තුළින් සාධාරණීකරණය කිරීමක් ද සිදු වී ඇත **(United Nations Development Programme,1995).**

විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුව පවත්නා අසමානකම් හේතුකොටගෙන සංවර්ධනයට සහභාගි වීම මෙන්ම එහි ප්‍රතිලාභ ලැබීමේ අවස්ථාවන්ද කාන්තාවන්ට බොහෝදුරට අහිමි වී ඇති බව පෙනේ. විශේෂයෙන්ම දකුණු ආසියාව කාන්තාවන්ට වෙනස් ලෙස සැලකීමට ප්‍රධාන හේතුව වන්නේ ඇයට සමාජය දෙවැනි කොට සැලකීමත්, දකුණු ආසියාතික කලාපයේ පීතෘමූලික ක්‍රමය හේතුකොටගෙන පිරිමි දරුවන්ට ඇති කැමැත්තය. ඔවුන් පොදුවේ පිළිගත් විශ්වාසය වනුයේ පිරිමි දරුවා ඇති දැඩි කිරීමෙන් අනාගත ආර්ථික සහ දේශපාලන සුරක්ෂිත භාවයක් පවුලට ලැබෙන බවය. ගැහැණු දරුවෙකු රැකබලා ගැනීම අසල්වැසි වත්තට වතුර දැමීමක් හා සමාන වන බවය. මෙලෙස ගැහැනු දරුවන්ට වඩා පිරිමි දරුවන් කෙරෙහි පවත්නා වැඩි කැමැත්ත දකුණු ආසියාතික සමාජයේ කාන්තාවගේ තත්ත්වය තීරණය කිරීමේ වැදගත් සාධකයක් විය.

දකුණු ආසියාවේ පුරුෂාධිපත්‍ය මුල්කරගත් සමාජ වාතාවරණය තුළ ගැහැනු දරුවන්ට උචිත ස්ථානය නිවස වේ. ඒ අනුව සාම්ප්‍රදායික සමාජ චින්තනයේ කාන්තාවන් පිළිබඳ විවිධ අදහස් සහ සිතුවිලි විශේෂයෙන්ම ග්‍රාමීය සමාජවල දක්නට ලැබුණි. ඉන් කිහිපයක් වනුයේ ගැහැනිය අපූරු වස්තුවකි, ඇවිදින පිරිමියා පිරිමියා සටන් බිමට ගැහැනිය දරුවන් වැදීමට, ගැහැනියගේ ලෝකය ගෙදරය පිරිමියාගේ ගෙදර ලෝකය ය ආදියයි. මෙවැනි සාම්ප්‍රදායික අදහස් දකුණු ආසියාතික සමාජය කාන්තාවන්ගේ තත්වය තීරණය වීම උදෙසා සෘජුවම බලපායි. ඉන්දියාව ප්‍රමුඛ දකුණු ආසියානු

සමාජය තුළ ආගමික සම්ප්‍රදායන් සාම්ප්‍රදායික සමාජ ආකල්ප මත කාන්තාවන් පුරුෂයාට සාපේක්ෂව වෙනස්කම්වලට ලක් වේ.

දකුණු ආසියාතික කාන්තාවන් පිළිබඳ පවත්නා සාම්ප්‍රදායික චින්තනයන් හා ඒ පිළිබඳව ගොඩනැගී ඇති සමාජ ආකල්ප මගින් තේරුම්ගත හැකි වන්නේ කාන්තාවන්ට ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහභාගිවීමට තිබූ ඉඩප්‍රස්ථා ඉතා අල්ප වන බවය. දකුණු ආසියාතික රටවල ස්ත්‍රී  පුරුෂ සමාජභාවීය විෂමතා සම්බන්ධව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ මානයන් තුනක් ඉදිරිපත් වී ඇත. එනම්,

- ආර්ථික ක්‍රියාකාරකම්,
- බලගැන්වීම
- අධ්‍යාපනය **යනාදියයි.**

දකුණු ආසියානු කලාපයේ මෙම සමානාත්මතාවය ගත්කල එහිදී ඉහළ අගයක් දැකිය හැකි වනුයේ අධ්‍යාපනය තුළ පමණි.

"බංග්ලාදේශය ඉන්දියාව හා ලංකාව ගත් විට ආර්ථික ක්‍රියාවලිය තුළ අසමානතාවය දැඩිව දැකිය හැකි අතර බලගැන්වීමේ ක්‍රියාවලියේ දී භූතානය සහ ඉන්දියාවේ තත්ත්වය පහළ අගයක් ගනී. කෙසේනමුත් නේපාලය සහ පාකිස්ථානය යන රටවල පොදුවේ සියලු අංශවල වර්ධනයක් දැකිය හැක. කෙසේනමුත් සමස්ථයක් ලෙස ගත්විට නේපාලය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව අගයක් ගන්නා බැවින් ඔවුන්ගේ රටවල් තුළ ආර්ථිකමය වශයෙන් කාන්තාවන් දායක වන ප්‍රමාණය ද ඉහල අගයක් ගනී" (රස්නායක හා ගලගමගේ, 2017: 355).

මෙලෙස අඩු සමාජ තත්ත්වයකට හිමිකම් කියනු ලබන දකුණු ආසියාතික කාන්තාවට දේපල හා ඉඩම් හිමිකම සඳහා ප්‍රවේශ වීමට ඇති ඉඩකඩ ඉතා අඩු හෝ නොමැති තරම්ය. එනමුදු දකුණු ආසියාතික කලාපයේ කාන්තාවන් පිරිමින්ට වඩා වැඩි කාර්යයන්හි නිරත වෙති. නිදසුන් ලෙස පකිස්ථානය, බංග්ලාදේශය, ඉන්දියාව වැනි රටවල ගෘහාශ්‍රිත කටයුතුවලට අමතරව ගොවිපොළ කටයුතුවලින් වැඩි කොටසක් ඉටු කරනු ලබන්නේ කාන්තාවන් විසිනි. එමෙන්ම ඉන්දියාවේ හරියානා ප්‍රාන්තයේ තිරිඟු වගාව පිළිබඳ පර්යේෂණයක් සිදු කළ ශාන්ති චක්‍රවර්ති පවසා සිටින්නේ ගොවිපොළ කටයුතුවලදී ඉන් සිදුවන්නේ පිරිමියාට කාන්තාවගේ

සහායක් ලැබීමක් නොව කාන්තාවට පිරිමියාගෙන් සහයක් ලැබීමක් බවය.

ශ්‍රී ලංකාවේ තත්ත්වය සලකා බැලීමේදී රටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන අංශ තුන එනම් විදේශ රැකියා, ඇගලුම්, තේ වගාව වැනි ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන දායකත්වය සපයනුයේ කාන්තාවන්ය. එහෙත් දකුණු ආසියාතික කාන්තාවන් කරනු ලබන බොහෝ ශ්‍රම වැගිරීම්වලට කිසිදු ගෙවීමක් නොමැති අතර ඒවා පිළිගැනීමට ද ලක්වී නැත. ඒවා බොහෝවිට අදෘශ්‍යමාන හෝ අනාරක්ෂිත රැකියාවන් වේ. එසේම විධිමත් අංශයේ රැකියාවන් වුවද බොහෝ ඒවා සුළු වැටුපක් හිමි රැකියාවන් වේ.

හියුගෝ විසින් 2000 වසරේ දී සඳහන් කර ඇති ආකාරයට Dirty, Dangerous, Difficult රැකියාවන් මේ අතර බහුලව දක්නට ලැබේ. එමෙන්ම බොහෝ දකුණු ආසියා රැකියාවන්ගේ පොදු ලක්ෂණයක් වනුයේ සංවර්ධන ක්‍රියාදාමයට කාන්තාවන්ට ඇතුළුවීමට ඇති අඩු අවකාශයයි. සහයෝගය නොලැබීමේ අඩුවක්ද, අධ්‍යාපනය ලැබීමට අඩු ඉඩකඩ ද පුරුෂයාට සාපේක්ෂව අඩු නිපුණතාවයද ඒ සඳහා හේතු වී ඇත.

දකුණු ආසියාවේ රැකියා වර්ගීකරණයේ දී ද කාන්තාවට වෙන් කොට සැලකීම තවදුරටත් දැක්විය හැකිය. ඒ අනුව ගුරු වෘත්තිය, පිළිගැනීමේ නිලධාරී තනතුර, සාත්තු සේවය, ගෘහ සේවිකා වෘත්තිය බොහෝදුරට කාන්තාවන් සඳහා වූ රැකියා ලෙස සැලකේ. එසේම රැකියාවක නිරත වුවත් බොහෝ කාන්තාවන් ගෘහීය කටයුතුවල නිරතවීම වීම දකුණු ආසියාතික සමාජවල දැකිය හැකි පොදු ලක්ෂණයකි එම ද්විත්ව කාර්යය (Dual Task) කාන්තාවක් පීඩා කරන්නකි.

ආර්ථිකය තුළ ස්ත්‍රී පුරුෂ සමානත්වය ලබාදීමටද දකුණු ආසියා ආසියාතික රජයන් සහ එහි වැසියන් උත්සාහ ගනු ලැබේ. නමුත් මේ රටවල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දර්ශකයන් වර්ධනය වී ඇත්තේ අඩුවෙනි. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ දුගීභාවය ස්ත්‍රීකරණය වීමය. රටවල දුගීකමට කාන්තාවන් මූලික වීම සඳහා කෘෂිකාර්මික කටයුතුවල නිරත වීම හා අනියම් හා වැටුප් රහිත රැකියාවන්හි නිරත වීම වත්කම් අසමාන ලෙස බෙදී යාම යන කාරණා බලපා ඇත.

සමස්තයක් ලෙස ගත් විට දකුණු ආසියාතික කාන්තාවන්ගේ ශ්‍රම බලකාය සඳහා සහභාගීත්වය 1980 දී 33% ක් වූ අතර 2014 වන විට එය 29 % දක්වා අඩු වී ඇත (Mahendra, 2000). මේ තත්වයට හේතුවක් ලෙස කාන්තාවන්ගේ බොහෝ කාර්යයන් අවිධිමත්කරණය වීම පෙන්වා දිය හැකිය. මේ නිසා දකුණු ආසියාතික රටවල ශ්‍රම බළකාය තුළ ස්ත්‍රී පුරුෂ ලෙස විශාල පරතරයක් දැකිය හැකිය.

දකුණු ආසියාතික රටවල් බොහෝ ආර්ථිකයන් කාන්තා ශ්‍රමය මත රඳා පවතී. නිදසුන් ලෙස, ශ්‍රී ලංකාව ගතහොත් රටට විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ග තුනටම එනම් ඇඟළුම්, විදේශ සම්ප්‍රේෂණය  හා වැවිලි කර්මාන්තය යන ත්‍රිත්වයටම කාන්තාවන් ඉහල දායකත්වයක් සපයන බව කිව යුතු ය.

නමුත් මෙහිදී ගැටලුව වනුයේ මෙම කාන්තාවන් නිසි ඇගයීමට ලක් නොවීමය. ඔවුන් විශාල වශයෙන් අනාරක්ෂිතව සිටින අතර හිංසනයට ගොදුරු වීමේ තදබල අවදානමක ද සිටී. මේ හැරෙන්නට පවත්නා සමාජ ආකල්ප හේතුකොටගෙන කාන්තාවන්ට පුරුෂයන් කරනු ලබන හිංසන ක්‍රියා අනුමත කිරීම සිදුව ඇත. මෙහිදී සැලකිය යුතු කරුණක් වනුයේ දකුණු ආසියාවේ සියලුම කාන්තාව මෙලෙස බල රහිත නොවන බවය. ස්වාධීන ලෙස ආදායම් උපයන කාන්තාවන් සතුව බොහෝ දුරට තීරණ ගැනීමේ බලය පවතී. ඒ හැරෙන්නට රැකියාවක නිරත නොවන ගෘහණියන් සතුව ආහාර සහ වෙනත් සම්පත් පිළිබඳ තීරණ ගැනීමේ හැකියාව තවදුරටත් පවතී. ඒ තුළින් ගොඩනැගූ පාලන බලයක් ඔවුන් සතුව පවතී. නමුත් මෙහිදී ගැටලුව වනුයේ එම පාලන බලය තමාටම අවාසියක් කරගැනීමය.

කලාපයේ නේපාලය සහ භූතානය හැරෙන්නට අනෙකුත් රටවල් යටත්විජිතකරණයට නතුව පැවැතුණි. යටත්විජිතකරණයේ බලපෑමෙන් මෙම රටවල සාම්ප්‍රදායික සංස්කෘතීන් පූර්ණ පරිවර්තනයකට ලක් නොවුණ ද කාන්තාවන්ට සාම්ප්‍රදායිකව හිමි වී තිබූ තත්වියෙන් තරමක් හෝ පෙරට ඒමේ හැකියාවක් මේ මත ලැබුණි. නැතහොත් සාම්ප්‍රදායික සමාජයේ දැඩිව සීමා වී සිටී.

කාන්තාවට පූර්ණ වශයෙන් ස්වාධීනත්වයක් හිමි නොවුන ද යටත් විජිතකරණයේ බලපෑම ඇගේ වර්තමාන සමාජ ආර්ථික තත්වයට ධනාත්මකව බලපාන ලදී. බටහිර අධ්‍යාපනය ස්ථාපිත වීම සහ ඡන්ද අයිතිය කාන්තාවන්ට හිමි වීම මගින් මෙම රටවල කාන්තාවන්ගේ සමාජ ආර්ථික තත්වයේ සැලකිය යුතු වෙනසක්

සිදුව ඇත. එසේම මෙම රටවල් වල රජයන් 1975 වර්ෂයේ සිට ජාත්‍යන්තර වශයෙන් කාන්තාවන්ගේ තත්වය ඉහළ නැංවීමටත්, ඇයට සුරක්ෂිතභාවයක් ලබාදීම සඳහාත් විවිධ උත්සාහයන් ගනිමින් සිටී.

එහිදී ස්ත්‍රී පුරුෂ සමාන බව වැදගත් කොට සලකන ලද අතර කාන්තාවන්ට ඒ සඳහා පියවර ගැනීමේ අවස්ථාව හිමිකර දී ඇත. විශේෂයෙන්ම 20 වන සියවස අවසානය වන විට ස්ත්‍රී පුරුෂ සමාන බව සහ බලගැන්වීම සංවර්ධන විෂයෙහි පිළිගත් ධර්මතාවක් බවට පත්වී ඇත.

විශේෂයෙන් මේ දක්වා යොදා ගනු ලැබූ ස්ත්‍රී පුරුෂ අපක්ෂග්‍රාහී එළඹුම් පිළිබඳව හා ඒවා සංවර්ධනයට බලපා ඇති ආකාරය, දරිද්‍රතාව ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට බලපා ඇති ආකාරයත් ප්‍රශ්න කෙරි ඇත. කෙසේවුවද දකුණු ආසියාතික රටවල් කාන්තාවන් වෙනුවෙන් සමාජ ප්‍රතිපත්ති බොහෝමයක් පසුගිය දශකය තුළ ආරම්භ කර තිබේ. විශේෂයෙන්ම ඒ සමාජ ආර්ථික ආරක්ෂක අධ්‍යාපන පහසුකම් වෙනුවෙනි.

මේ වන විට දකුණු ආසියාතික කලාපීය රටවල්වල දැකිය හැකි අණපනත් මගින් කාන්තාවගේ තත්වය යම්තාක් දුරට නංවාලීමට හැකිවී ඇතත්, එහි බලපෑම එතරම් දුරට ඇයට ලැබී නොමැත. මේ හේතු නිසා සමහර අවස්ථාවලදී කාන්තාවගේ මූලික අයිතිවාසිකම් බොහෝමයක් නොසලකා හැර ඇත. මෙකී අයිතිවාසිකම් ගණයට කාන්තාවට ආර්ථික ක්‍රියාකාරකම් සඳහා දායක වීමේ අයිතිය ද වර්තමානයේ දී පවා දකුණු ආසියාතික කාන්තාවන්ට සපුරා ගැනීමට අපහසු දෙයක් වී ඇත. මේ හේතුවෙන් ඇයට තවමත් සමාජීය ලෙස අසාධාරණයක් සිදු වෙමින් පවතී.

දකුණු ආසියාවේ බොහෝ කාන්තාවන් තමාගේ අයිතීන් පිළිබඳව සීඝ්‍රයෙන් සහ විවිධාකාරයෙන් දැනුවත් වෙමින් සිටීම සැලකිය යුතු කරුණකි. විශේෂයෙන්ම දකුණු ආසියාතික කාන්තාවන් හොඳ රැකියා තත්වයන් සඳහා අරගල කිරීම තුළින් මෙම තත්ත්වය තවදුරටත් පැහැදිලි වේ. මෙමගින් ඇඟවෙන්නේ දකුණු ආසියාතික කාන්තාවන්ට ආර්ථිකමය වශයෙන් දායකත්වය සැපයීමේ උනන්දුවක් පවත්නා බවය.

කෙසේවුවද කාලානුරූපීව කලාපයේ සිදු වූ සමාජ නවීකරණයත් සමග දකුණු ආසියාතික කාන්තාවගේ සාම්ප්‍රදායික

තත්ත්වය නූතනය වන විට ක්‍රමයෙන් වෙනස් වී තිබේ. මේ හේතුවෙන් ඇය දකුණු ආසියාවේ ආර්ථිකයට ලබාදෙන දායකත්වය වෙනසකට භාජනය වී ඇත.

ඓතිහාසික පසුබිම තුළ දකුණු ආසියානු කාන්තාවගේ ආර්ථික දායකත්වය දකුණු ආසියානු සංස්කෘතිය තුළින් කාන්තාවන් ප්‍රජනනය උදෙසා බිහිවූ සත්වයන්යී යන මතවාදය මුල්කොටගත් බැවින් ඔවුන්ට පැවරුණු ආර්ථික කෘත්‍යයන් පුරුෂයන්ට වඩා හාත්පසින්ම වෙනස් විය. නමුත් අතීතයේ දී ද දකුණු ආසියාතික කාන්තාවන් ආර්ථික සංවර්ධනයට යම්තාක් දුරකට දායක වූ බවට සාක්ෂි තිබේ. වී වගාව හා අස්වනු නෙලීම ඇතුළු කෘෂිකාර්මික කටයුතු ,රෙදි විවීම සහ අලෙවිකරණය යනාදී කර්මාන්ත ඊට ඇතුළත් විය.

ශ්‍රී ලංකාව ගත්විට ඈත අතීතයේ කුවේණියගෙන් පටන් වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථික පද්ධතියට කාන්තාවගේ දායකත්වය නන් අයුරින් ලැබී ඇති බව කාටත් නොරහසකි. ඈත අතීතයේ සිටම ශ්‍රී ලාංකේය සමාජයේ පුරුෂයා සහ ස්ත්‍රිය සම මට්ටමින් නොසලකා ඇත. එකල තිබූ පුරුෂ මූලික සමාජ ක්‍රමය, පුරුෂයා නිවසේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, ස්ත්‍රිය කුටුම්බය ආරක්ෂා කර ගිනිමින්, දරුවන් රැක බලා ගැනීමටත් කැප වී සිටියහ. නමුත් ලාංකීය කාන්තාවන් ආර්ථික සංවර්ධනයට යම්තාක් දුරකට දායක වූ බවට සාක්ෂි තිබේ . නිදසුන් ලෙස, ලංකාවේ මෙකල බොහෝ ස්ත්‍රීන් රේන්ද බීරළු ගෙතීම රෙදි විවීම, වට්ටි- පෙට්ටි- පැදුරු විවීම ආදී නොයෙකුත් කර්මාන්තවල නියැලෙමින් ගොවිතැන් කටයුතුවලට සම්බන්ධ වෙමින් ආර්ථික සංවර්ධනයට රුකුල් දුන්හ. එහෙත් මේ සාමාන්‍ය රටාවෙන් බැහැරව අපේ රටේ කාන්තාව සුවිශේෂී අවස්ථා සඳහන් කළ අවස්ථා ද නැත්තේ නොවේ.

ශ්‍රී ලංකාවේ පුරාණ කර්මාන්ත අතර රෙදිපිළි කර්මාන්තය හිමි කර ගන්නේ අද්විතීය ස්ථානයකි. එය කර්මාන්තයක් වුවත් කලාව සමඟද අවියෝජනීය සබඳතාවක් පවත්නා බැවින් කාර්මික කලාවක් ලෙසද හැඳින්වුවහොත් නිවැරැදිය. රෙදි විවීම පමණක් නොව, සායම් යෙදීම, මෝස්තර යෙදීම, ඇම්බ්‍රොයිඩිං ආදියෙන් මෙරට රෙදිපිළි කර්මාන්තය සමන්විත විය.

ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය පිළිබඳ පැරණිම ඓතිහාසික මූලාශ්‍රය වන්නේ විජය රජු ශ්‍රී ලංකාවට පැමිණෙන විට,

කුවේණිය කපු කැටීමෙහි නිරත වූ බවට සඳහන් මහාවංසයේ පුවතය. දෙවන පෑතිස් රජ දවස ජය ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩමවීමත් සමඟ පැමිණි අටලොස් කුලයක පිරිස අතර පේෂකාර්මිකයන් ද වූ බවට සඳහන් වේ.  ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය සඳහා යොදා ගන්නා ලද්දේ කපු බව සඳහන් කරන ආනන්ද කුමාරස්වාමි, කපු දෙවර්ගයක් ගෙනහැර දක්වයි.

එනම්, අවුරුදු කීපයක් පවත්නා විශාල වර්ගය හා කුඩා වාර්ෂික කපු වර්ගය (බාල කපු) වශයෙනි. රෙදි පිළි කර්මාන්තය සඳහා කපු භාවිතය සම්බන්ධයෙන් මානව සභ්‍යත්වය තුළ ඉතා දිගු ඉතිහාසයක් පවතින බව හඳුනාගත හැකිය. ද්‍රවිඩ ග්‍රන්ථයක් උපුටා දක්වා මාර්ටින් වික්‍රමසිංහ, කපු කැටීමෙන් රෙදි වියන ආකාරය දැනගන්නට පෙර පුරාණ ද්‍රවිඩ ස්ත්‍රීන් කොළ හා මානෙල් මල් එල්ලා සාදාගත් ඉණහැඳයන් ඉගටිය වටා බැඳගත් පුවතක්ද සඳහන් කරයි (රත්නායක, 2017).

පුරාතන සමාජ ආර්ථික රටාවන් තුළ වීමයි යන්න සඳහා නිශ්චිත වූ අර්ථකථනයක් නො සැපයේ. නමුත් මෑතකාලීන මිනිසා හා ඔහුගේ දේශපාලන, සමාජ හා ආර්ථික ක්‍රියාදාමයන් පිළිබඳව විවිධ විග්‍රහයන් ඉදිරිපත්වීම හා සමගාමී ශ්‍රමය පිළිබඳව පුළුල් කතිකාවතක් ගොඩනැගී ඇත. විද්වතුන් අවධාරණය කරන පරිදි පුරාතන ලෝකයේ ශ්‍රමය හා නිෂ්පාදන කටයුතු පිළිබඳව විග්‍රහ කර පැවතියේ දේව-මිත්‍යා කථා ඇසුරිනි. එහි දී ජගත් මාතා දෙවඟනී හා පුරුෂ දෙවියා ආදී සංකල්ප භාවිතයට ගත් බව විශ්වාස කෙරේ.

පුරාතන ඉන්දීය ආර්ථිකය තුළ කාන්තා ශ්‍රමය භාවිත වූ ආකාරය පිළිබඳව විමසා බැලීමේ දි කුල ස්ත්‍රීන්ගේ ශ්‍රමය ආර්ථික ක්‍රියාදාමය හා සම්බන්ධ කරගත් අයුරු පිළිබඳව විමසා බැලීම වැදගත්ය මෞර්ය රාජ්‍ය සමයේ දී පවා කුල කතුන්ගේ නිදහස, සමාජ සම්මත සිරිත්විරිත් නිසා සීමාව පැවති බවට සාධක කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය වැනි මූලාශ්‍ර  ඇසුරෙන් විද්‍යාමාන විය. රජුගේ පේෂකර්ම අධ්‍යක්ෂකට දුන් උපදෙස් අනුව රාජකීය නූල් කැටීමේ හා රෙදි විවීමේ ආයතනවල සේවකයින්, වැන්දඹුවන්, අනාථයින්, හිඟන්නියන්ට දඩ ගෙවීමට බැරි නිසා ඒ වෙනුවට වැඩ කිරීමට සිදු වූ ණයගැති ස්ත්‍රීන් හා තවදුරටත් තම රක්ෂාව කරගත නොහැකි වෛශ්‍යාවන් ආදී නානා ප්‍රකාර දිළිඳු ස්ත්‍රීන්ගෙන් සමන්විත විය යුතු යැයි සඳහන් වේ. මේ  සියලු දෙනා පහත් කුලවලට අයත්ය. ඔවුහු

පිරිමි කංකානම්වරුන් යටතේ සේවය කළහ. මේ අනුව ස්ත්‍රී ශ්‍රමය ද ආර්ථික ක්‍රියාදාමයන් හා සම්බන්ධකර ගැනීමට කටයුතු කර ඇති අයුරු විද්‍යමාන වේ.

ඉහත දී අවධාරණය කරන ලද ආකාරයට සමාජයේ විසූ අනෙකුත් කාන්තාවන් සේම ඇතැම් අවස්ථාවන්හී දී උසස් කුල කතුන් ද දුෂ්කර කාලපරාසයන් එළඹී කල්හි මෙයාකාරයෙන් රෙදි විවීම හා සමඟ සහසම්බන්ධ වූ බව ප්‍රකට වුව ද, ඔවුහු ඉහත දී අවධානයට ලක්කරන ලද පිරිස් හා එක්ව සිය ශ්‍රම දායකත්වය විවෘතව ලබාදීමෙන් වැළකීමට වග බලාගත් අයුරු පෙනේ. සේවිකාවන් තබාගැනීමට තරම් වත්කමක් එකී කාන්තාවන්ට තිබේ නම්, ඒ සේවිකාව ලවා පේෂ කර්මාන්තායතනයෙන් නූල් ගෙන්වා රෙදි වියා ඈ ලවාම ආපසු යැවිය හැකි ය. එහෙත් එබඳු ශක්‍යතාවක් නොමැති කතුන්ට අවශ්‍ය සියලු විධිවිධාන බලධාරීන් විසින් සකස් කර තිබූ බව ප්‍රකට වේ.

ඒ අනුව පුරාතන ඉන්දියාවේ ආර්ථික ව්‍යුහය තුළ කුල කතුන්ගේ ශ්‍රමය භාවිතයට ගැනීමේ දී දැඩි කොන්දේසිවලට යටත්ව එකී ක්‍රියාවලිය හැසිරවීමට අධිකාරීන් ක්‍රියාකළ අයුරු ප්‍රකට වේ. මේ අනුව උසස් කුල කතුන් තම නිෂ්පාදන භාරදීමට හෝ එහි අවශ්‍යතා සඳහා පේෂ කර්මාන්ත ශාලාවට යා යුත්තේ අඳුර පහවෙමින් අරුණෝදය උදාවන විටය. ඒ එම කතුන් හඳුනාගැනීම එවිට දුෂ්කර වන බැවිනි. නිෂ්පාදන පරීක්ෂා කරන නිළධාරියා විසින් පහනක් පමණක් භාවිතයෙන් ඒවා පරීක්ෂා කළයුතු වූ අතර ඔහු ඇගේ මුහුණ දෙස බැලුවහොත් ඈ කළ කාර්ය ගැන හැර වෙනත් යමක් පිළිබඳව කතා කළහොත් පළමු වැනි දණ්ඩනයට ඔහු යටතේ විය යුතු ය. මේ දඩය පණ 48 සිට 90 දක්වා විය හැක.

මේ අනුව පුරාතන ඉන්දීය ආර්ථිකය තුළ උසස් කුල කතුන්ගේ ශ්‍රමය ද භාවිතයට ගෙන ඇත්තේ දැඩි නීතීන්ට අනුකූල වෙමිනි. මේ අනුව අතීතයේදී ද දකුණු ආසියාතික කාන්තාවක් ආර්ථිකමය වශයෙන් සිය දායකත්වය සැපයීමට යම්තාක් උත්සාහයක් දරා ඇති බව ඉහත ඓතිහාසික සාක්ෂි මත පදනම්ව කිව හැකිය.

දකුණු ආසියාතික කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය වර්ධනය වීමට බලපෑ හේතු කිහිපයක්

- **කාන්තාවගේ නිදහස සීමා කරමින් පනවා තිබූ විවිධ වාරණ ක්‍රමයෙන් ඉවත් වීම**

කාන්තා දායකත්වයක් නොමැතිව ආර්ථික සංවර්ධනයක් ලබා ගැනීම දුෂ්කර යැයි ලෝක බැංකුවේ කාන්තා ව්‍යවසායකත්වය සහ නීතිය පිළිබඳ 2018 වාර්තාව සඳහන් කරයි. එම වාර්තාව පවසන අන්දමට ලොව පුරා වෙසෙන බිලියන 2.7 ක් වූ කාන්තා පිරිසකට තමතමන් කැමැති අන්දමේ රැකියාවක් තෝරා ගැනීමට හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ තවම නිදහසක් නැත. විවිධ නීති රීති මඟින් ඔවුනට එම නිදහස අහිමි කර ඇත.

එහෙත් පසුගිය වසර තුළ රටවල් 67 ක් එවැනි නීති රීති වෙනස් කර කාන්තාවනට ව්‍යාපාරවල යෙදීමටත්, කැමැති වෘත්තියක් තෝරා ගැනීමටත් නිදහස උදා කර දී තිබේ. රටවල් 104 ක කාන්තාවනට ඉන්ධන, කෘෂි නිෂ්පාදන, ජලසම්පත් ගමනාගමනය සහ කර්මාන්ත නිෂ්පාදන යන ක්ෂේත්‍රයන්හි රැකියා කිරීමේ දී සහ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමේදී විවිධ වාර්තා පනවා ඇතැයිද එම වාර්තාව සඳහන් කරයි. කාන්තා ව්‍යවසායකත්වය පිළිබඳ වාර්තාවෙන් හෙළිවන්නේ කාන්තාවගේ නිදහස සීමා කරමින් පනවා තිබූ විවිධ වාරණ ක්‍රමයෙන් ඉවත්වූ බව දකුණු ආසියානු රටවල් මඟින් පෙන්වා දිය හැකි ය. මෙය කලාපයේ කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය වර්ධනයකි කිරීමට බලපෑවේ ය. නිදසුන් ලෙස, බංග්ලාදේශය කාන්තාවන් බරවැඩට යොදාගැනීම තහනම් කරන ලදී. එසේම ඇෆ්ගනිස්ථානය තම නීති රීති රාශියක් හඳුන්වා දෙමින් ව්‍යාපාර ආරම්භ කිරීමේ දී කාන්තාවන් දිරිමත් කිරීම් අරඹා තිබේ. එසේම සේවා ආයතනයන්හිදී සිදුවන ලිංගික හිංසන දඬුවම් ලැබිය යුතු වරදක් බවට නීතිගත කර දැඩි දඬුවම් හඳුන්වා දී ඇත

- **සංවිධාන සහ ආයතනික මට්ටමින් කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය වැඩිදියුණු කිරීමට උපකාර කිරීම**

මෙයට නිදසුන් ලෙස, ශ්‍රී ලංකාවේ කාන්තාවනට ව්‍යාපාරයක් ඇරඹීමට කිසිදු නීතිමය බාධාවක් නැත. ඇතැම් රටවල කාන්තාවනට ව්‍යාපාරයක් ඇරැඹීමට සැමියාගෙ නිසි අවසරයක් ලබා ගත යුතුය. දැනට ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ 10% කට පමණ කාන්තා ව්‍යාපාරික හිමිකාරිත්වය ඇතැයි කාන්තා ව්‍යාපාරික වෙළෙඳ මණ්ඩලය - උබෂක ප්‍රකාශ කර ඇත. උතුරු නැගෙනහිර කාන්තා වෙළඳ ව්‍යාපාර ආරම්භ කිරීම දැන් වැඩිව තිබේ. එම වාණිජ

මණ්ඩලය පවසන අන්දමට විවිධ ව්‍යවසායන්හි නියුතු සාමාජික කාන්තාවෝ 200 ක් පමණ එහි සාමාජිකත්වය හිමිකර ගෙන සිටිති. කෘෂි නිෂ්පාදන ඇතුළු විවිධ නිෂ්පාදකයන්ට සම්බන්ධ ඔවුනට ක්ෂුද්‍ර ණය පහසුකම් සැපයීම, පුහුණු පාඨමාලා සහ වෙළෙඳ ප්‍රදර්ශන අවස්ථා සැපයීම, එම වාණිජ මණ්ඩලයේ කටයුතු අතර මුල්තැනක් ගනී.

ආසියානු සංවර්ධන බැංකුව පසුගියදා ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්ව කටයුතු දියුණුව සඳහා ඇමරිකානු ඩොලර් දස ලක්ෂ 12.6 ක ආධාරයක් ලබාදීමට මැදිහත් විය. යුද්ධයෙන් පසු නිදහස් වූ මුලතිව් දිස්ත්‍රික්කයේ කාන්තා ව්‍යවසායක ව්‍යාපෘති කීපයක් ආරම්භ කළ අතර වදරී ප්‍රදේශයේ පාවහන් නිෂ්පාදනය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය අවශ්‍ය තාක්ෂණික උපදෙස් සපයන ලදී. මේ හැර බෙල්ලන් ඇති කිරීමේ ව්‍යාපාර, සත්ව පාලනය, රසකැවිලි කර්මාන්තය, තල් නිෂ්පාදන සහ පලතුරු යුෂ ඇසුරුම් කිරීමේ නිෂ්පාදන මෑත කාලයේ දී එම පළාත්හි ඇරැඹිණ. මේ ඇතැම් ව්‍යාපාර සඳහා විදේශීය ආයතන සමඟ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය ද එක්ව අවශ්‍ය ආධාර උපකාර කරනු ලැබේ.

- **ශ්‍රම සූක්ෂම කර්මාන්ත සඳහා පිවිසීමට කාන්තාවන්ට ඉඩකඩ ලැබීම**

ඇඟලුම් වැනි ශ්‍රම සූක්ෂම අංශ සඳහා ගෝලීය වෙළඳපොලට පිවිසීමේ ඇති විවෘතභාවය කලාපයේ කාන්තා සේවා නියුක්තිය කෙරෙහි විශාල බලපෑමක් සිදු කර තිබේ. 2012 ලෝක සංවර්ධන වාර්තාවට අනුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සංවර්ධනය ජාත්‍යන්තර හා කාන්තා රැකියා සඳහා ඇති විවෘතභාවය අතර දැඩි සම්බන්ධයක් තිබුණි.

ඇඟලුම් අපනයනයෙන් ගෝලීය බලාගාරයක්ව පැවති දකුණු ආසියාවේ එකම රට වන බංග්ලාදේශය තම කාන්තා ශ්‍රම බලකාය සහභාගිත්වය කිසිසේත්ම පහත වැටීමට ඉඩ නොදුන්නේය. චීනයේ ඇඟලුම් මිල 10% කින් වැඩි වීම නිසා ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා සේවා නියුක්තිය වර්ධනය වීය. පාකිස්ථානය 8% කින් ද, ශ්‍රී ලංකාවේ 7% කින් ද, ඉන්දියාවේ 5% කින්ද, බංග්ලාදේශයේ 4% කින් ද වැඩි විය.

- **කාන්තාවන්ට ද බලශක්තිය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව පුළුල් කිරීම.**

ග්‍රාමීය විදුලිබල සැපයුම් මගින් පවුල් වල ජීවන තත්ත්වය සහ යහ පැවැත්ම කෙරෙහි බලවත් ධනාත්මක බලපෑම් ඇති කළ හැකි අතර දේශීය ආර්ථික වර්ධනය කෙරෙහි ද ඉන් ධනාත්මක බලපෑමක් ඇති කරයි. බංග්ලාදේශය තුළ විදුලිබල සැපයුම් නොමැති පවුල් ඒකකවල කාන්තා ශ්‍රම සහභාගීත්වය, විදුලි බල සැපයුම ඇති පවුල් ඒකකවලට වඩා 7% කින් ඉහලය. පකිස්ථානයේ මෙම වෙනස 2% කින් වැඩි වීම නිසා කාන්තාවන්ට තවත් ප්‍රතිලාභ ගෙන දේ. ඔවුන්ගේ අධ්‍යන කටයුතු සඳහා වැය කළ හැකි කාලය මෙමගින් වැඩි වේ ජෛව බලශක්ති රැස්කිරීමේ කාලය ඉතිරිවෙයි. රෝගාතුර වීම නිසා කාන්තාවන්ට අහිමි වන කාලය අඩු වේ.

මීට අමතරව නව ආයෝජන අවස්ථාවන් ඇදගැනීම නිෂ්පාදන හා සේවාවන්හි නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම කාන්තාවන්ට නව රැකියා, හොඳ රැකියා සහ ප්‍රයෝජනවත් රැකියා අවස්ථාවන් ලබා ගැනීමට හැකිවීම යනාදී තවත් බොහෝ හේතුන් මත දකුණු ආසියාතික කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය වර්ධනය වී ඇති බව කිව යුතුය.

දකුණු ආසියානු කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය පිළිබද සිදුවී ඇති අධ්‍යයන

- **දකුණු ආසියාතික ආර්ථිකය තුළ කාන්තා බලගැන්වීම පිළිබඳ අධ්‍යයන**

දසාරති භූයන් (Dasharati Bhuyan) 2006 දී සිදුකරන ලද නව දිල්ලියේ කාන්තාවන් සවිබලගැන්වීම් (Women Empowerment( New Dehli) නම් වූ අධ්‍යයනය මඟින් කාන්තාවන් සමාජ හා ආර්ථිකමය වශයෙන් සවි බලගැන්වීමේ සංකල්පය නිර්වචනය කොට ඇත. මෙහිදී ඒ සඳහා නිශ්චිත ක්‍රමයක් තිබිය යුතු බව ඔහු හඳුනා ගනියි. කාන්තාවන් සවිබල ගැන්වීම තුළ ඔවුනට දියුණු වීමට පවතින ගැටළු සහ බාධක දුරැලීමට හැකිවන බව ඔහුගේ අදහසයි. ඔවුන් සමාජ ආර්ථික සහ දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම පුළුල් ක්‍රියාදාමයක් වන බව ඔහු දක්වයි. ගෝලීය ක්‍රියාවලිය තුළ කාන්තාවන්ට ලබා දෙන අයිතිවාසිකම් ඔවුන්ව බලගැන්වීමේ අවශ්‍යතාවය අවධාරණය කරන බව ඔහු දක්වා ඇත. කෙසේනමුත්

දකුණු ආසියානු කලාපයේ කාන්තාව සවිබලගැන්වීම පිළිබඳව මොහු සාකච්ඡා කරන්නේ ඉන්දියානු කාන්තාවන් ඇසුරින් පමණි. දකුණු ආසියානු කලාපයේ පවත්නා පීතෘ මූලිකත්වය සහ සංස්කෘතික සාධක මත කාන්තාව ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට ඇති අවස්ථා සීමා කොට ඇති බව මොහු දක්වයි. ඔහු මෙම අධ්‍යයනය මගින් දැක්වූ පුළුල් විග්‍රහය හේතුවෙන් කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සහභාගී වීමේ ප්‍රවණතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය දැඩි සේ මතු කළ බව දක්වා ඇත (Ali Abbas 2019)

- **දකුණු ආසියාතික කාන්තාවන්ට ආර්ථික දායකත්වය ලබාදීමේ දී මුහුණ පෑමට වන ගැටලු පිළිබඳ අධ්‍යයන**

ජැකී වෙස්ට් (Jackie West) හා සොෆී පිල්ග්‍රිම් (Sophie Pilgrim) 1995 දී සිදුකරන ලද දකුණු ආසියානු කාන්තාවන් රැකියා නියුක්තියඃ සංක්‍රමණය, ජනවාර්ගික සම්භවය සහ දේශීය ආර්ථිකයේ බලපෑම් (South Asian women in employment: The impact of migration" ethnic origin and the local economy) මෙමගින් දකුණු ආසියානු කලාපයේ සිට වෙනත් රටවල්ට සංක්‍රමණය වන කාන්තාවන් නිරත වන රැකියා හා එම රැකියා තුල කාන්තාවන් මුහුණ දෙන ගැටලු හා තත්ත්වයන් පිළිබඳව අවධාරණය කොට ඇත විශේෂයෙන්ම මෙහිදී බ්‍රිතාන්‍ය තුළ වෙසෙන බංග්ලාදේශ ජාතික පාකිස්තානු ජාතික සික් ජාතිකය ගුජරාටි ජාතික කාන්තාවන් දෙස අවධානය යොමු කරමින් ඔවුන්ගේ රැකියා සහ ශ්‍රම වෙළෙඳපොළ තුළ තත්වය පිළිබඳව දත්ත ද ඉදිරිපත් කොට ඇත මේ තුළ ඔහු අවධාරණය කරන්නේ අනාගතයේ දී මෙකී කාන්තාවන්ට රැකියා වෙළඳපොළ තුළ විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවන බවය විශේෂයෙන්ම ජාතිවාදය මත පැනනැගුනු ගැටළු සඳහා මොවුනට මුහුණපෑමට සිදුවන බව ඔහු දක්වයි (West & Pilgrim 1995)

ස්ටූවන් අදිකාරම් හා කෙලාසපති විසින් 2015 දී සිදුකරන ලද දකුණු ආසියාවේ ස්ත්‍රී පුරුෂ භාවය (තුළ) සමානාත්මතාවයඃ ගැටලු, බලාපොරොත්තු සහ මාර්ග (Gender Inequality in South Asia: Problems,Prospects and Pathway) නම් වූ අධ්‍යයනය මගින් දකුණු ආසියාවේ විවිධ අංශවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සාකච්ඡා කොට ඇත ඉන් ආර්ථික අංශ තුළ ද පවතින ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ගැටලු පිළිබඳවසාකච්ඡා කොට ඇත.

මෙමගින් ජාතික හා ප්‍රාදේශීය ශ්‍රම වෙළඳපොලවල්, ජාතික ව්‍යවස්ථාදායක රාමු සහ සමාගම් සහ සංවිධාන තුළ සමානකම් සහ අසමානකම් පරීක්ෂා කරන අතර කාන්තාවන් විෂමජාතික කණ්ඩායමක් ලෙස මෙම ආයතනවල සලකන බව පිළිගනී. තවද, ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ පකිස්ථානය නියෝජනය කරමින් මෙහි තොරතුරු රැගෙන ඇත (Strachan & Adikaram, Kailasapathy, 2015).

- **ආර්ථිකයේ අංශ සඳහා දකුණු ආසියානු කාන්තාවන්ගේ දායකත්වය පිළිබඳ අධ්‍යයන**

හස්වතී භට්ටාචාර්‍ය (Bhaswati Bhattacharya) හා මුන්මුන් ඝොෂ් (Munmun Ghosh) 2009 දී සිදුකරන ලද කෘෂිකර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා දකුණු ආසියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සහභාගීත්වය විශ්ලේෂණය (Participation analysis of south Asian rural women towards sustainable development in agriculture) නම් වූ අධයයනය මගින් දක්වා ඇත්තේ සාක් සංවිධානය ප්‍රමුඛ රටවල් පහක් වන බංග්ලාදේශය, ඉන්දියාව, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව තුළ කෘෂිකර්මාන්තය සඳහා කාන්තාවන් සහභාගී වීමේ ප්‍රවණතාවයයි.

මෙහිදී දකුණු ආසියාවේ කෘෂිකාර්මික කාන්තා ජනගහන අනුපාතය (WPR) විශ්ලේෂණය කෙරේ. සාර්ක් රටවල ආර්ථික වශයෙන් ක්‍රියාකාරී කාන්තා කෘෂිකාර්මික ජනගහනය ධූරාවලියක් ලෙස මෙහිදී සලකා බලා ඇති. එසේම සාක්ෂරතාව ඉහළ නැංවීමේදී කාන්තා කෘෂිකාර්මික ජනගහනය කෙරෙහි ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා විශ්ලේෂණයක් ද සිදු කර ඇත **(Bhattacharya & Ghosh, 2009)**

- **දකුණු ආසියානු කාන්තාවන්ට ආර්ථික දායකත්වයට ඇති අවස්ථා පිළිබඳ අධ්‍යයන**

චැරිටි ට්‍රෝයර් මුවර් (Charity Troyer Moore) හා වෙස්ටල් මැකින්ටයර් (Vestal McIntyre) 2017 දී සිදුකරන ලද කාන්තාවන්ගේ ආර්ථික අවස්ථාඃ දකුණු ආසියානු රටවලට එකිනෙකාගෙන් ඉගෙනගත හැක්කේ මොනවාදැ? යන අධ්‍යයනය මගින් දකුණු ආසියානු රටවල කාන්තාවන් ආර්ථික දායකත්වයේ අඩුපාඩු මෙන් ම

නව ප්‍රවණතා ද දක්වා ඇත. උදාහරණයක් වශයෙන්, ඉන්දියාවේ කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ ඇමතුම් මධ්‍යස්ථාන තුළ රැකියා ලබා ගත හැකි වීම නිසා ගැහැනු ළමයින් වසර ගණනක් පාසැලේ ගත කිරීමට හා විවාහය සහ දරුවන් ලැබීම ප්‍රමාද කිරීමට හේතු වූ බවය. බංග්ලාදේශයේ කරන ලද අධ්‍යයනයකින් ඇඟලුම් කර්මාන්තයේ රැකියා ලැබීමෙන් සමාන ප්‍රතිඵල ලැබුණි. පවුල් ජීවිතය ප්‍රමාද කිරීමෙන් එහි ප්‍රතිලාභ ලැබේ: පසු කලෙක විවාහ වන විට කාන්තාවන්ට ගෘහස්ථ හිංසනයට මුහුණ පෑමට සිදු නොවන අතර පසුව දරුවන් ලැබීමේදී සෞඛ්‍ය අවදානම අඩු වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ ගැහැණු උපයන්නෙකු සිටින පවුල් දරුවන් සඳහා වැඩිපුර ආයෝජනය කරන බව දක්වා ඇත (Moore McIntyre 2017).

මේ අයුරින් දකුණු ආසියාතික රටවල කාන්තා ආර්ථික දායකත්වය පිළිබඳ අධ්‍යයන දැක්විය හැකි ය.

## 2. වත්මන් දකුණු ආසියානු රටවල් කිහිපයක කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය

මෙහිදී කලාපයේ කාන්තා ආර්ථික දායකත්වය පහල රටවල් ද්විත්වයක් වන ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල් ද, කලාපයේ කාන්තා ආර්ථික දායකත්වය ඉහලම රටවල් ද්විත්වය වන නේපාලය හා භූතානය යන රටවල් ද ඇසුරු කොටගනිමින් මේ පිළිබඳව විමසා බැලීම සිදු කෙරෙන බව මූලිකවම සඳහන් කළ යුතු ය.

### 2.1 ඉන්දියානු කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය

ඉන්දියාව ගෝලීය ආර්ථිකයේ බලවතෙකි. ඉන්දියාව ලොව විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී සහ වේගයෙන් වර්ධනය වන ආර්ථිකයක් වන අතර විවිධ සමාජ ආර්ථික පසුබිම් වලින් හා සංස්කෘතීන්ගෙන් යුත් බිලියන 1.2 ක ජනතාවක් වාසය කරයි. දරිද්‍රතාවය අවම කිරීම, අධ්‍යාපනය සහ ක්ෂය රෝගය තුරන් කිරීම අතින් රට හොඳ දියුණුවක් ලබා ඇති නමුත් අසමානතාවය වැඩි වීම සාගින්න, මාතෘ මරණ වර්ධනය වීම ජලය සහ සනීපාරක්ෂාව සඳහා අවම ප්‍රවේශයක් තිබීමඉන්දියාවේ දැකිය හැක. මෙහි ශ්‍රම වෙළඳපොල තුළ කාන්තා සහභාගීත්වය බෙහෙවින්ම අඩු වන අතර පසුගිය වසර කිහිපය තුළ දපැවති කාන්තා ශ්‍රම බලකායද පහත වැටෙමින් තිබේ. ස්ත්‍රී ශ්‍රම බලකා අනුපාතය 0.36 ක් පමණි. කාන්තාවන්ගේ වැඩ වර්ග කිරීම ,

පීතෘමූලිකත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් සහ කාන්තාවන් ඒකවරණය පිළිබද ගැටළු හා අදාළ වැටුප් සහිත වැඩවල යෙදීමට දැනුමක් නොමැතිකම නිසා මෙම තත්වය තවත් උග්‍ර වේ (Womenzs Economic Empowerment in India,no year).

ඉන්දියාව පුරාම විශාල සමාජ බෙදීම් පවතින අතර සෞඛ්‍ය,ආර්ථිකය අධ්‍යාපනය, සාක්ෂරතාවය ඇතුළු බෙහෝ අංශවල ස්ත්‍රී පුරුෂ සමාජ අසමානතාවය බහුලව දක්නට ලැබේ. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ඉහළ නැංවීම සඳහා ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකු කටයුතු කරමින් සිටින නමුත් කාන්තාවන් ඉලක්ක කරගත් සංවිධාන ප්‍රතිශතය ඉතා අඩු ය. එරට කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ඇති ප්‍රතිපත්ති බෙහෙවින් සීමා වී ඇත කෙසේ වෙතත්, කාන්තා සවිබල ගැන්වීම වැඩි කිරීම සඳහා රජයේ වැඩසටහන් කිහිපයක් හැරුණු විට, කාන්තා අයිතිවාසිකම් සහ වැඩකටයුතු පිළිබඳ පර්යේෂණ සහ මාර්ගෝපදේශන මේ වන විට එරට ඉහළ යමින් පවතින අන්දමක් දැකිය හැකිය.

ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදිතය 7% ට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින් 2017 දී ලොව වේගයෙන් වර්ධනය වන ප්‍රධාන ආර්ථිකය ලෙස ඉන්දීය ආර්ථිකය හදුනා ගන්නා ලදි. ඉන්දියාවේ කාන්තාවන් සඳහා, 2017 වසර තවත් හේතුවක් නිසා වැදගත් විය එනම් නිදහසින් පසු ඉන්දියාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය අවම මට්ටමකට පහත වැටුණු වසර වීම හේතුවෙනි. ලෝක බැංකුව 2017 දී සඳහන් කරන්නේ ගෝලීය වශයෙන් පහළම ඣඛඣජසෲ - ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඇති රටවල් අතර ඉන්දියාව සිටින බවය **(Prabhu & Singh,no year)**.

මෙය හදිසියේ සිදු වූවක් නොවේ. පසුගිය දශක හත තුළ එරට ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ සහභාගීත්වයේ අඛණ්ඩ අඩුවීමක් පෙන්නුම් කර ඇත. 1972-73 දී එරට ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 33% දක්වා ඉහළ ගිය අතර 1999-00 දක්වා එය 26% දක්වා පහත වැටීමක් පෙන්නුම් කළේය. 2017-18 දී 17.5% ක් සනිටුහන් වූ අතර එය ඉතිහාසයේ අඩුම අගයයි. දැනට පවතින ඇස්තමේන්තුවලට අනුව, ඉන්දියාවේ කාන්තා සහභාගීත්ව අනුපාතය 24% ක් වුවද එය අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් හා ගත් කළ අවම අගයකි . පසුගිය වසර කිහිපය තුළ

බොහෝ කාන්තාවන් ශ්‍රම වෙළඳපොලෙන් ඉවත් වී ඇත, නැතහොත් සමාජ ප්‍රතිලාභ නොමැතිව සහ විශාල වැටුප් වෙනස්කම් වලින් අඩු වැටුප් සහිත රැකියා වල නිරත වෙති. නිදසුන් ලෙස, රටේ අනෙකුත් අංශ සමඟ සංසන්දනය කිරීමේදී මෙන්ම අනෙකුත් රටවල නියෝජනය වන අංශ හා සසඳන විට මෙරට තොරතුරු තාක්ෂණ අංශය සඳහා කාන්තා සහභාගීත්වය ඉහළ ය. 1990 ගණන් වල සිට ඉංජිනේරු අධ්‍යාපනයට කාන්තාවන්ගේ සහභාගීත්වය ඉහළ යාම සහ පෞද්ගලික ඉංජිනේරු විද්‍යාල වර්ධනය වීම එරට තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වර්ධනයකට හේතු විය.

මෙම කර්මාන්තය 2011-2012 තුළ රැකියා 230,000 ක් ද 2017-2018 දී 105,000 ක් ද එකතු කර ඇත කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ සේවාවන්හි ප්‍රාග්ධනය 2017-2018 වර්ෂයේදී 27.25% කින් වර්ධනය වී තිබේ. තවද, 2013 දී ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.4% සිට 2017 දී 6.9% දක්වා වර්ධනය වීය. තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙන් මෙරට ලබන ආදායම 2013 සහ 2018 ලෝක බැංකු සංඛ්‍යාලේඛනවලට අනුව 9.5% කින් වර්ධනය වී තිබේ.

ඉන්දියානු කාන්තාවන්ගෙන් බහුතරයක් අවිධිමත් අංශයේ සීමිත සමාජ ආරක්ෂක හා අඩු වැටුප් සහිත රැකියා වල නියුතු අය වෙති. ලොව ඕනෑම ජාතියකට වඩා කාන්තාවන්ට ආර්ථික වශයෙන් සහභාගී වීමේ වැඩි වාසියක් ඉන්දියාවෙන් ලැබෙන බව එම රජය පිළිගනී. මෑතකදී, ඉන්දියානු රජය විසින් ස්ත්‍රී පුරුෂභාවය සැලකිල්ලට ගත් ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අතර ඉන් එරට කාන්තාවන්ට ආර්ථිකයට දායක වීමට සහයක් ලැබිණි. (රජය විසින් පුරුෂයින්ට හා කාන්තාවන්ට සමාන වැටුප් ලබා දිම අවශ්‍ය බවත්, වැඩබිම්වල කාන්තාවන්ගේ ළමුන් සුරැකීමට විධිවිධානත් ඇතුළත්කර පුළුල් සේවක ආරක්ෂණ වැඩසටහනක් දියත් කළේ ය.)

ඉන්දියානු ආර්ථිකයේ වර්ධනය සඳහා කාන්තාවන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් 17-18% ක් පමණ කාන්තාවන් දායක වන බව ගණන් බලා ඇත. කෘෂිකර්මාන්තය හා කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත හේතුවෙන් ඔවුන් ශක්තිමත්ව සිටියද, ඉන්දියාවේ වේගවත් නාගරීකරණය තවමත් වැඩිපුර කාන්තාවන් ශ්‍රම බලකායට බැඳීමට උනන්දු කර නැත. දැනට

ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට කාන්තා දායකත්වය අඩුම රටක් ලෙස ඉන්දියාව දැක්විය හැක.

කෙසේවෙතත් විධිමත් ආර්ථිකය තුළ පිරිමින් හා සමාන අනුපාතයකින් කාන්තාවන් නියෝජනය කරන්නේ නම් ඉන්දියානු ආර්ථිකය 2025 වන විට 60% ක් දක්වා වර්ධනය විය හැකි බවට ගණන් බලා ඇත මේ අයුරින් ඉන්දීය ආර්ථිකය තුළ කාන්තා දායකත්වය පිළිබඳ තත්වය දැක්විය හැක.

### 2.1.1. ඉන්දීය කාන්තාවන් ආර්ථික සංවර්ධනයට දායක වන අංශ කිහිපයක්

#### 2.1.1.1. කෘෂිකර්මාන්තය

ඉන්දියාවේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයට බැඳී ඇති ජාතික සම්ප්‍රදායක් ඇත. උතුරේ ඉන්දු නිම්නය සහ බ්‍රහ්මපුත්‍ර කලාපය හා ගංගා නිම්නයෙන් සමන්විත කෘෂිකාර්මික ප්‍රදේශ මෙරට වේ. 2011 ලෝක බැංකු දත්ත මත පදනම්ව කෘෂිකාර්මික නිෂ්පාදනය හරහා සපුරා ඇත්තේ ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 17.5% ක් පමණි. එය රටේ බහුතරයක් සඳහා ජීවන මාර්ග වී ඇත ග්‍රාමීය ඉන්දියාවේ වෙසෙන බිලියන 1.1 ක ජනතාවගෙන් 72% කගේ ජීවන වෘත්තියද මෙය වේ. නිදසුන් ලෙස ඉන්දියාවේ හිමාචල් ප්‍රදේශ් ප්‍රාන්තයේ කුලු නගරය ආසන්නයේ පිහිටි එළවළු බිම්වල ගොවීන් සිය වගා කටයුතු සිදු කරනු ලැබේ. පෙරදී මෙම ප්‍රදේශය ඉහළ වටිනාකමකින් යුත් ඇපල් නිෂ්පාදනය කරන පුදේශයක් වූ නමුත් පසුගිය දශක කිහිපය තුළ උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් ඇපල් නිෂ්පාදකයින්ට තම අස්වැන්න අතහැර දැමීමට සිදු විය. එබැවින් මෙම ගොවීන් එළවළු නිෂ්පාදනයට මාරුවීය. මේ නිසා ඔවුනගේ ආදායම් හා ජීවනෝපාය මාර්ග විශාල වශයෙන් වර්ධනය වී ඇත (Women in agriculture in India, 2021).

ඉන්දියාවේ කෘෂිකර්මාන්තය සම්ප්‍රදාය, සමාජ සම්බන්ධතා සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ භූමිකාවන් අර්ථ දක්වයි. සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රම හරහා කෘෂිකාර්මික අංශයේ කාන්තාවන් නියෝජනය කරන්නේ ඉතා වැදගත් ජන විකාශන සමූහයකි. ආර්ථික ස්වාධීනත්වය, තීරණ ගැනීමේ හැකියාව, සහ අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට නොහැකියාව වැනි ගැටලු සමඟ කෘෂිකර්මාන්තය සෘජුවම බැඳී ඇති අතර දුප්පත්කම සහ කොන්

කිරීම වැනි බාහිර ගැටළු ද මොවුනට ඇති වී තිබීම ස්ත්‍රී - පුරුෂ සමාජ අසමානතාවයේ සංකීර්ණ බව විදහා දක්වයි.

ඇස්තමේන්තුගත කර ඇති පරිදි කෘෂිකර්මාන්තයේ නියැලෙන ඉන්දියානු කාන්තාවන්ගෙන් 52%-75% ක් පමණ නූගත් වන අතර එමඟින් කාන්තාවන්ට පුහුණු ශ්‍රමික අංශවලට සහභාගී වීම වළක්වයි. මොවුනගේ සෑම ආර්ථික ක්‍රියාකාරකම සාමාන්‍යයෙන් ස්ත්‍රී පුරුෂ වැටුප් විෂමතාවක් පවතින අතර පිරිමින්ගේ වැටුපෙන් කාන්තාවන් උපයන්නේ 70% ක් පමණි (එම). ඊට අමතරව බොහෝ කාන්තාවන් වැටුප් රහිත යැපුම් ශ්‍රමය ලෙස කෘෂිකාර්මික වැඩ සඳහා සහභාගී වෙති.

කෘෂිකාර්මික වෙළඳපොලේ වර්ධනය හා ස්ථායීතාව මත යැපීම, රැකියා සංචලනය හා අධ්‍යාපනයේ හිඟකම හේතුවෙන් ඉන්දියාවේ බහුතරයක් කාන්තාවන් අවදානමට ලක් වේ.

2018 දී ඉන්දියානු රජය සිදු කළ ආර්ථික සමීක්ෂණයේදී කෘෂිකාර්මික අංශය ස්ත්‍රීකරණයට භාජනය වන බව සඳහන් කළ අතර මෙම යෙදුම භාවිතා කරන කාන්තාවන් විශාල සංඛ්‍යාවක් ව්‍යවසායකයින්, වගා කරන්නන් සහ කම්කරුවන් වශයෙන් කෙතරම් වැඩි වැඩියෙන් සිය භූමිකාවන් භාර ගනිමින් සිටිනවාද යන්න දැක්වේ. මේ වන විට ඉන්දියාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී කාන්තාවන්ගෙන් 80% ක් කෘෂිකාර්මික අංශයේ සේවය කරන අතර එයට ස්වයං රැකියා කරන ගොවීන්ගෙන් 48% ක් සහ කෘෂිකාර්මික ශ්‍රම බලකායෙන් 33% ක් ඇතුළත්ය (එම). පසුගිය දශකය තුළ බොහෝ ගෝලීය ආර්ථිකයන් ද ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ දේශීය කෘෂි ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා කාන්තාවන් ඉටු කරන තීරණාත්මක කාර්යභාරය පිළිගෙන තිබේ.

මෑත වසර කිහිපය තුළදී තත්ත්වය යහපත් වූවත්, මෙම අංශයේ කාන්තාවන්ගේ ජයග්‍රහණය සඳහා සහයෝගය අවශ්‍ය අංශ කිහිපයක් තිබේ.

ඉන්දියාවේ කාන්තා කෘෂි ව්‍යවසායිකාවන් මුහුණ දෙන අභියෝග රැසකි. කෘෂිකර්මාන්තය සහ ඒ ආශ්‍රිත අංශවල ස්වයං රැකියා කරන ව්‍යවසායකයින් ලෙස 25% ක් පමණ කාන්තාවන් සහභාගී වුවද, බොහෝදුරට ඔවුන් ගොවීන් ලෙස නොසැලකීම කණගාටුවට කරුණකි. බොහෝවිට ඉන්දියාව තුළ කාන්තාවන්ට තමන් වගා කරන ඉඩම පවා අයිති නැති විය. ඉන්දියානු මානව සංවර්ධන

සමීක්ෂණයට අනුව, රටේ කෘෂිකාර්මික ඉඩම් වලින් 83% ක්ම පුරුෂයින් විසින් උරුම කරගෙන තිබේ.

මෑත වසර කිහිපය තුළදී කෘෂිකර්මාන්තය, ව්‍යාපාර, ව්‍යවසායකත්වය සහ නිපුණතා සංවර්ධනයේ විවිධ අංශ පිළිබඳව පුහුණුව ලබා ගැනීම සඳහා කාන්තාවන් එක් කර ගැනීම අරමුණු කරගත් මහිලා කිසාන් ශක්තිකරන් පරියෝජනා (එණීෂ) සහ දීන්දයාල් අන්‍යෝදය යෝජනා-ජාතික ග්‍රාමීය ජීවනෝපාය මෙහෙවර වැනි වැඩසටහන් ඉන්දියානු රජය විසින් මෑතක සිට ආරම්භ කර ඇත. කාන්තාවන් ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් ද කෘෂි ආර්ථික අංශය හඳුන්වා දී ඇත.

### 2.1.1.2. ස්වයං රැකියා අංශය

1993 - 1994 සහ 2017 - 2018 කාලය තුළ කෘෂිකර්මාන්තයේ රැකියාවල නියුතු ග්‍රාමීය කාන්තා ශ්‍රමිකයින්ගේ ප්‍රතිශතය 13% කින් අඩු විය. අනෙක් පැත්තෙන්, කෘෂිකාර්මික නොවන අංශයේ රැකියා මඟින් 2009 - 2010 හැර මේ වන විට ඉන්දියාවේ ග්‍රාමීය කාන්තා ශ්‍රම බලකාය වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. ඉන්දියාවේ නාගරික ප්‍රදේශවල, 1993 - 1994 සහ 2017 - 2018 කාලය තුළ කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන රැකියාවල පිළිවෙලින් 6 % සහ 5 % කින් කාන්තා ශ්‍රම බලකාය පහල යෑමක් සිදුව ඇත.

### 2.1.1.3.අවිධිමත් අංශය

ගෝලීය වශයෙන් ගත් කළ , ජනගහනයෙන් බිලියන දෙකක් වයස අවුරුදු 15 ට අඩු අවිධිමත් ආර්ථිකය තුළ නිරත පිරිස් ය ඔවුන් ඒ තුළ වසරක් හෝ ඊට වැඩි කාලයක් සේවය කරයි ලොව රැකියා අංශවලින් 61.2% ක් මෙම අංශය නියෝජනය කරයි. ඉන්දියාවේ අවිධිමත් අංශයේ නිරත කාන්තා සේවකයින්ගේ ප්‍රතිශතය පිරිමින් හා සසඳන විට වැඩිය. ජාත්‍යන්තරය කම්කරු සංවිධානයේ 2018 - ILO වාර්තාවේ සටහන්වලට අනුව මෙම අවිධිමත් රැකියාවල නිරත පිරිස කලින් කලට වෙනස් අගයන් ගනී . අවිධිමත් අංශයට යොමු වීම නිසා මෙරට කාන්තාවන් ද්විතියික අධ්‍යාපනයට පිවිසීමට ඇති ඉඩකඩ අඩුය.

දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යාම සහ ඉන්දියානු ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වුවද, ඉන්දියාවේ කාන්තා රැකියාවල ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක දියුණුවක් නොමැත.

සංඛ්‍යාත්මකව ගත් කල, එරට කාන්තා ශ්‍රම සැපයුම පහත වැටී ඇත. කාන්තා ශ්‍රම බලකායේ අඩුවීම බොහෝ දුරට ග්‍රාමීය ප්‍රදේශවලින් වාර්තා වන අතර වයස අවුරුදු 15 - 29 අතර වයස් කාණ්ඩවල කාන්තාවන් අතරින් මෙව වැඩිපුර වාර්තා වී ඇත. නමුත් ඉන්දියාවේ කෘෂිකර්මාන්තය තවමත් කාන්තා ශ්‍රමය වැඩි වශයෙන් පවත්නා අංශය ලෙස දැක්විය හැකි ය. වෙළඳාම, ප්‍රවාහන හා වෙනත් සේවාවන්හි රැයාවන්ට ද මේ වන විට වැඩි වැඩියෙන් කාන්තාවන් සහභාගී වීම දක්නට ලැබෙන හෙයින් එය ඉන්දීය ආර්ථිකයට යහපතක් වනු ඇත (එම).

ඉන්දියාවේ කාන්තාවන්ගේ ශ්‍රමයේ ගුණාත්මකභාවය දුර්වල බවට අධ්‍යයන මඟින් සොයාගෙන ඇත. කෘෂිකාර්මික අංශයේ ශ්‍රම බලකාය වැටුප් කම්කරුවන් ලෙස සංකේන්ද්‍රනය කිරීම, අඩු වැටුප්, විශාල පරිමාණයේ අවිධිමත් රැකියා, සාක්ෂරතා මට්ටම් සහ බොහෝ ස්වයං රැකියාවල නියුක්ත කාන්තාවන් වැටුප් රහිත ශ්‍රමිකයින් වීම ශ්‍රම වෙළඳපොල කාන්තාවන්ට අවාසි සහගත වීම සහ ආර්ථික විෂමතාවය මෙයට හේතු වේ. රටක ආර්ථික දියුණුව රඳා පවතින්නේ කාන්තාවන්ගේ ශ්‍රම සහභාගීත්වය මතය. ඊට අමතරව, ජන විකාශන ලාභාංශයේ ප්‍රතිලාභ ලබා ගැනීම සහ ආර්ථික සවිබල ගැන්වීම සඳහා කාන්තාවන් ශ්‍රම වෙළෙඳපොළට සහභාගී වීම වැදගත් වේ.

කාන්තා ශ්‍රම සැපයුම වැඩි දියුණු කිරීමට ප්‍රමාණවත් පියවර නොගන්නේ නම්, කාන්තාවන්ගෙන් විශාල ප්‍රමාණයක් රැකියා බලකායෙන් බැහැරව සිටීමේ හැකියාවක් පවතින අතර මෙය ඉන්දියාව තුළ දැකිය හැකි තත්වයයි. ග්‍රාමීය හා නාගරික කාන්තාවන් අතර රැකියා වියුක්තිය වර්ධනය වීම පිළිබඳ ගැටලුව විසඳීමට ඉන්දියාව මූලික පියවර ගැනීම අවශ්‍යය. ඉන්දියාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයේ වර්ධනය උත්තේජනය කිරීම සහ දිගුකාලීන ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා නිෂ්පාදන අංශයේ රැකියා ඉලක්ක කරගත් සංවර්ධන උපාය මාර්ගයක් අවශ්‍ය වේ.

ඉන්දියාවේ ද්විතීයික පාසල් අධ්‍යාපනයෙන් ඔබ්බට වූ අධ්‍යාපනය කුසලතා, පුහුණුව හා සංවර්ධනය සමඟ ප්‍රවර්ධනය කළ යුතු අතර එමඟින් කාන්තාවන්ගේ වෘත්තීය තෝරා ගැනීම් ඉහළ නංවන අතර කාන්තා ශ්‍රමයේ ගුණාත්මකභාවයද වැඩිදියුණු කළ හැකිය. මෙරට ළමා රැකවරණය, ප්‍රවාහන, ජලය සහ සනීපාරක්ෂාව

වැනි මූලික යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමෙන් ගෙවන වැඩ සඳහා ඇති කාලය වැඩි කිරීමෙන් කාන්තා ශ්‍රම සැපයුම ඉහළ නැංවීමට හැක. ඒ සියල්ලටම වඩා, පවුල හැර ආර්ථිකයේ තම ශ්‍රමයේ වැදගත්කම පිළිබඳව කාන්තාවන් අතර දැනුවත් කිරීමක් ඇති කළ යුතුය. ගෘහස්ත වැඩවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය බිඳ දැමීම සඳහා ද උත්සාහයන් අවශ්‍ය වේ. ඉන්දියාවේ කොවිඩ් -19 තත්වය හේතුවෙන් එරට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය වර්තමානයේ පසුබෑමට ලක්ව ඇත රටේ වැඩිවෙමින් පවතින රැකියා වියුක්තිය හේතුවෙන් කාන්තාවන්ගේ ශ්‍රම සැපයුම ඉහළ යාම එරට කාන්තාවන්ට ආර්ථික අසහනයක් ද ඇති කොට ඇති බවට මාධ්‍ය වාර්තා කොට ඇත.

## 2.2. ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ දායකත්වය කැපී පෙනේ. මෙයට වසර ගණනාවකට පෙර අප රටේ විධිමත් අංශයේ රැකියා සහ වෘත්තීමය අවස්ථා හිමිව පැවතියේ පිරිමි පාර්ශවයට පමණි. නමුත් මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය කැපී පෙනෙන මට්ටමකට පිවිස ඇත. ලංකාවේ ගුරු වෘත්තිය, හෙද සේවය වැනි බොහෝ වෘත්තීන්වල බහුලව යෙදී සිටින්නේ කාන්තාවන්ය. එමෙන්ම ලංකාවේ කාන්තාවන්ට සිදු කිරීමට අපහසු යැයි බොහෝ දෙනා පවසන වරාය ගුවන් හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ද රැකියාවන් සඳහා කාන්තාවන් මෙම දශකය තුළ යොමු වී ඇත.

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයේ ස්වරූපය පුළුල් වපසරියක විහිදී ඇති නමුත් පසුගිය වසර හය හතක කාලය දෙස බලන විට, ශ්‍රී ලංකාවේ ආර්ථිකය එතරම් සුභදායී නොවුණු ආකාරයක් දක්නට ලැබුණි. 2013 ට පසු කාලය ලංකාවේ ආර්ථිකය දිගින් දිගටම පහළ බැස තිබුණු ආකාරයක් දක්නට ලැබුණි. 2013 වර්ෂයේ 3.4% වන ආර්ථික වර්ධන වේගය, 2015 වන විට 4.5% ක සීමිත වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2019 වන විට එම ආර්ථික වර්ධන වේගය 2.3% දක්වා පහළ ගොස් 2020 වන විට 1.9% ක් දක්වා තවත් පහළට ගමන් කරන්නට විය. සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය දෙස බලන විට 2019 ට පෙර අපේ රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය සහ ආර්ථික

කළමනාකරණය තුළ තිබුණු ගැටලු නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය දිගින් දිගටම පහල වැටුණි.

ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්වය නගාසිටුවීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර අවධානය යොමු කළ යුතු සේම, ඊට ප්‍රථමයෙන් මේ වන විට ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්තිය පවතින ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් ය. ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කර බැලීමේදී ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්ති සහභාගිත්වය ඉතාමත් අඩු මට්ටමක පවතී.

ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්ති සහභාගිත්ව අනුපාතිකය 35% ක මට්ටමක පවතින අතර ශ්‍රී ලංකාවේ පිරිමි සේවා නියුක්ති සහභාගිත්ව අනුපාතිකය 73% ක මට්ටමක පවතී. මෙසේ බලන විට ශ්‍රී ලංකාවේ කාන්තා සහ පිරිමි දෙවර්ගයේම සේවා නියුක්ති සහභාගීත්වය 52% ක මට්ටමක පවතී. වෙනත් රටවල් හා සසඳා බැලීමේදී ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්ති සහභාගිත්ව අනුපාතිකය ඉතා අඩුය . මැලේසියාවේ 55%, තායිලන්තයේ 58%, ඔස්ට්‍රේලියාවේ 59%, ජපානයේ 52%, ඇමරිකාවේ 52%ක් වශයෙන් ලෝකයේ විවිධ රටවල කාන්තා සේවා නියුක්ති සහභාගීත්වයක් දක්නට ලැබේ. මේ පිළිබඳ විමසීමේදී ලෝකයේ විවිධ රටවල කාන්තා සේවා නියුක්ති සහභාගිත්වය 50%කට වඩා ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ පවතින 35% වන කාන්තා සේවා නියුක්තිය ඒ තරම් සුබදායී තත්ත්වයක් නොවේ.

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයම කෘෂිකාර්මික, කාර්මික සහ සේවා ත්‍රිත්වයේ එකතුවෙන් නිර්මාණය වී තිබේ. ලංකාවේ කෘෂිකර්මික අංශයේ කාන්තා සේවා නියුක්තියෙන් 28% ක් යෙදී සිටින්නේ කෘෂිකාර්මික අංශයෙනි. තව ද ශ්‍රී ලංකාවේ කාන්තා සේවා නියුක්තියෙන් 26%ක් කාර්මික අංශයෙහි ද, කාන්තා සේවා නියුක්තියෙන් 46% ක් සේවා අංශයෙහි නිරත වී සිටී. බොහොමයක් රටවල සේවා අංශය තුළ කාන්තා සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතී. කෘෂිකාර්මික සහ කාර්මික අංශවල වැඩ අධිකභාවය සහ දැඩිභාවය හේතුවෙන් කාන්තා සේවා නියුක්තිය සීමිතව පවතී. නමුත් සේවා අංශය තුළ කාන්තා සේවා නියුක්තිය ඉහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ අනෙකුත් රටවල සේවා අංශය වර්ධනය කළවිට කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවිය හැකිය. ලංකාවේ සේවා වියුක්තිය දෙස බලන විට 5.7% ක

මට්ටමක පවතී. එවැනි තත්ත්වයක කාන්තා සේවා වියුක්තිය 10% කට ආසන්නව පවතී. ලංකාවේ කාන්තාවන් අතර සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතී. කාන්තා සේවා වියුක්තියෙන් 55% ක් පමණ සිටින්නේ 15- 29 වයසේ කාන්තාවන් ය. එය ඉතාමත් අවාසනාවන්ත තත්වයකි. මොවුන් සක්‍රීය වශයෙන් ආර්ථිකයට දායක විය හැකි අවදියේදී සේවා වියුක්තිකව සිටී.

ශ්‍රීලංකාවේ කාන්තා සේවා වියුක්තිය අඩු කර කාන්තා සේවා නියුක්තිය වැඩි කිරීමේ ක්‍රමවේද සකස් කළ යුතු වේ. ඒ සඳහා ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ. එසේ ම අප රටේ කාන්තා ව්‍යවසායකත්වය නඟා සිටුවිය යුතුය. පුරුෂ පාර්ශවයට සාපේක්ෂව අප රටේ පවත්නා ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලන කාරණා මත කාන්තාවගේ දායකත්වය සෑම අංශයකම, අඩු වීමක් දක්නට ලැබේ. රට තුළ පවතින මේ ක්‍රමවේදය වෙනස් විය යුතු අතර ඒ සඳහා කාන්තා සේවා නියුක්තිය වැඩි කළ යුතු ය.

ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දීමේදී කාන්තාවන්ගේ කැපකිරීම් සුවිශාලය. විශේෂයෙන්ම අපනයන ආදායම තුළ සියයට හතළිහක් පමණ ප්‍රතිශතයක් නියෝජනය කරන ඇඟලුම් ක්ෂේත්‍රයේ 100 කින් යුක්ත වූවන් ගෙන් 90% ක් පමණ කාන්තාවන් ය. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග නිදහස් වෙළෙඳ කලාප බිහි වීමෙන් පසුව ඒවායේ සේවයට රටේ සියලුම ග්‍රාමීය ප්‍රදේශයන්ගෙන් කාන්තාවන් එම ප්‍රදේශවලට සංක්‍රමණය විය. ලංකාවේ විදේශ විනිමය උල්පත් බවට එම නිදහස් වෙළෙඳ කලාපීය කාන්තාවන්ගේ ශ්‍රමය සූරාකමින් දශක 4 ක් පමණ ගතවී ඇතත් තවමත් එම කාන්තාවන් තම අයිතිවාසිකම් වෙනුවෙන් ඉල්ලීම් කරති.

එපමණක් නොව ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත වන කාන්තාවන්ගේ ආදායම් ද මෙරට ආර්ථිකය නංවා නංවාලීමෙහිලා බෙහෙවින් ඉවහල් වේ. එමෙන්ම තේ සහ රබර් ආදී වතු වැවිලි අංශයේ සේවයේ නියුතු කම්කරු කාන්තාවන්ද, ස්වයං රැකියාවල නිරත යුතු කාන්තාවන් ද මෙරට ආර්ථික සංවර්ධනයෙහිලා දායක වෙති. සංවර්ධනයට කාන්තා සහභාගීත්වය ඉහළ යෑම පොදුවේ ලොව බොහෝ රටවල දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. වර්තමානයේදී ලංකාවේ ද මෙය ඉහළ නංවනු වස් කාන්තාවන් සවිබල ගැන්වීමට නොයෙකුත් ආකාරයේ පියවර ගනී.

### 2.2.1. ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික සංවර්ධනයට දායක වන අංශ කිහිපයක්

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික අංශ වන්නේ සංචාරක කර්මාන්තය, තේ අපනයනය, ඇගලුම් කර්මාන්තය, වී නිශ්පාදනය, සහ අනෙකුත් කෘෂි නිෂ්පාදනයි. ඉහත සඳහන් අංශ වලට අමතරව විදේශ රැකිය නියුක්තිකයන් මගින් විදේශ විනිමය සඳහා ඉහල දායකත්වයක් ලැබෙයි. එහිදී ප්‍රධාන වශයෙන් මැද පෙරදිග රටවල රැකියා නියුක්තිකයන් සඳහන් කල හැක. මේ සෑම අංශයකම කාන්තාවන්ගේ දායකත්වය කැපී පෙනේ.

#### 2.2.1.1. කෘෂිකර්මාන්තය

අතීතයේ පටන්ම ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පරිපාලනය හා ආර්ථික කටයුතු පවත්වා ගැනීමේදී ග්‍රාමීය කෘෂිකාර්මික කාන්තාව ප්‍රබල භූමිකාවක් රඟ දක්වා ඇත. ආදායම් ඉපයීමේ ආර්ථික කටයුතු සහ ගෘහස්ත පරිපාලනය මිශ්‍රව ඉටු කිරීම හේතුවෙන් කාන්තාවන්ගේ ආර්ථික කටයුතු පිළිබඳව දේශීය ආර්ථිකය තුළ සංඛ්‍යාත්මකව හඳුනා ගැනීමක් සිදු නොවුවද, පවුල තුළ මෙන්ම කෘෂි ආර්ථික අංශය තුළ ද කාන්තාවගේ දායකත්වය සුළුපටු නොවන බව බොහෝ අධ්‍යයන සාක්ෂි දරයි.

සිංහල සමාජය තුළ ආර්ථික කටයුතුවල දී පුරුෂ පාර්ශ්වය හා සමානවම කාන්තා පාර්ශ්වයේ ද ක්‍රියාකාරී වන බව වනසුන්දර විසින් 2006 දී ගැටුම්කාරී වාතාවරණයක් පැවති ග්‍රාමීය ආර්ථිකය තුළ කාන්තාව සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනයක් මගින් පෙන්වා දී ඇත. කාන්තාවන් විසින් තම ගොවිපල තුළ මෙන්ම කෘෂිකාර්මික වගා කටයුතුවල නියුක්ත වන බවත්, ගෘහස්ථ කාර්යභාරයට අමතරව සත්ත්ව පාලනයේත්, වෙරළබඩ ජීවත්වන කාන්තාවන් ධීවර කර්මාන්තයේත් නිරත වීමෙන් ආදායම් ඉපැයීම සිදු කරන බවත් එම අධ්‍යයනයෙන් පැහැදිලි කරයි.

වර්තමානයේදී නාගරික මෙන්ම ග්‍රාමීය කෘෂිකාර්මික පවුල්වල කාන්තාවන් තම කාර්යභාරය ඉටු කිරීමේදී විකල්ප අවස්ථාවන් රාශියක් පවතින අතර, ඒවා බහුතරය නව තාක්ෂණය හා බැඳුණු අවස්ථා වන බැවින් එම අවස්ථාවන්ගෙන් වඩාත් ගැළපෙන විකල්පය කරා යාමේ වගකීම ඔවුන් සතු වේ.. මේ උදෙසා ශ්‍රී ලංකාව විසින් විවිධ වැඩසටහන් නිර්මාණය කළ බවට සාක්ෂි පවතී. 1970 දශකයේ දී කෘෂිකාර්මික අංශයේ ගොවි කාන්තාවන් සංවර්ධනය කිරීම සඳහා

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාපෘතිය නමින් විශේෂ වැඩසටහනක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ආරම්භ කෙරිණි.

### 2.2.1.2. ඇඟලුම් කර්මාන්තය

සමස්ත ලාංකික කාන්තාවන්ගෙන් අධික පිරිසකගේ ශ්‍රම දායකත්වයෙන් පෝෂණය වුණු දේශීය ඇඟලුම් කර්මාන්තය, අද වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ මෙහෙයුම්කරුවා බවට පත්ව ඇත. 2010 වන විට කාන්තාවෝ 350,000 රටේ ඇඟලුම් කර්මාන්ත ශාලා 850 ක සේවය කරති. නිදසුන් ලෙස MAS Holdings, Brandix Lanka Limited, Smart Shirt lanka & Ltd, Hirdaramani Group, Maliban Textiles, Timex and Fergasam Group, Vogue Tex Group වැනි ආයතනවල බහුතරයක් සේවය කරනුයේ කාන්තාවන්ය මෙය ඇඟලුම් කර්මාන්තයේ ශ්‍රම බලකායෙන් 85% ක් පමණ වේ. දශක ගණනාවක් පුරා තේ, පොල්, රබර් අපනයනය මත පදනම්ව පැවති මෙරට ආර්ථිකය, පසුව සිය උරමතට ගනිමින් පසුගිය දශක හතරක කාලය තුළ ඔවුන් විසින් ඉටුකරනු ලැබුවේ අභියෝගාත්මක වූ ජාතික මෙහෙවරකි.

ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය යනු, වර්තමානය වන විට ප්‍රතිශතාත්මකව සමස්ත අපනයන්ගෙන් 59% ක ප්‍රමාණයක් සපුරාලන්නකි. නිෂ්පාදන අපනයන අංශයෙන් මෙය සළකා බැලීමේදී එය 45% ක ප්‍රතිශතාත්මක අගයක් වන අතර එයින් රටට අත්කරදුන් ආදායම ඇ.එ.ජ. ඩොලර් බිලියන 11.3 කි.

වර්තමානයේදී මෙම කර්මාන්තයේ ඇති සුවිශේෂී බව මනාව ප්‍රකට වූයේ ඇ.එ.ජ. ඩොලර් බිලියන 5 ක අපනයන ආදායම් සීමාව පසුකළ ලංකාවේ ප්‍රථම කර්මාන්තය බවට ඇඟලුම් කර්මාන්තය පත්වීමත් සමඟිනි. මේ වික්‍රමය සිදුවූයේ අපගේ දිරිය කාන්තාවන්ගේ කැපවීම තුළිනි.

### 2.2.1.3.තේ කර්මාන්තය

දිනකට ලොව පුරා තේ කෝප්ප බිලියන දෙකක් පමණ රස විඳින අතර අපේ සුප්‍රකට "සිලෝන් ටී" ලොව අංක එකේ තේ ලෙස ඉදිරියෙන්ම සිටි. මෙම රසවත් උණුසුම් තේ කෝප්පය තුළ ගැලී ඇත්තේ ඉතා දුක්මුසු කතාවකි. රටට ප්‍රධානම විදේශ විනිමය උපයන ප්‍රභවය වන මේ තේ කර්මාන්තය සඳහා යෝධ ශක්තිය වනුයේ

මෙරට කාන්තාවන් ය. ඉතා දුෂ්කරම තත්ව හා අඩු පහසුකම් යටතේ දුක්විඳිමින් සිය ශ්‍රම දායකත්වය සපයන ලක්ෂ සංඛ්‍යාත වූ තේ දලු නෙලන කාන්තාවන් උපයන්නේ මෙම කර්මාන්තයෙන් උපයන ඉහළ විදේශ විනිමයෙන් ඉතා සුළු ප්‍රතිශතයකි.

තේ කතාවේ සැඟවුණු වීරවරියන් වන්නේ දලු නෙලන්නියන්ය. විශාල තේ වතුවල මෙන් තේ නිෂ්පාදනය කිරීම මෙම කුඩා තේ වතුවල සිදු නොකරන අතර ඔවුන් ව්‍යාපාරික මැදිහත්කරුවකු හරහා විශාල තේ කර්මාන්ත ශාලාවලට සිය අස්වැන්න විකිණීම සිදු කරයි. ප්‍රතිලාභ දාමයේ පහලම පුරුකක් වන කුඩා තේ වතු අංශයේ නියුතු කාන්තාවන්ගේ පහළ ආර්ථික තත්වයට හේතුවන්නේ ඔවුන් දක්වන කැපවීමේ අඩුපාඩුවක් හෝ ක්‍රියාවලියේ ඇති දුර්වලතාම නිසාම නොවේ.

### 2.2.1.4. සංචාරක කර්මාන්තය

මෙම කර්මාන්තය නියුක්ත සියලු කම්කරුවන්ගෙන් සියයට 60% ක් 70% ක් අතර ප්‍රමාණයක් කාන්තාවන්ය නමුදු ඔවුන්ගේ ඉපැයීම් පිරිමින්ට වඩා අඩුවෙන් සිදුවීමේ ප්‍රවනතාවය සහ ඔවුන් අතරින් අඩු ප්‍රමාණයක් කළමනාකරණ මට්ටමේ තනතුරුවලින් යුක්තව සිටින හෙයින් ඔවුන්ගේ තත්වය යහපත් මට්ටමක නැත. අඩු නිපුණතා සහ අඩු වැටුප් රැකියා තුළ කාන්තාවන් අසමානුපාතිකව නියෝජනය වන අතර ගෘහ පාලනය සහ ඇතැම් පාරිභෝගික හා සම්බන්ධතා පැවැත්වෙන අංශ තුළ මෙම සුවිශේෂී ලක්ෂණය දැකිය හැකි ය.

### 2.2.1.5. ගෘහ සේවය

2017 වසරේ පළමු මාස අට ඇතුළත ශ්‍රී ලාංකික කාන්තාවන් 37002 ක් ගෘහ සේවිකාවන් ලෙස විදේශගතව ඇති බව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නිකුත් කරන ලද අලුත් සංඛ්‍යාලේඛන මගින් පැවසෙයි. 2015 වසරේ ගෘහ සේවය සඳහා කාන්තාවන් 73,226 ක් විදේශගතව ඇති අතර 2016 වසරේ එය 65,023 ක් වී තිබුණි. 2017 වසර තුළ එය තවත් අඩු වනු ඇතැයි විදේශ සේවා නියුක්ති කාර්යාංශය බලාපොරොත්තු වෙන බවත් එම නිවේදනයේ දැක්වෙයි.

ගෘහ සේවිකා නොවන වෙනත් රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයන් ලෙස විදේශගත වූ කාන්තාවන්ගේ සංඛ්‍යාව 2015 වසරේ 17,429 ක් ලෙසත් 2016 වසරේ 17,495 ක් ලෙසත් වාර්තා කොට ඇත.

පුහුණු ශ්‍රමිකයන් විදේශගත කිරීමෙන් ශ්‍රී ලංකාවට වැඩි විදේශ විනිමයක් ද එම කාන්තාවන්ට වැඩි ආදායමක් ද උපයා ගැනීමට අවස්ථාව උදා වී ඇත ("කාන්තාවන් තිස්හත් දහසක් මැදපෙරදිග ගෘහසේවයට", 2017).

මීට අමතරව හෙද සේවය, ගුවන් සේවය, අත්කම්, බතික් නිර්මාණය, රූපලාවන්‍ය කර්මාන්තය, කොහු ආශ්‍රිත නිෂ්පාදන, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය යනාදී ක්ෂේත්‍ර රාශියක් ඔස්සේ ලාංකීය කාන්තාවන් යම්තාක් අයුරකින් බලගැන්වී ඇත. මේ අයුරින් ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික දායකත්වය දක්වනු ලබන අංශ දැක්විය හැකිය.

කෙසේවුවද වර්තමානයේ ඇතිවී තිබෙන ජදඩසා - 19 තත්වයත් සමග ලංකාවේ ආර්ථිකය ද යම්තාක් අර්බුදයකට ලක් වී ඇත. විශේෂයෙන්ම මේ නිසා ලංකාවේ අවිධිමත් රැකියාවන්හි නිරත වූ කාන්තාවන්ට දැඩි බලපෑමක් එල්ල විය. ඒ හැරුණු කොට සෙසු රැකියාවන්හි නිරත වූ ලාංකීය කාන්තාවන්ට ද ගැටළු රැසකට මුහුණ පෑමට සිදු වූ ඇති අතර ඇතැම් කාන්තාවන්ට රැකියාව පවා අහිමි වීය. මේ හේතුවෙන් වර්තමානයේදී ලාංකීය කාන්තාවගේ ආර්ථික සහභාගිත්වය යම්කිසි අභියෝගයන්ට ලක් වී ඇති බව සඳහන් කළ යුතුය.

## 2.3 නේපාලයේ කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය

2019 වර්ෂය වන විට නේපාලය ලොව ඉහලම කාන්තා ශ්‍රම බලකායක් සහිත රටවල් අතුරින් තෙවැනි තැනට පත් වීය එම අගය මුළු කාන්තා ජනගහනයෙන් 81.69% තරම් වීය. මේ හේතුවෙන් 2019 වර්ෂය වන විට දකුණු ආසියානු කලාපයේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය අතින් ඉහලින්ම සිටින රට බවට පත් වූයේ නේපාලයයි.

නේපාල ආර්ථිකය තුළ කාන්තාවන්ට යම් යම් අභියෝග නැත්තේ ද නොවේ. රටේ වැඩ කරන වයසේ සිටින ගැහැණු ජනගහනය පිරිමින්ට වඩා වැඩි වුවද, රැකියා කිරීමේදී විවිධ අංශවලින් කාන්තාවන් පිරිමින්ට වඩා තවමත් බොහෝ පසුගාමීය. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය අතර වැටුප් පරතරය ද විශාලය. නිදසුන් ලෙස නේපාල ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, අවිධිමත් අංශය තුළ පිරිමි වැඩි වශයෙන් නිරත වන අතර කාන්තාවන් වැඩි වශයෙන් අවිධිමත් කෘෂිකාර්මික අංශයට සම්බන්ධ වී සිටිති. අවිධිමත් අංශය

තුළ සමාජ ආරක්ෂක හිඟයක් පවතින අතර සේවකයින්ට අඩු වැටුපක් ලැබේ.

එරට සමීක්ෂණ මගින් පෙන්නුම් කර ඇත්තේ ඉදිකිරීම්, නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රවල වැඩි වශයෙන් පුරුෂයින් සේවය කරන බවත් කෘෂිකර්මාන්තය, තොග සහ සිල්ලර වෙළඳාම සහ අධ්‍යාපන යන ක්ෂේත්‍රයන්හි කාන්තාවන් වැඩි වශයෙන් රැකියාවල නියුක්ත වන බවත්ය. සමීක්ෂණයට අනුව රැකියා බොහෝමයක් නිර්මාණය කර ඇත්තේ වැඩි වැඩියෙන් පුරුෂයින් හා ස්ත්‍රීන් රැකියා කරන අවිධිමත් අංශය තුළ ය. නිදසුන් ලෙස, රැකියා කරන කාන්තාවන්ගෙන් සියයට 66.5 ක් සහ රැකියා කරන පිරිමින්ගෙන් සියයට 59.7 ක් අවිධිමත් අංශයේ ය. 2017-18 නේපාල කම්කරු බලකා සමීක්ෂණයට අනුව, වැඩ කරන වයසේ ජනගහනයේ සෑම පිරිමි 100 දෙනෙකු සඳහාම කාන්තාවන් 125 ක් සිටින නමුත් රැකියා කරන සෑම පිරිමින් 100 දෙනෙකු සඳහාම සේවයේ යෙදී සිටින්නේ කාන්තාවන් 59 ක් පමණි. වැඩ කරන වයසේ පිරිමි ජනගහනය මිලියන 9.2 ක් වන අතර වැඩ කරන වයසේ ගැහැණු ජනගහනය මිලියන 11.53 කි. වැඩ කරන වයසේ ජනගහනය වයස අවුරුදු 15 සහ ඊට වැඩි පුද්ගලයින් ලෙස අර්ථ දක්වා ඇත.

සමස්ත වැඩ කරන වයසේ කාන්තාවන්ගෙන් මිලියන 8.5 ක් පමණක් ශ්‍රම බලකායේ සිටින අතර වාර්තාවට අනුව මුළු කාන්තා ශ්‍රම බලකායෙන් මිලියන 2.6 ක් පමණක් සේවය කරති. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ රැකියාවල නියුතු කාන්තාවන් 22.5% ක් පමණක් වන බවය. නේපාලය තුළ කරන ලද මෙම සමීක්ෂණයෙන් සලකා බලා ඇත්තේ රැකියාවක් කිරීම සහ ස්වයං රැකියාවක් කිරීම සඳහා මෙන් ම ලාභයක් ලැබීම සඳහා වැටුපක් හෝ වැටුපක් ලබන අය පමණක් "රැකියා කරන අය" ලෙස ය. එබැවින් යැපුම් ගොවිතැනේ සහ ගෙදර දොරේ වැඩවල නියුක්ත වන අය "රැකියා කරන" යන්නෙහි අර්ථයට යටත් නොවේ. පසුගිය සතියේ වාර්තාව ප්‍රකාශයට පත් කළ එරට මධ්‍යම සංඛ්‍යාලේඛන කාර්යාංශයට අනුව, කාන්තාවන් වැඩි ප්‍රමාණයක් ලාභ නොලබන සහ වැටුප් නොලබන වැඩවලට සම්බන්ධ වීමත් සමඟ කාන්තාවන්ගේ රැකියා අනුපාතය ඉතා අඩු වී ඇත.

රැකියා සඳහා එරට පිරිමින් විශාල සංඛ්‍යාවක් විදේශ රටවලට සංක්‍රමණය වීමත් සමඟම, විධිමත් කාර්මික අංශයේ කාන්තා රැකියා

නියුක්තිය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කොට ඇත. කෙසේ වෙතත්, ශ්‍රම සංක්‍රමණය සහ නිපුණතා නොමැතිකම හේතුවෙන් විධිමත් රැකියාවල නියුක්ත වන කාන්තාවන් සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් සිදු වී නැති බවට මෙරට මාධ්‍ය අනාවරණය කොට ඇත.

## 2.3.1. නේපාල කාන්තාවන් ආර්ථික සංවර්ධනයට දායක වන අංශ කිහිපයක්

### 2.3.1.1. කෘෂිකර්මාන්තය

රැකියා කරන ශ්‍රම බලකායෙන් 76% ක් නිරත ප්‍රධාන රැකියා අංශය කෘෂිකර්මාන්තයයි. නේපාලයේ සංඛ්‍යාලේඛනවලින් පෙන්වාදෙන්නේ සමස්ත කාන්තා ශ්‍රම බලකාය මේ වන විට 85.19 % ක් බවය. එය සමස්ථ පිරිමි ශ්‍රම බලකාය වන 67.06 % ට සාපේක්ෂව පැහැදිලි වර්ධනයකි. විධිමත් කෘෂිකාර්මික අංශයේ කාන්තා සේවකයින් හා අවිධිමත් කෘෂිකාර්මික අංශයේ නියුතු කාන්තා සේවකයින් වශයෙන් බෙදීමක් මෙරට ඇත.

අවිධිමත් කෘෂිකාර්මික අංශයේ නියුතු කාන්තා ශ්‍රමිකයින් ප්‍රධාන වශයෙන් වැටුප් රහිත අය වෙති. වැටුප් රහිත පවුල්වල සේවකයින්ට පර්මා නමින් චාරිත්‍රයක් එරට ඇත. එනම්, පිටිසර නේපාල සමාජයේ කෘෂිකාර්මික සේවකයින් සමීප ඥාතීන් සමඟ ශ්‍රමය හුවමාරු කර ගනිමින් ක්‍රියාකාරකම් සිදු කිරීමය. මෙම පර්මා ක්‍රමය යටතේ, අසල්වැසි පවුල්වල සේවකයින්ට වැටුප් ගෙවීමක් සිදු නොවේ. කෙසේවෙතත්, එකම දින ගණන අනුව, ඒ ඒ පවුල්වල කම්කරුවන් ද එක හා සමානව වැඩ කරති. අනෙක් අය ගොවි බිම්වල වැඩ කරති.

### 2.3.1.2. අවිධිමත් අංශය

පසුගිය දශක තුන තුළදී මෙරට ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතික සංඛ්‍යාලේඛනයන්ට අනුව අවිධිමත් අංශවල කාන්තා ශ්‍රම සහභාගීත්වය වැඩි වී තිබේ. මෑතකාලීන එරට ජාතික ජීවන සම්මත සමීක්ෂණයට අනුව, කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගීත්වය 71.3 % කි. කෙසේවෙතත්, අවිධිමත් රැකියා අංශය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ වෙනස්කම් තිබේ. ගැහැනු ළමයින්ට හා කාන්තාවන් කෙරෙහි ඇති අසමානතාවය මෙරට විවිධ ක්ෂේත්‍ර තුළ දක්නට ඇත.

පීතෘ මූලික සංකල්පය ද මෙරට රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් මෙන් ම සමස්ත නීති පද්ධතිය තුළින් ද පිළිබිඹු වේ. මෙරට ලිංගික

හිංසනය යනු විධිමත් මෙන්ම අවිධිමත් යන අංශ දෙවර්ගයේම නිරත කාන්තාවන්ට බිය ගෙන දෙන ගැටලුවකි. ඊට අමතරව, විවිධ ජාවාරම් වැඩ කරන පවුල්වල කාන්තාවන් වාණිජ ලිංගික සූරාකෑමට ලක්වීම සුලභ ය. විධිමත් හෝ අවිධිමත් අංශයන්හි කාන්තා රැකියා සඳහා මෙරට කාන්තාවන්ට පවත්නා මානසිකත්වය වර්තමානයේ දැඩි වෙනස්කම්වලට ගොදුරු වෙමින් පවතී.

නේපාලයේ කාන්තා ව්‍යවසායකයින්ගේ සම්මේලනයේ සභාපතිවරයා (President of the Federation of Women Entrepreneurs' Association of Nepal - FWEAN) සහ නේපාලයේ සාර්ක් ව්‍යවසායක කාන්තාවන්ගේ සභාවේ උප සභාපතිනිය - Vice chairperson of the SAARC Chamber Women Entrepreneurs Council - SCWEC) ටඅනුව මෙරට කාන්තාවන් 500,000 ක් ස්වයං රැකියාවල යෙදෙන අතර ක්ෂුද්‍ර හා මධ්‍යම මට්ටමේ ව්‍යාපාරවලද ඔවුන් නිරත වෙති. තවද, කාන්තාවන්ට ලබා දෙන බොහෝ පුහුණුවීම් බොහෝ දුරට සාම්ප්‍රදායික, මැහුම්, අත්කම්, ඉවුම් පිහුම් වැනි ඒවාට සීමා වේ. මෙරට කුඩා පරිමාණ ව්‍යාපාර අවිධිමත් ව්‍යාපාරයන්ට එරට කාන්තාවන්ගෙන් 77 % ක් පමණ දායක වේ.

මෙරට වාණිජ හා කර්මාන්ත මණ්ඩල (FNCCI) නිලධාරීන්ගේ සම්මේලනයට අනුව කාන්තාවන්ගේ ලියාපදිංචි ව්‍යාපාර 3,000 ක් පමණ මෙරට ඇති අතර එය ඉතා අඩු අගයක් බව ඔවුන් දැනුම් දුන්නේය. තවද ව්‍යවසායකත්වයට කාන්තාවන් සම්බන්ධ නොවීමට හේතු සාධක වන්නේ සම්පත් හිඟකම, අඩු අධ්‍යාපනය යනාදියයි. නේපාල රජය සහනාධාර සහ බදු සහන සඳහා කාන්තා ශ්‍රමිකයන්ට දිරිගැන්වීම් ලබා දුන්නේය. නේපාලයේ වාණිජ මණ්ඩල නිලධාරින්, කාන්තාවන් සඳහා 50 % ක ව්‍යවසායකයින්ට බදු සහනයක් දී ඇත. කාන්තාවන් සඳහා බොහෝ පහසුකම් තිබුණද තවමත් මෙරට විධිමත් හා අවිධිමත් යන අංශ දෙකෙහිම කාන්තා ශ්‍රමිකයන් වෘත්තීය සමිතිවලට සම්බන්ධ වී සිටිති. ඊට අමතරව, ඔවුන් රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා ද සම්බන්ධ වී සිටිති. එරට කම්කරු නීතිය මෙම කාන්තා ශ්‍රමිකයන්ගේ ගැටළු පිළිබඳ දැනුවත් වී සිටී. නමුත් මෙරට රජයන් විසින් කාන්තා ව්‍යවසායකයින්ට හිතකර වැඩසටහන් සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ගනු ලැබූ උත්සාහයන් ඵලදායී වී නැති බවද කිව යුතු ය.

## 2.4. භූතානයේ කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය

සාමාන්‍යයෙන් භූතානයේ ආර්ථිකයේ ප්‍රධාන අංශ වශයෙන් දැක්විය හැක්කේ කෘෂිකර්මාන්තය කර්මාන්ත අංශය සේවා අංශය වැනි දෑය. මෙහිදී කර්මාන්ත අංශය ගත්කල සිමෙන්ති, දැව නිෂ්පාදන, පලතුරු නිෂ්පාදනය , මධ්‍යසාර නිෂ්පාදනය, සංචාරක ව්‍යාපාරය යනාදී ක්ෂේත්‍ර ඉතාමත්ම වැදගත් තැනක් ගනී. මෙම කෘෂිකර්මාන්ත කර්මාන්ත හා සේවා අංශ බොහෝමයක කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය දක්නට ලැබීම විශේෂිත ය.

### 2.4.1. භූතානයේ කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය දක්වන අංශ කිහිපයක්

#### 2.4.1.1. කෘෂිකර්මාන්තය

මෙරට කාන්තාවන්ගෙන් 62% ක් කෘෂිකර්මාන්තයේ වැඩ කරති. ග්‍රාමීය කාන්තාවන් අතර සාක්ෂරතාවය 10% පමණ ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ශ්‍රමය බෙදීම දැඩි ලෙස මෙහි නොවේ, මන්ද පිරිමින්ට හා කාන්තාවන්ට එකිනෙකාගේ කාර්යයන් හඳුනාගත හැකි වීම නිසාය. ඉඩමෙන් 70% ක අයිතිය කාන්තාවන්ටය. ජනගහනයෙන් බහුතරයක් කාන්තාවන්ට ඉඩම් සහ පශු සම්පත් වල හිමිකාරිත්වය ලබා දෙමින් මාතෘ උරුමයන් අනුගමනය කිරීමට මෙම රට කටයුතු කොට ඇත.

ගොවිපල සහ ගොවිපල නොවන ක්‍රියාකාරකම් තුළින් ගෘහස්ථ ආදායම සඳහා කාන්තාවන් සැලකිය යුතු ලෙස දායක වේ. වල් පැලෑටි සහ වන නිෂ්පාදන භාවිතා කරන්නන් ලෙස කාන්තාවන් ස මොවුන් ස්වාභාවික සම්පත් පරිසරය සමඟ සමීපව කටයුතු කරයි. ගෙවතු වගා කළමනාකරුවන් වශයෙන් කාන්තාවන් ජෛව විවිධත්වයේ කළමනාකරුවන් ද වේ.

භූතානය කෘෂිකර්මාන්තයේ නිරත වන කාන්තාවන්ට ද විශාල වශයෙන් අභියෝගවලට මුහුණ පෑමට සිදුවේ. මෙරට රජය විසින් කර්මාන්තයේ නිරත කාන්තාවන් වෙනුවෙන් සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති සහ නීතීන් හේතුවෙන් ඔවුනට ඇති ගැටලු බොහෝ දුරට අවම වී ඇති බව සාක්ෂාත් වේ.

- මානව-වනජීවී ගැටුම,
- කටුක ශීත කාලය,

- දැඩි ශාරීරික ශ්‍රමය,

යනාදිය කෘෂිකාර්මික අංශය තුළ කාන්තාවන්ගේ නියැලීම දුෂ්කර මාවතක් බවට පත් කරයි.

- ස්වයං රැකියාව ක්ෂේත්‍රය

මෙරට ILO ඇස්තමේන්තුවට දක්වන පරිදි එරට කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය 2019 දී 83.24 % ක් ලෙස වාර්තා කර ඇත. මෙයින් 2018 දී පැවති 83.73 % ට වඩා අඩුවීමක් වාර්තා කරයි. මෙම දත්ත 2012 දී, 85.52 % ක් වූ අතර 2006 දී, 76.71 % ක් විය. ෂබධ ඇස්තමේන්තුවට අනුව මෙරට කාන්තාවන්ගේ ස්වයං රැකියා ආර්ථික දායකත්වය සක්‍රීය තත්ත්වයේ පවතින බව වාර්තා වේ.

ස්වයං රැකියා නියුක්තිකයින් යනු ”තමන්ගේම සහයෙන් හෝ හවුල්කරුවන් කිහිප දෙනෙකු සම්බන්ධ කරගනිමින් රැකියා කරන සේවකයින් ය”. එනම් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවන්ගෙන් ලැබෙන ලාභය මත මොවුනගේ රැකියා වැටුප සෘජුවම රඳා පවතින්නකි.

මීට අමතරව වෙනත් අංශ මඟින් ද භූතානයේ කාන්තා ආර්ථික දායකත්වය ලැබී ඇති ආකාරය දක්නට ලැබේ.

මෙරට ආර්ථික වර්ධනය මඟින් කාන්තාවන්ට වෛද්‍යවරුන් සහ හෙදියන් වශයෙන් වෛද්‍ය විද්‍යාව වැනි ක්ෂේත්‍ර සඳහා සහභාගී වීමේ අවස්ථා වැඩි වී තිබේ. ඉගැන්වීම සහ පරිපාලනය වැනි අංශවලට ද ඔවුනට දායක විය හැකි ය . 1989 වන විට රජයේ සේවකයින්ගෙන් 10% කට ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් වූ අතර 1989 දී සිවිල් සේවා විභාගයේ ඉහළම උපාධිධාරිනිය ද කාන්තාවක් විය.

රජයේ රැකියා කාලය තුළ, සිවිල් සේවකයින්ට දරු ප්‍රසූති තුනක් සඳහා පූර්ණ වැටුපක් සහිතව මාස තුනක මාතෘ නිවාඩුවක් සඳහා ද මෙරට රජය අවසර දෙනු ලැබූ අතර අතිරේක බෙදාහැරීම් සඳහා වැටුප් රහිතව නිවාඩු ලබා දී ඇත. නිදසුන් ලෙස මෙරට 'කෙල්සාං ෂ්මෝ' නම් බස් කොන්දොස්තරවරියක් සිටින අතර (ඇය උපදේශිකාවක් ලෙස ද සේවය කරයි) ඇය පොදු ප්‍රවාහන සේවයේ රැකියා කරන සෙසු කාන්තා කොන්දොස්තරවරියන්ගේ ද සහයෙන්

ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් හිංසනය තුරන් කිරීමට කටයුතු කරනු ලැබේ (United Nations Population Fund, 2021).

සේවා අංශය සහ අනෙකුත් නාගරික, කාර්මික හා වාණිජ කටයුතු සඳහා පිටත්ව යන පිරිමින්ට වඩා 1980 ගණන්වල කාන්තාවන් කෘෂිකාර්මික ශ්‍රම බලකායේ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළහ.

1980 දශකයේ මැද භාගයේදී, වයස අවුරුදු පහළොවේ සිට අවුරුදු හැට හතර දක්වා වූ භූතාන කාන්තාවන්ගෙන් 95% ක් ම කෘෂිකාර්මික කටයුතු සඳහා සම්බන්ධ වූ අතර, එම වයස් සීමාව තුළ සිටියේ පිරිමින්ගෙන් 78% ක් පමණි. මෙරට කෘෂිකාර්මික ශ්‍රමය කාන්තාවන් හා පිරිමින් සමානව බෙදා ගන්නා බව විදේශීය නිරීක්ෂකයින් සඳහන් කර ඇත. පොදුවේ ගත් කල, ආර්ථිකයේ සෑම අංශයකම පිරිමින්ට වඩා වැඩි ශ්‍රමයක් මෙරට කාන්තාවන් ලබා දේ. රැකියාවක් නොමැති පිරිමින්ගෙන් 10% කට ආසන්න සංඛ්‍යාවක් හා සසඳන විට සමස්ත කාන්තා ශ්‍රම බලකායෙන් 4 % කටත් වඩා අඩු සංඛ්‍යාවක් මෙරට රැකියා විරහිතව සිටියහ. මෙසේ භූතාන ආර්ථිකයට එරට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය සඳහන් කළ හැකිය.

### 3. දකුණු ආසියානු කාන්තාවගේ ආර්ථික දායකත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත විශ්ලේෂණය

මෙහිදී ඉහත තෝරාගනු ලැබූ දකුණු ආසියාතික රටවල් සතරෙහි කාන්තාවන්ගේ දායකත්වය පිළිබඳව විමසා බැලීම සිදු කරනු ලබයි. එහිදී පෙරදී තෝරාගත් දකුණු ආසියාවේ පහල කාන්තා ආර්ථික දායකත්වයක් ඇති රටක් වන ඉන්දියාව හා දකුණු ආසියාවේ ඉහළ කාන්තා ආර්ථික දායකත්වයක් ඇති රටක් වන නේපාලය ඇසුරු කොට ගනිමින් මෙම විශ්ලේෂණය සිදු කරයි. මෙහිදී එම රටවල ජීවත් වන කාන්තාවන්ගේ,

- රැකියා නියුක්තිය
- රැකියා වියුක්තිය
- විවධ අංශවල කාන්තා ශ්‍රම බලකාය

යනාදී මිනුම් දඬු යොදා ගනිමින් එකී රටවල් කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය පිළිබඳව විශ්ලේෂණය කිරීම සිදුකරන බව කිව යුතුය.

### 3.1. ඉන්දියාව

2019 සංඛ්‍යා දත්ත වාර්තාවන්ට අනුව ඉන්දියාවේ කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය සම්බන්ධ දත්ත මෙසේ ය.

#### 3.1.1. රැකියා නියුක්තිය

1990 සිට එරට කාන්තා රැකියා නියුක්තිය ඉතා සුළු ප්‍රමාණයකින් වැඩි වන අන්දම දිස්වුවද අවම වශයෙන් රටේ සමස්ත ශ්‍රම බලකායෙන් අඩක්වත් කාන්තාවන් රැකියාවන්හි නියුක්ත වීම දැකගත නොහැකිය. 50% මට්ටමක්වත් නොමැති වීම) ඊට සාපේක්ෂව 2010 වර්ෂය වන විට පෙර පැවති තත්වයටත් වඩා කාන්තා රැකියා නියුක්ති ප්‍රතිශතය අවම වන අතර 1990 සිට 2019 වන විට කාන්තා රැකියා නියුක්ති ප්‍රතිශතය ඉතා අවම මට්ටමකට ළඟා වී ඇති බව කිව හැක. මේ අනුව ඉන්දියාවේ කාන්තාවන් ආර්ථිකය සඳහා දායකත්වය දක්වන ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩුවී යන ආකාරය දිස් වේ (Statista Research Department" 2021)

#### 3.1.2. රැකියා වියුක්තිය

2013 සහ 2014 වර්ෂවල සිට ඉන්දියාවේ කාන්තාවන්ගේ රැකියා වියුක්තිය ක්‍රම ක්‍රමයෙන් අඩු ව ගොස්, ඇත. එය 2019 වර්ෂය වන විට 5.21 % දක්වා අඩු වී ඇති බව නිරීක්ෂණය කළ හැකිය. විශේෂයෙන්ම 2019 වර්ෂය වන විට ඉන්දියානු කාන්තාවන්ගේ රැකියා වියුක්තිය පෙර වසරවලට සාපේක්ෂව ඉතාම පහළ මට්ටමක තිබීම ඉන්දියානු ආර්ථිකයට යහපත් බලාපොරොත්තුවක් වී ඇති බව කිව යුතුය(India( Female Unemployment˜, 2021).

#### 3.1.3. විවිධ අංශ මගින් නිරූපිත කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය

ඉහත දත්ත විශ්ලේෂණයෙන් (1970-2018) පෙන්නුම් කරන්නේ කාන්තාවන් බොහෝදුරට අඩු ඵලදායිතා අංශයන් කෙරෙහි අවධානය යොමු කර ශ්‍රමය-දැඩි, ගෙදර වැඩ සහ අවිධිමත් වැඩ කටයුතු කරගෙන යන බවයි. (සංඛ්‍යා 2 සහ 3) 1977-78 දී කෘෂිකර්මාන්තයේ නියුක්ත ග්‍රාමීය කාන්තාවන්ගේ අනුපාතය 88.1% සිට 2017-18 දී 73.2% දක්වා අඩු වී ඇත. 1977-78 දී සේවා නියුක්තියේ 35.7% සිට 2017-18 දී 60.7% දක්වා ඉහළ යාමත් සමඟ නාගරික කාන්තාවන් සඳහා සේවා අංශය වඩ වඩාත් වැදගත් වී ඇත. මෙම අංශය තුළ කාන්තාවන් වෘත්තීය දියුණුව සඳහා සීමිත විෂය

පථයක් පමණක් ලබා දෙන ඉගැන්වීම සහ හෙද සේවය වැනි වෘත්තීන් කෙරෙහි අවධානය යොමු කර ඇත. පිරිමින් මෙන් නොව, නාගරික හෝ ග්‍රාමීය කාන්තාවන්ට ද්විතීයික අංශයේ තම පැමිණීම සැලකිය යුතු ලෙස වැඩි කර ගත නොහැකි වී ඇත (Nikore,2019).

## 3.2. නේපාලය

### 3.2.1. රැකියා නියුක්තිය

1990 - 2019 දක්වා නේපාලයේ කාන්තා රැකියා නියුක්තිය ගත්විට එම කාලය තුළ නේපාලයේ කාන්තා රැකියා නියුක්තියේ සාමාන්‍ය අගය 80.73% ක් වූ අතර එය 2008 දී අවම වශයෙන් 79.34% ක් වූ අතර 1995 දි එය උපරිම වශයෙන් 81.67% ක් විය. 2019 වසරේ නවතම අගය වූයේ 81.52% කි. මේ අනුව ඉහත දත්ත දෙස බැලීමේදී පෙනී යන්නේ නේපාලයේ කාන්තාවක් රැකියා සඳහා නියුක්ත වීමේ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් ඉහළ ගිය බවය. මේ හේතුවෙන් 2019 වර්ෂයේ දකුණු ආසියාවේ කාන්තා ආර්ථික දායකත්වය වැඩිම රට බවට නේපාලය පත්වූ බව කිව හැකි ය (Nepal Female labor force participation, 2021).

### 3.2.2. රැකියා වියුක්තිය

නේපාලයේ 1991 - 2019 වර්ෂය දක්වා කාන්තාවන් සඳහා විරැකියා අනුපාතය සැලකීමේ දී එම කාලය තුළ නේපාලයේ සාමාන්‍ය අගය සියයට 1.82% ක් වූ අතර එය 2008 දී අවම වශයෙන් සියයට 1.07% ක් වූ අතර උපරිම වශයෙන් 2.88% ක් විය.

2012 වර්ෂයේ දී නේපාලයේ කාන්තා රැකියා වියුක්ති ප්‍රතිශතය ඉතාමත්ම පහළ මට්ටමක තිබූ අතර එම ප්‍රමාණය 2.14% ක් තරම් වීය. 2019 වසරේ නවතම අගය සියයට 2.73% කි. මෙහිදී 2015 සහ 2017 වර්ෂ වන විට නේපාලයේ රැකියා වියුක්ති කාන්තා ප්‍රතිශතය ඉතා ඉහළ අගයක් ගත් නමුත් 2019 වර්ෂය වන විට එම ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු ව ගිය අන්දම දැකිය හැකිය.

කෙසේ නමුත් මේ නේපාලයේ රැකියා වියුක්තික කාන්තා ප්‍රතිශතය අනෙකුත් දකුණු ආසියාතික රටවල්ට වඩා අඩු බව මෙම සංඛ්‍යා දත්ත ඔස්සේ පෙන්වා දිය යුතුය.

### 3.2.3. විවිධ අංශ මගින් නිරූපිත කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය

නේපාලයේ කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගී වීමේ අනුපාතය ඉහළ ය, නමුත් තොරතුරු හා තාක්ෂණය පිළිබඳ වෘත්තීන්වල නිරත කාන්තාවන්ගේ අනුපාතය ඉතා අඩු ය. නේපාලයේ 2017-18 ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, අවුරුදු 15 ට වැඩි කාන්තා ජනගහනයෙන් 81% ක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වන නමුත් මෙම කාන්තාවන් හා ගැහැණු ළමයින්ගෙන් 0.5% ක් පමණක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සේවය කරති **(Ashray et 2021)**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හැරුණු විට නේපාලයේ පර්යේෂකයින්ගෙන් 7.8% ක් කාන්තාවන් බව යුනෙස්කෝව ඇස්තමේන්තු කරයි. තොරතුරු හා තාක්ෂණ අංශයෙහි ස්ත්‍රී - පුරුෂ විෂමතාව මීට හේතුවයි මෙය නේපාලයට පමණක් ආවේණික නොවන නමුත් මෙම අංශයන්හි කාන්තා නියෝජනය අඩු වීමට එරට සමාජ හා සංස්කෘතික සාධක බලපා ඇති බව කිව යුතු ය.

මෙලෙසින් දකුණු ආසියාතික කලාපයේ කාන්තා ආර්ථික දායකත්වය ඉහළ රටවල හා දකුණු ආසියාවේ කාන්තා ආර්ථික දායකත්වය පහළ රටවල එසේ වීමට බලපෑ තත්වයන් පිළිබඳ සංඛ්‍යා දත්ත ඔස්සේ මේ අයුරින් විශ්ලේෂණය කළ හැකිය.

දකුණු ආසියාතික කාන්තාවන්ට ආර්ථික සංවර්ධනයට දායකත්වය දැක්වීමේ දී මුහුණ දීමට වන ප්‍රධාන ගැටලු සහ අභියෝග කිහිපයක්

පොදුවේ ගත්තද දකුණු ආසියාතික රටවල කාන්තාවන්ට ආර්ථික සංවර්ධනයට දායක වීමට ඇති මූලික ගැටළු සහ බාධක මෙසේ සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවය.
- ශ්‍රම වෙළඳපොල තුල කාන්තාවන්ගේ අත්දැකීම් අඩු සහභාගිත්වය.
- ඉහල විරැකියාව.
- නොනැසී පවතින වැටුප් විෂමතාව.
- කාන්තාවන්ගේ අධ්‍යාපන සුදුසුකම් අවම වීම.

කාන්තාව පිලිබඳ විමසා බැලිමේ දී, ස්ත්‍රී පුරුෂ සමාජභාවය වනාහී ලිංගික වෙනස්කම් සඳහා දෙනු ලබන සමාජීය/සංස්කෘතික ආර්ථික වටිනාකම් වේ. මෙය සංස්කෘතියෙන් සංස්කෘතියට මෙන් ම කාලයෙන් කාලයට ද වෙනස් විය හැකිය. කාන්තාව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු එක සමාන අර්ථයන් නොවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජ, ආර්ථික, දේශපාලනික තත්ත්වයන්ට අනුව වෙනස්වේ.

ඉහත දැක්වෙන ප්‍රකාශනය හරහා ද ගම්‍යමාන වනුයේ ස්ත්‍රීත්වය සමාජයෙන් සමාජයටත්, කාලයෙන් කාලයටත් වෙනස්වන බවයි.

2010 දී 41% ක් වූ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය 2016 වන විට 36% දක්වා පහත වැටී ඇත. නව ලෝක බැංකු වාර්තාවක් සඳහන් කරන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන්, විශේෂයෙන් ම තරුණ පිරිස්, වෙළඳපොළ නිපුණතා නිවැරදිව ග්‍රහණය නොකර ගනිමින්, ඉහළ විරැකියා ප්‍රතිශතයට මුහුණ දී අවසානයේ පුරුෂයින්ට වඩා අඩු වැටුප් ලැබීමට යටත් වන බවයි.

Getting to Work( Unlocking Women's Potential in Sri Lanka's Labor Force නමැති වාර්තාව කාන්තාවන්ගේ අධ්‍යාපනය ප්‍රගතිය හා යහපත් සෞඛ්‍ය ප්‍රතිලාභයන්ගේ ප්‍රගතිය ශ්‍රී ලාංකික කාන්තාවන්ට වඩා ඉහළ රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා පරිවර්තනය වී නොමැති බව සඳහන් කරයි.

වාර්තාවට අනුව, සිය කාන්තාවන්ගේ කුසලතාවන් ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි රටවල ආර්ථිකයට සිය පූර්ණ සාර්ථකත්වය කරා ළඟා වීමට නොහැකි වනු ඇති අතර ඒ හේතුවෙන් ඉහළ නගින වයෝවෘද්ධ ජනගහනයට සහාය වීමට ඇති ඉඩ අහිමි වී යනු ඇත.

ශ්‍රී ලංකාව බොහෝ අංශවලින් විශාල ප්‍රගතියක් අත් කර ගෙන ඇති නමුත් බහුතර කාන්තාවන්ගේ අත්දැකීම් ලබා නොගැනීම හේතුවෙන් රටෙහි අභිවෘද්ධිය හමුවේ බරපතල ප්‍රතිවිපාක අත්විඳිනු ඇත," යනුවෙන් ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා ලෝක බැංකු අධ්‍යක්ෂිකා අයිඩා ස්වරායි රිඩ්ඩිහොග් පවසා ඇත. කාන්තාවන්ට රැකියා ලබා දීම යනු මානව අයිතීන්ට ගරු කිරීමක් පමණක් නොව බුද්ධිගෝචර ආර්ථික පෙරදැක්මකි. ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ

සහභාගිත්වය සඳහා ඇති බාධක ඉවත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික හැකියාවන් ඵලදායී කොටගනිමින් ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වීමට ඉඩ සැලසෙනු ඇත.

Getting to Work වාර්තාව තුළ වැටුප් හිමි දකුණු ආසියාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය වළක්වන කරුණු තුනක් ගෙනහැර දක්වයි.

පළමුව, විවාහය, දරුවන් තැනීම හා අදාළ ගෘහ කුටුම්භයන් තුළ කටයුතු කාන්තාව වෙත අසමාන ලෙස බෙදී යාම ශ්‍රම වෙළඳපළ තුළ ඔවුන්ගේ සහභාගීත්වය අඩාල කරවයි. විවාහය, කාන්තාවන් වෙත වැටුප් හිමි රැකියා ලැබීමේ අවස්ථාව 26% කින් අඩු කර ඇති නමුත්, පිරිමින් හමුවේ, එය 2.5% කින් ඉහළ දමා ඇත.

දෙවනුව, කාන්තාවන්, පෞද්ගලික අංශයේ සේවායෝජකයන් අපේක්ෂා කරනු ලබන අධ්‍යාපනික ක්ෂේත්‍රයන්ට පිවිස නොමැති අතර, විශේෂයෙන්ම ඔවුන් බලාපොරොත්තු වන කුසලතා වර්ධනය කොටගෙන නොමැත.

තෙවනුව, රැකියා සෙවීම, බඳවා ගැනීම හා උසස්වීම් ලබා ගැනීම විෂයයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්ව කටයුතු කිරීම මත, කාන්තාවන්ට ඉහළ මට්ටමේ දක්ෂතා පදනම් වන සහ කළමනාකරණ රැකියාවන් ලබා ගැනීමෙන් වළක්වා ඇති අතර පුරුෂයින් එහි ආධිපත්‍යය දරයි. මෙලෙස දකුණු ආසියානු කාන්තාවන්ට ආර්ථිකයට දායක වීමට බාධක ඇත.

## 4. දකුණු ආසියානු කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

### 4.1. ග්‍රාමීය කාන්තාවන් සවිබල ගැන්වීමට විවිධ වැඩසටහන් දියත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය කාන්තාවන් බල ගැන්වීමේ ක්‍රියාවලි අවම මට්ටමක පවතී. එම තත්ත්වය මඟහරවා ගැනීමට ග්‍රාමීය කාන්තාව සක්‍රීය කර ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සම්බන්ධ කර ගත යුතුය. ග්‍රාමීය කාන්තාවන්ගේ දක්ෂතා ඔප්නැංවීම, (Skills Development) මෘදු ගුණාංග වර්ධනය කිරීම (Soft Skills) රටේ යටිතල පහසුකම් වර්ධනය කිරීම, රටේ ග්‍රාමීය මට්ටමේ ස්වයං රැකියා ක්‍රමයක් ක්‍රමයෙන් වර්ධනය කිරීම, නිවසේ සිට වැඩ කරන

ව්‍යවසායකයින් බිහි කිරීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීම යන දෑ තුළින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන් සක්‍රිය කර රටේ ආර්ථිකය දියුණු කිරීමට උපයෝගී කර ගත හැකිය. තව ද කර්මාන්ත ගමට ගෙන යාමේ සංකල්පය ද ග්‍රාමීය කාන්තාවන් සක්‍රීය කිරීමේදී වඩාත් වැදගත් වේ. විශාල කර්මාන්ත නොව කුඩා පරිමාණයේ කර්මාන්ත ඒ ඒ ගම්වල ව්‍යාප්ත කිරීම වඩාත් සුදුසු ය. නිදසුන් ලෙස, අනුරාධපුරයේ සිටින කාන්තාවන් පිරිසක්, කොළඹට පැමිණ රැකියාවක් කරන විට එම කාන්තාවන්, විශාල වැටුපක් ඉල්ලා සිටී. එවැන්නක් සිදුවනුයේ ගම්වල සිට කොළඹට පැමිණ ජීවත්වීමේදී එම කාන්තාවන්ට තම එදිනෙදා ජීවිතය පවත්වා ගැනීම සඳහා ඔවුන්ට ගමේ ජීවිත් වීමට යන වියදමට වඩා වැඩි මුදලක් (සැලකිය යුතු මුදලක්) වැය වීම ය. එම නිසා ග්‍රාමීය කාන්තාවන්ට තමන්ගේ ගමේ සිට ගෙන යාමට හැකි රැකියා අවස්ථා උත්පාදනය කළ යුතු ය. විශේෂයෙන්ම නිවසේ සිට ඇඳුම් මසා විකිණීම, නිවසේ සිට පලතුරු වගා කර විකිණීම පෙන්වා දිය හැකි ය.

වර්තමානයේ බොහෝ ග්‍රාමීය කාන්තාවන් තමන්ගේ දක්ෂතාවන් නිසි පරිදි හඳුනා නොගෙන නිකරුණේ නිවෙස්වලට වී කාලය ගත කරනු ලබයි. ඒ හේතුවෙන් මැහුම් ගෙතුම්, විවිධ නිර්මාණ වැනි දෑ තුළින් වෙළෙඳපළ ජයගැනීමට කාන්තාවන් පොලඹවාලිය යුතුය. සෑම ග්‍රාමීය කාන්තාවක්ම තමන්ගේ දක්ෂතා උපයෝගී කර ගනිමින් ඒ තුළින් වෙළඳපළට භාණ්ඩයක් ඉදිරිපත් කිරීමට හුරු විය යුතුය.

රජය විසින් නිවසේ සිට ස්වයං රැකියා පවත්වාගෙන යන කාන්තාවන්ට තමන්ගේ භාණ්ඩ ගැටලුවකින් තොරව අලෙවි කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. රජයේ සහ පෞද්ගලික අංශයේ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් නිසි ක්‍රමවේදයකට අනුව සෑම දිස්ත්‍රික්කයකටම ව්‍යාප්ත වන පරිදි සම්පාදනය කළ යුතුය. ග්‍රාමීය කාන්තාවන් උදෙසා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## 4.2. බහු පාර්ශ්වීය ක්‍රමෝපායන් නිර්දේශ කිරීම

කාන්තාවන්ට රැකියාවක් ලබා ගැනීමට සහ ඉන්පසුව වැඩ කරන ස්ථානයේ සාර්ථකත්වය කරා ළඟාවීමට උපකාරී වන බහු පාර්ශ්වීය ක්‍රමෝපායන් නිර්දේශ කරයි. තරුණ වියෙහිදීම යොමු කෙරෙන වෘත්තීය සංවර්ධන ප්‍රවේශයන්, ගැහැණු ළමුන්ට පාඨමාලා

හැදෑරීමට අවශ්‍ය අධ්‍යාපනය, කුසලතා හා විශ්වාසය දිනා ගැනීම සඳහා උපකාරී වනු ඇත. විශේෂයෙන්, අනාගත සේවාදායකයින්ගේ ඉල්ලුම හිමිවන, විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත ක්ෂේත්‍රවල සාමාන්‍ය අධ්‍යාපනය හෝ සාම්ප්‍රදායික-නොවන කුසලතා උගන්වන තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) ලැබීමට ඉඩ සලසනු ඇත.

කාන්තාවන් රැකියාවල නිරත වන විට, උසස් මට්ටමේ ළමා සුරැකුම් සේවාවන්, අර්ධකාලීන රැකියා අවස්ථා හා මාතෘ නිවාඩු සඳහා ප්‍රවේශයන් ඉහළ නගිනු ඇති අතර කාන්තාවන්ගේ ගමන්බිමන් සඳහා ආරක්ෂිත ප්‍රවාහන සේවා හා දුරස්ථව සේවය කිරීම පිළිබඳ වන සමාජ-භෞතික බාධාවන්ට විසඳුම් ලබා දීම අත්‍යාවශ්‍ය වනු ඇත.

සේවා ස්ථානවල, කම්කරු නීති හමුවේ සම සැලකීම්, වෙන් කොට නොසැලකීම පිළිබද ප්‍රතිපත්ති සහ ලිංගික හිංසනය සඳහා ශූන්‍ය අවස්ථා ඇතුලු සම අයිතිවාසිකම් ආවරණය කළ යුතු වනු ඇත. සදාචාරාත්මක වෙළඳ සන්නාම වැඩසටහන් සහ කාන්තා කේන්ද්‍රීය පුහුණු වැඩසටහන් මගින් කාන්තාවන්ට පුද්ගලික අංශයේ රැකියා අවස්ථා සහ නැගී එන කර්මාන්තවල හිමිකම ඉහළ නැංවීමට උදව් විය හැකිය.

කාන්තාවන්ට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට එක්වීමට සහ එහි සාර්ථක වීමට ඇති නොයෙකුත් ගැටලුවලට විසඳුම් සෙවීමට ප්‍රබල මැදිහත්වීමක් අවශ්‍ය වනු ඇතැයි" ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ සමාජ සංවර්ධන විශේෂඥවරියක සහ වාර්තාවේ කතුවරියක වන ජෙනිෆර් සොලතරොෆ් පැවසුවා ය. "අදාල රාජ්‍ය අමාත්‍යාංශ, අධ්‍යාපනය සඳහා වන සැපයුම්කරුවන්, රාජ්‍ය අංශයේ සහ විශේෂයෙන් පෞද්ගලික අංශයේ සේවායෝජකයන් යන අයගෙන් සැදුම්ලත් නන්විධ පාර්ශ්වකරුවන් ඵලදායී, ආරක්ෂිත හා සාධාරණ වැටුපක් සහිතව සේවය කිරීම සඳහා කාන්තාවන් වෙත වන අවස්ථා පුළුල් කිරීම සඳහා ඔවුන්ගේ බහුවිධ ශක්තිය යෙදවිය යුතුය.

## 4.3. කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා උපායමාර්ග හඳුන්වා දීම

නිදසුන් ලෙස, ලංකාවේ පමණක් නොව ලෝකයේ අනෙකුත් රටවල සේවා අංශය වර්ධනය කළවිට කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවිය හැකිය. ලංකාවේ සේවා වියුක්තිය දෙස බලන විට

5.7% ක මට්ටමක පවතී. එවැනි තත්ත්වයක කාන්තා සේවා වියුක්තිය 10% කට ආසන්නව පවතී. ලංකාවේ කාන්තාවන් අතර සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතී.

කාන්තා සේවා වියුක්තියෙන් 55% ක් පමණ සිටින්නේ අවු. 15- 29 වයසේ පසුවන කාන්තාවන් ය. එය ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයකි. මොවුන් සක්‍රීය වශයෙන් ආර්ථිකයට දායක විය. හැකි අවදියේදී සේවා වියුක්තිකව සිටී. ලංකාවේ කාන්තා සේවා වියුක්තිය අඩු කර කාන්තා සේවා නියුක්තිය වැඩි කිරීමේ ක්‍රමවේද සකස් කළ යුතු වේ. ඒ සඳහා ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ. එයට කාන්තා ව්‍යවසායකත්වය නඟා සිටුවිය යුතුය.

පුරුෂ පාර්ශවයට සාපේක්ෂව අප රටේ පවත්නා ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලන කාරණා මත කාන්තාවගේ දායකත්වය සෑම අංශයකම, අඩු වීමක් දක්නට ලැබේ. රට තුළ පවතින මේ ක්‍රමවේදය වෙනස් විය යුතු අතර ඒ සඳහා කාන්තා සේවා නියුක්තිය වැඩි කළ යුතු ය. කාන්තාව තුළින් ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා ගෙවල් මත පදනම් වු (Home Based Work) ව්‍යවසායකත්වයක් ක්‍රියාත්මක කළ යුතුය. එම ක්‍රමවේදය ශ්‍රී ලංකාව වැනි රටකට වඩාත් සුදුසුය.

කාන්තා ව්‍යවසායකයින් නඟාසිටුවීමේ රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳ අවධානයෙන් සිටිය යුතුය. කාන්තා ව්‍යවසායකයින් නඟාසිටුවීමේ ක්‍රමවේදයක් සකස් කරන විට, කාන්තා ව්‍යවසායකයින් බිහිවීම අවම වන කාරණා, කාන්තා ව්‍යවසායකයින්ට තිබෙන ගැටලු සහ එම ගැටලු මඟහරවා ගැනීමට කළ යුතු දෑ පිළිබඳ අවබෝධයෙන් සහ අවධානයෙන් බැලිය යුතුය. කාන්තාවන්ට තමන්ගේ දරු දැරියන්ගේ, පවුලේ සාමාජිකයින්ගේ වැඩපල කරන අතරතුර නිවසේ සිට යම් ව්‍යවසායකත්වයක් ආරම්භ කිරීමට උපකාර කළ යුතුය.

## 4.4. මාර්ගෝපදේශනය ලබාදීමට ක්‍රියා කිරීම

සැමියා හෝ දරුවන් යම්කිසි ආබාධයකට ගොදුරු වූ භාර්යාවන්ට සහ සැමියා මිය ගොස් තනිවම පවුල නඩත්තු කරන භාර්යාවන්ට තම ශක්තියෙන් ජීවිතය ගොඩනඟා ගැනීමට අවශ්‍ය උපදෙස් රජයෙන් ලබා දීමට පියවර ගත යුතුය. එවැනි කාන්තාවන්ට ගැටලුවකින් තොරව ස්වයං රැකියා ආරම්භ කිරීමට පසුබිම සකස් කර

දිය යුතුය. සෑම කාන්තාවකටම තනියෙන් ජීවිතය ගොඩනගා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ, නීතිමය උපදෙස් මෙන්ම මනෝවිද්‍යාත්මක උපදේශ ලබාදීම වඩාත් යහපත්ය. මෙවැනි ක්‍රියාමාර්ග ඔස්සේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දකුණු ආසියානු කාන්තාවන්ගෙන් ලැබෙන සහයෝගය වැඩි කර ගත හැක.

## 5. නිගමනය

දකුණු ආසියානු ආර්ථික සංවර්ධනය සඳහා කාන්තා දායකත්වය පෙර නොවූ විරූ පරිදි වර්ධනය වෙමින් පවතී. කාන්තා සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඇතිවී තිබෙන ප්‍රගතිය විසින් ඊට මනා පසුබිමක් සපයයි. ඒ ඔස්සේ දකුණු ආසියානු ආර්ථිකය තුළ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාන්තාවන් සංවර්ධනයට දායක වෙමින් සිටිති.

එහෙත් මෙම සහභාගීත්වය සීමා කරන බාධක රැසක් ද පවතී. ඒවා එහි ප්‍රමාණය ඒ රටවල සමාජ සංස්කෘතික සහ දේශපාලන බලපෑම් මත තීරණය කෙරෙන අතර එමගින් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර නොගත් විශාල ශ්‍රමයක් තවමත් අපතේ යමින් පවතී. මෙම ශ්‍රමය නිෂ්පාදන ක්‍රියාවලිය තුළට ඇද ගැනීමෙන් සහ ශ්‍රම වෙළෙඳපොළ තුළ කාන්තාව ශ්‍රමිකයන්ට පවත්නා වැටුප් විෂමතා සහ ණය සහ වෙනත් සහනාධාර ආදී ලබා ගැනීමේ අවහිරකම් මගහැරවීම දකුණු ආසියානු ආර්ථික සංවර්ධනය සඳහා ඉතාමත්ම හිතකර වනු ඇති බවට මෙම නිබන්ධනය ඔස්සේ ලබා ගත් නිගමනය වශයෙන් ගෙහැර දැක්විය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා විද්‍යුත් මූලාශ්‍ර නාමාවලිය


කාන්තාවන් තිස්හත් දහසක් මැදපෙරදිග ගෘහසේවයට. (2017). Retrieved from https://www.bbc.com/sinhala/sri-lanka-41384770

රත්නායක, ආර්.එම්. (2017). පුරාතන ඉන්දීය ආර්ථිකය තුළ ශ්‍රම භාවිතය. Retrieved from https://sinhala.archaeology.lk

රස්නායක., සුසන්ත. සහ ගලගමගේ., ප්‍රභාත්. (2019). දකුණු ආසියාව පිළිබඳ සමාජ විද්‍යාව. සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්ගලික) සමාගම: කොළඹ 10.

Ali Abbas. (2019). Women Empowerment in South Asia: Role of Women in Development of Pakistan. *International Journal of Research in Humanities and Social Studies,* 6(*2*), 42-49. Retrieved from https://www.ijrhss.org/papers/v6-i2/6.pdf

Ashray, B., Pande, Binita., Shrestha, & Carolyn, D. (2021). We need more women in data. https://asiafoundation.org/2021/04/14/we-need-more-women-in-data

Bhattacharya, B. (2009). *Participation analysis of south Asian rural women towards sustainable development in agriculture.* Retrieved from https://www.researchgate.net/publication/268854717_Participation_analysis_of_south_Asian_rural_women_towards_sustainable_development_in_agriculture

India: Female Unemployment. (2021). Retrieved from https://www.theglobaleconomy.com/India/Female_unemployment

Mahendra, S. (2000). Economic liberalisation and employment in South Asia. *Economic and Political Weekly*. 35(3), 135-146. Retrieved from https://www.jstor.org/stable/4408823

Moore, C., & McIntyre, V. (2017). *Women's economic opportunities: What can South Asian countries learn from each other*. Retrieved from https://www.theigc.org/blog/womens-economic-opportunities-can-south-asian-countries-learn

Nepal: Female labor force participation. (2021). Retrieved from https://www.theglobaleconomy.com/Nepal/Female_labor_force_participation

Nikore, Mitali. (2019). *Where are India's working women*. Retrieved from https://timesofindia.indiatimes.com/blogs/irrational-economics/where-are-indias-working-women

Statista Research Department. (2021). *Female labor force participation rate across India from 1990 to 2019*. Retrieved from https://www.statista.com/statistics/983020/female-labor-force-participation-rate-india

Strachan, G., Adikaram, A. & Kailasapathy, P. (2015). Gender (In)Equality in South Asia: Problems, Prospects and Pathways. *South Asian Journal of Human Resources Management*, 2(1), 1-11. doi: 10.1177/2322093715580222

United Nations Development Programme. (1995). *Human development report 1995*. Retrieved from https://www.undp.org/publications/human-development-report-1995

United Nations Population Fund. (2021). Women supporting women: Female bus conductors drive out violence in Bhutan. Retrieved from https://www.unfpa.org/news/women-supporting-women-female-bus-conductors-drive-out-violence-bhutan

West, Jackie., & Pilgrim, Sophie. (1995). *South Asian women in employment: The impact of migration, ethnic origin and the local economy*. Retrieved from

https://www.researchgate.net/publication/233444729_South_Asian_women_in_employment_The_impact_of_migration_ethnic_origin_and_the_local_economy

Women in agriculture in India. (no year). Retrieved from https://en.wikipedia.org/wiki/Women_in_agriculture_in_India

# ශ්‍රී ලංකාවේ පෞද්ගලික උපකාරක පන්තිවලින් එල්ල වන සෘණාත්මක සමාජ සංස්කෘතික බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

**ආර්. එම්. ඩබ්ලිව්. ජී. සචිනි රවින්දිකා රාජපක්ෂ**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**පේරාදෙණිය**

## 1. හැඳින්වීම

ටියුෂන් හෙවත් උපකාරක පන්ති යන වචනය පැමිණෙන්නේ ආරක්ෂාව, රැකවරණය, භාරකාරත්වය යන අර්ථය දනවන **'ටුයිසියොන්'** යන **ඇන්ග්ලෝ-ප්‍රංශ** වචනයෙනි. මෙම 'ටියුෂන්' යන වචනය තුළ අමතර ඉගැන්වීම් තුළින් ඇති කරන ආරක්ෂාව හෝ රැකවරණය මෙන්ම භාරකාරත්වය යන අර්ථය ද ඉස්මතු කරයි (උබේසිංහ, 2019). වර්තමානය වන විටදී ටියුෂන් හෙවත් උපකාරක පන්ති යන වචනය නොදන්නා පුද්ගලයෙක් නොමැති තරම්ය. නමුත් අදින් වසර තිහ හතළිහකට පමණ පෙරදී ටියුෂන් යන වචනය ශ්‍රී ලංකාවේ භාවිත නොවූහ. ඊට හේතුව වන්නේ දරුවන් හට විධිමත් ද්විතීක අධ්‍යාපනයක් ලබා දීම සඳහා එකල ස්ථාපිත කර තිබූ එකම ආයතන වූයේ රජය විසින් පාලනය කළ පාසල් සහ විශ්ව විද්‍යාල පමණි. නමුත් ශ්‍රී ලංකාවේ 1977 දී බලයට පත් එක්සත් ජාතික පක්ෂ රජය විසින් 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ මෙරට සමාජය සීඝ්‍රයෙන් වාණිජකරණය වූ අතර එම වාණිජකරණයේ ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනය ද වාණිජකරණයට ලක් විය. ටියුෂන් නමින් අප විසින් අද භාවිත කරනු ලබන උපකාරක පන්ති ක්‍රමය ද එම සමාජ ආර්ථික පරිවර්තනවල ප්‍රතිඵලයක් වූ අතර මෙම නවීන අධ්‍යාපනික ක්‍රමවේදය මුදල් ගෙවීමෙන් අධ්‍යාපනය ලබා ගැනීමේ ක්‍රමවේදයක් වශයෙන් හඳුන්වා දුනි. විශේෂයෙන්ම මෙම උපකාරක පන්ති ක්‍රමය ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික සංස්කෘතියට දායාද වූයේ 80 දශකයේදීය. මෙලෙස 80 දශකයෙන් පසුව මන්දගාමීව වර්ධනය වූ පෞද්ගලික උපකාරක පන්ති ක්‍රමය 90

දශකයෙන් පසුව ඉතාමත් සීඝ්‍රයෙන් ශ්‍රී ලංකාව පුරා වර්ධනය විය. එහිදී සංවිධානාත්මකව විශාල පරිමාණයේ ආයතන ප්‍රමාණයක් මෙම පෞද්ගලික ඉගැන්වීම් කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත විය. මෙලෙස 90 දශකයෙන් පසුව නිර්මාණය වූ පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතිය තුළ ප්‍රචාරණවාදී උපක්‍රම ද වර්ධනය වූ අතර ඒවා නවීන තාක්ෂණය සහ නිර්මාණාත්මක උපක්‍රම භාවිතයෙන් ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කරනු ලැබුවේ පුද්ගලයන් තුළ පෙළඹවීම වර්ධනය කර වැඩි පිරිසක් එම උපකාරක පන්ති සඳහා ගෙන්වා ගැනීම ඉලක්ක කොට ගෙනය (උබේසිංහ, 2019).

ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතියක් වර්ධනය කිරීමෙහිලා පාසල් අධ්‍යාපනය තුළින් ද විශාල බලපෑමක් එල්ල කරයි. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව ඇති කරන ලද අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ තුළින් අධ්‍යාපනයත් වෙනස් වෙන වෘත්තීයකරණයත් අතර සබඳතාවක් ඇති කර ගැනීමට අපොහොසත් වීම නිසා සිදු වූයේ අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක ප්‍රසාරණයට සාපේක්ෂව රැකියා නොමැති වීමයි. එමනිසා ජනප්‍රිය ගණයේ රැකියා සඳහා විශාල තරඟයක් වර්ධනය වූ අතර ඒ සඳහා සුදුසුකම් ලබා ගැනීමට දරුවන්ට බල කෙරෙන අධ්‍යාපනික පරිසරයක් නිර්මාණය විය. මේ පිළිබඳව 1972 වසරේ තරුණ අසහන කොමිසන් සභා වාර්තාවේ ද පෙන්වා දී තිබේ (උබේසිංහ, 2019). ශ්‍රී ලංකාව තුළ මෙලෙස ජනප්‍රිය රැකියා අවස්ථා සඳහා පවතින ඉල්ලුම වැඩිවීම හේතු කොට ගෙන ඒ සඳහා ඉහළ සුදුසුකම් ලබා ගැනීමට පාසල් අධ්‍යාපනය පමණක් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දෙමාපියන් විසින් තම දරුවන්ව පෞද්ගලික උපකාරක පන්ති කෙරෙහි යොමු කරන ප්‍රවණතාවයක් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමවේදය තුළදී තීරණ ගන්නා ප්‍රධාන දෙපාර්තමේන්තුව වන්නේ ජාතික අධ්‍යාපන ආයතනයයි. මෙම ආයතනයේ ඇතැම් දුර්වල නිර්දේශ හේතුවෙන් වර්තමානයේදී පාසල් අධ්‍යාපනික සංස්ථාවට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටලුවක් වන්නේ පාසල් කාලය තුළදී නිම කළ නොහැකි තරම් අති විශාල විෂය නිර්දේශයක් පාසල් ගුරුවරුන්ට ඉගැන්වීමට සිදු වීමයි. මෙම කාරණය හේතු කොටගෙන වර්තමාන පාසල් ගුරුවරුන් විසින් මුහුණ දී තිබෙන විශාල ගැටලුවක් වන්නේ වසර අවසානයේදී සෑම පාසලකම පාහේ බොහෝ විෂයන්හි විෂය කොටස් ආවරණය කර ගැනීමට

ගුරුවරුන්ට පවතින කාලය සීමිත වීමයි. මේ නිසා සෑම විෂයකම පාඩමේ අත්‍යවශ්‍ය විෂය කොටස් උගන්වා ගත නොහැකිව අතහැර දැමීමට පාසල් ගුරුවරුන් හට සිදු වේ (සෝමවීර, 2019). මෙලෙස පාසල් අධ්‍යාපනික පද්ධතියේ පවතින ගැටලු මුල් කොටගෙන පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතියක් බිහි වීමට පදනම සැකසුණි.

## 2. පෞද්ගලික උපකාරක පන්ති මඟින් සමාජයට එල්ල වන සෘණාත්මක සමාජ බලපෑම

පෞද්ගලික උපකාරක පන්ති මඟින් සමාජයට අත්වන සෘණාත්මක සමාජ බලපෑම් රැසක් පවතී. ඒවා පහත පරිදි සවිස්තරාත්මකව විග්‍රහ කළ හැක.

නූතනයේ පවතින තරඟකාරී අධ්‍යාපන ක්‍රමවේදය තුළ උසස් පෙළ හදාරන සිසුවෙකුගේ සරසවි සිහිනය යථාර්තයක් කරවීමට පෞද්ගලික උපකාරක පන්ති වෙත තම දරුවාව යොමු කිරීමට බොහෝ දෙමාපියන් විසින් පෙළඹී ඇත. නමුත් මෙම උපකාරක පන්ති සිදු කරන්නන් විසින් පුනරීක්ෂණ පන්ති, කණ්ඩායම් පන්ති, තනි පුද්ගල පන්ති යන විවිධ ක්‍රමෝපායන් පෞද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රයට හඳුන්වා දෙමින් එවා කරා පැමිණෙන පුද්ගලයන්ගෙන් අනිසි ලෙස මුදල් ගැනීම සිදු කරයි.

**උදා :** බොහෝ උපකාරක පන්තිවලදී එම උපකාරක පන්තියට ඇතුලත් වීමේ ගාස්තුව වශයෙන් එක් ගාස්තුවක් ද, මාසික ගාස්තුව වශයෙන් තවත් ගාස්තුවක් ද අයකර ගනී. ඇතැමුන් විසින් පුනරීක්ෂණ පන්ති සිදු කරන මුවාවෙන් එම උපකාරක පන්තියට ගෙවිය යුතු මාසික ගෙවීමට අමතරව පුනරීක්ෂණ පන්තියට සහභාගි වීම පදනම් කොටගෙන ද අමතර ගෙවීමක් අය කරයි. එසේම බොහෝ උපකාරක පන්ති ගුරුවරුන් විසින් විශාල ශාලාවක විශාල සිසුන් ප්‍රමාණයකට උපකාරක පන්ති සිදු කිරීමේදී යම් ගාස්තුවක් අය කළ ද එම ගාස්තුව එම විෂයම කණ්ඩායම් පන්තියක් ලෙස ඉගැන්වීමේදී දෙගුණයකින් වැඩි කර අයකර ගනී. මෙම උපකාරක පන්ති පවත්වනු ලබන ගුරුවරුන් විසින් තනි පුද්ගල පන්ති පැවැත්වීමේදී කණ්ඩායම් පන්ති සඳහා අය කරන මුදලටත් වඩා විශාල ගුණයකින් මුදල් අය කරන අතර මෙලෙස එක් එක් පන්ති සඳහා මාසිකව ගෙවිය යුතු ගාස්තුව ද හාත්පසින්ම එකිනෙකට

වෙනස් අගයක් ගනී. මෙමඟින් අවබෝධ වන්නේ සාමාන්‍ය මධ්‍යම පාන්තික ජනයාව සූරා කන අන්දමින් මෙම පෞද්ගලික උපකාරක පන්ති සිදු කරන පුද්ගලයන් විසින් තම ආර්ථික ශක්‍යතාවය ඉහළ නංවා ගැනීමට දරන වෑයමයි. විශේෂයෙන්ම සාමාන්‍ය මධ්‍යම පන්තියකට අයත් උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටීමට සූදානම් වන සිසුවෙක් විසින් අවම වශයෙන් මාසිකව රුපියල් 25,000 ත් 30,000 ත් අතර මුදලක් උපකාරක පන්ති සඳහා වැය කරයි. නමුත් මෙහි ඇති සෘණාත්මක ප්‍රතිඵලය වන්නේ ඇතැම් විට එම සිසුන්ගේ දෙමාපියන්ගේ ද මාසික වැටුප එම පෞද්ගලික උපකාරක පන්තිවලට ගෙවන මුදලටත් වඩා අවම වීම තුළ ඔවුන් බාහිර සමාජයට ණයගැති ප්‍රජාවක් බවට පත් වීමයි. එහෙත් තම දරුවාගේ අධ්‍යාපනික සුභසිද්ධිය උදෙසා බාහිර සමාජයට ණය කරුවෙක් වෙමින් හෝ පෞද්ගලික උපකාරක පන්ති සඳහා ගෙවීම් සිදුකර තම දරුවාව ඒ සඳහා කෙසේ හෝ යොමු කිරීමට දිළිඳු දෙමව්පියන් කටයුතු කරයි. එපමණක් නොව එම අවම වශයෙන් ගෙවීමට සිදුවන මුදලටත් වඩා වැඩි පිරිවැයක් ජීව විද්‍යාව, ගණිතය වැනි විෂය ධාරාවකින් උසස් පෙළ අධ්‍යයන කටයුතු සිදු කරන සිසුවෙකු හට ගෙවීමට සිදු වේ. ඊට හේතුව වන්නේ එම විෂයන් සමත් වීම සඳහා ඔවුන්හට පන්ති වාර බොහොමයකට සහභාගි වීමට සිදුවීම මත අමතර ගෙවීමක් වශයෙන් ද ඔවුන්ගෙන් අමතර මුදලක් මෙම උපකාරක පන්ති ගුරුවරුන් විසින් අය කර ගැනීමයි. මෙය වර්තමාන සමාජයේ දක්නට ලැබෙන කණගාටුදායක තත්ත්වයක් වන අතර ඇතැම් අවස්ථාවලදී කොතෙකුත් උපකාරක පන්තිවලට මුදල් වැය කළ ද ඇතැම් සිසුන්ට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමේ සිහිනය බොඳ කර ගැනීමට සිදුවීම මත පෙරදී බාහිර සමාජයට ණයගැති වී උපකාරක පන්තියට සහභාගී වීම සඳහා වැය කළ මුදල ද ගෙවා නොහැකිව ඔවුන් සමාජ, ආර්ථික සහ මානසික වශයෙන් දැඩි පීඩනයකට ලක්වන අවස්ථා වර්තමාන සමාජය තුළ බොහෝ සෙයින් දක්නට ලැබෙයි.

වර්තමානයේ උද්ගතව පවතින Covid 19 වසංගත තත්ත්වය හේතු කොටගෙන ඔන්ලයින් තාක්ෂණික ක්‍රමවේදය ඔස්සේ පන්ති පවත්වනු ලබන බොහෝ පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරුන් විසින් සිසුන් දස දහස් ගණනකගේ මුදල් සූරා කෑමට ලක් කරයි. විශේෂයෙන්ම මෙම ඔන්ලයින් තාක්ෂණික ක්‍රමවේදය ඔස්සේ

පෞද්ගලික උපකාරක පන්ති සිදු කිරීම හේතුවෙන් ශාලා ගාස්තු සහ එම ශාලා සඳහා විදුලිය හෝ වායු සමීකරණ වෙනුවෙන් වැයවන වියදම් මෙන්ම නිබන්ධන සඳහා ද කිසිදු වියදමක් එම උපකාරක පන්ති ගුරුවරුන් හට වැය කිරීමට අවශ්‍ය නොවේ. නමුත් ඇතැම් උපකාරක පන්ති ගුරුවරුන් විසින් වර්තමානයේදී ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ උපකාරක පන්ති පැවැත්වීම සිදු කළ ද පෙරදී ශාලා පන්ති සිදු කිරීමේදී සිසුන් හට ශාලා පහසුකම් ලබා දීම වෙනුවෙන් අය කරන ලද ශාලා ගාස්තුව ද කිසිදු අඩු කිරීමකින් තොරව පෙර මෙන් ඔවුන්ගෙන් අය කරනු ලබයි. මේ හේතුවෙන් බොහෝ පෞද්ගලික උපකාරක පන්ති සිදු කරන ගුරුවරුන් විසින් විශාල වශයෙන් අමතර ලාභයක් උපයයි. මෙම තත්ත්වය හමුවේ දැඩි පීඩනයකට පත් වන්නේ Covid 19 වසංගත තත්ත්වය හේතු කොටගෙන ආදායම් මාර්ග අහිමි වූ සාමාන්‍ය මහජනතාවයි.

**උදා :** වර්තමානයේදී ඔන්ලයින් තාක්ෂණික ක්‍රමවේදය ඔස්සේ පවත්වනු ලබන බොහෝ පෞද්ගලික උපකාරක පන්ති සඳහා සහභාගි වන සිසුන් එම උපකාරක පන්ති ගාස්තුව අදාළ උපකාරක පන්තිය සිදු කරන ගුරුවරයාගේ බැංකු ගිණුම වෙත බැර කර එම මුදල් ගෙවූ රිසිට්පත අදාළ පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරයා වෙත යොමු කළ යුතුය. නමුත් කවර හෝ හේතුවක් මත එම ගාස්තුව ගෙවීමට නොහැකි වූ සිසුන්ට එම ඔන්ලයින් පෞද්ගලික උපකාරක පන්ති සඳහා සහභාගී වීමට බොහෝ උපකාරක පන්ති ගුරුවරුන් විසින් අවස්ථාව ලබා නොදේ. එමෙන්ම වර්තමානයේ වාර්තා වී ඇති තොරතුරුවලට අනුව ඔන්ලයින් ක්‍රමවේදය ඔස්සේ ඉගැන්වීමේදී ද ළමුන් 1500-2000 අතර සංඛ්‍යාවක් සහභාගී වන මහා පරිමාණ පෞද්ගලික උපකාරක පන්ති සඳහා රුපියල් 2000, 2500 හෝ 3000 යනාදී වශයෙන් එක් සිසුවෙකුගෙන් මාසිකව මුදලක් අය කරයි. මෙලෙස රට පුරා පවත්වනු ලබන පෞද්ගලික උපකාරක පන්ති මඟින් එම උපකාරක පන්ති පවත්වනු ලබන ගුරුවරුන් මාසිකව විශාල ලාභයක් උපයන බව ද වාර්තා වේ (සිල්වා, 2021). නමුත් මෙහි ඇති සමාජමය බලපෑම වන්නේ Covid 19 වසංගතය නිසා විශාල වශයෙන් ආදායම් මාර්ග අහිමිව ගොස් සිටින ජනතාවට උසස් පෙළ පන්ති සඳහා විෂයන් තුනක් වෙනුවෙන් තම දරුවෙකු පෞද්ගලික උපකාරක පන්ති වෙත සහභාගි කරවීමට තරම් ප්‍රමාණවත් මූල්‍යමය වත්කමක් නොමැති වීමයි. මෙය ඉතා බරපතළ

ගැටලුවක් වන අතර විශේෂයෙන්ම බොහෝ දරුවන් හට ඔවුන් විසින් වර්තමානයේ මුහුණ පා සිටින අධික ජීවන බර හේතුවෙන් තම අධ්‍යාපනය අතරමඟදී නවතා දැමීමට පවා සිදුවීම ද කණගාටුව දනවන කරුණකි.

එසේම ඉතුරුම් අහිමි වීම නිසා ආයෝජන අවස්ථාවන් ගිලිහී යාම හේතු කොටගෙන පවුලේ ආර්ථිකයට පමණක් නොව ජාතික ආර්ථිකයට ද යම් අයහපත් බලපෑමක් මෙම උපකාරක පන්ති ක්‍රියාවලිය මඟින් එල්ල වේ. එමෙන්ම නිදහස් අධ්‍යාපනයක් ලබා දෙන ශ්‍රී ලංකාව වැනි රටක මවුපියන් හට අමතරව විශාල මුදලක් තම දරුවන්ගේ උපකාරක පන්ති වෙනුවෙන් දැරීමට සිදු වීම ද අතිශයින් ඛේදජනක සංසිද්ධියකි. එපමණක් නොව පාසල් පද්ධතියේ ගුරුවරුන් සඳහා වැටුප් ගෙවන අතරම ඒ සඳහා වූ බදු මුදල තම ආදායමෙන් ලබා දෙන දුප්පත් දෙමව්පියන් හට තම දරුවාව පෞද්ගලික උපකාරක පන්තිවලට ඇතුලත් කිරීම සඳහා තවත් අමතර වියදමක් දැරීමට සිදුවීම තුළින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය අන්තයටම ඇද දමන වාතාවරණයක් උදා වේ.

**උදා :** ශ්‍රී ලංකාවේ බොහෝ පාසල්වල උසස් පෙළ පන්ති පාසල් තුළ පැවැත්වීමට හැකියාව ලැබෙන්නේ මුල් වසර තුළ පමණි. එයට හේතුව වන්නේ බොහෝ සිසුන් විසින් 13 වසර වන විටදී පාසල් යාම අතහැර පෞද්ගලික උපකාරක පන්ති කරා යොමු වීමයි. මේ නිසා බොහෝ පාසල් ගුරුවරුන් හට 13 වසර සඳහා හඳුන්වා දී තිබෙන විෂය නිර්දේශය වසර ගණනාවක සිට සම්පූර්ණ ලෙස අවසන් කිරීමට නොහැකි වී තිබේ. මේ හේතුවෙන් රජයට විශාල පිරිවැයක් පාසල් පද්ධතිය නඩත්තු කිරීම සඳහා දැරීමට සිදුවන අතර මවුපියන් හට තම දරුවන් වෙනුවෙන් තම ආදායමෙන් වැඩි කොටසක් උපකාරක පන්ති සඳහා යෙදවීමට ද සිදුව තිබේ. එහි භයානක අවසන් ප්‍රතිඵලය වන්නේ වසර කිහිපයක් උපකාරක පන්ති සඳහා වියදම් කරමින් මුළු ආර්ථිකයම ඊට කැප කර අවසානයේදී තම දරුවන් තරඟකාරී විභාග කඩඉම්වලින් අසමත් වීම නිසා දෙමව්පියන් විසින් විශාල මානසික ඇද වැටීමකට සහ අපේක්ෂා භංගත්වයකට පත් වීමයි. මේ නිසා ඇතැම් දෙමව්පියන් මෙම මානසික පීඩනය දරා ගත නොහැකිව සියදිවි නසා ගැනීමට පවා පෙළඹෙන අවස්ථා වර්තමාන සමාජය තුළ බොහෝ සෙයින් අසන්නට සහ දකින්නට ලැබේ.

පෞද්ගලික උපකාරක පන්ති හේතු කොටගෙන උද්ගත වන තවත් සුවිශේෂී සමාජ ගැටලුවක් වන්නේ මෙම උපකාරක පන්තිවල පැවැත්ම පාසල් යන වයසෙහි පසුවන දරුවන්ගේ අධ්‍යාපනයට අභියෝගයක් වීමයි. මෙහිදී දරුවන් පාසල් නොපැමිණ උපකාරක පන්ති මතම රඳා පැවතීම හේතු කොටගෙන පාසල මඟින් සිදු කරන සමාජානුයෝජන ක්‍රියාවලිය සහ පෞරුෂ සංවර්ධනය අඩාල වීමත් මෙහිදී උද්ගත වන තවත් එක් ගැටලුවකි. විශේෂයෙන්ම උසස් පෙළ පන්තිවල දරුවන් සම්බන්ධයෙන් මෙම තත්ත්වය ප්‍රබලව දැකිය හැකි වන අතර මෙම උපකාරක පන්ති පවත්වන කාලය ද අවිද්‍යාත්මක ලෙස දීර්ඝ වීම හේතු කොටගෙන සිසුන්ගේ විවේකය සහ නිදහස ද අහිමි වී යයි. නමුත් පාසල තුළ ඉගැන්වීම් කටයුතු සිදු කරනුයේ නියමිත කාල පරිච්ඡේදයකදී නියමිත කාල සටහනකට අනුකූලවය. මේ නිසා දීර්ඝ කාල පරිච්ඡේදයක් එකම විෂයක් කෙරෙහි අවධානය යොමු කිරීමෙන් එල්ල වන මානසික අවිවේකී භාවය දරුවන් කෙරෙන් දුරු වන අතර පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට විවිධත්වයකින් යුතු විෂය මාලාවක් ඉගැන්වීම තුළින් ඒ ඒ කාල පරිච්ඡේදවලට අනුකූලව මානසික වශයෙන් අනවශ්‍ය පීඩනයකට ගොදුරු නොවී සිසුන් හට විවිධත්වයකින් යුතු දැනුම් සම්භාරයක් පාසල තුළින් ලබා ගැනීමේ හැකියාව ලැබේ. එමෙන්ම පාසල තුළින් ලබා දෙන විෂය දැනුම පමණක් නොව විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සිසුන්ව යොමු කිරීම තුළින් ද ඔවුන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීමට පාසල මඟින් ක්‍රියා කරයි.

**උදා :** පාසල තුළින් සිසුන්ගේ සමාජ කුසලතා ප්‍රවර්ධනය කරවන විවිධ ක්‍රීඩා තරග පවත්වා එම ක්‍රීඩා තරග ඔස්සේ ලබා ගත් ජයග්‍රහණයන් තවදුරටත් දිරිමත් කිරීමේ අරමුණින් ක්‍රීඩා උත්සව සංවිධානය කිරීම තුළින් සිසුන් හට ත්‍යාග ලබා දී ඔවුන්ව ඇගයීමකට පාත්‍ර කිරීම සිදු කරයි. එසේම පාසල තුළදී ළමා සමාජ, බාලදක්ෂ කඳවුරු හා ශිෂ්‍ය පාර්ලිමේන්තු වැනි විෂය බාහිර ක්‍රියාකාරකම් පැවැත්වීම මඟින් ද සිසුන්ගේ නායකත්ව හැකියාව, නිර්මාණශීලී චින්තනය, ඉවසීම, කණ්ඩායම් හැඟීම, තාර්කික බුද්ධිය සහ අවදානම් දැරීමේ හැකියාව වැනි මෘදු කුසලතාවයන් රැසක් සංවර්ධනය කරයි. එමෙන්ම විවිධ විෂයන් සඳහා ඉහළ සාමාර්ථ ලබා ගත් සිසුන්ගේ අධ්‍යාපනික කාර්ය සාධනය තවදුරටත් ඉහළ නංවාලීමේ අරමුණ පාදක කොට ගෙන ඔවුන්ව තවදුරටත් ධෛර්යමත් කරමින්, ඔවුන්ව

අගයමින් විවිධ ත්‍යාග සහ සම්මාන ලබා දීමට ද පාසල මඟින් කටයුතු කරයි. එපමණක් නොව විෂය සමගාමී එළිමහන් ක්‍රියාකාරකම්වලට අදාළ ලෙස පන්ති කාමරය සකස් කිරීම තුළින් ද සිසුන්ගේ මානසික සමබරතාවය යහපත්ව පවත්වා ගැනීමට ද පාසල් ගුරුවරුන් ක්‍රියා කරයි. මෙලෙස පාසල මඟින් විධිමත් ආකාරයෙන් සිසුන්ගේ පෞරුෂය සංවර්ධනය කරන අතර විධිමත් සමාජානුයෝජනය ක්‍රියාවලියකට සිසුන්ව භාජනය කිරීම ද සිදු කරයි. නමුත් පෞද්ගලික උපකාරක පන්ති මඟින් එලෙස පෞරුෂ සංවර්ධනයක් හෝ විධිමත් සමාජානුයෝජන ක්‍රියාවලියක් සිදු නොවන අතර පෞද්ගලික උපකාරක පන්තියක් තුළදී දරුවන් හට එකම ඉරියව්වකින් බොහෝ කාල වේලාවක් අදාළ විෂය කෙරෙහි අවධානය යොමු කිරීමට සිදු වීමෙන් ඔවුන්ගේ ශාරීරික ක්‍රියාකාරකම් පවා අඩාල වී සෞඛ්‍ය ගැටලු මතුවීමේ අවදානමක් ද එල්ල වේ. මේ අනුව පෞද්ගලික උපකාරක පන්ති යනු දරුවන්ගේ පෞරුෂය සහ සමාජානුයෝජනය ධනාත්මක ලෙස සංවර්ධනය කිරීමට ක්‍රියා නොකරන විෂය දැනුම පමණක් වෙළඳ භාණ්ඩයක් සේ මුදලට අලෙවි කරන ආර්ථික ලාභය මත පමණක් පදනම් වී ක්‍රියා කරන ඒකකයක් වශයෙන් ද සැලකිය හැක.

වර්තමානයේදී බොහෝ පාසල් ගුරුවරුන් විසින් පෞද්ගලික උපකාරක පන්ති පවත්වමින් පෞද්ගලික මට්ටමින් සිසුන් හට අධ්‍යාපනය ලබා දෙන අතර එහිදී ඔවුන් පාසලට සාපේක්ෂව උපකාරක පන්තිය තුළදී වැඩි විෂය කරුණු ප්‍රමාණයක් සහ වැඩි දැනුමක් සිසුන් හට ලබා දෙයි. එමෙන්ම වර්තමානයේ බොහෝ පාසල් ගුරුවරුන් වඩාත් උනන්දු වන්නේ පාසලේදී සිසුන්ට ඉගැන්වීමට නොව පෞද්ගලික උපකාරක පන්තිවලදී ඔවුන්ට ඉගැන්වීමටය. එහිදී ඇතැම් ගුරුවරුන් විසින් පාසල තුළ නාමිකව පමණක් පෙනී සිටින අතර පාසල තුළදී සිසුන් හට නිසි ලෙස විෂය දැනුමක් ලබා දීමට ක්‍රියා නොකර පෞද්ගලික උපකාරක පන්තිය තුළදී මුදල් ලබා ගැනීමේ පරමාර්ථයෙන් මහත් උනන්දුවකින් යුතුව සිසුන් හට අධ්‍යාපනික දැනුම ලබා දෙයි. නමුත් මෙහි පවතින බරපතළ තත්ත්වය වන්නේ ඇතැම් පාසල් ගුරුවරුන් විසින් පවත්වාගෙන යනු ලබන උපකාරක පන්තිවලට සහභාගී නොවන සිසුන් හට එම ගුරුවරුන් විසින් පාසලේදී නොයෙක් ආකාරයේ හිරිහැර සිදු කිරීමට පෙළඹීමයි. මෙවැනි හිරිහැර ගණනාවක්

නිරන්තරයෙන් වාර්තා වන බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තාවල ද සටහන්ව පවතී.

**උදා :** 2018 වසරේ පළ වූ වාර්තාවකට අනුව පහ වසර ශිෂ්‍යත්වය ඉලක්ක කර ගනිමින් පැවැත්වෙන අමතර ඉගැන්වීම් පන්ති සඳහා දරුවන් සහභාගි කරවා ගැනීම සම්බන්ධයෙන් ඇතැම් ගුරුවරුන් විසින් සිදු කරන බලපෑම් පිළිබඳව ඇතැම් මාපියන් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත පෞද්ගලිකව තොරතුරු ඉදිරිපත් කර ඇත (පෙරේරා, 2018).

ඇතැම් පාසල් ගුරුවරුන් විසින් සිසුන් හට පාසල තුළදී නියමිත ලෙස අධ්‍යාපනය ලබා නොදී ලාභ පරමාර්ථයෙන් තම පෞද්ගලික උපකාරක පන්තියට සිසුන්ව ගෙන්වා ගැනීම සඳහා කූඨ උපක්‍රම යොදා ගැනීම වර්තමානයේ දක්නට ලැබෙන සුලභ සංසිද්ධියකි. විශේෂයෙන්ම පාසල තුළ උගන්වන ලද කිසියම් විෂයකට අදාළ පුනරීක්ෂණ සහ තරඟකාරී විභාග ඉලක්ක කොටගත් ප්‍රශ්ණ පත්‍ර සාකච්ඡා කරනු ලබන අමතර සාකච්ඡා පන්ති පැවැත්වීම සඳහා තම පෞද්ගලික උපකාරක පන්තියට පැමිණෙන මෙන් බොහෝ පාසල් ගුරුවරුන් විසින් සිසුන් හට බලපෑම් එල්ල කරයි. එසේම තවත් ගුරුවරුන් කොට්ඨාශයක් විසින් පාසල් විෂය නිර්දේශයේ එක් කොටසක් පාසලේදී ද ඉතිරි කොටස පෞද්ගලික උපකාරක පන්තියේදී ඉගැන්වීමට ද කටයුතු කරයි. මෙමඟින් බොහෝ පාසල් සිසුන් දැඩි සේ පීඩනයකට ලක්වන අතර විශේෂයෙන්ම පෞද්ගලික උපකාරක පන්තියක් වෙනුවෙන් මුදල් වැය කිරීමටවත් නොහැකි අන්දමින් දැඩි සේ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ජීවත් වන සිසුන් මෙවැනි හේතු නිසා දැඩි අසරණ භාවයකට පත් වේ. මෙලෙස ආර්ථික වශයෙන් දිළිඳු භාවයට පත්ව සිටින දුවා දරුවන් පාසලේ මගපෙන්වීම යටතේ තම අධ්‍යාපනික අභිවෘද්ධිය ළඟා කර ගැනීමට අපේක්ෂා කළ ද පාසල තුළින් නිසි දැනුමක් දරුවන් හට ලබා නොදී එම දැනුම උපකාරක පන්ති වෙත පැමිණීම ඔස්සේ ලබා දීම තුළින් වර්තමාන දිළිඳු දරුවන්ට නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ නොලැබී යන තත්ත්වයක් උදා වී ඇත.

වර්තමාන පාසල් දරුවන් විසින් සතියේ දවස් 05 ක් පාසල් අධ්‍යාපනය වෙනුවෙන් කැප කොට ඉතිරි දවස් ද්විත්වය පෞද්ගලික උපකාරක පන්ති වෙනුවෙන් කැප කිරීම වත්මන් සමාජය තුළ සාමාන්‍යකරණය වී ඇති සංසිද්ධියකි. නමුත් මෙහි ඇති සෘණාත්මක

සමාජ බලපෑම වන්නේ මෙලෙස ඉවක් බවක් නොමැතිව පෞද්ගලික උපකාරක පන්ති කරා දරුවන් හතිලමින් දිව යාම හැර ඉන් පරිබාහිර කටයුතුවල නියැලීමේ ඉඩහසර ඔවුනට අහිමිව යාමයි. එතරම්ම මෙම පෞද්ගලික උපකාරක පන්ති නම් වාණිජ ව්‍යාපාරය විසින් දෙමාපියන් මෙන්ම දරුවෝ ද ආක්‍රමණය කර හමාරය. මෙහිදී දරුවෙකු හට අධ්‍යාපනය පමණක් නොව අධ්‍යාපනයෙන් පරිබාහිර වූ සමාජ කුසලතාවයන් සංවර්ධනය කර ගැනීම සඳහා ද අවස්ථාව ලබා දිය යුතුය. එනම් තම පවුලේ සාමාජිකයන් සමඟ සතුටු සාමීචියේ කාලය ගත කිරීමට සහ ඔවුන් සමග තම අදහස් උදහස් බෙදා හදා ගැනීම සඳහා දරුවා හට කාලවේලාවක් තිබිය යුතුය. එසේම තම සම වයස් සගයින් සමග කෙළිදෙළින් ගත කිරීම සඳහා දරුවාට කාල වේලාවක් තිබිය යුතුය. එපමණක් නොව තම පෞද්ගලික රසාස්වාදයන් දියුණු කර ගැනීම උදෙසා පොත් පත් සහ සඟරා කියවීම සඳහා දරුවාට ඉඩ හසර තිබිය යුතුය. තමා කැමති සංගීතයක් වෙත සවන් යොමු කිරීමට ඔවුනට විවේකයක් තිබිය යුතුයි. එසේම තම සමීපතමයන් සමඟ යම් විනෝදාස්වාදයක් ලබා ගැනීම සඳහාත්, නිවසෙන් පිටත බාහිර ලෝකය දැක ගැනීමට සහ බාහිර ලෝකයා සමඟ ගනුදෙනු කිරීම සඳහාත්, දරුවන්ට කාලයක් පැවතිය යුතුය. මෙවැනි ක්‍රියාකාරකම් තුළින් දරුවන්ට ප්‍රායෝගික වශයෙන් තම සමාජ දැනුම සංවර්ධනය ගැනීමට හැකියාව ලැබේ. නමුත් මෙම සියලු ක්‍රියාකාරකම් වර්තමානය වන විටදී දරුවන් කෙරෙන් ගිලිහී ගොස් ඇති අතර ඔවුන් විසින් පෞද්ගලික උපකාරක පන්ති පසුපසම හඹා ගොස් අවිවේකී වීම නිසා ඔවුන්ගේ ළමා කාලය වර්තමානය වන විටදී පෞද්ගලික උපකාරක පන්ති තුළම ගෙවී යයි. මෙය වත්මන් සමාජයේ ළමා පරපුර විසින් මුහුණ දෙනු ලබන ඉතාමත් බරපතළ සමාජ ගැටලුවක් වන අතර මෙවැනි තරඟකාරී අධ්‍යාපනික ක්‍රමවේදයක් තුළින් අවසානයේදී බිහි වන්නේ කිසිදු ප්‍රායෝගික දැනුමකින් තොර පොත්පතේ විෂය දැනුමින් පමණක් පරිපූර්ණ වූ නැණ ගුණදම් සහ සමාජමය දැනුමින් තොර රොබෝවරුන් මෙන් යාන්ත්‍රීකරණය වූ අනාගත පරම්පරාවකි. මෙම විශාල පරිහානිය සඳහා මූලික වශයෙන්ම අනුග්‍රාහකත්වය සපයනු ලබන්නේ විභාග ඉලක්ක කොට ගනිමින් ව්‍යාප්ත වන වාණිජකරණය වූ උපකාරක පන්ති මාෆියාවයි.

එහෙත් ඈත අතීතයේදී එලෙස දැඩි ලෙස වාණිජකරණය වූ උපකාරක පන්ති ක්‍රමවේදයක් ස්ථාපිත වී නොතිබුණු අතර පාසල පමණක් විධිමත් අධ්‍යාපනය ලබා දීමේ ප්‍රධාන ද්විතීක ඒකකය විය. එහිදී එකල සිසුන් හට පාසල් අධ්‍යාපනය ලබන අතරම බාහිර සමාජය සමඟ ගනුදෙනු කිරීම තුළින් අවිධිමත් ආකාරයේ සමාජානුයෝජනයක් ලබා ගැනීමට ද විශාල අවකාශයක් පැවතිණි. එහිදී අතීත දරුවන් හට තම සම වයස් සගයින් සමග කාලය ගත කිරීමට, තම පවුලේ සාමාජිකයින් සමඟ දුක සතුට බෙදා හදා ගැනීමට සහ නිදහසේ තම සමීපතමයන් සමඟ එක්ව විනෝද චාරිකාවක් ගොස් විනෝද වීමට යනාදී වශයෙන් විවිධ **ප්‍රතිලාභ** අත් විඳීමට හැකියාව ලැබුණි. එමඟින් ඔවුන් බුද්ධිමත්කමින් පමණක් නොව උගත්කමින් සහ සාරධර්මවලින් ද පරිපූර්ණ වූ සමාජයට වැඩදායි යහපත් ගුණාංගවලින් යුතු පුරවැසියන් බවට පත් විය.

වර්තමානය වන විටදී තරඟකාරී අධ්‍යාපනික රටාව පදනම් කොටගත් උපකාරක පන්ති මතම දරුවන් තම ළමා කාලය වැය කිරීම හේතු කොටගෙන ඔවුන් හට සමාජයට ගොස් විවිධ අත්දැකීම් සහ පරිචයන් ලබා ගනිමින් සමාජශීලී පුරවැසියෙක් බවට පත්වීමේ ඉඩ හසර අවහිර වී තිබේ. අද වන විට මෙම උපකාරක පන්ති මාෆියාව නිසා පාසල් සිසුන් තුළ **'කෙසේ හෝ එකිනෙකාව පරයා ජයගත යුතුය'** යන ආකල්පය හෙවත් මමත්වය පෙරදැරි කොටගත් ගුණාංගයන් වර්ධනය වී ඇත. ඊට හේතුව වන්නේ පෞද්ගලික උපකාරක පන්ති මඟින් සිසුන් තුළ සංවර්ධනය කරන්නේ ආත්මාර්ථකාමී ගුණාංගයන් වීමයි. එනම් වඩාත් හොඳ සාමාර්ථයක් ලබා ගනිමින් විශ්වවිද්‍යාල වරම් ලැබීමටත්, අනාගතයේදී හොඳ රැකියා අවස්ථාවක් කරා යාමටත් මදක් ආත්මාර්ථකාමී ලෙස කටයුතු කළ යුතු බවත්, උසස් පෙළ වැනි තරඟකාරී විභාගවලදී අනෙකාට උදව් කරමින් පරිත්‍යාගශීලී ලෙස කටයුතු කිරීම තුළින් තමා හට අවාසියක් එල්ල විය හැකි බැවින් මෙම තරඟකාරී විභාග කඩඉම තුළදී සීමිත සිසුන් ප්‍රමාණයක් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම හේතුවෙන් අනෙකාව පරදා කෙසේ හෝ විශ්ව විද්‍යාල වරම් හිමිකර ගත යුතුය යන මමත්ව පෙරදැරි කොටගත් මානසිකත්වයක් පෞද්ගලික උපකාරක පන්ති තුළින් ශිෂ්‍ය මනස තුළ ප්‍රවර්ධනය කරයි. නමුත් එහි අවසන් ප්‍රතිඵලය වන්නේ දරුවන් තුළ කුඩා කල සිටම සංවර්ධනය වී පැවති සහයෝගයෙන් බෙදා හදාගෙන කටයුතු

කිරීමේ මානසිකත්වය, පරාර්ථකාමී භාවය සහ ත්‍යාගශීලිත්වය වැනි ගුණධර්ම විනාශ වී ගොස් ආත්මාර්ථකාමී ලෙස තම අරමුණු සහ අභිමතාර්ථයන් පමණක් ඉටු කර ගැනීමේ සෘණාත්මක මානසිකත්වයක් ප්‍රවර්ධනය වීමයි. මෙලෙස උපකාරක පන්ති මඟින් දරුවන් තුළ ආකල්පමය වශයෙන් සංවර්ධනය කරන ලද සෘණාත්මක ගුණාංග හේතු කොටගෙන එය අනාගතයේදී මෙරටේ ආර්ථික සහ සමාජමය සංවර්ධනයට ද විශාල බාධාවක් වේ. එනම් අනාගතයේදී බොහෝ පුද්ගලයන් තුළ සාමූහිකව වැඩ කිරීමේ ගුණාංගය, කණ්ඩායමක් ලෙස සංවිධානය වී මෙරට සංවර්ධනය කිරීමට ක්‍රියා කළ යුතුය යන මානසිකත්වය දුරු වී ගොස් තමා පමණක් ආර්ථිකමය වශයෙන් දියුණු වී තමා පමණක් ගුණාත්මක ජීවන මට්ටමක් කරා ළඟා විය යුතුය යන ආත්මාර්ථකාමී මානසිකත්වයෙන් කටයුතු කරන මතු පරපුරක් අවසානයේදී බිහි වේ. මෙය ඉතාමත් ඛේදනීය තත්ත්වයක් වන අතර මෙම තත්ත්වය වෙනස් කිරීමට වර්තමානයේදී කටයුතු නොකිරීම මත එය මෙරට සමාජ, සංස්කෘතික සහ ආර්ථික සංවර්ධනය අඩාල වීමට ප්‍රබල සෘණාත්මක බලපෑමක් එල්ල කළ හැක.

නූතනයේදී උපකාරක පන්තිවලට සහභාගි වීම හේතුවෙන් සිසුන් ශාරීරික සහ මානසික ගැටලුවලට මුහුණ පාන බව ජාතික අධ්‍යාපන කොමිසන් සභාව අනාවරණය කරන ලද්දේ 2010 වසරේ කරන ලද සමීක්ෂණයකිනි. මෙහිදී සිසුන් උපකාරක පන්තිවලට සහභාගි වීම පිළිබඳ තත්ත්වය, ඒවාට යොමු වීමට බලපාන හේතු සාධක සොයා බැලීම සහ ඒ ආශ්‍රිතව හටගන්නා සමාජ ගැටලු හඳුනා ගැනීම වැනි අරමුණු 06 ක් ඉලක්ක කර ගනිමින් සිදු කරන ලද එම සමීක්ෂණයේ ප්‍රතිඵල ඉතාමත් අයහපත් මට්ටමක පවතින බව පෙන්වා දී තිබේ. මෙහිදී ජාතික අධ්‍යාපන කොමිසන් සභාව මෙම සමීක්ෂණය සඳහා පළාත් 06 ක දිස්ත්‍රික්ක 15 ක් පුරා විහිදුණු පාසල් 80 ක සිසුන් යොදා ගෙන තිබේ. මෙම පාසල් 80 ට ජාතික පාසල් 30 ක් ද ඇතුළත්ව තිබේ. මෙහිදී 10 වන ශ්‍රේණියේ සිසුන් 2578 ක් ද, 12 වන ශ්‍රේණියේ සිසුන් 884 ක් ද මෙම සමීක්ෂණයට භාජනය වී තිබේ. මීට අමතරව උසස් පෙළ විභාගයෙන් සමත් වූ සිසුන් 310 ක් පාසල් 135 ක් නියෝජනය වන පරිදි එම සමීක්ෂණයට යොදා ගෙන තිබේ. එමෙන්ම 10 වන ශ්‍රේණියේ හා උසස් පෙළ පන්තිවල

උගන්වනු ලබන ගුරුවරුන් 513 ක් සහ දෙමව්පියන් 220 ක් ද මෙම සමීක්ෂණය සඳහා භාජනය වී තිබේ. මේ අනුව මෙම සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් පෙන්වා දෙන්නේ 10 වන ශ්‍රේණියේ විෂයන් සඳහා බහුලව උපකාරක පන්ති පවත්වා ඇත්තේ රජයේ පාසල්වල ඉගැන්වීමේ යෙදී සිටින ගුරුවරුන් වන බවත් එම ප්‍රතිශතය දළ වශයෙන් 65 % ඉක්මවා ඇති බවත් සොයා ගෙන තිබේ. එහිදී උසස් පෙළ පන්ති පිළිබඳව අවධානය යොමු කිරීමේදී උසස් පෙළ පන්ති සඳහා උපකාරක පන්ති පවත්වන රජයේ ගුරු ප්‍රතිශතය 40 % ක් පමණ වන බව ද මෙහිදී සොයාගෙන තිබේ. මෙම 2010 වර්ෂයේ පැවැත් වූ සමීක්ෂණයට අනුව 10 වන ශ්‍රේණියේ සිසුන් මසකට එක් විෂයක් සඳහා රුපියල් 325 ක් පමණ ද, උසස් පෙළ වාණිජ විෂය ධාරාවෙන් ඉගෙනුම ලබන සිසුන් එක් විෂයකට රුපියල් 425 ක් පමණ ද, විද්‍යා විෂය ධාරාවෙන් ඉගෙනුම ලබන සිසුන් එක් විෂයකට රුපියල් 775 ක් පමණ ද වැය කරන බව අනාවරණය වී තිබේ. ඒ කෙසේ වුවද තනි තනිව හෝ අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් ලෙස ගුරුවරුන්ගෙන් ඉගෙන ගැනීමේදී එක් ශිෂ්‍යයෙකු වැය කළ යුතු මුදල ඉහත අගයන්වලට සාපේක්ෂව බෙහෙවින් ඉහළ අගයක් ගන්නා බව මෙම සමීක්ෂණ වාර්තාව තුළින් පෙන්වා දී තිබේ. එපමණක් නොව දහවැනි ශ්‍රේණියේ සියලුම සිසුන් විෂයන් 10 ක් සඳහා මසකට රුපියල් දස ලක්ෂ දෙසිය විසිපහක් අවම වශයෙන් උපකාරක පන්ති සඳහා වැය කරන අතර උසස් පෙළ වාණිජ විෂය ධාරාවෙන් ඉගෙනුම ලබන සිසුන් මසකට වැය කරන මුදල රුපියල් දස ලක්ෂ හැත්තෑ හතරකි. කලා විෂය ධාරාවෙන් ඉගෙනුම ලබන සියලුම සිසුන් මසකට රුපියල් දස ලක්ෂ අනූඅටක් සහ ජීව විද්‍යා විෂය ධාරාවෙන් ඉගෙනුම ලබන සියලුම සිසුන් මසකට රුපියල් දස ලක්ෂ අසූනවයක් ද වැය කරන බව එම සමීක්ෂණ වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වී ඇත. තවද උසස් පෙළ ගණිතය විෂය ධාරාවේ සිසුන් මසකට වැය කරන මුදල රුපියල් දස ලක්ෂ හැට අටක් වන බව ද එහිදී සොයා ගෙන තිබේ (මදුරාවල, 2012). මෙලෙස රුපියල් දස ලක්ෂ ගණනින් වැය කරන මුදල් උපකාරක පන්ති ගාස්තු පමණි. නමුත් එම ගාස්තුවලට අමතරව උපකාරක පන්ති වෙත යාමේදී වැයවන ගමන් වියදම්, ආහාර පාන සඳහා වැය කිරීමට සිදුවන මුදල් ද මේ සඳහා එක් කළ යුතු වේ.

මෙම උපකාරක පන්තිවලට සහභාගි වීමේදී සිසුන්ට එල්ල වන ගැටලු සම්බන්ධයෙන් ද කරුණු රැසක් මෙම සමීක්ෂණ වාර්තාවෙන් අනාවරණය කරයි. එයට අනුව, උපකාරක පන්තිවලට සහභාගී වීමේ අතුරු ප්‍රතිඵල ලෙස අසම්මත ප්‍රේම සම්බන්ධතා පැවැත්වීමට පාසල් සිසුන් යොමු වීම, මත්ද්‍රව්‍ය භාවිතා කිරීම වැනි සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා යොමු වීමට සිසුන්ට ඉඩ හසර ලැබීම, පෞද්ගලික අතවරයන්ට සහ තර්ජනයන්ට ගොදුරු වීමට සිදුවීම, සිසුන් හට විශාල මානසික සහ ශාරීරික ගැටලු රැසකට මුහුණ පෑමට සිදුවීම, නිසි වේලාවට ආහාර නොගැනීම, සමබල ආහාර වේලක් නොලැබීම හා තාක්ෂණික ආහාර පානවලට යොමු වීම නිසා සිසුන් බරපතළ ශාරීරික රෝගවලට ගොදුරු වීමේ ඉහළ ප්‍රවණතාවක් පැවතීම, විවේකය සහ විනෝදය අඩු වීමල අධික තෙහෙට්ටුවකින් මෙන්ම දැඩි මානසික පීඩනයකින් කල්ගත කිරීම නිසා සිසුන් මානසික රෝගවලට ගොදුරු වීමේ ප්‍රවණතාවය ඉහළ යාම වැනි ගැටලු රැසකට මෙම තරඟකාරී විභාග උන්මාදය සහ ඒ හා සම්බන්ධ උපකාරක පන්තිවලට සහභාගි වීම තුළින් සිසුන් හට අත්වන අයහපත් ප්‍රතිඵල වන බව මෙම ජාතික අධ්‍යාපන කොමිසන් සභා වාර්තාව මඟින් පෙන්වා දී තිබේ (මදුරාවල, 2012).

ඉහත සඳහන් සමීක්ෂණය පිළිබඳව තවදුරටත් විමර්ශනය කිරීමේදී පෙනී යන්නේ මෙම පෞද්ගලික උපකාරක පන්ති පවත්වනු ලබන බොහෝ ගුරුවරුන්ගේ මූලික අරමුණ වන්නේ වාණිජ ඉලක්කයන් පමණක් බවත්, එහිදී සිසුන් හට මෙම උපකාරක පන්තිවලට සහභාගි වීම නිසා එල්ලවන අතුරු අර්බුදයන් කෙරෙහි පෞද්ගලික උපකාරක පන්ති පවත්වන ගුරුවරුන් විසින් කිසිදු වගකීමක් නොදරන බවත්ය. මේ නිසා මුදල පමණක් පදනම් කොටගෙන ක්‍රියාත්මක වන බොහොමයක් පෞද්ගලික උපකාරක පන්ති හේතුවෙන් මෙම උපකාරක පන්තිවලට සහභාගි වන සිසුන් දැඩි පීඩාවකට පත් වේ. නමුත් මීට වසර 12 කට පෙර ජාතික අධ්‍යාපන කොමිසන් සභාව විසින් සිදුකරන ලද මෙම සමීක්ෂණයට අනුව උපකාරක පන්ති සඳහා දෙමාපියන් විසින් වැය කරමින් සිටි රුපියල් දස ලක්ෂ ගණන වර්තමානය වන විටදී දෙගුණ තෙගුණ වීම නිසා මෙම උපකාරක පන්ති සඳහා සහභාගී වන සිසුන්ගේ දෙමව්පියන් ද දැඩි ආර්ථික පීඩනයකට ගොදුරු වී ඇති බව පෙනී යයි.

පෞද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රය මඟින් එල්ල කරන තවත් එක් ප්‍රබලතම ඍණාත්මක සමාජ බලපෑමක් වන්නේ වර්තමාන උපකාරක පන්ති ගුරුවරුන් විසින් තම උපකාරක පන්තිය වෙත පැමිණෙන සිසුන් හට කායික, මානසික සහ ලිංගිකමය වශයෙන් එල්ල කරනු ලබන බලපෑමයි. එහිදී කායික වශයෙන් සිසුන් හට දැඩි සේ පහර දීම, තම අධ්‍යාපනික ආයතනය වෙත පැමිණෙන සිසුවියන්ව අපයෝජනයට සහ අපහරණයට ලක් කිරීම, සිසුන්ගේ කීර්ති නාමයට අපහාස වන සේ ඔවුන්ව ප්‍රසිද්ධියේ නින්දාවට සහ අපහාසයට ලක් කිරීම, සිසුන්ව කෲර දඬුවම් සහ වධ බන්ධනවලට ලක් කිරීම වැනි කායික, මානසික, ලිංගික සහ චිත්තවේගීමය බලපෑම් රැසක් පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරුන් හමුවේ සිසුන්ට අත්විඳීමට සිදුවේ. එවැනි ඍණාත්මක සමාජ බලපෑම්වලට නිදසුන් වර්තමාන සමාජයේ ජන මාධ්‍ය ඔස්සේ බොහෝ සේ දකින්නට සහ අසන්නට ලැබේ.

**උදා :** ඉන්දියාවේ පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරුන්ගේ කෲරත්වය හමුවේ හිංසනයට ලක් වූ සිසුන් පිළිබඳව වාර්තා වූ සිදුවීම් අනන්තවත් අසන්නට ලැබේ. එයින් 2020 වසරේදී අසන්නට ලැබුණු සිදුවීම් අතුරින් එක් සිදුවීමක් වන්නේ ඉන්දියාවේ වයස අවුරුදු තුනක් පමණ වූ පිරිමි දරුවෙකු වන ඩීව් කාෂාප්ට ඔහුගේ පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරයා විසින් සිදු කරන ලද දරුණු පහර දීමයි. එහිදී එම උපකාරක පන්ති ගුරුවරයා කාෂාප්ගේ මුහුණට සහ ඔහුගේ ශරීරයේ වෙනත් අවයවවලට ලී කැබැල්ලකින් දරුණු ලෙස පහර එල්ල කර ඇත. එසේ එල්ල කරන ලද දරුණු පහරවල් වල ප්‍රභලත්වය හමුවේ මෙම කුඩා දරුවා එම ස්ථානයේදීම සිහිසුන්ව ඇද වැටී ඇත. එසේම මෙම උපකාරක පන්ති ගුරුවරයා විසින් එල්ල කරන ලද පහර දීම්වල ප්‍රබලත්වය හේතු කොටගෙන එම දරුවාගේ මුහුණ ඇතුලු අනෙකුත් ශරීර අවයව දරුණු ලෙස ඉදිමී ඇති බවට ඉන්දීය මාධ්‍ය මඟින් වාර්තා කරයි. නමුත් මේ පිළිබඳව එම පහර දීම සිදු කළ ගුරුවරයාගෙන් විමසූ විටදී ඔහු පවසා ඇත්තේ එම දරුවාගේ අතට, පිටුපසට සහ හිසට පමණක් තමා විසින් කුඩා ලී කෝටුවකින් පහර දුන් බවයි (ලක්මිණී, 2020). නමුත් කුඩා ලී කෝටුවකින් පහර දීම තුළින් එලෙස දරුණු ගණයේ ශාරීරික හායනයන් සිදුවන්නේ නැත. ඔහු විසින් තමා සිදු කළ එම වරද සාධාරණීකරණය කිරීම උදෙසා මුසා බස් පවසන ආකාරයක් මෙම

සංසිද්ධිය විග්‍රහ කිරීමේදී පෙනී යයි. මේ අනුව අවබෝධ වන්නේ කිසිදු නියාමනයක් සහ වගකීමක් නොමැති පෞද්ගලික උපකාරක පන්තිවලට දරුවන්ව යොමු කිරීම හේතු කොටගෙන එම උපකාරක පන්ති තුළදී සිදු වන්නේ සිසුන්ට අධ්‍යාපනය ලබා දීම නොව එම උපකාරක පන්ති ගුරුවරුන්ගේ පෞද්ගලික කෝපයන් සහ විරසකයන් සිසුන් මාර්ගයෙන් පිරිමසා ගැනීම බව මෙම සංසිද්ධිය විමර්ශනය කිරීමේදී පෙනී යයි.

ඇතැම් පෞද්ගලික උපකාරක පන්ති සිදු කරනු ලබන ගුරුවරුන් විසින් සිසුන්ට අධ්‍යාපනය ලබා දීමේ මුවාවෙන් තම විකෘති ලිංගික ආශාවන් තම උපකාරක පන්තියට සහභාගි වන සිසු සිසුවියන් යොදා ගනිමින් මුදාහැරීමට පෙළඹේ. විශේෂයෙන්ම තම උපකාරක පන්තියට පැමිණෙන සිසුවියන්ගේ ලිංගික අවයව අනවශ්‍ය ලෙස ස්පර්ශ කිරීමට යාම, රාගය උද්දීපනය වන ප්‍රකාශන ඉදිරිපත් කිරීම තුළින් සිසුන්ව ලිංගික කර්තව්‍යයන් සඳහා පොළඹවා ගැනීම වැනි අපගාමී ක්‍රියාකාරකම් වර්තමානයේ උපකාරක පන්ති පවත්වන ඇතැම් පුද්ගලයන් විසින් සිදු කරයි. මෙය ඉතාමත් ඛේදනීය තත්ත්වයක් වන අතර මෙමගින් අවසානයේදී එම පෞද්ගලික උපකාරක පන්තියට සහභාගි වන සිසුන්ගේ ජීවිත අකාලයේ විනාශ වීමට පවා ඉඩකඩ පවතී.

**උදා :** ශ්‍රී ලාංකික අපරාධ ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ බරපතලම ළමා ලිංගික අපයෝජනය සහ අන්තර්ජාතික ළමා කාම වීඩියෝ ජාවාරමක් පිළිබඳව 2021 වසරේදී වාර්තා විය. මෙම සිදුවීමට පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරයෙක් සම්බන්ධ බව ශ්‍රී ලංකාවේ මාධ්‍ය මඟින් වාර්තා කර ඇත. මෙහිදී මෙම වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි විෂය උගන්වනු ලැබූ උපකාරක පන්ති ගුරුවරයෙක් විසින් බාලවයස්කාර දරුවන් රැසක් ලිංගිකව අපයෝජනය කරමින් එම ලිංගික අපයෝජනයන් සිදුකළ වීඩියෝ පට තැටිවලට නගා යුරෝපයේ, ඇමරිකාවේ සහ ඕස්ට්‍රේලියාවේ විකෘති කාමාතුරයන්ට අලෙවි කර තිබෙන බවට වාර්තා වී ඇත. එසේම මෙම පෞද්ගලික ඉංග්‍රීසි උපකාරක පන්ති ගුරුවරයා විසින් තම වෛද්‍ය මිතුරෙක් සමඟ එක් වී මෙම ජාවාරම වසර ගණනාවක් පුරා පවත්වා ගෙන ගොස් තිබෙන අතර එමඟින් ඔවුන් අති විශාල මුදලක් ද උපයාගෙන තිබෙන බවට වාර්තා වී ඇත. එසේම ශ්‍රී ලංකා පොලිසිය විසින් සිදු කරන ලද විමර්ශනවලට අනුව මෙම ගුරුවරයාගේ පන්නිපිටියේ

පිහිටි නිවසෙහි අල්මාරියක තිබී ඔහුගේ උපකාරක පන්තිය සඳහා පැමිණි දරුවන්ගේ ලිංගික අවයව සහිත දර්ශන ඇතුළත් අසභ්‍ය සීඩී පට බවට සැක කෙරෙන තැටි 130 ක් සහ දරුවන්ගේ යට ඇඳුම් 25 ක් පමණ ද සොයා ගෙන තිබේ. පොලිස් විමර්ශනවලට අනුව මෙම උපකාරක පන්ති ගුරුවරයා විසින් දරුවන් 20 දෙනෙකුට අධික පිරිසක් අපයෝජනයට ලක් කර ඇති බවට තොරතුරු හෙළි වී ඇති අතර එම දරුවන් සියලු දෙනා වයස අවුරුදු 8 ත් 12 ත් අතර වයසේ පසුවන්නන් බවත් සොයා ගෙන තිබේ (ප්‍රනාන්දු, 2021).

පෞද්ගලික උපකාරක පන්තිවල එක් ස්වරූපයක් වන ශාලා පන්ති සම්ප්‍රදාය වෙත අවධානය යොමු කළ විටදී මෙම පන්ති බොහෝ සෙයින් පවත්වනු ලබන්නේ පාසල් ගුරුවරුන් නොවන පුද්ගලයන්ය. ඔවුන් බොහෝ විට විශ්වවිද්‍යාල උපාධිධාරීන් වේ. නමුත් ජනප්‍රිය උපකාරක පන්ති ගුරුවරුන්ගේ මෙවන් ශාලා පන්ති සඳහා අවම වශයෙන් සිසුන් 700 ක් හෝ 800 ක් පමණ සහභාගි වන අතර මෙම ජනප්‍රිය උපකාරක පන්ති ගුරුවරුන් කොළඹ, ගම්පහ, කළුතර සහ ගාල්ල වැනි ප්‍රධාන නගරවල සතියකට වරක් උපකාරක පන්ති පවත්වනු ලබයි. එසේම එක් නගරයක විශාල උපකාරක පන්ති සංඛ්‍යාවක් ඔවුන් විසින් පවත්වයි. මෙලෙස පවත්වනු ලබන උපකාරක පන්ති හේතු කොටගෙන අවමය ලක්ෂ 30 ක් පමණ ඉක්මවන මාසික ආදායමක් එම ගුරුවරුන් විසින් උපයයි. මේ නිසා මොවුන් විසින් දැඩි සුඛෝපභෝගී ජීවිතයක් ගත කරයි. නමුත් මේ අතර සිටින බොහොමයක් ජනප්‍රිය ගුරුවරුන් සිසුන් විසින් ගෙවන ලද මුදලට සරිලන ලෙස අධ්‍යාපනික පහසුකම් සලසයි ද යන ගැටලුව මතු වේ.

**උදා :** කොළඹ පෞද්ගලික උපකාරක පන්තිවල තත්ත්වය යම්තාක් දුරකට සතුටුදායක වුවද කොළඹ අවට පවතින පෞද්ගලික උපකාරක පන්ති පවත්වන ආයතන බොහොමයක් ඉතා සුප්‍රසිද්ධ නම් යටතේ පවතින ආයතන වුවත් එම ආයතන තුළට ගොස් පන්තිවල තත්ත්වය නිරීක්ෂණය කළ විටදී බොහොමයක් පෞද්ගලික උපකාරක පන්ති කණු කිහිපයක් උඩ නංවා ඇති වහලක් සහිත, ඇස්බැස්ටෝස් සෙවිලි කළ සහ බිමට සිමෙන්ති යෙදූ ඉතා ප්‍රාථමික ගොඩනැගිලි බව බොහෝ උපකාරක පන්ති නිරීක්ෂණය කළ විටදී පෙනී යයි. එහිදී සිසුන්ට අසුන් ගැනීම සඳහා ලෑලි බංකු සකසා ඇති අතර ඒවා

කෙතරම් පටුයි ද කිවහොත් සිසුන් හට ඒවා මත ප්‍රමාණවත් පරිදි සුවපහසු ලෙස අසුන් ගැනීමට තරම්වත් හැකියාවක් නැත. බොහෝවිට එක් බංකුවක අසුන් ගැනීමට හැකි සිසුන් සංඛ්‍යාව පස්දෙනෙක් නම් හත් දෙනෙකු හෝ අට දෙනකු පමණ එම බංකුවල බලෙන්ම වාඩි කරවීමට එම පෞද්ගලික උපකාරක පන්තිවල සේවය කරන පුද්ගලයන් විසින් කටයුතු කරයි. නමුත් මෙලෙස දීර්ඝ කාලීනව ඉතා පටු බංකුවක් තුළ දීර්ඝ වේලාවක් ඉතා අපහසුවෙන් අසුන්ගෙන සිටීම තුළ එම පන්තිවලට සහභාගී වන සිසුන් හට කොන්දේ ආබාධ, දනිස් ආබාධ සහ තුනටියේ ආබාධ වැනි කායික රෝගී තත්ත්වයන්වලට මෙන්ම වෙනත් අතුරු රෝගාබාධවලට ද අවසානයේ ගොදුරු වීමට සිදු වේ. මෙම බොහොමයක් උපකාරක පන්තිවල සනීපාරක්ෂක පහසුකම් දෙස අවධානය යොමු කිරීමේදී බොහෝ ආයතනවල පවතින්නේ සීමිත වැසිකිලි පහසුකම් වන අතර ඒවා ද බොහෝ විට දීර්ඝ කාලයක් මුළුල්ලේ කිසිදු පවිත්‍රතාවයකට භාජනය නොකොට අපිරිසිදු තත්ත්වයෙන් පවතින ඒවා වේ. මෙලෙස මෙම උපකාරක පන්ති සඳහා සහභාගි වන සිසුන් හට ගුණාත්මක සනීපාරක්ෂක පහසුකම් වත් නොලැබීම හේතු කොට ගෙන බොහෝ සිසුන් මෙම අපිරිසිදු සනීපාරක්ෂක පහසුකම් හමුවේ සෞඛ්‍යමය වශයෙන් විවිධ රෝගාබාධවලට පවා ගොදුරු වීමට ඉඩකඩ පවතී. එමෙන්ම ජලය පානය කිරීම සඳහා ඉදිකර ඇති ජල කරාම ද බාල ප්‍රමිතියකින් යුතු වේ. එම පානීය ජලය ද බොහෝ විට අපිරිසිදු තත්ත්වයේ පවතී. මෙම අපිරිසිදු ජලය හේතු කොට ගෙන පාචනය, සෙංගමාලය වැනි දරුණු රෝගාබාධවලට පවා සිසුන් භාජනය වීමට දැඩි අවධානමක් ඇත. එපමණක් නොව සිසුවෙකු හට අසනීපයක් වූ විටෙක විවේක ගැනීමට තරම්වත් සුදුසු පහසුකම් බොහෝ පෞද්ගලික උපකාරක පන්තිවල දක්නට නොලැබීම ද ඉතා ඛේදනීය තත්ත්වයකි.

උක්ත නිදසුන දෙස අවධානය යොමු කළ විටදී පෙනී යන්නේ බොහොමයක් පෞද්ගලික උපකාරක පන්ති හුදෙක්ම එම උපකාරක පන්ති පවත්වනු ලබන ගුරුවරයාගේ ආර්ථික ලාභය මත පමණක් පදනම් වී ක්‍රියාත්මක වීම නිසා එම පන්ති සඳහා සහභාගී වන සිසුන්ගේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පහසුකම් කෙරෙහි ඔවුන් අවධානය යොමු නොකරන බවය.

පෞද්ගලික උපකාරක පන්ති මඟින් එල්ල වන තවත් ප්‍රබල සමාජ බලපෑමක් වන්නේ ඇතැම් රටවල දෙමව්පියන් විසින් තම දරුවන්ව පෞද්ගලික උපකාරක පන්ති සඳහා යොමු කිරීමේදී ඔවුන් හට විශාල වියදමක් දැරීමට සිදුවීම හේතු කොටගෙන බොහෝ දෙමාපියන් විසින් නැවත දරුවන් සෑදීම පිළිබඳව අධෛර්යමත් වී තිබේ. නමුත් එය අනාගතයේදී එම රටවල සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වන ශ්‍රම බලකා සහභාගීත්වය අවම වීමට ද දැඩි බලපෑමක් එල්ල කරයි. මේ නිසා මෙම පෞද්ගලික උපකාරක පන්ති හේතු කොටගෙන එල්ල වන ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ඇතැම් රටවල රජයන් මැදිහත් වී පෞද්ගලික උපකාරක පන්ති තහනම් කිරීමට පියවර ගෙන තිබේ. එපමණක් නොව ඇතැම් රටවල් විසින් මෙලෙස පෞද්ගලික උපකාරක පන්ති තහනම් කිරීමට පාදක කර ගත් තවත් අරමුණක් වන්නේ වයස අවුරුදු 06 සිට 15 දක්වා වූ ළමුන් සඳහා අනිවාර්ය අධ්‍යාපන පීඩනය ලිහිල් කිරීමයි. නමුත් මෙවැනි නීති රීති හමුවේ වර්ධනය වන අයහපත් අතුරු ප්‍රතිඵල වන්නේ ඇතැම් රටවල වාසය කරන බොහොමයක් ජනයා මෙම පෞද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රයෙහි රැකියා සිදු කිරීම නිසා කුමන හෝ හේතුවක් මත මෙලෙස පෞද්ගලික උපකාරක පන්ති තහනම් කළහොත් එය ඔවුන් විරැකියාවට ලක්වීමේ අවදානම ඉහළ යාමටත්, පෞද්ගලික උපකාරක පන්ති කර්මාන්තය විනාශ වීමේ තර්ජනයකට ලක් වීමටත් විශාල ඉඩකඩක් පැවතීමයි. එසේම මෙලෙස උපකාරක පන්ති තහනම් කිරීමට විවිධ රටවල රජයන් විසින් ක්‍රියා කිරීම හේතු කොටගෙන උද්ගත වන තවත් එක් ඍණාත්මක සමාජ බලපෑමක් වන්නේ උපකාරක පන්ති ක්ෂේත්‍රයෙහි නියැලෙන බොහොමයක් පුද්ගලයන් විරැකියාවට ලක්වීම මත ශ්‍රම බලකා සහභාගිත්වය ද අවම වී එය එම රටවල ආර්ථික සංවර්ධනය අඩාල කිරීමට ද විශාල බලපෑමක් එල්ල කිරීමයි.

**උදා :** චීන රජය විසින් පාසල් විෂයන් පාසලෙන් පිටතදී කිසිදු ආකාරයක ප්‍රතිලාභයක් ලබන පදනමකින් එනම් උපකාරක පන්ති ලෙස ඉගැන්වීම සඳහා තහනම් කිරීමට කටයුතු කර ඇත. මීට හේතුව ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ චීනයේ පවුලකට දරු උපත් සඳහා පනවා තිබූ නීති සංශෝධනය එනම් දරුවන් දෙදෙනෙකුගේ සිට තිදෙනෙකු දක්වා සෑදීමට අවසර ලබා දීමේ ක්‍රමයට තිබෙන උනන්දුව පෞද්ගලික උපකාරක පන්ති සඳහා වැයවන වියදම් හේතුවෙන් අඩුවේ යැයි සැක කළ නිර්දේශයකි. එම නිර්දේශයෙන්

පෙන්වා දෙන්නේ පෞද්ගලික උපකාරක පන්ති සඳහා වැයවන වියදම් ඉහළ යාම හේතුවෙන් චීන වැසියන් විසින් දරුවන් තිදෙනෙකු දක්වා සෑදීමට අධෛර්යමත් වන බවයි. එපමණක් නොව චීනයේ සිදුකරන කරන ලද තවත් සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ චීන දෙමව්පියන්ගෙන් 92 % ක් වසරකට ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ තුනකට වඩා වැඩි මුදලක් ගෙවා තම දරුවන්ව බාහිර උපකාරක පන්තිවලට ඇතුලත් කරන බවත්, එය මුළුමනින්ම පාහේ තරඟකාරීත්වය හේතු කොටගෙන ගොඩනැගුණු කර්මාන්තයක් වන අතර චීන පාසල්වල ඉගැන්වීම් ක්‍රියාවලිය හොඳ මට්ටමක පැවතියදී මෙලෙස දෙමව්පියන් තම දරුවන්ව බාහිර උපකාරක පන්ති සඳහා යොමු කිරීම මඟින් දරුවන් හට අනවශ්‍ය ලෙස පීඩනයක් සහ බර පැටවීමක් සිදුවන බවත් මෙම සමීක්ෂණය මඟින් පෙන්වා දෙයි (ගමගේ, 2021).

චීන රජය විසින් පෞද්ගලික උපකාරක පන්ති තහනම් කිරීමට මුල් වූ තවත් එක් ප්‍රධාන අරමුණක් ලෙස පෙන්වා දෙන්නේ වයස අවුරුදු 06 සිට 15 දක්වා වූ ළමුන් සඳහා අනිවාර්ය අධ්‍යාපන පීඩාව ලිහිල් කිරීමයි. නමුත් චීන විධායකයින් සහ ප්‍රාදේශීය මාධ්‍ය සිදුකළ ගණනය කිරීම්වලට අනුව චීනයේ මිලියන 10 ක ජනතාවක් මෙම උපකාරක පන්ති ක්ෂේත්‍රයෙහි රැකියා කරන බව සොයාගෙන ඇති අතර මෙම පෞද්ගලික උපකාරක පන්ති තහනම් කිරීම මඟින් එම උපකාරක පන්ති කර්මාන්තය විනාශ වී මිලියන 10 ක් වූ ජනතාවකගේ රැකියා අහිමි වීමට පවා ලක් විය හැකි බවත් මෙම සමීක්ෂණයෙන් සොයාගෙන තිබේ. එසේම චීන මාධ්‍ය විසින් පෙන්වා දෙන තවත් කරුණක් වන්නේ මෙලෙස පෞද්ගලික උපකාරක පන්ති තහනම් කිරීම තුළින් චීනයේ මධ්‍යම පන්තියට බරපතළ ගැටලුවකට මුහුණ පෑමට සිදුවන බවයිග එනම් චීනයේ ධනවත් පාන්තිකයන් හට රජයේ බලධාරීන් කිසිවෙකුටත් නොදැනෙන සේ තම සුඛෝපභෝගී නිවාසවලට පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරුන් ගෙන්වා උපකාරක පන්ති සඳහා තම දරුවාව යොමු කිරීමේ හැකියාවක් පවතී. නමුත් මධ්‍යම පාන්තික දෙමව්පියන්ට එලෙස තම දරුවන් හට නිසි ලෙස අධ්‍යාපනයක් ලබා දීමට නොහැකි වීම හේතු කොට ගෙන ඔවුන් තුළ තම දරුවන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණයන් පිළිබඳව සැක සංකා පහල වී තම දරුවන්ගේ අනාගතය ගැන දැඩි කනස්සල්ලකින් පසුවන බව ද චීන

මාධ්‍ය විසින් පෙන්වා දෙයි (ගමගේ, 2021). ඉහත දැක්වූ නිදසුන මඟින් අවබෝධ වන්නේ පෞද්ගලික උපකාරක පන්ති හේතුවෙන් ප්‍රබල සෘණාත්මක සමාජ බලපෑම් රැසක් උද්ගත වන බවයි.

වර්තමානය වන විටදී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය ද සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග හා සමගාමීව අතිශය තරඟකාරී මට්ටමකට ළඟා වී ඇත. එනම් මෙම සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග සඳහා පවතින උපකාරක පන්ති ක්‍රියාවලිය 6, 7 හා 8 ශ්‍රේණිය දක්වාද, ශිෂ්‍යත්වය ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන උපකාරක පන්ති ක්‍රියාවලිය ඉන් ඔබ්බට ගොස් වර්තමානය වන විටදී 2, 3 සහ 4 වෙනි ශ්‍රේණිවල ඉංග්‍රීසි හා ගණිතය වැනි විෂයන් කරා ද ව්‍යාප්ත වී ඇත. මෙහි ඇති සුවිශේෂත්වය වන්නේ එක් දෙමව්පියෙක් විසින් සිය දරුවාව උපකාරක පන්තියකට ඇතුළත් කළ විටදී සෙසු දෙමව්පියන් ද එය අනුගමනය කරමින් සිය දරුවන්ව ද උපකාරක පන්ති කරා යොමු කිරීමයි. මෙලෙස උපකාරක පන්ති ආරම්භ කරන බහුතරයක් පුද්ගලයන් ප්‍රාථමික ශ්‍රේණි සඳහා උගන්වනු ලබන රජයේ පාසල්වල ගුරුවරුන් වේ. නමුත් මෙම පවතින ක්‍රමය හමුවේ උපකාරක පන්ති රැල්ලට හසු නොවන දෙමව්පියෙක් හෝ දරුවෙක් වෙත් නම් ඒ ඉතා අල්ප පිරිසකි. මෙහි ඇති ගැටලුව වන්නේ ඇතැම් ගුරුවරුන් පන්ති කාමරයේදී ඉගැන්වීම් සිදු නොකර සිටීමයි. එමගින් ඔවුන් අපේක්ෂා කරන්නේ තමන්ගේ උපකාරක පන්තියට තම පාසලේ සිසුන්ව ගෙන්වා ගැනීමය. නමුත් උපකාරක පන්තියේදී සිය හැකියාව සහ දක්ෂතාවය මුදලට අලෙවි කරන එවැනි ගුරුවරුන් පාසල් පන්ති කාමරයේදී නිදි කිරමින් මාසය අවසානයේ ජනතාවගේ බදු මුදලින් වැටුප් ද ලබති. එහෙත් උපකාරක පන්තියට නොපැමිණෙන සිසුවා කෙතරම් දක්ෂයෙක් වුවත් ඔවුන්ව පාසල් පන්ති කාමරයේදී කිසිදු සැලකිල්ලකට භාජනය නොකෙරේ. පාසල තුළදී ඔවුන්හට නිරන්තරයෙන් සිදුවන්නේ උපකාරක පන්ති සිදු කරන පාසල් ගුරුවරුන්ගේ කොන් කිරීම් සහ ප්‍රතික්ෂේප කිරීම්වලට භාජනය වීමටය. මෙලෙස දරුවන්ගේ මනස කඩා ඉහිර වන්නේ මනස සෑදිය යුතු ගුරුවරයාම වීමේ අභාග්‍යයට මුහුණ දීමට ශ්‍රී ලාංකික පාසල් සිසුන්ට සිදු වී ඇත. එවැනි අවස්ථාවන්හිදී දෙමව්පියන් අපේක්ෂා කරන්නේ දරුවාගේ මානසික ඇද වැටීම වැළැක්වීම සඳහා උපකාරක පන්තියට අකමැත්තෙන් හෝ ඔවුන්ව යොමු කරවීමටය. මෙලෙස උපකාරක පන්ති ක්ෂේත්‍රය හේතු

කොටගෙන දරුවන් පමණක් නොව දෙමව්පියන් ද දැඩි සේ මානසික වශයෙන් පීඩාකාරී තත්ත්වයන්ට මුහුණ පා සිටී.

නූතනයේදී ශිෂ්‍යත්ව විභාගය මුල් කර ගනිමින් උපකාරක පන්ති කරා දරුවන්ව යොමු කිරීමට දෙමාපියන් හට සිදු වී තිබේ. ඒ අතර දෙවැනි, තුන්වැනි හා හතරවැනි ශ්‍රේණිවල දරුවන් හට ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන් සඳහා උපකාරක පන්ති ආරම්භ කරන ගුරුවරයාගේ අරමුණ වී ඇත්තේ මුදල් ඉපැයීමේ පරමාර්ථයයි. මෙම බිස්නස් මානසිකත්වය හෙවත් මුදල් ඉපැයීමේ මානසිකත්වය විසින් දෙමාපියන් වෙත එල්ල කරනු ලබන පෙළඹවීම අවසානයේ යොමු වන්නේ දරුවන් දෙසටය. **"කැමැත්තෙන් හෝ අකමැත්තෙන් පොත පතට පමණක් සීමා වෙයව්"** යන විධානය දරුවන් මත දෙමාපියන් හට අවසානයේදී පැටවීමට සිදුවේ. මෙලෙස විභාගය පමණක් දරුවන්ගේ මනසට කා වැදීමට ඉඩ හරිනු ලබන කණගාටුදායක ඉරණම හමුවේ බොහොමයක් දරුවන් කුඩා කල සිටම දැඩි සේ අසරණ භාවයටත්ල දැඩි පීඩනයකටත් ලක් වේ. මේ නිසා වර්තමාන දරුවන්ට පාසල් නිවාඩු කාලයේදී පාසල් නිවාඩුව ගත කිරීමට පවා අවකාශයක් නැත. ඊට හේතුව වන්නේ කෙළිදෙලෙන් ගත කළ යුතු එම වටිනා කාලය කුඩා කාලයේ සිටම උපකාරක පන්තියේ දිය කර හැරීමට දරුවන්ට සිදු වීමයි. මේ නිසා ළමුන් හට තම ජීවිතයට අත්‍යවශ්‍ය වෙනත් සමාජමය ගුණාංගයක් උකහා ගැනීමට පවතින ඉඩ ප්‍රස්ථාවන් මෙම පෞද්ගලික උපකාරක පන්ති මාෆියාව හමුවේ අහිමිව යාම ඉතාමත් ඛේදනීය තත්ත්වයක් ලෙස සැලකිය හැක.

## 3. පෞද්ගලික උපකාරක පන්ති මඟින් සමාජයට එල්ල වන සෘණාත්මක සංස්කෘතික බලපෑම

නූතනයේ දී මාෆියාවක් සේ ව්‍යාප්තව පවතින පෞද්ගලික උපකාරක පන්ති මඟින් විශාල සෘණාත්මක සංස්කෘතික බලපෑමක් ද එල්ල කරයි. එම සෘණාත්මක සංස්කෘතික බලපෑම් පහත පරිදි විග්‍රහ කළ හැක.

නූතන උපකාරක පන්ති කණ්ඩායම් පන්ති, ආයතනික පන්ති, තනි පුද්ගල පන්ති, පුනරීක්ෂණ පන්ති සහ ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කරනු ලබන පන්ති යනාදී ලෙස වර්ගීකරණය කළ හැක. මීට අමතරව ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ලබා දීම වැනි විශේෂිත කරුණු අරභයා සිදු කරනු ලබන උපකාරක පන්ති ද ඇති අතර ඒවා

බොහෝ විට ආරම්භ වන්නේ සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාගවලින් පසුවය. මේ ආදී ලෙස එකම විෂය තුළ විවිධ වර්ගයේ පෞද්ගලික උපකාරක පන්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් ජනප්‍රිය භාවයට පත් කරනු ලබන්නේ නූතන තරඟකාරී විභාග කඩයිම් ඉලක්ක කර ගනිමිනි. නමුත් මෙහි ඇති ඍණාත්මක සංස්කෘතික බලපෑම වන්නේ මෙම බොහොමයක් උපකාරක පන්තිවල අවසාන ප්‍රතිඵලය සිසුන්ව විභාගයෙන් සමත් කරවීම පමණි. මෙමඟින් අවසානයේදී රොබෝවරයෙක් මෙන් යාන්ත්‍රීකරණය වූ කිසිදු ආධ්‍යාත්මික ගුණ වගාවකින් තොර විෂය දැනුමින් පමණක් පරිපූර්ණ වූ පුරවැසියෙක් නිර්මාණය වේ. එසේම මෙම තරඟකාරී උපකාරක පන්ති ක්‍රමවේදය තුළින් සිසුන් තුළ කටපාඩම් කිරීමේ මානසිකත්වයක් වර්ධනය කරවන අතර ඔවුන් තුළ පවතින නිර්මාණශීලී චින්තනය, තාර්කික චින්තනය සහ ස්වාධීනව සිතා බලා ගැටලු සහ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව මොට කර දමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගතයේදී මෙම ශිෂ්‍ය ප්‍රජාව සමාජයට ගොස් සමාජයේ වෙසෙන විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයන් සමග ගනුදෙනු කිරීමේදී බොහෝ අභියෝග සහ ගැටලු රැසකට මුහුණ දෙන අතර විශේෂයෙන්ම තරඟකාරී පෞද්ගලික උපකාරක පන්ති ක්‍රමවේදය තුළින් දරුවන්ගේ මනස තුළ ස්ථාපිත කරන ලද කටපාඩම් කිරීමේ මානසිකත්වය සහ සටහන් මතම යැපීමේ මානසිකත්වය හේතු කොටගෙන අනාගතයේදී ස්වාධීනව සිතා බලා යම් ගැටලුවක් විසඳීමේ හැකියාව සහ ඒ ඒ අවස්ථාවලට උචිත ලෙස නිර්මාණශීලීව තීන්දු තීරණ ගැනීමේ කුසලතාවය වැනි මෘදු කුසලතාවයන් දරුවන් තුළින් ගිලිහී යයි.

එපමණක් නොව කුඩා කාලයේදී පවුල නම් ප්‍රාථමික සමාජ ඒකකය මඟින් දරුවන් තුළ සංවර්ධනය කිරීමට වෑයම් කරන ලද සමගිය, සහෝදරත්වය, බෙදා හදා ගැනීමේ ගුණාංගය, ඉවසීම, පරාර්ථකාමීත්වය සහ ත්‍යාගශීලී භාවය වැනි ගුණාංගයන් මෙම තරඟකාරී විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක වන පෞද්ගලික උපකාරක පන්ති මඟින් විනාශ කර දමයි. එසේම වර්තමානයේ පාසල් පද්ධතිය තුළත් ඉන් පිටතත් අත්විඳිනු ලබන සමාජ සහ සංස්කෘතික පරිහානිය නිර්මාණය වන්නේ ද මෙම විභාග කේන්ද්‍රීය අධ්‍යාපනික රටාව හේතුවෙනි. විශේෂයෙන්ම වත්මන් පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතිය තුළ මෙම විභාග කේන්ද්‍රීය තරඟකාරීත්වය වඩාත් උග්‍ර ලෙස දක්නට දක්නට ලැබේ.

පෞද්ගලික උපකාරක පන්ති ක්‍රමය විසින් සිසුන්ට ලබා දෙන අසීමිත නිදහස හේතු කොටගෙන මත්ද්‍රව්‍ය භාවිතය සහ ලිංගික ප්‍රේම සම්බන්ධතා යනාදිය පැවැත්වීම සඳහා පාසල් යන වයසේ සිටම සිසුන් තුළ පෙළඹවීමක් ඇති කරවයි. විශේෂයෙන්ම ඇතැම් උපකාරක පන්ති ගුරුවරුන් විසින් විශාල සිසුන් සංඛ්‍යාවක් තම පන්තියට කැඳවා ගැනීමටත්, ඔවුන්ව තම පන්තිය තුළම රඳවා ගැනීමටත් අසීමිත නිදහසක් සිසුන් හට ලබා දෙන අතර සිසුන්ගේ ලිංගික හැඟීම් උද්දීපනය වන සේ අතිශය රහසිගත ලිංගිකමය අසභ්‍ය දෑ පවා ඔවුන් සමග බෙදා හදා ගැනීමට පවා ඇතැම් උපකාරක පන්ති ගුරුවරුන් ක්‍රියා කරයි. එහෙත් මෙලෙස බොහෝ උපකාරක පන්ති ගුරුවරුන් විසින් සිසුන්ට ලබා දෙන අසීමිත නිදහස සහ ඔවුන් තුළ ඇති කරන අසම්මත පෙළඹවීම් යනාදිය විධිමත් ලිංගික අධ්‍යාපනයක් නොමැති ශ්‍රී ලංකාව වැනි රටකට ඇති කරනුයේ ඉතාමත් ඍණාත්මක සංස්කෘතික බලපෑමකි. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ උපකාරක පන්ති යන මුවාවෙන් පොත් බෑගය කරෙහි දමාගෙන තම පාසල් පෙම්වතුන් සමග මුහුදු තීරවල, තානායම්වල සහ හෝටල් කාමරවල පාසල් අධ්‍යාපනය ලබන වයසෙහි පසුවන බාල වයස්කාර දරුවන් මහා වැඩිහිටියන් සේ ලිංගික ක්‍රියාකාරකම් අත්හදා බැලීමට යොමු වීමයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් වගකිව යුතු එක් සාධකයක් වන්නේ ද වගකීම් විරහිත ලෙස ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව පවතින පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතියයි.

මෙම උපකාරක පන්ති හේතු කොටගෙන ඇති වන තවත් සංස්කෘතික පරිහානියක් වන්නේ, ඇතැම් පෞද්ගලික උපකාරක පන්ති පවත්වන පුද්ගලයන් උගන්වන මුවාවෙන් තම ලිංගික සංතෘෂ්ටිය සපුරා ගැනීමේ පරමාර්ථය පෙරදැරි කොටගෙන තම උපකාරක පන්තියට පැමිණෙන සිසුවියන් සමග ප්‍රේම සබඳතාවයන් ආරම්භ කරයි. නමුත් අවාසනාවන්ත ලෙස එවැනි වංචනික පුද්ගලයන්ගේ කුඨ උපායන්වලට රැවටී ඇතැම් සිසුවියන් විසින් එම පුද්ගලයා සැබැවින්ම තමා හට ප්‍රේම කරන බව සිතා එම උපකාරක පන්ති ගුරුවරයාගේ චාටු බස් සහ රැවටිලිකාර වදන්වලට හසු වී තම පවිත්‍රත්වය පවා කැප කරමින් එම උපකාරක පන්ති ගුරුවරයා සමග යහන් ගත වේ. මෙවැනි සංසිද්ධීන් නූතන සමාජයේ බොහෝ සෙයින් අසන්නට ලැබේ. නමුත් මෙමගින් එල්ල වන අයහපත් සංස්කෘතික බලපෑම වන්නේ බොහොමයක් සිසුවියන් විසින්

උපකාරක පන්ති පවත්වනු ලබන පුද්ගලයන් සමඟ සිදු කරන ලද අසම්මත ප්‍රේම සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස පාසල් යන සමයේදීම ගැබ් ගැනීම්වලට ලක් වීමයි. නමුත් මෙහි පවතින කණගාටුව දනවන කරුණ වන්නේ බොහෝ උපකාරක පන්ති සිදු කරන පුද්ගලයන් විසින් ඔවුන් සැබැවින්ම ප්‍රේම කරන බව හඟවමින් තම සියලු ලිංගික අවශ්‍යතාවයන් තම උපකාරක පන්තියට සහභාගි වන සිසුවියන්ව ගොදුරක් කර ගනිමින් සංතෘප්ත කර ගැනීමට ක්‍රියා කිරීමයි. නමුත් කිසියම් මොහොතකදී මෙම උපකාරක පන්ති පවත්වන පුද්ගලයන් විසින් තම ලිංගික අවශ්‍යතාවයන් සඳහා යොදාගත් යම් සිසුවියක් හදිසි ගැබ් ගැනීමකට ලක් වූ විටෙකදී එම වංචනික උපකාරක පන්ති ගුරුවරුන් එම උපකාරක පන්තිය සහ තම ව්‍යාජ ප්‍රේම වෘතාන්තය ද අතරමග නවතා දමා පලා යයි. මෙලෙස තම උපකාරක පන්ති ගුරුවරයා හමුවේ ගැබ් ගැනීම්වලට ලක් වූ සිසුවියන් හට සමාජයෙන් ද නින්දා අපහාස සහ ප්‍රතික්ෂේප කිරීම් රැසකට මුහුණ පෑමට සිදු වේ. එසේම සාම්ප්‍රදායික ලෙස පුරුෂාධිපත්‍යට යටත් වූ සංස්කෘතියක් නිර්මාණය වී පවතින ශ්‍රී ලංකාව වැනි සමාජයක් තුළ මෙලෙස ගැබ් ගැනීම්වලට ලක් වූ පාසල් යන වයසෙහි පසුවන සිසුවියන් 'ගණිකාවන්' යැයි ලේබල් ගත කිරීමට ද ලාංකික සමාජයේ ඇතැම් පුද්ගලයන් විසින් ක්‍රියා කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගතයේදී සැබැවින්ම ඔවුන්හට ගණිකාවක් ලෙස එම වෘත්තියෙහි නියැලීමට අවශ්‍ය පසුබිම ද මේ තුළින් නිර්මාණය කරන අතර බොහෝ සිසුවියන් තමා ජීවත් වන සමාජ සංස්කෘතික පරිසරයෙන් සහ පවුල් සංස්ථාව තුළ තම දෙමව්පියන් හා නෑදෑ හිතමිතුරන්ගෙන් ද එල්ල වන දැඩි විවේචන සහ පීඩාවන් හමුවේ සමාජයට මුහුණ දීමට නොහැකිව සියදිවි නසා ගැනීම වැනි ක්‍රියාවන් කිරීමට පවා පෙළඹේ.

පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතියේ දක්නට ලැබෙන තවත් ඍණාත්මක සංස්කෘතික පැතිකඩක් වන්නේ බොහෝ ප්‍රසිද්ධ උපකාරක පන්ති ගුරුවරුන් විසින් ඔවුන්ගේ උපකාරක පන්තියට සිසුන්ව ආකර්ෂණය කර ගැනීම සඳහා විශාල තරඟයක නියැලේ. විශේෂයෙන්ම මෙම පෞද්ගලික පන්ති සිදු කරනු ලබන ගුරුවරුන් එකිනෙකා සමග කුලල් කා ගනිමින් තම උපකාරක පන්තිය ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ දැවැන්ත ප්‍රචාරණයක නියැලේ. එහිදී විශාල පිටු ප්‍රමාණයක දීර්ඝ විස්තරයක් සහිතව තම පන්තියට පැමිණි ඉහළ සාමාර්ථ ලබා ගත් සිසුන්ගේ නම් සහ විභාග අංක ලැයිස්තු පිටින් එම පත්‍රිකාවල මුද්‍රණය කොට

බෙදා හැරීමට මෙම ගුරුවරුන් පෙළඹෙන්නේ තම පන්තියට අධික සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහාය. නමුත් මෙම ගුරු ව්‍යාපාරිකයන් විසින් තමන්ගේ ප්‍රතිඵල සාර්ථක යැයි පවසමින් අදාළ සිසුන්ගේ නම, ගම සහ පාසල තම ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගන්නේ විටෙක එම සිසුන්ගේ අවසරයකින් ද තොරවය. එපමණක් නොව වර්තමානයේදී බොහෝ ප්‍රසිද්ධ හා ධනවත් උපකාරක පන්ති ගුරුවරුන් විසින් ශ්‍රී ලංකාවේ වඩාත් තරඟකාරී විභාගයක් වන අ.පො.ස උසස් පෙළ විභාගයෙන් ශ්‍රී ලංකාවේ ඉහළ සාමාර්ථ ලැබූ සිසුන්ට මුදල් ලබා දී එම සිසුන් ලවා එම ගුරුවරුන්ගේ උපකාරක පන්තියට පැමිණීම නිසා ඔවුන්ට එවැනි උසස් ප්‍රතිඵලයක් අත් වූ බවට ප්‍රකාශ කරන මෙන් ඉල්ලා සිටී. මෙහි පවතින කණගාටුදායක කරුණ වන්නේ බොහෝ සිසුන් හට තම ආර්ථික දුෂ්කරතාවයන් මැඩ පවත්වා ගැනීම සඳහා මෙම ධනවාදී උපකාරක පන්ති ගුරුවරුන්ගෙන් අල්ලස් ලබාගෙන තම උසස් පෙළ ප්‍රතිඵලවල සැබෑ කොටස්කරුවන් පිළිබඳව හෙළි නොකර අකමැත්තෙන් වුවද තම ප්‍රතිඵල ධනවාදී ගුරු ව්‍යාපාරිකයන් හට විකිණීමට සිදු වීමයි. මෙලෙස වර්තමානයේ බොහොමයක් පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරුන් විසින් ලාභය සහ ජනප්‍රියත්වය අරමුණු කොටගෙන ශ්‍රී ලංකාවේ අ.පො.ස උසස් පෙළ විභාගයෙන් ඉහළ සාමාර්ථ ලැබූ සිසුන්ගේ සාමාර්ථයන් මුදලට මිලදී ගෙන තමන් විසින් සිදු කරන ලද උත්සාහයේ සහ කැපවීමේ ප්‍රතිඵලය මත එම සිසුන්හට උසස් ප්‍රතිඵලයක් ලැබුණු බවට විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ව්‍යාජ ප්‍රකාශ නිකුත් කරමින් වංචනික ලෙස තම උපකාරක පන්තියට සිසුන්ව ආකර්ෂණය කර ගැනීමේ මාෆියාවක නිරත වේ. නමුත් සැබැවින්ම එම අදාළ ප්‍රතිඵලය එම සිසුවාගේ පාසලේ ගුරුවරුන්, අනෙක් විෂයන්වල ගුරුවරුන් හා එම සිසුවාගේ මහන්සියේ සහ සාමූහික උත්සාහයක ප්‍රතිඵලයකි. නමුත් එම සත්‍ය වසන් කොට එම උසස් ප්‍රතිඵල ලැබූ සිසුන්ව මුදලට මිලදී ගෙන ආර්ථික ලාභය පමණක් මූලික කොට ගෙන ක්‍රියා කරන ගුරු ව්‍යාපාරිකයන් බොහෝ සෙයින් නූතන පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතිය තුළ දක්නට ලැබේ.

වර්තමානයේදී පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතිය තුළ ඇතැම් ගුරුවරුන් අතර කල්ලි ගැසීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙහිදී එක් එක් විෂය ධාරාවලට අදාළ විෂයන් තුන බැගින් උගන්වන ගුරුවරුන් විසින් මෙම කල්ලි ගැසීමේ ව්‍යාපාරය සිදු කරන අතර

ඔවුන් පන්ති සැලසුම් කරන්නේ ද එම කල්ලියට අයත් එක් එක් ගුරුවරුන්ගේ පන්ති අවහිර නොවන පරිදිය. නමුත් ඔවුනට විරුද්ධ ගුරු කල්ලියේ පන්ති අවහිර වන සේ තම උපකාරක පන්ති පැවැත්වීමට ඔවුන් සැලසුම් කර තිබේ (සබිත්, 2011). මෙම කල්ලි ගැසීමේ ප්‍රවණතාවය නිසා අවසානයේදී පීඩාවට පත් වන්නේ මෙම පෞද්ගලික උපකාරක පන්ති සඳහා සහභාගී වන සිසු පරපුරය. මෙහිදී මෙම උපකාරක පන්ති පවත්වනු ලබන ගුරුවරුන්ගේ කල්ලි ගැසීමේ ප්‍රවණතාවය හේතු කොටගෙන සිසුන් හට නියමිත ප්‍රමිතියකින් යුතු ගුණාත්මක උපකාරක පන්තියක් තෝරා ගැනීම සඳහා පවතින ඉඩ ප්‍රස්ථාව බොහෝ දුරට මඟ හැරී යන අතර මෙලෙස කල්ලි ගැසී උපකාරක පන්ති පවත්වන බොහෝ ගුරුවරුන්ගේ දැඩි ප්‍රචාරණය හමුවේ ගුණාත්මක භාවයෙන් තොර පෞද්ගලික උපකාරක පන්ති රැල්ලකට සිසුන් හසු වේ. නමුත් මෙලෙස රැල්ලක් සේ බොහෝ සිසුන් සංඛ්‍යාවක් සහභාගි වන උපකාරක පන්තිවලට කිසිදු සොයා බැලීමකින් තොරව සහභාගි වීම තුළින් අවසානයේදී එලෙස රැල්ලට උපකාරක පන්ති කරා ගිය සිසුන්ට අධ්‍යාපනයේ උපරිම ඵල නෙලා ගැනීමට නොහැකි වී යයි. එසේම විශාල ශාලාවක එක පොකුරක් සේ තෙරපෙමින් ඉගෙන ගන්නා බොහෝ සිසුන් හට අවසානයේදී ඔවුන් අපේක්ෂා කළ තරම් උසස් සාමාර්ථයක් කරා යාමට ද නොහැකි වන්නේ ශාලා පන්ති පවත්වන බොහෝ ගුරුවරුන් විසින් මූලික අවධානයක් යොමු කරන්නේ දක්ෂ සිසුන් කෙරෙහි පමණක් වන බැවින් විෂය දුර්වලතා පවතින සිසුන් කෙරෙහි එම ගුරුවරුන් යොමු කරන අවධානය අවම වීම නිසාය. එහෙත් මෙමගින් අවසානයේදී බොහෝ සිසුන් පිරිසකට තම අධ්‍යාපනික කඩයිම් ජයග්‍රහණය කිරීමට පවා නොහැකිව අපේක්ෂා භංගත්වයට පත්ව උපකාරක පන්ති සඳහා වැය කළ මුදල් ද අහිමිව යයි. මේ අනුව පෙනී යන්නේ මෙලෙස කල්ලි ගැසී විශාල ශාලා පන්තිවල උගන්වනු ලබන බොහෝ පෞද්ගලික උපකාරක පන්ති ගුරුවරුන්ගේ අවසාන ඉලක්කය වන්නේ ලාභය මූලික කොට ගනිමින් තම පන්තිය සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීම මිස තම පන්තියට සහභාගි වන සියලුම සිසුන්ගේ ගුණාත්මක අධ්‍යාපනික සංවර්ධනය නොවන බවයි.

පෞද්ගලික උපකාරක පන්ති හේතු කොටගෙන එල්ල වන තවත් අහිතකර සංස්කෘතික බලපෑමක් වන්නේ බොහොමයක් උපකාරක පන්ති පොහෝ දින සහ සති අන්තයේ ඉරිදා දින ද

කේන්ද්‍ර කොටගෙන පැවැත්වීම නිසා පාසල් දරුවන් හට දහම් අධ්‍යාපනය ලැබීමට සහ පොහෝ දින ආගමික වත් පිළිවෙත්වල නියැලීමට පවතින අවස්ථාව ද මෙමගින් අහිමි වී යයි. එසේම වර්තමානය වන විටදී බොහෝ දෙමව්පියන් විසින් තම දරුවන්ව පාසලේ එක වසරට ඇතුලත් කරන සමයේ සිටම පෞද්ගලික උපකාරක පන්ති වෙත යොමු කිරීම හේතුවෙන් නූතනය වන විටදී බොහොමයක් පාසල් දරුවන්ට දහම් පාසල් අධ්‍යාපනය ලැබීමට පවතින අවස්ථාව ද අහිමිව යයි. එහෙත් දහම් පාසල් අධ්‍යාපනය යනු කුඩා කල සිටම දරුවන් හට ලබා දිය යුතුම සුවිශේෂී අධ්‍යාපනික සේවාවක් වන අතර මෙම දහම් පාසල් අධ්‍යාපනය තුළින් පාසලේදී මෙන් මූලික විෂය කරුණු ඉගැන්වීමක් සිදු නොකළ ද පුද්ගලයෙකු කුඩා කල සිටම හික්මවා යහපත් ගුණධර්මවලින් සපිරි, චරිතවත්, සදාචාරසම්පන්න පුරවැසියෙකු බවට පත් කිරීම සඳහා විශාල දායකත්වයක් සපයයි. එහෙත් කුඩා කල සිටම දරුවන් තුළ මෙම නූතන තරඟකාරී අධ්‍යාපන ක්‍රමය මඟින් එකිනෙකාව පරයා විභාග සමත් වීමේ මානසිකත්වයක් වර්ධනය කිරීම තුළ බොහොමයක් දෙමව්පියන් තම දරුවන්ව කෙසේ හෝ එම තරඟකාරී විභාග කඩයිම්වලින් ජයග්‍රහණය කරවීම සඳහා ඔවුන් හට දහම් අධ්‍යාපනය ලබා ගැනීමට සහ පොහෝ දින වලදී ආගමික වත් පිළිවෙත්වල නියැලීමට පවතින අවකාශය ද අහුරා දමමින් ඉරිදා සහ පොහෝ දිනවල ද පෞද්ගලික උපකාරක පන්ති වෙත තම දරුවන්ව යොමු කිරීමට කටයුතු කරයි. එපමණක් නොව මෙම පෞද්ගලික උපකාරක පන්ති සිදු කරන බොහෝ පුද්ගලයන් විසින් ද පාසල් දරුවන් ඉරිදා දින දහම් පාසල් වෙත යාම වැළැක්වීම සඳහා ලාභ පරමාර්ථයෙන් ඉරිදා දින ද කේන්ද්‍ර කර ගනිමින් උපකාරක පන්ති පැවැත්වීමට කටයුතු කරයි. නමුත් මෙමගින් අවසානයේදී අත්වන අයහපත් ඉරණම වන්නේ බොහොමයක් දරුවන්ට නිසි දහම් අධ්‍යාපනයක් සහ ආගමික ශික්ෂණයක් නොලැබීම හේතු කොටගෙන ඔවුන් කෙරෙන් යහපත් ගුණාංගයන් සහ සාර්ධර්ම ගිලිහී ගොස් කිසිදු සංවේදී හදවතක් නොමැති යාන්ත්‍රීකරණය වූ මතු පරපුරක් බිහි වීමයි.

පෞද්ගලික උපකාරක පන්ති මඟින් එල්ල වන සෘණාත්මක සමාජ සංස්කෘතික බලපෑම් අවම කිරීම සඳහා විවිධ උපාය මාර්ගයන් යෝජනා කළ හැක. ඒවා නම්, රජය විසින් රාජ්‍ය අධ්‍යාපනයේ ඇති විෂමතා ඉවත් කිරීමට සහ විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයට නව විකල්ප

ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතු වීම, පෞද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රයට නොදෙවෙනි ලෙස නිදහස් අධ්‍යාපනයේ මානව සහ භෞතික සම්පත්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, සියලුම පෞද්ගලික උපකාරක පන්ති රජයේ නියාමනයකට සහ අධීක්ෂණයකට ලක් කොට ප්‍රමිතියෙන් තොර උපකාරක පන්ති තහනම් කිරීම, රජයේ පාසල් තුළ නියාමනයකට ලක් කළ පෞද්ගලික උපකාරක පන්ති ස්ථාපිත කිරීම මඟින් පෞද්ගලික උපකාරක පන්ති කර්මාන්තයේ පිරිවැය අවම කළ හැකි වීම සහ එහි ප්‍රතිලාභ ලෙස උපකාරක පන්ති ගාස්තු අවම කළ හැකි වීම, පෞද්ගලික උපකාරක පන්ති කරා යාම තුළින් දරුවන්ට එල්ල වන කායික සහ මානසික පීඩනයන් පිළිබඳව දෙමව්පියන් විසින් නිරන්තරයෙන් සොයා බැලීම සහ උපකාරක පන්ති ගුරුවරුන් හමුවේ දරුවන් නිරන්තරයෙන් කායික හා මානසික අතවරයන්ට ගොදුරු වන්නේ නම් ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමට දෙමව්පියන් විසින් ක්‍රියා කිරීම, දරුවන්ව අපගාමී සමාජ ක්‍රියාකාරකම්වලට පෙළඹවීම සඳහා පෞද්ගලික උපකාරක පන්ති මඟින් බලපෑම් එල්ල කරන්නේදැයි දෙමව්පියන් විසින් නිරන්තරයෙන් සැලකිලිමත් වීම සහ එවැනි අපගාමී සමාජ ක්‍රියාකාරකම් සඳහා ළමුන්ව යොමු කරවන උපකාරක පන්තිවලින් ඔවුන්ව ඉවත් කර නිසි ගුණාත්මකභාවයකින් යුතු උපකාරක පන්ති වෙත දරුවන්ව යොමු කිරීමට මව්පියන් විසින් ක්‍රියා කළ යුතු වීම, උපකාරක පන්ති පැවැත්විය යුතු දින ගණන, පැවැත්විය යුතු උපරිම පැය ගණන, ඒ සඳහා සහභාගී කරවා ගත හැකි උපරිම සිසුන් ගණන මෙන්ම අදාළ ආයතනවල යටිතල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම්වල ගුණාත්මකභාවය පිළිබඳව රජය විසින් මැදිහත් වී අදාළ අධ්‍යාපනික බලධාරීන් සමග සාකච්ඡා කොට පැහැදිලි නිර්ණායක ගොඩනැගිය යුතු වීම, සති අන්ත ඉරිදා දිනවලදී ළමුන් හට දහම් අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව ලබා දීම සඳහා දහම් පාසල් පවත්වනු ලබන කාල සීමාවෙන් පසුව පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීමට රජය ප්‍රමුඛ අදාළ අධ්‍යාපනික බලධාරීන් විසින් පියවර ගත යුතු වීම යනාදී උපාය මාර්ගයන් පෞද්ගලික උපකාරක පන්තිවලින් එල්ල වන ඍණාත්මක සමාජ සංස්කෘතික බලපෑම් අවම කිරීම සඳහා යෝජනා කළ හැක.

## 4. සාරාංශය

පාසල නම් ද්විතීක සමාජ සංස්ථාවේ සිදුවන විවිධ බිඳ වැටීම් සහ දුර්වලතාවයන් හේතු කොටගෙන නූතනය වන විටදී බොහෝ සිසුන් විසින් පාසල් අධ්‍යාපනයෙන් බැහැර වී පෞද්ගලික අධ්‍යාපන ආයතනවල පිහිට පතයි. මේ හේතුවෙන් වර්තමානයේ විභාග සමත් වීම සඳහා උපකාරක පන්ති අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම මෙය පළමු ශ්‍රේණියේ සිට නොව ඇතැම් විට මුල් ළමාවිය සංවර්ධන අවස්ථාවේ සිටම දරුවන් මුහුණ දෙන යථාර්ථයකි. නමුත් මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ තරඟකාරී විභාග කඩයිම් සමත් වීම පමණක් සලකා බැලීමයි. එසේම නවීන තාක්ෂණික දියුණුවත් සමඟ යටිතල පහසුකම් සීඝ්‍රයෙන් වර්ධනය වීම තුළ වර්තමානය වන විටදී එක් උපකාරක පන්තියකට දහසකට වැඩි ශිෂ්‍ය පිරිසක් කේන්ද්‍රගතව සිටී. මෙහිදී එකම ගුරුවරයා එකම දිනයේ නගර කිහිපයක ද ඉගැන්වීමෙහි නිරත වෙයි. මේ නිසා වර්තමාන ඉගැන්වීම් ක්‍රමය යන්ත්‍රානුසාර වී ඇති බව මැනවින් අවබෝධ වේ. විශේෂයෙන්ම බොහෝ උපකාරක පන්ති පවත්වනු ලබන ගුරුවරුන් විසින් මුදල පමණක් පදනම් කොටගෙන වාණිජ පරමාර්ථයෙන් දැනුම අලෙවි කිරීමේ ව්‍යාපාරයක නියැලීම තුළින් අවසානයේදී පීඩාවට පත් වන්නේ අඩු ආදායම්ලාභී දෙමව්පියන්ගේ දරුවන්ය. වර්තමානයේදී පෞද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රය තුළ නියැලෙන්නන් දැනුම ලබාදෙන මුවාවෙන් සිසුන් හට කායික, මානසික සහ ලිංගිකමය බලපෑම් සිදු කිරීමට යොමු වන අයුරු ද බොහෝ සෙයින් වාර්තා වේ. නමුත් මෙම පෞද්ගලික උපකාරක පන්ති සංස්කෘතියෙන් බැහැර වන්නැයි ශිෂ්‍ය පරපුරට ආඥා නිකුත් කිරීමට කිසිදු පුද්ගලයෙකුට බලයක් නැත. මෙනිසා පෞද්ගලික උපකාරක පන්තිවල පවතින ඍණාත්මක සමාජ සංස්කෘතික බලපෑම් අවම කොට ධනාත්මක සමාජ සංස්කෘතික බලපෑම් ඉහළ නැංවීමට අවශ්‍ය උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් පෞද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රය මඟින් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගුණාත්මක සංවර්ධනයක් ඇති කළ හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


උබේසිංහ,වී.කේ. (2019). පාසල ගිලගත් ටියුෂන් සැණකෙළි. *SRILANKA Guardian*. Retrieved From http://www.sinhala.slguardian.org/2019/12/blog-post_63.html?m=1.

ගමගේ, ටී. (2021). චිනයේ ටියුෂන් පන්ති තහනම් කිරීම නිසා මිලියන 10 ක් රැකියා අහිමි වේ. *ගොසිප් ලංකා NEWS*. Retrieved From https://www.gossiplankanews.com/2021/08/10.html.

ප්‍රනාන්දු, ටී. (2021). ශ්‍රී ලංකාවේ සිදු වූ බරපතලම ළමා ලිංගික අපයෝජනය යට යන ලකුණු?. *THELEADER*. Retrieved From https://theleader.lk/news/5591-2021-01-24-06-13-35.

පෙරේරා, එස්. (2018). ටියුෂන් නොගියොත් හිරිහැර: "දැඩි පියවර". *BBC NEWS*. Retrieved From https://www.bbc.com/sinhala/sri-lanka-43811013.

මදුරාවල, එන්. (2012). ටියුෂන් කුමට මෙලෙසේ !. *කන්නන්ගර දරුවෝග* Retrieved From http://kannangaradaruwo.blogspot.com/2012/12/blog-post_9.html?m=1.

මල්ලිකාරච්චි, ජේ. (2021). ලංකාවෙන් ටියුෂං අතුගා දැමීමට නම්....*NEWS 19*. Retrieved From https://www.news19.lk/sri-lankan-tusion-class/.

ලක්මිණී, එන්. (2020). තුන් හැවිරිදි දරුවාට ඔහුගේ උපකාරක පන්ති ගුරුවරයා පහර දෙයි. *theAsianparent*. Retrieved From https://lk.theasianparent.com/%E0%B7%85%E0%B6%B8%E0%B7%8F-%E0%B6%85%E0%B6%B4%E0%B6%A0%E0%B7%8F%E0%B6%BB.

සබිත්, ඒ. (2011). අපේ කාලයේ ටියුෂන් මාෆියාව. *Sabith*. Retrieved From http://sabithl.blogspot.com/2011/12/blog-post.html?m=1.

සිල්වා, එම්. (2021). ටියුෂන් ගුරුවරු මහා පරිමාණ ගසාකෑමක - කොරෝනාවෙන් අසරණ වූවන්ගේ දරුවන්ට පන්ති අහිමි වෙලා. *CNL NEWS*. Retrieved From https://www.channelnewslanka.com/2021/03/11/%E0%B6%A7%E0%B7%92%E0%B6%BA%E0%B7%94%E0%B7%82%E0%B6%B1%E0%B7%8A-%E0%B6%9C%E0%B7%94%E0%B6%BB%E0%B7%94%E0%B7%80%E0%B6%BB%E0%B7%94-%E0%B6%B8%E0%B7%84%E0%B7%8F%E0%B6%B4%E0%B6%BB%E0%B7%92%E0%B6%B8%E0%B7%8F/.

සෝමවීර, වී. (2019). පාසල් ළමුන් ටියුෂන් පන්ති වලට යොමු කරන්නේ කවුද. *අනංමනං*. Retrieved From http://sasara333.blogspot.com/2019/11/blog-post.html?m=1.

# සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ හැඳින්වීමක්

**ඩී. එම්. එන්. ලක්මිණී**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

**පේරාදෙණිය.**

## 1. හැඳින්වීම

කුල ක්‍රමය, බුදු සමය වැනි සංකල්ප මෙන්ම සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් ද දකුණු ආසියාවට ආවේණික සමාජ සංස්කෘතික ප්‍රපංචයක් ලෙස පෙන්වා දිය හැකිය. එනම් ඕනෑම රටක ජන වර්ගයක් සතුව විවිධාකාර වූ වෛද්‍ය ක්‍රම පවතී. එකී වෛද්‍ය ක්‍රම ගොඩනැගුණු එම ජනතාව සතු සංස්කෘතිකමය ලක්ෂණ හා අවට පරිසරය උපයෝගී කරගෙනය. දකුණු ආසියාතික රටවල පෙන්වා දිය හැකි ලක්ෂණය නම් සෞඛ්‍ය බහුත්වාදය දැකගත හැකිවීමයි. එයට හේතුව බටහිර යටත්විජිතවාදයේ බලපෑම් මත අප රටටද බටහිර වෛද්‍ය ක්‍රමය ආගමනය වූ අතර දේශීය වෛද්‍ය ක්‍රමය හා බටහිර වෛද්‍ය ක්‍රමය ලෙස මෙරට වෛද්‍ය ක්‍රමය ප්‍රධාන අංශ දෙකක් ඇත්තේ ස්ථාපිත වන්නේ ඒ හේතුවෙනි.

දකුණු ආසියාවේ වෛද්‍ය සම්ප්‍රදායන් පිළිබඳ සාකච්ඡාවේ දී මෙම අංශ දෙකම වැදගත් වන අතර සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් සම්ප්‍රදායක් ලෙස අනෙකුත් කලාපවලට හඳුන්වා දීම සම්බන්ධයෙන් දකුණු ආසියාව ප්‍රමුඛස්ථානයක් හිමිකර ගනී. මෙහි දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නට බලාපොරොත්තු වන සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය තුල අනෙකුත් කලාපීය රටවලට වඩා විවිධ වෛද්‍ය සම්ප්‍රදායන් හඳුන්වා දී ඇති කලාපයක් ලෙස ද වැදගත් වේ. එනම් සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් යටතේ ලංකාව තුළද වෛද්‍ය ක්ෂේත්‍රයේ සංකලනය දැක ගත හැකි වනුයේ දකුණු ආසියාතික කලාපයට අයත් ආවේණික වෛද්‍ය බහුත්වාදය තහවුරු කරමිනි.

විශේෂයෙන්ම ආයුර්වේදය, දේශීය චිකිත්සාව වගේම සිද්ධ, යුනානි, හෝමියෝපති, ආදිය වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස විමර්ශනය කළ හැකිය. වර්තමානයේ දී දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාව අතර දේශීය සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳව වැඩි අවධානයක් වර්ධන

වෙමින් පවත්නා සමයක ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය කෙරෙහි මෙම අධ්‍යයනය ඔස්සේ තොරතුරු විමර්ශනයට කිරීමද වැදගත්ය. තවද මෙකී අධ්‍යයනය තුළ එන පාරම්පරික වෙදකම හෙවත් දේශීය චිකිත්සාවේ එන අංගයක් ලෙස අත් බෙහෙත් පිළිබඳව ඇතැම් කරුණු ගමේ වෙද මහතාගෙන් තොරතුරු විමසා රැස් කරගත් අතර අනික් සියලු තොරතුරු ද්විතීක මූලාශ්‍ර මගින් සපයා ගත් තොරතුරු මත පදනම්ව මෙකී අධ්‍යයන සිදු කර ඇත.

## 2. අධ්‍යයන පසුබිම.

දකුණු ආසියාව සමාජය තුළ සෙසු අංග මෙන්ම ආයුර්වේදයත් යටත්විජිතවාදය සමඟ විශාල වෙනසකට ලක්ව තිබේ. යටත්විජිතවාදයට පෙර ආයුර්වේදයේ ඉතිහාසය විමසීමට ලක් කළහොත් ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ඉතාමත් විශාල මට්ටමින් ලැබෙන බව ඓතිහාසික කරුණු තුළ සඳහන් වී තිබේ. සමහර රජවරුන් පවා හසල බුද්ධියෙන් යුත් ආයුර්වේද වෛද්‍යවරුන් වී ඇත. එමෙන්ම දක්ෂ වෛද්‍යවරුන්ට නම්බුනාම, ඉඩකඩම්, තෑගිබෝග, විවිධ රජ පරම්පරා විසින් පිරිනමා ඇති නමුත් යටත්විජිතවාදය ආරම්භයත් සමඟ අතීතයේ ආයුර්වේදෙට තිබූ ස්ථානය ක්‍රමයෙන් බටහිර වෛද්‍ය වෘත්තිය කෙරෙහි යොමුවිය. බටහිර වෛද්‍ය ක්‍රමය ලංකාවට හඳුන්වා දුන්නේ පෘතුගීසීන් මිෂනාරිවරුන් විසිනි. මොවුන් තම ආගම ව්‍යාප්ත කර ගැනීමට මෙය අවියක් ලෙස උපයෝගී කර ගනු ලැබීය. බටහිර වෛද්‍ය ක්‍රමය ක්‍රිස්තියානි ආගමත් අතර දැඩි සබඳතාවක් දක්නට ලැබේ යටත්විජිතවාදයක් සමග බටහිර වෛද්‍ය ක්‍රමය වෛද්‍ය ක්‍රමයක් ලෙස රාජ්‍ය අනුග්‍රහය ලබන විට ආගමක් ලෙස රාජානුග්‍රහය ලැබුවේ ක්‍රිස්තියානි ආගමටය.

එසේ වුවත් මෙම වකවානුව තුළ ආයුර්වේද සම්පූර්ණයෙන්ම අමතක කර තිබුණේ යැයි මෙයින් අදහස් කළ නොහැක. මන්ද සමහර යටත් විජිත පාලකයින් ඇතැම් රෝග හා ඖෂධ පිළිබඳව විවිධ පර්යේෂණවල නියැලී ඇති අවස්ථාවන් පිළිබඳවද දැනගන්නට ලැබේ. කෙසේ වුවත් ආයුර්වේදය නැවත වර්ධනය සිදුවන්නේ විසිවන සියවසේ ආරම්භය වන බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාර සමඟය. මෙහිදී බෞද්ධ භික්ෂූන් බුදු සමයේ පුනර්ජීවනයට උර දුන්නා පමණක් නොව ආයුර්වේද වෛද්‍යවරු දේශීය සංස්කෘතිය තවත් අංගයක් ලෙස ආයුර්වේදය නගා සිටුවන්න ද ඉදිරිපත් වී ඇත. මේ

අතර ඉතා වැදගත් පුද්ගලයෙක් ලෙස පණ්ඩිත වික්‍රමආරච්චි ධර්මපාලතුමාගේ බෞද්ධ පුනර්ජනීය ක්‍රියාවලියේ කොටස්කරුවෙකු ලෙස කටයුතු කර තිබේ. පණ්ඩිත වික්‍රමආරච්චි ප්‍රසිද්ධ වෙද පරපුරකින් පැවත අයෙකි. නමුත් ඔහු පාරම්පරික වෙදකමින් සෑහීමකට පත් නොවූ නිසා ඉන්දියාවේ කල්කටා ප්‍රදේශයේ ආයුර්වේද ආයතනය විධිමත් පුහුණුවක් ලැබීමටද යොමුවී අනතුරුව වික්‍රමආරච්චි ඔහුගේ ප්‍රධානත්වයෙන් ආයුර්වේද වෛද්‍යවරු විධිමත්ව පුහුණු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය විද්‍යාල කිහිපයක් ම ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ප්‍රතිඵලයක් ලෙස මෙම ආයුර්වේද වෛද්‍ය විද්‍යාල ආරම්භ වන අතරින් පළමුවැන්න වූයේ බොරැල්ල ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය ඉන් අනතුරුව ගම්පහ හා හා යාපනය වෛද්‍ය සිද්ධ වෛද්‍ය විද්‍යාල ආරම්භ විය. මුල දී ගුරු ශිෂ්‍ය ක්‍රමයට වෛද්‍යවරු පුහුණුවට ලක් කළත් මේ වෛද්‍ය විද්‍යාල ආරම්භයත් සමඟ විධිමත් ආකාරයට ආයුර්වේද වෛද්‍යවරුන් පුහුණු කිරීමට ඇති වුණා දැයි දැකිය හැකිය. කෙසේ වුවද ආයුර්වේද විද්‍යාතන ආරම්භ කිරීමේදී බටහිර වෛද්‍ය විද්‍යාලවලට සමානව ආකාරයට ආරම්භ කරන අතර මෙම තත්වය දකුණු ආසියාතික රටවලට ම පොදු වූවකි. ජාතික ප්‍රබෝධතා ව්‍යාපාර ද එක් පැත්තකින් බටහිර ක්‍රමයන් විවේචනයට ලක් කරන අතර අනෙක් අතින් යම් කිසි අනුකරණාත්මක ලක්ෂණද දක්නට පුළුවන.

මෙම පුනර්ජීවන ව්‍යාපාරය තිබූ අනන්‍යතා ප්‍රතිවිරෝධී ක්‍රියාවලියකි. ඒ නිසා ආයුර්වේදය තුළ නවීකරණයක් ද එක්තරා දුරකට බටහිරකරණය ද දක්නට පුළුවන. 1956 න් පසු ආයුර්වේද යම්කිසි ප්‍රගමනයක් දක්නට ලැබේ. විශේෂයෙන්ම 1961 අංක 31 දරණ පනත මගින් ආයුර්වේදය වෙනම දෙපාර්තමේන්තුවක් බවට පත්වීම හා 1991 දී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලෙසින් වෙනම අමාත්‍යාංශයක් බවට පත්වීම මෙම පුනර්ජීවන ව්‍යාපාරය අවසන් ප්‍රතිඵලයයි (සමරසිංහ, 2010). කෙසේ වුවද අවසාන වශයෙන් වර්තමාන සමාජය තුල ආයුර්වේදය හා බටහිර වෛද්‍ය ක්‍රමය තුළ කෙබඳු වෛද්‍ය ක්‍රමයක් දැකිය හැකි ද යන්න විමසා බැලිය යුතුය. මේ අනුව තාක්ෂණය විද්‍යාව මුදල් යන කරුණු සැලකිල්ලට ගෙන බලන කල්හි ලාංකික සමාජ සූත්‍රයේ බටහිර වෛද්‍ය ක්‍රමය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට වඩා වැඩි බලයක් හිමිකරගෙන තිබේ. එමෙන්ම රජයේ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සංගම් ප්‍රබලව බලපෑම් සංගම්

ලෙස ක්‍රියා කරනු දැකිය හැකි නමුත් ආයුර්වේද වෛද්‍ය කණ්ඩායමට එබඳු බලපෑමක් කළ නොහැකි බව දැකගත හැකිය. මේ අනුව බටහිර වෛද්‍ය ක්‍රමය තවමත් වැඩි බලයක් ලබාගෙන ඉහළින් පවතින අතර සිංහල සංස්කෘතියේ අංගයක් ලෙස ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට සමාජයේ ඉහළ තැනක් ලැබී තිබුනද ඊට සමාන උසස් තත්ත්වයක් රාජ්‍ය මට්ටමේ දී ආයුර්වේද ලැබී නැති බව පෙනේ. දේශපාලන අනුග්‍රහය සේවාදායකයන්ගේ අනුග්‍රහය සම්පත් ලබා ගැනීම ආදිය මෙම වෛද්‍ය ක්‍රම දෙක අතර තිබෙන තරගයක් තවමත් දක්නට ලැබෙන බවද අවසන් ලෙස පෙන්වා දිය හැකිය.

## ප්‍රායෝගික සමාජය තුළ පවතින තත්ත්වය

Table 1: Sources of Treatment Resorted to by Patients

| Source | % of Respondents |
|---|---|
| Ayurveda (Govt.) | 2.18 |
| Ayurveda (Private) | 12.07 |
| Western (Govt.) | 45.56 |
| Western (Private) | 34.21 |
| Homoeopathy | 0.35 |
| Acupuncture | 0.14 |
| Other | 5.49 |
| Total | 100.00 |

Source: Consumer Finances Survey of the Central Bank of Ceylon, Colombo, 1981/82

මෙම දත්ත වලට අනුව පෙනි යන්නේ බහුතරයක් ප්‍රජාව එනම් 80%ක් පමණ ප්‍රතිකාර සඳහා බටහිර වෛද්‍ය ක්‍රමය තොරා ගන්නා බවත් 20% කටත් අඩු ප්‍රමාණයක් ප්‍රජාවක් දේශිය වෛද්‍ය ක්‍රමය හා සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් කෙරෙහි යොමු වන බවකි. මෙහි දත්ත ඉතා පැරණි ඒවා නිසා වර්තමානය වන විට මෙකි දත්ත වෙනස් වී ඇති බව අනුමාන කළ හැක්කේ බහුතරයක් ප්‍රජාව අද වන විට ආයුර්වේදය හා දේශිය චිකිත්සාව හා බැඳි සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් කෙරෙහි යොමු වීමක් දැකගත හැකිය. විශේෂයෙන් වර්තමානයේ ලෝකයකට මුහුණ දීමට සිදුවී ඇති කොරෝන වසංගත තත්වයට ලාංකීය ජනතාව සතු දේශීය සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයට සුවිශේෂී ස්ථානයක් හිමි කරගෙන සිටින බව පෙනී යයි. එන්නත්කරණයට අමතරව විශේෂයෙන් අනුගමනය කරන දේශීය ඇත බෙහෙත් දුම් මුට්ටිය ආදියට සුවිශේෂී ස්ථානයක් හිමිවී ඇත. මෙම සම්ප්‍රදායන් නිවැරදිම හෝ නිවැරදි නොවන බවට සත්‍යතාපනය නොවුවත් බොහෝ පිරිසක් එකී ක්‍රමවේදයකන

අනුගමනයට පෙළඹී සිටින බව දැකගත හැකිය. ඒ අනුව පෙන්වා දිය හැක්කේ කිසිඳු වෛද්‍ය සම්ප්‍රදායක් එකකට එකක් වැඩ හොඳ බව හෝ සියයට සියයක්ම සාර්ථක ප්‍රතිපල ළඟ කර දෙන බව සහතික විය නොහැක. ඒ වගේම පුදගලයින් අනුගමනය කරන වෛද්‍ය ක්‍රමය ඔහුගේ මතවාදය ඔවුන්ගේ හැකියාව මත එකී වෛද්‍ය ක්‍රමයන් සඳහා අනුගත වන බවද පේනවා දිය හැකිය (ගල්මන්ගොඩ, 2003).

තවද පවතින වසංගත තත්ත්වය හමුවේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුව විදිහට පාරම්පරික සිංහල වෛද්‍යවරුන්, ආයුර්වේද වෛද්‍යවරුන්, සිද්ධ සහ යුනානි කියන සියලු වෛද්‍යවරුන් සම්බන්ධ කරගෙන ඒ වෛද්‍ය ක්‍රමවල තියෙන විශේෂඥ දැනුම උපයෝගී කරගෙන මෙවැනි රෝගී තත්ත්වයන් අවම කර ගැනීම සඳහා ගතහැකි ප්‍රතිකාර ක්‍රම, පියවර පිළිබඳ පුළුල්ව සාකච්ඡා කළද එහිදි කොරෝනා තත්ත්වයට මේ වෙලාවේ දිය හැකි හොඳම විසඳුම ලෙස දැක්කෙ රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ශරීරය තුළ වර්ධනය කිරීම ලෙස පෙන්වා දී ඒ සඳහා දේශීය වෛද්‍ය ක්‍රමයේ විශේෂඥ දැනුම භාවිත කරල ඖෂධ හඳුන්වාදීමයි.

මේ කොරෝනා වයිරස් තත්ත්වය තුළදී වැඩිපුරම ඉස්මතුවෙන්නෙ බටහිර වෛද්‍ය මතයන්ය. දේශීය වෛද්‍ය මතයක් ඉස්මතු වුණත් ඒක ප්‍රබල ලෙස සමාජගත කරන්න එම වෛද්‍යවරු සමත්කම් දක්වන්නෙ නැති බවක් පෙනේ. එයට හේතු වී ඇත්තේ යටත්විජිත යුගයෙන් පසුව බටහිර ගැති මානසිකත්වයකින් කටයුතු කිරීම නිසාය. බටහිර චින්තනයට ගැතිවුණු ජනසමාජයක් බිහිවී පවතින කාලයක හෙළ වෙදකම, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අභාවයට යෑම වැළැක්වීම අපහසුය. ඒ චින්තනය පරම්පරාවෙන් පරම්පරාවට යන විට අපේ දේවල් පිළිබඳ තියෙන ඇගයීම් ඛණ්ඩනයට ලක්වේමටද හේතු වෙයි. ඒහෙත් බටහිරට ගැති නොවුණු පිරිසක් නිසා අපට මේ තරමින්වත් දේශීය වෛද්‍ය ක්‍රමය ආරක්ෂිතව පවතින බව කිව හැකිය.

### 3. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයේ පසුබිම

සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව ලාංකිකයින්ගේ ඉතිහාසය හා සංස්කෘතිය තුළ දැඩි ලෙස මුල් බැසගෙන ඇති අතර එය පරම්පරාවෙන් පරම්පරාවට සුවපත් කිරීමේ ක්‍රම භාවිතා කිරීම රටේ සම්ප්‍රදායන්හි කොටසකි. බොහෝ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම වල

පොදු ලක්ෂණය නම් සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම, රෝග වැළැක්වීම සහ ශාරීරික, චිත්තවේගාත්මක, මානසික අංශ සහ ජීවන පරිසරය විධිමත් කිරීමට උපකාරී වීමයි. ආසියානුවන්ට සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ පෞරාණික උරුමයක් ඇති අතර එය ජනප්‍රවාද පිළියම් වලින් පොහොසත්ය. මේ අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 60% සිට 70% දක්වා ප්‍රාථමික සෞඛ්‍ය සේවා සැපයීමේදී එය වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව සඳහන්ය. සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුමේ අතිමහත් නිධානයක් විශාල සාහිත්‍ය ගණනාවක තැන්පත් කර ඇති අතර විශේෂයෙන් ඒවා ඕල, කොළ සහ වෙද කවි (සාම්ප්‍රදායික කවි) වැනි අතින් ලියන ලද අත් පිටපත් ආකාරයෙන් වෙද ගෙට (රහස් කේතය) සමඟ පැවත එයි. කෙසේ වෙතත් නොදැනුවත්කම, නුසුදුසු ව්‍යාප්තිය, පාරම්පරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම සහ ඒවායේ මූලධර්ම මෙම වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිලාභ නිසි ලෙස සූරකීමට ඇති ප්‍රධාන බාධාවන් ලෙස හඳුනා ගත හැක (කරුණාරත්න, 2016).

තව දුරටත් කරුණු විමසීමේදී ආයුර්වේදය සහ හෙළ වෙදකම එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීමට නොහැකි තරම්ම එකිනෙකට බැඳී යන වෛද්‍ය සම්ප්‍රදායන් දෙකක් ලෙස පෙන්වා දිය හැක. එයින් ආයුවේදය වූකලි **ආයුෂය පිළිබඳ විද්‍යාවයි.** ආයුෂය හිතාය, සුඛාය, දීඝාය, වශයෙන් කොටස් තුනකට බෙදා දක්වා ඇත. ඒ අනුව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය යනු **මිනිසාට නීරෝගීව දීඝ කාලයක් ජීවත් වීමට මග පෙන්වන ජීවන දර්ශනයක් වන අතරම එය ලොව බිහි වූ ප්‍රථම වෛද්‍ය ක්‍රමය** ලෙස ද සැලකේ. ආයුර්වේදය වෛද්‍ය ක්‍රමය අතීතයේ සිටම ජනතාව විසින් අනුගමනය කරනු ලැබීය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උතුරු ඉන්දියාවෙන් ආරම්භ වූ අතර එය පෝෂණය වී ඇත්තේ රිෂි මඟිනි. සිද්ධ වෛද්‍ය ක්‍රමය දකුණු ඉන්දියාවෙන් ද යුනානි වෛද්‍ය ක්‍රමය අරාබියෙන් ද පැවත එන ලදි.

සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයේ දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ දේශිය චිකිත්සා නම් වෛද්‍ය ක්‍රමය පොහොසත් විය. පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍ය, ආර්ථික හා සමාජ සංවර්ධනයේ සියලු අංශ සඳහා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මෙන්ම එහි භාවිතයද හේතු වී ඇති බව ශ්‍රී ලංකා ඉතිහාසය පෙන්වා දී ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගයේ පැමිණීමත් සමඟ

බටහිර වෛද්‍ය ක්‍රමය ප්‍රමුඛ වෛද්‍ය ක්‍රමය ලෙස ඉස්මතු විය. **1948** ලෝක සෞඛ්‍ය සංවිධානය **'සෞඛ්‍ය'** යන වචනය අර්ථ නිරූපණය කර ඇත්තේ **රෝගයක් හෝ ආබාධයක් නොතිබීම පමණක් නොව, පූර්ණ ශාරීරික, මානසික සහ සමාජික සමෘද්ධිය ඇති තත්වයක්** යනුවෙනි. ඒ අනුව ශ්‍රී ලංකාවේ දේශීය වෙදකම, මෙන්ම රිෂි භාවිතයෙන් පෝෂණය වූ භාරතයෙන් සංක්‍රමණය වු ආයුර්වේදය හා මිශ්‍ර අපේ ඉපැරණි වෛද්‍ය ක්‍රමයකි. එය මිනිසාගේ රෝග සුවයට මෙන්ම ශාරිරික, මානසික, සමාජීය සංවර්ධනය සඳහා ද ඉවහල් වූ බව ඉතා පැහැදිලි වේ. පුරාවිද්‍යාත්මක ගවේෂණයන්ගෙන් හෙළි කරනු ලබන කරුණු අනුව ද ඉපැරණි වෙදකම ආශ්‍රිතව බුද්ධ මන්දිර ඉදිකරමින් ආගමික පසුබිමක් තුළ කායික සුවය මෙන්ම මානසික සුවය ජනතාවට සමීප කරන්නට කටයුතු යොදා ඇති බව ඉතා පැහැදිලි වේ (ගල්මන්ගොඩ, 2003).

අතීතයේ ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ විශ්වාසනීයත්වයකින් යුක්තව ගොඩනැගී තිබූ දේශීය වෛද්‍ය ක්‍රම සහ එහි භාවිතයන් ජනතාව වැළඳගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම රෝග තත්ත්ව යම්තාක් දුරකට පාලනය කර ගැනීමට අප රටේ ජනතාවට හැකි විය. විශේෂයෙන්ම එදිනෙදා මතුවන සුළු රෝග අවස්ථාවන් සඳහා පරිසරයේ ඇති තුරුලතාවන් උපයෝගී කර ගනිමින් අත් බෙහෙත් ප්‍රතිකාර ලබා ගැනීමට බොහෝ දෙනා දැනුමින් සන්නද්ධ වී සිටියහ. බ්‍රිතාන්‍ය ජාතික රොබට් නොක්ස් විසින් රචිත "එදා හෙළ දිව" ග්‍රන්ථයේ සඳහන් කොට ඇත්තේද පුදුමයට කරුණක් ලෙසය, " මෙරට මිනිසුන්ගේ ක්‍රියාව විස්මය ජනකය. සෑම පුද්ගලයෙකුම වෛද්‍යවරයෙකි. සෑම නිවසක්ම වෙද ගෙදරක්, යනුවෙනි". ජනගහනය වර්ධනයත් සමඟ බෝ වන රෝග ව්‍යාප්තිය ඉතා සීඝ්‍රයෙන් සිදුවිය. එසේ වුවත් විවිධ එන්නත් ක්‍රම හා ප්‍රතිකාර සේවාවන් බටහිර වෛද්‍ය ක්‍රමය හරහා ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාව බෝ වන රෝග පාලනය කළ රටක් බවට පත් විම සතුටට කරුණකි (කරුණාරත්න, 2016).

එසේ වුවද වර්තමානයේ බෝ වන රෝග අභිබවා බෝ නොවන රෝග, වසංගත රෝගයන් මෙන් ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. මිනිසා යාන්ත්‍රිකකරණය වීම හේතුවෙන් ව්‍යායාම රහිත වීම, කෘෂිකාර්මික විප්ලවය සමඟ රසායනික පොහොර සහ වල් නාශක භාවිතය ප්‍රචලිත වීම මෙන්ම කාබනික පොහොර කෘමි නාශක පාලනය සඳහා යොදාගත් පැරණි ක්‍රමයන්ගෙන් ගොවි ජනතාව ඈත්

වීම ආහාර පරිභෝජන රටාවේ වැරදි පුරුදු ඇති වීම තුළින් කය පිනවීමට වඩා දිව පිනවීමට යාම ආදී කරුණු හේතුවෙන් වර්තමානයේ දියවැඩියාව, අධික රුධිර පීඩනය, රුධිරයේ මේද සාන්ද්‍රණ ඉහළ යාම, ආඝාත, පිළිකා, වකුගඩු රෝග, සන්ධිගත වාත රෝග, චර්ම රෝග ආදී රෝග තත්වයන්හි සීඝ්‍ර වැඩිවීමක් සමාජය තුළ දක්නට ලැබේ. ඒවාට පිළියම් සොයමින් බටහිර වෛද්‍ය ක්‍රමය පසුපස හඹා යන කාල වකවානුවක එමෙන්ම සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය අභාවයට යමින් පවතින යුගයක මේ පිළිබඳව  අවධානය යොමු කිරීමද ඉතා වැදගත්ය. මෙකී වෛද්‍ය ක්‍රම අධ්‍යනයේදී හෙළ වෙදකම වගේද ආයුර්වේදය ආදි වූ වෛද්‍ය ක්‍රමයන් මේ දක්වා නොනැසී ඉදිරියට ගෙන ඒමේ ශ්‍රී ලංකාව පාලනය කළ විවිධ රජවරුන්ට මෙන්ම අපගේ භික්ෂු පරපුර ගෞරවයට පාත්‍රවිය යුතුය.

## 4. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයේ ඉතිහාසය

ඕනෑම රටක ජනවර්ගයක් සතුව විවිධ ආකාර වූ වෛද්‍ය ක්‍රම ඇත එම වෛද්‍ය ක්‍රම ගොඩනැගුණේ ජනතාව සතු සංස්කෘතිකමය ලක්ෂණ හා අවට පරිසරය උපයෝගී කරගෙනය. ලාංකේය ජන සමාජය ගත් කල්හි එහි වෛද්‍ය ක්‍රමය ඉතිහාසය බුද්ධ කාලයටත් එපිට යැයි සිතිය හැකිය. මහා රාවණ ගේ මුත්තණුවන් වූ පුලස්ති යනු වෛද්‍යවරයෙකි. ආයුර්වේද ඉතිහාසයේ සඳහන් වන ඉන්දියානු කලාපීය රිෂි සම්මේලනය සභාපතිත්වය දැරුවේ යැයි පවසනුයේ පුලස්ථි සෘෂිවරයා වූ බවත්  මෙම සම්මේලනය වෛද්‍යවරුන්ගේ සම්මේලනයක් බවත් ඉතිහාසයේ දැක්වේ. අදටත් එම පුරාවෘත්තයන් අතර පරාක්‍රම සමුද්‍රය අසල ඇති පිළිමය පුලස්ති සෘෂිවරයාගේ  යයි සලකනු ලැබේ. ඒ වගේම ලක්දිව වාසය කලා යැයි සැලකෙන රාවණා ද බාල රෝග (ළමා රෝග) සහ රස ශාස්ත්‍රය ප්‍රගුණ කළ අයෙක් බව පුරාවෘතයන්හි  සඳහන් වේ (කරුණාරත්න, 2016).

තවද බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩම වීමේදී නාග ගෝත්‍රිකයන් අතර යුද්ධයක් ආරම්භ වීමට ගිය බව ප්‍රකාශ වෙයි. බොහෝවිට යුද්ධ ඇති වීමේදී එහි තුවාල වන සෙබළුන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය වේ එම නිසා එම කාලවලදී යම් යම් ප්‍රතිකාර ක්‍රම තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය. නමුත් මුල්ම වෛද්‍ය වාර්තාවක් ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ ක්‍රිස්තු පූර්ව 377 - 307 පඬුවස්දෙව් රජුගේ මුණුබුරා වූ පණ්ඩුකාභය රජ සමයේ කරවූ සිවිකා ශාලාවන් හෙවත් තිබිරි ගෙයක් (ප්‍රසූතිකාගාරයක්) සම්බන්ධවය. මිහිඳු

මාහිමියන් ලක්දිවට වැඩම වූ පසු ධර්මාශෝක රජතුමා එවන ලද තුටුපඬුරු වලින් එකක් ලෙස ත්‍රිඵලා තිබූ බව සදහන් වෙයි. ක්‍රි. ප. 247 දී මිහින්තලා කඳු පාමුල දෙවන පෑතිස් රජතුමා විසින් ලෝකය ප්‍රථම ආයුර්වේද රෝහල පිහිට වූ බව සඳහන් වෙයි. අද ද මෙහි බෙහෙත් ඔරුවක් ඇතුළු නටබුන් දක්නට ඇත. දුටුගැමුණු රජ අවධියේදී ලෝදියෙන් දැනුනු කඩොල් ඇතු බෙහෙත් ගැල්වූ පුලුන් යොදා සුවපත් කළ බව සඳහන් වේ. දේශීය වෛද්‍ය ක්‍රමයෙහි දියුණු යුගයක් සනිටුහන් වන්නට තවත් හෙතුවක් ලෙස බුද්ධදාස රජුගේ අවදියේ දීය බුද්ධදාස රජු දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙක් යයි සඳහන් වී තිබ්මද හේතුවේ. ඔහු සතුන්ට පවා වෙදකම් කළ බව ඉතිහාසයේ කියැවේ. සාරාර්ථ සංග්‍රහයේ නම් වෛද්‍ය ග්‍රන්ථය එතුමා අතින් රචිත කෘතියකි. මේ ආකාරයෙන් ඉතිහාසයක් ඇති අප දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීමට සෑම ගමකටම නිදහස් බෙහෙත් ශාලා පිහිටු වූ බවට මහාවංශයේ සඳහන් වෙයි. පොළොන්නරු යුගයේදී මහා පැරකුම්බා රජු විසින් තම අමාත්‍ය මණ්ඩලයට මහ වේදනා සහ සුළු වේදනා නමින් සෞඛ්‍ය ඇමති පදවි දෙකක් ඇති කළ බව ඉතිහාසයේ දැක්වේ (ඉන්දජෝති හිමි, 2013).

ඒ පමණක් නොව ලංකාවේ බොහෝ ප්‍රදේශවල අවශ්‍ය ඖෂධිය ශාක ඇතිමුත් එකල රජ දරුවන් ඔසු උයන ද නිර්මාණය කළ බවට සාක්ෂි හමුවේ. ඒ සඳහා හොඳම උදාහරණය වනුයේ නිල්ගල ඔසු වනාන්තරයයි. නමුත් 1505 සිට විවිධ ආක්‍රමණයන් හේතුවෙන් අපගේ මෙම දැනුම් පද්ධතිය විනාශ මුඛයට ගොස් ඇත. බොහෝ පුස්කොළ වෙදපොත් සුදු ජාතිකයන් විසින් රැගෙන ගොස්ය. නමුත් ඒ ඒ පරම්පරා සතුව පැවති වෙදකම් මුඛ පරම්පරාගතව අද වනතුරු ද පවතී. අප රටේ සෑම පුරවැසියෙකුම පාහේ එදිනෙදා වැලඳෙන බොහෝ රෝග වලින් යම් යම් ප්‍රතිකාර අත් බෙහෙත් දැන සිටියහ. ඒ බව රොබට් නොක්ස් එදා හෙළදිව නමැති ග්‍රන්ථයේ සඳහන් කරනුයේ මේ රටේ සෑම පුරවැසියකුම වෙදෙක් යන්නයි. මෙයින් පැහැදිලි වනුයේ එදිනෙදා වැළඳ වලට වෛද්‍යවරු ප්‍රතිකාර කර ගැනීමට දක්ෂ වූ බවයි (ගල්මන්ගොඩ, 2003).

නමුත් වර්තමානය වන විට මෙම මහාර්ඝ දැනුම් පද්ධතිය අභාවයට ගොස් ඇති අතර එයට බොහෝ හේතු ඇතිමුත් ඉක්මනින් වෙනස් වූ අපගේ සමාජ සංස්කෘතික රටාව බොහෝ ලෙස ඉවහල් වන්නට ඇතැයි සිතිය හැකිය. මේ ආකාරයට ඓතිහාසික පසුබිම

පිළිබඳ අවධානය යොමුකළ හැකි අතර දැනට ලංකා සමාජයේ ක්‍රියාත්මක වන ආයුර්වේදය දේශිය චිකිත්සාව සිද්ධ යුනානි හෝමියෝපති වගේම දේශිය චිකිත්සාව තුළ එන අත්බෙහෙත් වලට අමතරව ආගමික විශ්වාසයන් හා බැඳි ඇති අභිචාර ක්‍රම පිළිබඳව අතීතයේ සහ වර්තමාන කරුණු විමර්ශනය කර ඇත.

## 5. හෙළ වෙදකම හෙවත් දේශීය චිකිත්සාව.

රටක සංස්කෘතියක් විවිධ අංගෝපාංගයන්ගෙන් සමන්විත වේ. ප්‍රකට මානව විද්‍යාඥ කේ. මැලිනොව්ස්කිට අනුව යම්කිසි පුද්ගලයකු අයත් වන සංස්කෘතිය පාරම්පරිකව උරුම වන මානව කෘති, භෞතික භාණ්ඩ, තාක්ෂණික ක්‍රියාවලීන්, සිරිත් - විරිත්, සංකල්ප හා සාරධර්ම යන අංගයන්වලින් පරිපෝෂිත වේ (අපේ සංස්කෘතික උරුමය, 1998). වෛද්‍ය ක්ෂේත්‍රයටද එය එසේමය. හෙළ සංස්කෘතියෙහි ප්‍රබල අංගයක් වශයෙන් පැවත ආ දේශීය වෛද්‍ය ක්‍රමය ලෙස සලකනු ලබන්නේ දේශීය චිකිත්සාව හෙවත් හෙළ වෙදකමයි. මෙයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. සාම්ප්‍රදායික වෙදකම පිළිබඳ හැදෑරීමේදී ඒ හා සම්බන්ධිත ඇදහිලි හා විශ්වාස, ග්‍රන්ථ, සිරිත් විරිත් හා තාක්ෂණික ක්‍රමවේදයන්ට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. මන්ද ඒ තුළ සැගවී ඇත්තේ අප රටේ පෞඪ ඓතිහාසික වටිනාකම් නිසාවෙනි.

කාලයත් සමග ස්වදේශීය වෙදකම අතරට ආයුර්වේදය වඩාත් ප්‍රබල ලෙස සම්බන්ධ වී සංකලනය වීමෙන් එහි ස්වාධීන පැවැත්ම ගිලිහී ස්වදේශිය වෙදකම හෙවත් පාරම්පරික සාම්ප්‍රදායික වෙදකම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ලෙසින් ජනතාවගේ සිත් තුළ විශ්වාසයෙන් ගොඩ නැගී ඇත. ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය සිංහල වෙදකම සැලකීමේදී මෙය අපට වෙනත් කිසිඳු රටකින් හඳුන්වාදෙන ලද්දක් නොව අප රටෙහි සිටි ඉපැරණි යක්ෂ ගෝත්‍රිකයින් විසින් නිපදවූ එකකි. ඒ අනුව ආයුර්වේදය හා හෙළ වෙදකම යනු දෙකකි. වර්තමානයේ බොහෝ දෙනෙකු මෙය පටලවා තේරුම්ගෙන ඇති බවක් පෙනි යයි. හෙළ වෙදකම යනු ආයුර්වේදයට වඩා ප්‍රබල එමෙන්ම 100% ක් දේශීය වෙදකමකි. නමුත් වර්තමානයේ මේ දෙකෙහි සුළු සුළු සමානකම් ඇති බව විද්වතුන් පෙන්වා දෙයි. එයට ඓතිහාසික සිදුවීම් රාශියක් හේතුවෙන බවද කියවේ. යන්ත්‍ර - මන්ත්‍ර භාවිතයෙන් ලෙඩ රෝග සුවකිරීම ආදී නොයෙකුත් විස්මිත ප්‍රතිකාර ක්‍රම රාශියක් මෙහි අන්තර්ගත වීමක්ද

දැකගත හැකිය. මෙම වෛද්‍ය ක්‍රමය පිළිබඳ විමසීමේදී වැදගත් කොට සලකන ඓතිහාසික සිංහල වෛද්‍යවරු ලෙස,

- පුලස්ති ඉසිවරයා
- රාවණා රජ
- බුද්ධදාස රජු
- මහා පරාක්‍රමබාහු රජු
- දෙවැනි පරාක්‍රමබාහු රජු

ආදිය හඳුනා ගත හැකි අතර වත්මන් සිංහල වෙදැදුරන් ද පාරම්පරික සිංහල වෙදුන් ලෙස හඳුන්වයි.

මෙකී සිංහල වෙදකමේ අංග පිළිබඳ වීමසිමේදී ,

- සර්වාග වෙදකම
- සර්ප වෙදකම
- කැඩුම් බිඳුම් වෙදකම (ගස් වෙදකම)
- ඔඩුවන් පිළිකා වෙදකම
- දැවුම් පිළිස්සුම් වෙදකම
- විඳුම් පිළිස්සුම් වෙදකම
- කැපුම් තුවාල වෙදකම
- ඇස් වෙදකම
- උමතු රෝග වෙදකම
- චර්ම රෝග වෙදකම
- නිල වෙදකම

ආදිය වැදගත් වේ (සෝමසුන්දර, 2007).

**6. හෙළ වෙදකම ඈත අතීතයේ සිටම පැවත එන බවට හමුවී ඇති සාධක අතර,**

- **ආරෝග්‍යශාලා**

මහාවංශය දක්වන පරිදි ශ්‍රී ලංකාවේ ආරෝග්‍යශාලා ඉදි කිරීම ක්‍රිසතු පූර්ව 4 වන සියවසේ පණ්ඩුකාභය රජ සමය තරම් ඈත අතීතයකට ගෙනයයි. ආරෝග්‍යශාලා ඉදි කිරීම පිළිබඳ අදහස පැහැදිලිවම බෞද්ධ සංකල්පයකි. මිහින්තලේ ආරාම සංකීර්ණයෙහි පිහිටුවා තිබූ ආරෝග්‍යශාලාවෙහි නටඹුන් වලට අනුව එය ලෝකයේ ප්‍රථම විධිමත් ආරෝග්‍යශාලාව වන බවට විශ්වාස කරයි. ශ්‍රී ලංකාවේ ආරෝග්‍යශාලා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වැදගත්ම මූලාශ්‍රය වන්නේ මහාවංශයයි. පැරණි ශ්‍රී ලංකාවේ ආරෝග්‍යශාලා

1- ගෘහස්ථයන් සඳහා වන ආරෝග්‍යශාලා

2- ආරාමිකයන් සඳහා වන ආරෝග්‍යශාලා

වශයෙන් දෙවර්ගයක් යටතේ හඳුනා ගත හැකිය. මහාවංශයෙහි තොරතුරු දක්වන්නේ ගෘහස්ථයන් සඳහා වන ආරෝග්‍යශාලා පිහිටුවීම සම්බන්ධයෙන් පමණි. ආරාමිකයන් සඳහා ඉදි කළ ආරෝග්‍යශාලා පිළිබඳ තොරතුරු ටැම් ලිපි ආදී ශිලා ලේඛන මගින් ද අනුරාධපුර, පොළොන්නරුව වැනි ප්‍රදේශයන් වලින් හමුවූ නටඹුන් මගින් ද හෙළිදරව් වේ (උඹරාගොඩ, 1998).

- **ගෘහස්ථයන් සඳහා වන ආරෝග්‍යශාලා**

රටේ ප්‍රධාන පුරවැසියා වූ රජුගේ මාළිගාවට යාව, බෙහෙත් ගේ, නමින් ස්ථිර වෛද්‍යාගාරයක් පිහිටුවා තිබිණි. මේ පිළිවෙත මහනුවර රාජධානි සමය වන තුරු පැවතුණු බව පැවසේ. පොදු ජනතාවගේ ප්‍රයෝජනය පිණිස ආරෝග්‍යශාලා පිහිටුවීම රාජානුග්‍රහය මත සිදුකර ඇත. ඒවා රෝගීන්ට නැවතී ප්‍රතිකාර ලැබීමට සුදුසු පරිදි සැළසුම් කර තිබිණු බවද සඳහනය. එනම් නැවතී සිටීම පිණිස සාදන ලද්දේ යයි සැළකෙන කුටි වටේට මැද මිදුලක් හා ඊට යාබද ව පිහිටි පොදු පහසුකම් සහිත කාමර වලින් වටවූ දෙවන මිදුලක් ලෙස සැළසුම් කර ඇත. විශේෂ සේවා ආරෝග්‍යශාලා ගණනාවක් ද පැරණි ශ්‍රී ලංකාවෙහි ඉදිකොට ඇත. මින් බොහොමයක් ඉදිකොට තිබුණේ අනුරාධපුර නගරයේය. බුද්ධදාස රජු : ක්‍රි. ව. 362-409/ ධාතුසේන රජු : ක්‍රි. ව. 460-478/ උපතිස්ස රජු : ක්‍රි. ව. 522-524/ උදය රජ : ක්‍රි. ව. 790-792 යන රජවරුන් ආබාධිත සහ කොර තැනැත්තන් සඳහා රෝහල් පිහිටුවා තිබූ බවටද සාක්ෂි හමුවී ඇත. බුද්ධදාස රජු සහ උපතිස්ස යන රජවරුන් අන්ධ තැනැත්තන් සඳහා විශේෂ රෝහල් පිහිටුවා තිබේ. මුල්ම මාතෘ නිවාසය ඉදිකරන ලද්දේ සස උපතිස්ස රජු විසින් යැයි සෙල් ලිපියක සඳහන් වේ (උඹරාගොඩ, 1998).

- **ආරාමිකයන් සඳහා වන ආරෝග්‍යශාලා**

අනුරාධපුර, පොළොන්නරුව යන නගර ආශ්‍රිතව භික්ෂූන් වහන්සේ දෙදහසකට පමණ වාසය කළ හැකි ආරාම සංකීර්ණ පිහිටුවා තිබූ අතර ඒවායේ ආරෝග්‍යශාලා ද ඉදි කර තිබිණ. පැරණි

ආරෝග්‍යශාලා වල නටඹුන් මෙතෙක් මතු කර ගැනීමට හැකිවී ඇත්තේ මිහින්තලේ, මැදිරිගිරිය, ආළාහණ පිරිවෙණ ආදී ආරාම භූමි ප්‍රදේශ වලින් පමණි. මේ ස්ථාන වල තිබී සෙල් මුවා ෘ ගලින් කරන ලද / බෙහෙත් ඔරු සහ වෛද්‍ය උපකරණ හමුවී තිබේ. මීට අමතරව මැදිරිගිරිය ආරාම සංකීර්ණයේ පිහිටි ආරෝග්‍යශාලාව සම්බන්ධ නීති රීති දක්වන සෙල් ලිපියක් ද එම භූමි ප්‍රදේශයෙන් හමු වී තිබේ (උඟරාගොඩ, 1998).

- **බෙහෙත් ඔරු සහ වෛද්‍ය උපකරණ**

බෙහෙත් ඔරුව පැරණි වෛද්‍ය ක්‍රමයේ අපූර්ව නිර්මාණයකි. බෙහෙත් ඔරුවක් මුල් වරට සොයා ගත්තේ ඉතිහාසඥ එච්. සී. පී. බෙල් මහතා විසින් 1886 දී ථූපාරාම විහාර භූමිය ආශ්‍රිත නටඹුන් වලිනි. ඖෂධීය දියර බෙහෙත් ඔරුවෙහි බහා ඒ මත රෝගී පුද්ගලයා ගිල්වා කරන ප්‍රතිකාර විධිය, අවගාහන කායික චිකිත්සාව, ලෙස හැඳින්වේ. අනුරාධපුර, මිහින්තලේ, මැදිරිගිරිය, දීඝවාපිය ආදී ස්ථාන වලින් මෙම බෙහෙත් ඔරු හමුවී තිබේ. ඒවා නව වන සියවස තරම් ඈත අතීතයකට හිමිකම් කියන බව පැවසේ. තවද බුද්ධඝෝෂ හිමියන් විසින් පස් වන සියවසේ දී සිංහලෙන් පාලි බසට පරිවර්තනය කරන ලද අටුවා ග්‍රන්ථයකට අනුව උණු දිය පුරවන ලද භාජනයක රෝගියෙකු බස්සවා එම උණු දියෙන් තවා කරන චිකිත්සා ක්‍රමයක් ගැන සඳහන් වේ. එනම් , නිමර්ජන චිකිත්සාව, ක්‍රි. පූ. 5 වන සියවස තරම් අතීතයේ සිට භාවිතා වී ඇත. තනි ගල් කුට්ටියකින් නිර්මාණය කරන ලද බෙහෙත් ඔරුව වූකලී, ශරීරයේ හැඩය හා අනුරූප වන පරිදි හැරීමෙන් සකස් කර ඇත. ඔසු දියර පෙරීම ලෙස පිරිමසා ගැනීම සඳහා අවම ඔසු දියර ප්‍රමාණයක මුළු සිරුරම ගිල්විය හැකි පරිදි ඔරුවේ ඇතුළු පැත්ත සකස් කර තිබේ. ශාක යූෂ, කිරි, ගිතෙල්, තෙල් වර්ග, විනාකිරි ආදිය යොදා ගනිමින් ඒ ඒ රෝගී තත්වයන් අනුව වෙනස් සංයෝග වලින් යුතු ඖෂධීය දියරයන් තනාගෙන තිබෙන අතර මෙම චිකිත්සා ක්‍රමය චර්ම රෝග, වාත රක්තය, අර්ශස් සහ උණ වැනි රෝගී තත්ත්වයන් වලට ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගෙන තිබෙන බව කියවේ. බෙහෙත් ඔරු වලට අමතරව බෙහෙත් ඇඹරුම් ගල්, ගලින් සහ වානේ වලින් සෑදූ කතුරු

හා පිහි වැනි ශල්‍ය වෛද්‍ය උපකරණද නටඹුන් අතර තිබී හමුවී ඇත (උෟරාගොඩ, 1998).

ඒ වගේම ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්‍රමය පිළිබඳ මූලාශ්‍ර ඓතිහාසික ග්‍රන්ථ හා පුරා විද්‍යාත්මක සාධක යනාදිය ඉපැරණි ශ්‍රී ලංකාවේ දියුණු හා උසස් විධිමත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් පැවති බව සනාථ කරයි. එසේ හඳුනාගත් වෛද්‍ය ග්‍රන්ථ අතර,

**සාරාර්ථ සංග්‍රහය** - අනුරාධපුර යුගයෙහි මුල් අවධියේ සිටම ආයුර්වේද ශාස්ත්‍රය ලක්දිව පැවති බවට සාක්ෂි ඇතත් ඒ සමයෙහි ලියැවුණු වෛද්‍ය ග්‍රන්ථයක් යැයි කිව හැකිව තිබෙන්නේ බුද්ධදාස රජතුමන් විසින් ලියන ලද සාරාර්ථ සංග්‍රහය පමණකි. මෙය සතුරු ආක්‍රමණ හමුවේ ඉතිරිවූ එකම ග්‍රන්ථය යැයි සිතිය හැක.

**සාරාර්ථ සංග්‍රහය** - ආයුර්වේදීය ග්‍රන්ථයන් ඇසුරුකොට ලියූවක් බව පෙනේ. පසුකාලීනව මෙම ග්‍රන්ථයට සන්න ලියූවන් විසින් දක්ෂිණාත්‍ය වෛද්‍ය සම්ප්‍රදායට අයත් අග්නි කර්ම විධිය හා වෙනත් ප්‍රතිකාර ක්‍රමයන්ද ඊට ඇතුලත් කරනු ලැබ ඇත.

**භේසජ්ජ මංජුසාව** - මීළඟට දේශීය වෛද්‍ය ග්‍රන්ථයන් අතුරෙන් ප්‍රධාන ස්ථානයෙහිලා ගැනෙන්නේ අනවමදර්ශී සංඝරාජ මාහිමියන් විසින් මාගධී භාෂාවෙන් ලියන ලද භේසජ්ජ මංජුසාවයි. මේ සඳහා වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් විසින් ලියන ලද සන්නය දේශීය වෛද්‍ය ශාස්ත්‍රයෙහි උන්නතිය පිණිස කෙරුණු ශ්‍රේෂ්ඨතම කෘතියකි. මෙහි දකෂිණාත්‍ය සිද්ධ වෛද්‍ය මතයන් ද ඇතුලත් කර තිබේ.

**යෝගාර්ණවය හා ප්‍රයෝග රත්නාවලිය** - පලමුවන බුවනෙකබාහු අවධියෙහි මයුරපාද හිමියන් විසින් ලියන ලද යෝගාර්ණවය හා ප්‍රයෝග රත්නාවලිය අගනා දේශීය වෛද්‍ය ග්‍රන්ථයෝ වෙති. මෙහි ද දක්ෂණාත්‍ය සිද්ධ වෛද්‍ය ශාස්ත්‍රයට අයත් වෙද පිළියම් ඇතුලත් කර තිබේ. වරයෝග සාරය , ප්‍රයෝග සමුච්ඡය, යෝග පිටකය, වෛද්‍ය චින්තාමණිය ආදී ග්‍රන්ථයන් හා යෝග රත්නාකරය, යෝග මුක්තාවලිය, වටිකාප්‍රකරණය, යෝග මාලාව ආදී ග්‍රන්ථයන් ද සිංහලයෙන් හා සංස්කෘත ශ්ලෝකයෙන් රචිත යෝග ශතකය

මෙන්ම සිංහල සෙනහ ශතකය ආදී සංග්‍රහ ග්‍රන්ථයෝද දේශීය චිකිත්සාව ඉගෙනීම සඳහා යොදා ගනී.

යනාදි ග්‍රන්ථ වැදගත්කොට සලකයි. මේ දැක්වුණු ග්‍රන්ථ සියල්ලම විශේෂයෙන්ම දේශීය කාය චිකිත්සාවට අදාළ වේ. මීට අමතරව ගද්‍ය වූත්, පද්‍ය වූත් නොයෙක් දේශීය වෛද්‍ය ග්‍රන්ථ රාශියක් දක්නට ලැබේ. මෙසේ බලන කල දේශීය වෛද්‍ය ශාස්ත්‍රය හෙවත් සිංහල වෙදකම වූ කල්හි උතුරු ඉන්දියාවේ සංස්කෘත බසින් සම්පාදිත ග්‍රන්ථයන් හා දකුණු ඉන්දියාවේ දෙමළ, තෙළිඟු, මලයාලි යන භාෂාවලින් ලියැවුණු ග්‍රන්ථයන්ද ඇසුරින් අපේ රටේ දේශගුණික හා ශාරීරික තත්වයන්ද සළකා බලමින් සකස් කරගන්නා ලද්දකි. දඹදෙණි අවදියෙන් මෑත භාගයෙහි වරින් වර ලංකාවට පැමිණි කේරළ, චෝල, පාණ්ඩ්‍ය වැනි ජාතීන්වලට අයත් සිද්ධ වෛද්‍යවරයෝ දක්ෂිණ භාරතයෙහි එකල ප්‍රචලිතව පැවති උසස් ශාස්ත්‍ර ක්‍රමයන් හා විවිධ ඖෂධ හා වර්ග ද සිංහල වෛද්‍ය ශාස්ත්‍රයට ඇතුළත් කොට ඇති බව පෙන්වා දෙයි (ගල්මන්ගොඩ, 2003).

ඓතිහාසික ග්‍රන්ථ සැලකීමේදී මහාවංශය - ආරෝග්‍යශාලා ඉදිකිරීම, ඖෂධ හා ආහාර පාන වැනි දෑ සම්පාදනය කිරීම පිළිබඳ ව මහාවංශයෙහි තොරතුරු දැක්වේ. ඊට සාපේක්ෂව පුරාවිද්‍යාත්මක සාධක ලෙස කෙටියෙන් සිංහල ශිලා ලේඛන - මුල් කාලීන බ්‍රාහ්මී ශිලා ලේඛන වල මේ පිළිබඳ ව සඳහන් නොවේ. නමුත් සෞඛ්‍යාරක්ෂාව පවත්වා ගෙන යාම, නිරෝගී සම්පත ආදී කරුණු පිළිබඳ ව මෙන්ම ආරෝග්‍යශාලා පිහිටුවීම හා සම්බන්ධ කරුණු ද සිංහල ශිලා ලේඛන මගින් දක්වයි. **උදාහරණ :** මැදිරිගිරිය ආරාම සංකීර්ණයේ පිහිටි ආරෝග්‍යශාලාව සම්බන්ධ නීති රීති දක්වන දසවන මිහිඳු රජුගේ මැදිරිගිරිය පුවරු ලිපිය වගේම හය වන දප්පුල රජු විසින් ප්‍රධාන වෛද්‍යවරයෙකු වෙත ගම්වරයක් ප්‍රදානය කිරීම පිළිබඳ ව දැක්වෙන දෙවන දොරබාවිල ටැම් ලිපිය, පැරණි ආරෝග්‍යශාලාවන්හි සහ වෛද්‍ය මෙවලම් හා උපකරණ වල නටඹුන් - මිහින්තලේ, මැදිරිගිරිය, ආළාහණ පිරිවෙණ, ආදී ස්ථාන වලින් මෙම නෂ්ටාවශේෂ හමුවී තිබිමද පෙන්වා දිය හැකිය (ගල්මන්ගොඩ, 2003).

## 7. අනෙකුත් වෛද්‍ය සම්ප්‍රදායන්

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ කරුණු අධ්‍යනයේදී විවිධ වෛද්‍ය ක්‍රමයන්ගේ එකතුවක් එනම් වෛද්‍ය බහුත්වවාදයක් දැකගත හැකිබව මුලින්ම පෙන්වා දුනි. එහි එන දේශිය චිකිත්සාව මෙන්ම අපට වැදගත් වෛද්‍ය ක්‍රමයක් ලෙස ආයුර්වේදය පෙන්වා දිය හැක. ආයුෂ පවත්වාගෙන යැමේ විද්‍යාව, යන අරුත් දෙන ආයුර්වේදය වෛද්‍ය ක්‍රම කිහිපයකින්ම සමන්විත බව පෙනී යයි. උතුරු ඉන්දියාවෙන් පැමිණි පිරිස් සමග ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මෙරටට පැමිණෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. මේ අතර ලංකාවේ උතුරුකරය හා වෙනත් ප්‍රදේශ වරින්වර යටත් කරගත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ ජාතීන් වෙතින් ලංකාවට සිද්ධ වෛද්‍ය ක්‍රමය දායාද විය. ස්වදේශීය වෙදකම, ආයුර්වේදය හා සිද්ධ වෙදකම යන තුන් හවුලක ජන සුවසෙත පතා මහගු සේවයක් කරත් දී ඇත අතීතයේ පටන් වෙළඳාම් කටයුතුවල යෙදී සිටි මුස්ලිම්වරුන්ගේ මහගු වෛද්‍ය ක්‍රමයක් ව පැවති යුනානි වෛද්‍ය ක්‍රමය ද මේ අතරට පිවිසියේය. කෙසේ වුවද මෙම වෛද්‍ය ක්‍රම තුනම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ලෙස සලකන අතර දේශීය සිංහල වෙදකමද ඊට සම්බන්ධ වෙමින් වසර දහස් ගණනක් තිස්සේ ලංකාවාසීන්ගේ ශාරීරික ගැටලු පමණක් නොව මානසික ගැටලුවලට ද සත්කාර කරමින් ශ්‍රී ලංකා සංස්කෘතිය කළ එළි කරයි (වාර්ෂික වාර්තා, 2008). ඒ අනුව දේශිය චිකිත්සාව පමණක් නොව ආයුර්වේදය වගේම සිද්ධ, යුනානී, හොමියෝපති ආදීය වෛද්‍ය ක්‍රමයන් පිළිබඳවද අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

වර්තමානය වන විට දකුණු ආසියාවට ආවේණික වූ වෛද්‍ය සම්ප්‍රදාය තුනක් පවතින බව දක්නට පුළුවන. එනම්,

- යුනානි
- ආයුර්වේද
- සිද්ධ

වේ. මෙයින් යුනානි වෛද්‍ය ක්‍රමය අරාබි සම්ප්‍රදායන්ගෙන් ආරම්භ වී පැවත එන්නකි. පසුව විශේෂයෙන්ම මෝගල් යුගයෙන් පසු ඉන්දියාවට හඳුන්වා දෙන ලද වෛද්‍ය ක්‍රමයකි. ආයුර්වේද ගත්කල

උතුරු භාරතයේ ප්‍රභවය ලබා ඇති අතර බුදු සමය ආරම්භ වූ ප්‍රදේශයේ තමයි මෙහි වර්ධනය සිදුවී ඇත්තේ. සිද්ධ වෛද්‍ය ක්‍රමය ගත්විට එය දකුණු භාරතයේ විශේෂයෙන්ම මදුරාසිය කේන්ද්‍ර කරගෙන ආරම්භ වූවකි. මෙම වෛද්‍ය ක්‍රමයන්හි ඒ ව්‍යාප්ති ප්‍රදේශ අනුව ආගම් සමගද සම්බන්ධ වී බද්ධ වී පවතී. යුනානි ක්‍රමය ඉස්ලාම් ආගම හා සම්බන්ධව පවතින බව දක්නට පුළුවන.

ආයුර්වේදය සම්භවයෙ හින්දු ආගම හා සම්බන්ධ වූවක් වන අතර සිද්ධ වෛද්‍ය ක්‍රමය හින්දු ආගමට ජනප්‍රිය රැල්ලක් වූ ශිවා ආගම හා බැඳී පවතී. ආගම පමණක් නොව භාෂා සම්ප්‍රදායන් ද මෙම වෛද්‍ය ක්‍රම සමඟ සම්බන්ධ වී තිබේ. යුනානි වෛද්‍ය ක්‍රමය අරාබි බස තුළින් ආරක්ෂා වී ඇති අතර ආයුර්වේද සමඟ සම්බන්ධ වී පවතින්නේ සංස්කෘත භාෂාව සමගය. ද්‍රවිඩ බස සමඟ බැඳී ඇත්තේ සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය සමගය. මෙම වෛද්‍ය ක්‍රමය තුළ එක්තරා ආකාරයකට මහා සම්ප්‍රදායට අයත් වන බව විද්වතුන්ගේ අදහසයි (*අපේ සංස්කෘතික උරුමය,* 1998).

මෙකී වෛද්‍ය ක්‍රමයන් ප්‍රායෝගික භාවිතයේදී සම්ප්‍රදායන් තුනම සම්මිශ්‍රව රූපයක් පවතිනු දක්නට ලැබෙන අතර එකිනෙකට සම්බන්ධ වී පැවතීම නිසා වෙන් වෙන් වශයෙන් මේවා හඳුනා ගැනීමට පවා අපහසු වී තිබේ. යටත්විජිතවාදයෙන් පසුව බොහෝ දුරට බටහිර වෛද්‍ය විද්‍යාව සමඟ ද මෙම වෛද්‍ය සම්ප්‍රදායන් බද්ධ වී තවදුරටත් සංකලන වීමත් දක්නට පුළුවන. මෙම එක් එක් වෛද්‍ය සම්ප්‍රදායන් පහත පරිදි අපට විමර්ශනය කළහැකිය.

### 7.1. ආයුර්වේදය

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට පෙර පැවති වෛද්‍ය ක්‍රමය වූයේ පාරම්පරිකව පැවත ආ "දේශීය චිකිත්සාව" හෙවත් සිංහල වෙදකමයි. ශ්‍රී ලංකාව වෙත බුදු දහම සම්ප්‍රාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස ආයුර්වේදයද දායාද විය. ආයුර්වේදය ශ්‍රී ලංකාවට ලැබුනේ අවුරුදු තුන්දහසකටත් අධික කාලයක් තිස්සේ එය වැඩී වර්ධනය වූ ඉන්දියාවවෙනි. ආයුෂ පවත්වාගෙන යාමේ විද්‍යාව යනු ආයුර්වේදය යන්නෙහි අදහසයි ආයුර්වේද වෛද්‍ය ක්‍රමය රෝග නිවාරණය පදනම් කරගත්තෙකි එහි ප්‍රතිකාර ක්‍රම මෙන්ම ඇවතුම් පැවතුම් ක්‍රම හා වත් පිළිවෙත් ද පවතී.

හුදෙක් රෝගයකට ප්‍රතිකාර කිරීමට වඩා රෝගයන්ට ගොදුරු නොවන පරිදි කායිකව හා මානසිකව සුවදායි සෞඛ්‍යමත් ජීවිතයක් පවත්වාගෙන යාම ආයුර්වේද මගින් අදහස් කෙරේ.

කෙසේ නමුත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උතුරු ඉන්දීය ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය, දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය, අරාබි යුනානි වෛද්‍ය සම්ප්‍රදාය, සහ ශ්‍රී ලංකාවේ පාරම්පරික දේශීය චිකිත්සා ක්‍රමය යන සියල්ලෙහි සංකලනයක් ලෙසින් පවතින්නකි. එසේ වුවද ශ්‍රී ලංකාව ස්වකීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ආවේනික සම්ප්‍රදායක් තුළ පවත්වා ගෙන යන අනන්‍ය වෛද්‍ය විද්‍යාවක් ලෙස පිළිගෙන තිබේ.

ආයුර්වේදය යනු සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයකි. ආයුෂ් යන්නෙන් දීර්ඝ ජීවිතය ද වේදය යන්නෙන් උසස් දැනගැනීම නොහොත් උතුම් අනුශාසනය ද ගැනේ. මේ අනුව දිගු කලක් ජීවත්වීමට උපදෙස් දෙන උතුම් ශාස්ත්‍රය ආයුර්වේදය ලෙසින් නම් කර ඇත. මෙසේ ඉන්දියාවේ ජනිත වූ ආයුර්වේදයේ නිර්මාතෘවරයා ලෙස සැළකෙනුයේ ධන්වන්තරි නම් ඍෂිවරයායි. එතුමා ආයුර්වේදීය ශල්‍ය සම්ප්‍රධායේ පියා ලෙසින් ද හැඳින්වේ. ආයුර්වේදය හෝ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව යනු ඉන්දියානු උප මහද්වීපයට ආවේනික පෞරාණික වෛද්‍ය ක්‍රමයකි. එය ඉන්දියාව නේපාලය සහ ශ්‍රී ලංකාවේ මිලියන ගණනක් වු ජනතාව විසින් බහුලව භාවිතා කරන ක්‍රමයකි. බටහිර රටවල ද ආයුර්වේදය ජනප්‍රියව පවතී. ආයුර්වේද යන්න ආයු යනු ජීවිතය හෝ දිර්ඝ ආයුෂ සහ වේද යනු දැනුම යන තේරුම ඇත්තකි. එලෙස ගත් කළ ආයුර්වේද යන්නෙහි සරල අදහස ජීවිතය පිළිබඳ දැනුම/ දිර්ඝායුෂ පිළිබඳ දැනුම හෝ ජීවිතය පිළිබඳ විද්‍යාව (The Science of Life) යන්නයි. එසේ ඉහතින් දැක් වූ කරුණුවලින් පෙනීයන්නේ ආයුර්වේදයෙහි මූලික අරමුණ වන්නේ ශාරීරික, මානසික, සමාජීය සහ අධ්‍යාත්මික සුසංයෝගයන් පවත්වා ගැනීමෙන් දිර්ඝායුෂ පවත්වා ගැනීමය යන්නයි. තවද ආයුර්වේදය යනු ශල්‍ය චිකිත්සාව මගින් විදග්ධ සැත්කම් ක්‍රමය භාවිතා වන සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමවේදයන් අතරින් එකකි (වාර්ෂික වාර්තාව ,1998).

### 7.1.1. ආයුර්වේදයෙහි ඉතිහාසය සහ පුරාතන සාක්ෂි

අථර්වන් වේදයේ උපාංගයක් වන ආයුර්වේදය මහා බ්‍රහ්මයා විසින් කරවන ලද බව සුසැත සංහිතාවෙ දැක්වේ. ආයුර්වේදයෙහි උපත පිලිබඳව පරම්පරාවෙන් පරම්පරාවට වාචිකව තොරතුරු ගමන් කර ඇත. ආදි ඍෂිවරු හෙවත් බහුස්‍රැතයන් ඉන්දියාවේ හිමාල කන්ද පාමුල එක්රැස්වී ඇති අතර ඔවුනගේ අරමුණ වී ඇත්තේ සෞඛ්‍ය සම්පන්නව දීර්ඝායුෂ විදීමේ රහස් පිළිබඳව දැනුම වැඩිදියුණු කර ගැනීම හා හුවමාරු කර ගැනීමයි. ඔවුන්ගේ මෙම ප්‍රයත්නයෙහි අවසන් ප්‍රතිඵලය වනුයේ ආයුර්වේදය හෙවත් ජීවිතය පිළිබඳ විද්‍යාව බිහිවීමයි (ඉන්ද්‍රජෝති, 2013).

ආයුර්වේදයෙහි භාවිතයන් සහ මූලාරම්භය පිළිබඳව ලිඛිත පරිශීලන මාධ්‍යයන් නොමැත. ආයුර්වේදයෙහි වයස නිර්ණය කරනුයේ අමතර පර්යේෂණ සාක්ෂි සහ වේද යුගයෙහි විසූ අග්නි වේශ විසින් රචිත අග්නිවේශ තන්ත්‍රනම් ග්‍රන්ථයෙහි මුල්වරට ආයුර්වේදය පිළිබඳ සඳහනක් කොට ඇත. මෙය පසුකාලීනව චරත විසින් චරක සම්හිත ලෙස සංශෝධනය කරන ලදී. ආයුර්වේද පිළිබඳ අනෙකුත් මුල් යුගයේ ලේඛනයන් වනුයේ චරක සම්හිත හා ශුසෘත සම්හිතයි. ශිලා ලිපි වලින් පැවත ඒමට ප්‍රථම මෙම දැනුම ගුරුකුල ක්‍රමය ඔස්සේ වාචිකව මුඛ පරම්පරාවෙන් ආරක්ෂා වී ඇත.

මුල් යුගයේ ලේඛනයන් රචිතව තිබුණේ කල්තබා ගත නොහැකි තල්පත්‍ර සහ බෝජපත්‍ර වලය. මේවා පසු කාලීනව ශෛල හා තඹ පත්‍ර මත රචනා කර ආැත. ආයුර්වේදය පිළිබඳව රචිත ඇතැම් ශ්ලෝකයන් අතර්වේදයෙහි සඳහන්ව ඇති අතර ආයුර්වේදයෙහි ඇතැම් ඒවා ඉතාමත් පැරණිය. ආයුර්වේද ක්‍රමයන් කාලයක් මුළුල්ලේ විකාශනයට පත්ව ඇත. ඇතැම් ඒවා පුරාණ වේද යුගයෙහි පටන් නව්‍යකරණය වෙමින් පවතින අතර ඉන්දියාවේ බුදුන් ජීවත් වු කාලයේ දී එය වැඩි වශයෙන් සිදු වී ඇත.

ආයුර්වේදයෙහි විවිධ සිද්ධාන්තයන් ගොඩ නැගීම සඳහා හින්දු ආගම බොහෝ බලපෑම් ඇති කර ඇත. මුල් යුගයේදී දිව්‍යමය ප්‍රාඥයින් විසින් අවබෝධ කරගත් දැනුම සංකීර්ණ ස්මෘති ආධාරක මගින් සාමාන්‍ය මනුෂ්‍යයන් වෙතද පසු කාලීනව ක්‍රම ක්‍රමයෙන් ගමන් කර ඇත. ආයුර්වේද සම්ප්‍රදායන් පිළිබඳ විස්තර එක් එක් රචකයන් අනුව වෙනස් වේ. එසේ වන්නේ වාචිකව පැවත එන

දත්තයන් විවිධ මාධ්‍ය ඔස්සේ පරිවර්තනය වීමෙනි. මුල්ම ආයුර්වේද අත්පිටපත් රචනා කරන ලද ලේඛකයන් විසින් එහි එකිනෙකට වෙනස් ක්‍රම වේදයන් පිළිබඳ සදහන් කර ඇත (ගල්මන්ගොඩ, 2003).

මහා භාරතයේ සදහන් වන අන්දමට ක්‍රිෂ්ණා දෙවිදුන් හට සම්බ් නම් පුතෙක් විය. ඔහු ලාදුරු රෝගයෙන් පීඩා වින්දේය. ඔහුට ප්‍රතිකාර කරනු වස් ක්‍රිෂ්ණ දෙවිදුන් විසින් ශක්‍ර දේශයෙහි (නූතන ඉරානය) වෙසෙන විශේෂ බ්‍රහ්මයින් කොටසක් වෙත ආරාධනා කොට යවන ලදී. ඔවුන් සූර්යය නමස්කාරයෙහි නිරත වන්නන් සහ ප්‍රසිද්ධ දෛවඥයන් වුණි. ඔවුන් සම්බ් හට ප්‍රතිකාර කොට ලාදුරු රෝගය සම්පූර්ණයෙන් සුව කරන ලදී. ශක්‍ර ද්වීපයෙහි බ්‍රාහ්මණයින්හට මාගි බ්‍රාහ්මණයන් ලෙසද ව්‍යයවහාර කෙරේ. සකල් ද්වීපයෙහි ආයුර්වේදය, දෛවඥවේදය, තාරකා විද්‍යාව පිළිබඳ විශේෂ දැනුමක් තිබූ අතර ඔවුන් සූර්යය නමස්කාරයෙහි යෙදෙන්නන් වූයෙන් සෞර යන නමින් හැදින්විණි. මොවුන්ගේ උපත පිළිබද වැඩි විස්තර භාවිශ්‍ය පුරාණයෙහි අන්තර්ගතය. ඔවුන් ආයුර්වේදයෙහිලා විශේෂ මෙහෙයක් ඉටු කළහ. නූතන ආයුර්වේදයෙහි නිජබිම මාගි හෝ සකල් ද්වීපයයි. ආයුර්වේදයේ නිර්මාතෘවරයා ලෙස සැළකෙනුයේ ධන්වන්තරී මහ ඍෂි තුමාය.

මෙතුමා විසින් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය භාරතයේ ව්‍යාප්ත කරනු ලැබූ අතර එයින් වර්ෂ 400 කට පමණ පසු උත්තර භාරතයේ ජනයා අතර උග්‍ර අයුරින් ලෙඩ රෝග පැතිර යන්නට විය. එයින් පීඩාවට පත් ජනතාවට සෙත සැළසීම පිණිස එකල ජීවත් වූ මහා ඍෂිවරුන් හිමාලය පාමුල පංච නදී තීරයට එක්රැස්ව මෙය සඳහා පිළියම් සෙවූහ. එහි දී ගත් තීරණයකට අනුව භාරද්වාජ නම් මහ ඍෂිවරයාණන්ව ඉන්ද්‍රභවනයට යවා තිබේ. යථෝක්ත අවශ්‍යතාවශ උදෙසා ප්‍රතිකාර පද්ධතියක් හදාරා ඒමට ඉන්ද්‍රභවනට පිවිසි භාරද්වාජ මහා ඍෂිතුමා ඉන්ද්‍රදේවයාගෙන් ආයුර්වේදය මැනවින් හදාරා නැවතත් භාරත දේශයට සම්ප්‍රාප්ත වී ඇත. නැවතත් රැස් වූ මහා ඍෂි සමුළුවේ දී භාරද්වාජ මහා ඍෂි තුමා තමන් උගත් ශාස්ත්‍රය සෙස්සන්ට ද ප්‍රගුණ කරවා ඇති අතර එය අද දක්වා පැවතින්නේ එකී ශාස්ත්‍රයයි (කරුණාරත්න, 2016). ආයුරවේදයේ උපපත්ති කතාව අපහට ඒ අයුරින් හඳුනා ගන්නට හැකිය.

### 7.1.2. වර්තමාන ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ප්‍රධාන අංග (අෂ්ඨාංග ආයුර්වේදය).

ආයුර්වේදීය මූලග්‍රන්ථ වන සුශ්‍රැත සංහිතාව හා චරක සංහිතාව යන සංහිතා ග්‍රන්ථ වලට අනුව ආයුර්වේදීය චිකිත්සාව අංග (තන්ත්‍ර) අටකට විභේදනය කර දක්වා ඇත. එය අෂ්ඨාංග ආයුර්වේදය ලෙස හැඳින්වේ.

- කාය චිකිත්සා තන්ත්‍රය - ශාරීරික අග්නිය විකෘත වීමෙන් හටගත් (ත්‍රිදෝෂ අසමතුලිතතාවය මගින් හටගත්) රෝග සඳහා අනුගමනය කරන චිකිත්සා පද්ධතිය(general medicine)
- ශල්‍ය චිකිත්සා තන්ත්‍රය - ශල්‍ය කර්ම (Surgical techniques)
- ශාලාක්‍ය තන්ත්‍රය - ගෙලෙන් ඉහල කොටසේ ඇතිවන රෝග පිළිබඳ චිකිත්සාව ("ENT")
- කෞමාරභෘත්‍යය තන්ත්‍රය (බාල රෝග චිකිත්සාව) - ළදරුවකුගේ උපතේ පටන් ළදරුවාගේ පෝෂණය හා ඔහුට ඇතිවන රෝග සඳහා වූ චිකිත්සා පද්ධතිය (Paediatrics)
- අගද තන්ත්‍රය - විෂ චිකිත්සාව (Toxicology)
- භූත විද්‍යා තන්ත්‍රය - ඉතා සියුම් ශරීර ඇති සත්ව කොටස් මගින් හා ග්‍රහ බලපෑම් මගින් ඇතිවන රෝග සඳහා වූ චිකිත්සා පද්ධතිය.
- රසායන තන්ත්‍ර - වයස්ථාපනය ඊ ශරීරයේ වැහැරියාම පමා කිරීම සඳහා වූ චිකිත්සා පද්ධතිය (Rejuvenation)
- වාජීකරණ තන්ත්‍රය - ප්‍රජාස්ථාපනය, කාම වර්ධනය, ලිංගික ශක්තිය වැඩි දියුණු කිරීම හා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම මනා වූ ප්‍රජනන ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම සඳහා වූ චිකිත්සා පද්ධතිය

(වාර්ෂික වාර්තාව 2018). යනාදිය ලෙස හඳුනාගත හැකිය.

### 7.1.3. ආයුර්වේදයේ භාවිත ඖෂධ වර්ග

ආයුර්වේදයේ භාවිතා වන ඖෂධ වර්ග වැඩි ගණනකම මූලාශ්‍රය වන්නේ ශාකමය කොටස්ය. ඖෂධීය වටිනාකමක් ඇති ශාකයක පංචාංගය (මුල්, කොළ, පොතු, මල්, ඵල) ඇසුරින් ඖෂධ නිපදවා තිබේ. ඔසු පැන්, යුෂ, තෛල, බෙහෙත් ගුලි, කල්ක, ආසව, කෂාය, අරිෂ්ඨ ආදී වශයෙන් ආයුර්වේදයේ ඖෂධ මාධ්‍යයන් භාවිතා වී තිබේ.

### 7.1.4. ශ්‍රී ලංකාවේ වර්තමාන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය.

**ආයුර්වේදයේ සිද්ධාන්ත**




ආයුවේදය ගොඩනැගෙන මූලික සිද්ධාන්ත දෙකක් පදනම් කරගෙනය. ඒ පංච

මහා භූත සිද්ධාන්තය සහ ත්‍රි දෝෂ සිද්ධාන්තයි. පංචමහා භූත සිද්ධාන්තය කියන්නේ විශ්වය නිර්මාණය වූ පඨවි, ආපෝ, තේජෝ, වායෝ සහ ආකාශ කියන පංච මහා භූතයන් මූලික කරගෙන ගොඩනැගුණු සිද්ධාන්තය වේ. වා, පිත්, සෙම් යන තුන්දොස් මූලික කරගෙන ගොඩනැගුණු සිද්ධාන්තය ත්‍රි දෝෂ සිද්ධාන්තය විදිහට හැඳින්වේ.

සංස්කෘතිය පෝෂණය වීමේදී විවිධ ආගමික ඉගැන්වීම් හා වෛද්‍ය විද්‍යාත්මක ඉගැන්වීම් ඒ සඳහා බලපෑම් කරනු ලබයි. ශ්‍රී ලංකා සංස්කෘතිය කෙරෙහි බුදු දහමේ වගේම ආයුර්වේදයද දැඩි බලපෑමක් කොට තිබේ. උදාහරණ වශයෙන් හොඳ, නරක, පින්, පව් ලෙසින් විවාහය මරණය, මගුල දරු ප්‍රසූතිය වැනි අවස්ථාවල ආයුර්වේදීය බලපෑමක් ලංකා සංස්කෘතිය තුළින් පැහැදිලිව හඳුනාගත හැකිය. ආයුර්ාවිදය බුදුදහම හා සමාන සිංහල සංස්කෘතිය හැඩගැස්වීමෙහිලා

දක්වන ලද සබඳතාවයට බොහෝ ලෙසින් සමාන ආකාරයෙන් ම ආයුර්වේදයද සිංහල සංස්කෘතිය කෙරෙහි බලපෑම් කොට තිබෙන බව අපට පෙනේ. බටහිර වෛදය විද්‍යාව අනුව මානව ශරීරයේ සියලුම රෝග වලට හිමිවන්නේ ඒක සමාන තත්ත්වයනි. නමුත් ආයුර්වේදයට අනුව ශරීරයේ ඉහළින් ම තිබේන්නේ හිසයි. ඒ විශේෂ්ම සියලු සියළු ජීව ක්‍රියාවලීන් මෙහෙයවනු ලබන්නේද හිසයි. මෙලෙස හිස මූලික වන නිසා හිස් ආරක්ෂා කර ගැනීමට සිංහල සමාජයේ සුවිශේෂ උත්සහ ක්රීමක් දැකගත හැක. හිස ප්‍රධාන යන අදහස තුළ සමහර විට බෞද්ධාගමික බලපෑමක් ද ඇතැයි සිතිය හැකිය. අපගේ සියලුම ක්‍රියාවන් වල දී ප්‍රධාන වගේ මතයයි. මනස යනු එහිම කොටසකි. එය ආරක්ෂා කර ගැනීමට නිරතුරුවම උත්සාහ ගන්නා බව පෙනේ.උදාහරණ ලෙෂ හිසතෙල් ගෑම, මිනපතා ස්නානය කිරීම, පින්න හා අව්ව වැනි අවස්ථාවල දී හිස ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම, ආදි චර්යාවන් වලට පෙළඹී සිටින අකාරය අපි දනිමු. එමෙන්ම ආයුර්වේදයේ ප්‍රධාන ලක්ෂණ අතර ජලය හා ගින්දර වැදගත් වේ. ජලය මගින් සීතල හා ගින්න මගින් උෂ්ණත්වයක් විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතුවලදී ජලය හා ගින්න මිනියාට ඉතාමත් ප්‍රයෝජනවත්ය. මේ අතර සමතුලිතතාවය ආරක්ෂා කර ගැනීමටත් සිංහල ජනතාව කටයුතු කරනු දක්නට ලැබේ.

එසේ උවද ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවා පුළුල් වශයෙන් ක්‍රියාත්මක වන්නේ බටහිර වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයයි. නමුත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ද නව පිබිදීමක් දක්නට ඇත. විශේෂයෙන් ශ්‍රී ලංකාව සංචාරකයන ආකර්ෂණය කරන තෝතැන්නක් බවට පත් වීමට ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය හේතු වී තිබේ. ඒ හැර ශ්‍රී ලාංකිකයන් ද පෙරට වඩා වැඩි උනන්දුවක් ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සහ වත් පිළිවෙත් කෙරේ දක්වන බවක් දැකගත හැකිය. වර්තමානයේ ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් පුහුණු කිරීම විවිධ ආකාරයෙන් සිදුවේ. ඇතැම් විට බටහිර වෛද්‍ය සම්ප්‍රදායයන් අනුව ද වෛද්‍යවරු සහ හෙදියන් පුහුණු කෙරෙති. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයත් ඒ යටතේ පිහිටුවා ඇති ආයුර්වේද දෙපාර්තමේන්තුවත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීමෙහි ලා ප්‍රධාන කාර්යයක් ඉටු කරන අතර ආයුර්වේද

වෛද්‍ය ක්‍රමය ඉගැන්වීම හා පුහුණු කිරීම විධිමත් අන්දමින් සිදු කෙරෙන බවක් දැකගත හැක. ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම මගින් පිළිගැනීමක් සහ ආරක්ෂණයක් සපයා තිබීමද වැදගත්ය.

1961 අංක 31 ආයුර්වේද පනත යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව පිහිටුවා ඇති අතර එමගින් සහ පනත මගින් දක්වන සුදුසුකම් සපුරාලන තැනැත්තන් වෛද්‍ය වෘත්තිකයන් ලෙස ලියාපදිංචි කෙරෙනු ලැබේ. එසේ ලියාපදිංචිය ලබා ගත් වෛද්‍යවරුන්ට පමණක්, වෛද්‍යාචාර්ය, යන නාමය භාවිතා කිරීමට අවසර තිබේ. ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනය උපාධි මට්ටමින් පිළිගැනීම දේශීය වෛද්‍ය විද්‍යායතනය මගින් සහ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් සිදු කරයි (වාර්ෂික වාර්තාව, 2018). මෙවැනි කරුණු අනුව ලංකාවේ ආයුරවේද වෛද්‍ය ක්‍රමය ස්ථාවරව පවත්වාගෙන යාමට ගෙන යන වැඩ පිළිවෙල පිළිබඳවද කරුණු දැනගත හැකිය.

## 7.2. සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය

සිද්ධ වෙදකම දකුණු ඉන්දියාවේ ආරම්භ වූ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවක් වන අතර එය ඉන්දියාවේ ඇති පැරණිම වෛද්‍ය ක්‍රම වලින් එකකි. සිද්ධ වෛද්‍ය ශාස්ත්‍රය වනාහි ආයුර්වේදය මෙන්ම සම්පූර්ණ වූ විද්‍යාවකි. ආයූර්වේදයේ කාය චිකිත්සා, ශල්‍ය, ශාලාඛ්‍ය යන අංග තුන එකල ජන සමාජයෙහි බෙහෙවින් ප්‍රචලිතව ඇත. බුද්ධ කාලයේ දී දියුණු තත්වයක පැවැති ශල්‍ය, ශාලාඛ්‍ය ක්‍රම දෙන භාරතීය බෞද්ධ සමයේ පිරිහීමක් සමගම අභාවයට පත් වී ඇත. මෙම සම්ප්‍රදාය ද ආයුර්වේදයේ මූලධර්මයන් අනුගමනය කර ඇත. සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය ප්‍රතිකාර ක්‍රමයක් ලෙස ''සින්දූරම්'' ප්‍රතිකාරය බෙහෙවින් දියුණු වී තිබේ. මෙම සින්දූරම් ප්‍රතිකාරය පසු කාලීනව ''රස වෛද්‍ය ක්‍රමය'' යන නාමයෙන් ආයුර්වේදයට සංකලනය වී ඇත්තේ තව තවත් දියුණු සොයා ගැනීම්වල ප්‍රතිඵලයක් ලෙසටය. මෙම සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය දක්ෂිණ භාරතය පුරාම ප්‍රචලිත වූවක් ලෙස මෙහි දී හැඳින්විය හැකිය. මෙය ආත්‍රෙය මහා ඍෂිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති වෛද්‍ය අධ්‍යාපන සාකච්ඡාවකට දක්ෂිණ භාරතයෙන් අගස්ති මුනිවරයා ද ලංකාවෙන් පුලස්ති මහා ඍෂි තුමා ද සහභාගී වී ඇත. එහි දී ආයූර්වේදය හැදෑරූ අගස්ති මුනිවරයා

දක්ෂිණ භාරතයේ විසු අසුරයන් වෙත පැමිණ එහි සුලභ බෞද්ධ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් වෛද්‍ය ක්‍රමයක් බිහි කොට ඇත. එය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය යනුවෙන් හඳුන්වන බව පුරාවෘතවල සඳහන්ය.

සිද්ධ දෙමළ භාෂාවෙන් වෛතියර් ලෙස හැඳින්වෙන අතර එහි ඉතිහාසය විමසිමේදි දකුණු ඉන්දියාවේ පරිණාමය වූ පැරණි ඉන්දියානු සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රමයක් වන අතර එය ක්‍රිස්තු පූර්ව 3 ශතකයේ ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය හෝ ඊට පෙර කාලයට අයත් වේ. පැරණි සිද්ධ සාහිත්‍යයට අනුව මෙම වෛද්‍ය ක්‍රමය ආරම්භ වූයේ හින්දු දෙවියන් වන ශිවගෙන් බවත් එය ඔහුගේ බිරිඳ වන පාර්වතීට ඉගැන්වූ බවත් කියවේ. පසුව පාර්වතී එය නන්දි වෙත භාර දුන් අතර නන්දි ඒ ගැන දේවාත නවයකට ඉගැන්වූ බවත් පුරාවෘතයන්හි සඳහන්ය.

### 7.2.1. රෝගය සහ හේතුව පිළිබඳ සංකල්පය

වාදම්, පිත්තම් සහ කපම් යන දොෂ තුනේ සාමාන්‍ය සමතුලිතතාවයට බාධා ඇති වූ විට රෝග ඇති වෙන බව අප ඉහතදීද දැන ගතිමු. මෙම සමතුලිතතාවයට බලපාන සාධක නම් පරිසරය, දේශගුණික තත්ත්වයන්, ආහාර, ශාරීරික ක්‍රියාකාරකම් සහ ආතතින්ය. සාමාන්‍ය තත්වයන් යටතේ වාදම්, පිත්තම් සහ කපම් අතර අනුපාතය පිළිවෙලින් 4: 2: 1 වේ. සිද්ධ වෛද්‍ය ක්‍රමයට අනුව ආහාර සහ ජීවන රටාව සෞඛ්‍ය සහ රෝග සුව කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙම සිද්ධ වෙද සංකල්පය පතියම් සහ අපාතියම් ලෙස හැඳින්වෙන අතර එය මූලික වශයෙන්, කළ යුතු දේ හා නොකළ යුතු දේ, ලැයිස්තුවක් සහිත රීති පදනම් කරගත් පද්ධතියකි.

### 7.2.2. සිද්ධ වෛද්‍ය ක්‍රමයේ සඳහන් ශාකසාරවාදය

සිද්ධාර්වරුන් විසින් භාවිතා කරන ලද ශාකසාර කාරක කාණ්ඩ තුනකට වර්ග කළ හැකිය. තාවරම් (ශාකසාර නිෂ්පාදනය) තාඩු (අකාබනික ද්‍රව්‍ය) සහ ජංගමම් (සත්ව නිෂ්පාදන). තාඩු ඒජන්තයින් ලෙස තවදුරටත් වර්ගීකරණය කර ඇත. උප්පු (ගිනි තැබීමේදී වාෂ්ප නිකුත් කරන ජලයේ ද්‍රාව්‍ය අකාබනික ද්‍රව්‍ය),

පශනම් (ද්‍රවයන් ජලයේ දිය නොවන නමුත් දැවෙන විට වාෂ්ප විමෝචනය කරයි), උපරසම් (පාෂාණමට සමාන නමුත් ක්‍රියාවෙන් වෙනස් වේ), ලොහම් - ජලයේ දිය නොවන නමුත් දැවෙන විට දිය වේ), රසම් (මෘදු ද්‍රව්‍ය) සහ ගාන්ධගම් සල්ෆර් වැනි ජලයේ දිය නොවන ද්‍රව්‍ය) භාවිත වේ.

### 7.2.3. ශ්‍රී ලංකාවේ සිද්ධ වෛද්‍ය විද්‍යාවේ ඉතිහාසයේ සිට අද දක්වා පුනර්ජීවනය වී ඇති අකාරය




සිද්ධ ක්‍රමය වෛද්‍ය විද්‍යාව ඉන්දියාවේ පැරණිතම වෛද්‍ය ක්‍රමය වන අතර දකුණු ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක වූ දීර්ඝ ඉතිහාසයක් ඇත. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වල සාම්ප්‍රදායික සෞඛ්‍ය සේවා ක්‍රමයේදී සිද්ධ වෛද්‍ය ක්‍රමය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරයි.

දැන් සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය දෙසට ලෝකය යොමු වී ඇත. සිද්ධ වෛද්‍ය ක්‍රමය නැගෙනහිර පළාතේ ඉතා මුල් බැස ඇති පද්ධතියක් වන අතර ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ දිගු කාලීන අවශ්‍යතාවශ(අක් වූ අතර සිද්ධම්දිසි ශාන්ත අහතියර්ගේ පියා පා තබමින් අහතියර් ස්ථානයක් පිහිටුවා ගත් අතර (සිද්ධ විද්‍යාව ඇතුළු දෙමළ කලා 64 ක් සඳහා පුරාණ විශ්ව විද්‍යාලය) තිරුකරසායිපුරන් විසින් සාක්ෂි දරන කන්ගුවේලි මුතුර්හිදී මෙම විචිත්‍රවත් ශක්තියෙන් ගරු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. තංගේෂ්වරී මහත්මිය මෙම ස්ථානයට පැමිණි අතර නැගෙනහිර විශ්වවිද්‍යාලයේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධා වෛද්‍ය පීඨය පිහිටුවීම සඳහා ඇය නැගෙනහිර විශ්වවිද්‍යාලයට හිමිකම් කීයා ඇත.

2004 දී නැගෙනහිර පළාත් සිද්ධ වෛද්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ ඉල්ලීම් ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නැගෙනහිර

විශ්වවිද්‍යාල සභාව සාකච්ඡා කර මෙම විෂය ත්‍රිකුණාමලය මණ්ඩපයේ පිහිටුවීම සඳහා ත්‍රිකුණාමලය මණ්ඩපයට භාර දී ඇත. මෙම අවස්ථාවේදී, සිද්ධ පීඨය පිහිටුවීම සඳහා වූ යෝජනාව සහ විෂය මාලාව සකස් කිරීම සඳහා ආයුර්වේද රෝහලේ කප්පල්තුරෙයි, කප්පල්තුරේ උපදේශක වෛද්‍ය, ආචාර්ය එන්. වර්ණකුලේන්ද්‍රන් අධ්‍යයන උපදේශකයෙකු ලෙස සේවය කළේය. එම යෝජනාව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 175 වන කවුන්සිලයේ දී අනුමත කර ඇති අතර ත්‍රිකුණාමලය මණ්ඩපයේ සිද්ධ වෛද්‍ය පීඨය ගොඩනැගීමේ 2015 දී නව පියවරක් ගන්නා ලදී. 2007 සිට දේශීය වෛද්‍ය විද්‍යාවේ ස්ථාවර කමිටුවේ දී පැවති දීර්ඝ කාලීන සාකච්ඡාව ල 2007/ 2008 අධ්‍යයන වර්ෂයේ සිට දැනට පවතින පීඨය යටතේ සිසු අංක 20 ද සමඟ වැඩසටහන ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෛද්‍ය වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය (BSMS) ලබා දුන්නේය. මෙම තත්ත්වය තුළ සිද්ධ ක්‍රමය වෛද්‍ය ක්ෂේත්‍රයක් වන හෙයින් ත්‍රිකුණාමලය කැම්පස් හි දැනට පවතින පීඨයන්ට ඔවුන්ගේ පීඨයට ඇතුළත් වීමට හැකියාවක් නොතිබුණි. පසුව දේශීය වෛද්‍ය විද්‍යාවේ ස්ථාවර කාරක සභාව විසින් යාපනය විශ්ව විද්‍යාලය පිහිටුවීම හා සමානව රෙක්ටර්ගේ විෂය යටතේ ඒකකයක් ලෙස කටයුතු කිරීමට තීරණය කරන ලදී.

2017 දී පැවති 247 වන කවුන්සිලයේ පසුව උපාධි ප්‍රදානය කිරීමේ ගැටළුව විසඳීම සඳහා සිද්ධ වෛද්‍ය ඒකකය ව්‍යවහාරික විද්‍යා පීඨය සමඟ සම්බන්ධ කිරීමට තීරණය කරන ලදී. සිද්ධ වෛද්‍ය පාඨමාලාවට වසර 5 ක පාඨමාලා වැඩ, රසායනාගාර කටයුතු, පර්යේෂණ කටයුතු සහ සායනික පුහුණුව ඇතුළත් වේ. 2007/ 2008 අධ්‍යයන වර්ෂයේ මූලික ප්‍රවේශය සිසුන් විස්සක් (20) ක් වූ අතර දැන් එය 2015/ 2016 අධ්‍යයන වර්ෂයේ සිට 75 දක්වා වැඩි කර ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 10 දෙනා අතර හය දෙනෙක් සිද්ධා වෛද්‍ය විද්‍යාවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණියේ සිටිති.

## 7.3. යුනානි වෛද්‍ය ක්‍රමය

යුනානි වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ පවතින සාම්ප්‍රදායික දේශීය වෛද්‍ය ක්‍රමයකි. මෙහි මව් බිම ග්‍රීසියයි. දහ වන සතවර්ෂයේ දී ශ්‍රී ලංකාව තුළ මෙම වෛද්‍ය ක්‍රමය ආරම්භ විය. 1929 දී කොළඹ

විශ්වවිද්‍යාලයට අනුබද්ධ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ යුනානි අංශය ස්ථාපිත කරන ලද අතර මෙම වෛද්‍ය ක්‍රමයේ පියා ලෙස හිපොක්‍රටිස් විරුදාවලිය ලබයි. යුනානි වෛද්‍ය විද්‍යාවේ ඉතිහාසය ආරම්භ වන්නේ පෙරිකල්ස් යුගය ක්‍රිස්තු පූර්ව 562-430 සමග වන අතර අරාබි ශිෂ්ටාචාරය අතරතුර ඒ වර්ධනය විය. එබැවින් එය අරාබි වෛද්‍ය පදනම ලෙස හැඳින්වේ. මධ්‍යකාලීන යුගයේදී භාවිත වූ අරාබි වරුන්ට ප්‍රධාන වශයෙන් ම ඉන්දියාවට සමග සෘජුව වෙළඳාමක් පැවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම වෙරළබඩ ප්‍රදේශවල පදිංචි වූහ.

විසිඑක්වන ශත වර්ෂයේ දී පවා ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මෙම වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කර සංරක්ෂණය කර තබා ගත්තේය. එහි ප්‍රමුඛයා වූයේ බොහැරත් (හිපොක්‍රටීස්) ක්‍රිස්තු පූර්ව 460-360 යුගයට අයත් අයෙකු වන අතර ඔහු තවමත් වෛද්‍ය විද්‍යාවේ පියා වන අතර ත්‍රිදෝෂවාදය නිලධාරියා වෙ. පළමුවන සියවසේ දී අරාබිවරුන් මෙම ක්‍රමය ලංකාවට ගෙන ආ අතර මුස්ලිම්වරුන්ගේ ද ඒ වැඩි දියුණු කළහ. ඉතිහාසයේ හෙළිදරව් කරන්නේ අරාබි කායික වෛද්‍යවරුන් රටේ විවිධ රාජධානිවල රජුන් ගේ පවුල උපදේශ ගැන බවට පත්වී සිටි බවයි. යුනානි වෛද්‍ය ක්‍රමයෙහි ඵලදායි බව සහ වටිනාකම හඳුනාගෙන සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයට එයද එක ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය ලෙස ආයුර්වේදයෙහි අන්තර් ග්‍රහණය වෙයි (අමරසිංහ, 2013).

යුනානි වෛද්‍ය ක්‍රමය මිනිස් සිරුරේ ඇති මනස්ප්‍රකෘති (Temperament) හතරක් හා චතුර්දෝෂ (Humours) මත පදනම වී ඇත. එමෙන්ම මිනිස් සිරුරේ සෞඛ්‍ය හා සමස්ථිතිය පවත්වා ගැනීමට මූලික කායික විද්‍යාත්මක කරුණු හතක් ද දායක වේ.

එනම්

- Elements
- Temperaments
- Humours
- Spirits
- Faculties / powers
- Functions

තවද මිනිස්සු ඔහුගේ මානසික භාවාත්මක ආධ්‍යාත්මික හා කායික තත්ත්ව රෝගී හා නිරෝගී බවට හේතු වන බව පිළිගනි මෙහි ප්‍රධාන ප්‍රතිකාර ක්‍රම හතරකි. එනම්

- Regimental therapy
- Dieto therapy
- Phamaco therapy
- Surgery

එමෙන්ම රෝග විනිශ්චය කිරීමේදී බාහිර රෝග ලක්ෂණවලට අමතරව pluse, stool and urine අයුරින් යනාදී නූතන වෛද්‍ය ක්‍රමයන් ද යොදා ගනී (කුලරත්න, 2020).

### 7.4. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය.

හෝමියෝපති යනු ඵලදායක සහ විද්‍යානුකූල ක්‍රමයට ශරීරයේ රෝග සුව කිරීමේ දී දායක වන ස්වභාවික ප්‍රතිශක්තිය වැඩි දියුණු කිරීමට සැලැස්වීම ක්‍රමයක් සේ සැලසේ. මෙම හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ දී රෝගියාගේ ශරීරයේ සියලු රෝග ලක්ෂණ පරීක්ෂා කර බලා ප්‍රතිකාර නියම කරන අතර එක් එක් රෝග සඳහා වෙන වෙනම ප්‍රතිකාර කිරීමක් සිදු නොවේ.

නිරෝගී පුද්ගලයකුට කිසියම් ඖෂධයක් විශාල මාත්‍රාවකින් වරින්වර ලබාදුන් විට හටගන්නා කායික මානසික ලක්ෂණ වලට සමාන රෝග ලක්ෂණ සහිත රෝගියෙකුට එම ඖෂධවලින් කුඩා

මාත්‍රාවක් ලබා දීමෙන් රෝගීන් සුවපත් කිරීම හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ සිද්ධාන්තය ලෙස පිළිගැනේ. මෙහි අද ඊයේ පාඨය ලෙස සලකනු ලබන්නේ ලතින් ග්‍රීක භාෂාවේ අලුතින් සමාන දෙයින් සමාන දෙය නැසීම. (Similar Similibus Curntur) යන මූලධර්මයයි. ඉංග්‍රීසි භාෂාවෙන් "Let Like Be Treated By Likes" සිංහල සමාන දේට සමාන දෙය යන්නයි (පතිරගේ, 1999). හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වාදී දැනට වසර දෙසීයක් පමණ ගතවී තිබුණද ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වී දැනට වසර හැත්තෑ අටක් පමණ ගත වී ඇත. 1950 දශකයේ පටන් මෙරට නිල නොවන තත්ත්වයක් යටතේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ක්‍රියාත්මක වී ඇත.

මෙම වෛද්‍ය ක්‍රමයට නිල රාජ්‍ය අනුග්‍රහය ලැබුනේ දහස් නවසිය හැත්තෑවෙ පෙබරවාරි 12 වන දින 1970 අංක 7 දරණ හෝමියෝපති පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමත් සමගය. එම පනත ක්‍රියාත්මක වන දිනය ලෙස ක්‍රියාත්මක වන දිනය ලෙස නම් කරන ලද්දේ 1979 මාර්තු පලවන දිනයයි. ඒ අනුව හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මෙරට ස්ථාපිත කළ පුද්ගලයා ලෙස වෛද්‍ය සිද්ධාර්ථ මෙරට හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ පියා වශයෙන් සලකනු ලැබේ. හෝමියෝපති රෝහල සියලු ළමා රෝග සහ කාන්තා රෝග, ඇදුම හා ස්වසන ආබාධ සමේ රෝග, ආමාශගත රෝග, ස්නායු රෝග, දීර්ඝකාලීන හිසරදය, ගලගන්ඩය, අධි රුධිර පීඩනය සහ අධික කොලෙස්ටරෝල් තත්ත්ව සඳහා ප්‍රතිකාර කරනු ලැබේ (පතිරගේ, 1999).

## 7.5. අත්බෙහෙත්

ගෘහස්ථ ප්‍රතිකාර ක්‍රමය හෙවත් අත් බෙහෙත් පිළිබඳ අපට දීර්ඝ ඉතිහාසයක් තිබෙන අතර ඒ සම්ප්‍රදායක් ලෙස තවමත් පත්වා ගෙන යන වෛද්‍ය ක්‍රමයකි. මෙහිදී තවත් වැදගත් සාධකයක් නම් සාමාන්‍ය ජනතාවට, ගෘහණියන් තුළ එදිනෙදා සෞඛ්‍ය ගැටලු සම්බන්ධව තිබූ හෙළ දැනුම අවබෝධයයි. රොබට් නොක්ස් එදා හෙළදිව කෘතියේ දී මෙම අදහස දක්වා ඇත. වගේ මෙම දැනුම සමඟ ජීවන කුසලතා සමුදායක් ද නිර්මාණය වූ අතර ඊට සරිලන පාරිසරික සාධක සංරක්ෂණය කිරීමට ඔවුන් වග බලා ගත්තේය. මෙකී දැනුම කාලයත් සමග අත්හදා බලන ලද සංස්කෘතිකමය

සම්පතක් ලෙස සමාජය තුළ පරපුරෙන් පරපුරට වෛද්‍ය සම්ප්‍රදායක් වශයෙන් මෙන්ම සමාජය ජනතාවද ගුණ ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් දියුණු වෙමින් වර්තමානය දක්වා පවතී.

අත් බෙහෙත් යනු කවරේද යන්න විමසීමේදී,

> **"අත් බෙහෙත් යන සියවස් ගණනාවක් තුළ විවිධ රෝග සඳහා පරම්පරා ගණනක වෛද්‍යවරු සහ ජනතාව විසින් අත්හදා බැලීමෙන් අනතුරුව ප්‍රත්‍යක්ෂ වූ ඖෂධ හා ප්‍රතිකාර විධීන්ය".**

බොහෝවිට ජනයා අතරින් ගොඩ වෙදකම ලෙස මෙය ප්‍රචලිතය. එනම් ඒ සඳහා ගම්බද වනාන්තර හා ඒ ආශ්‍රිතව ඇති ශාක හා ඒ ආශ්‍රයෙන් සොයා ගන්නා අමුද්‍රව්‍ය යොදා ගනිමින් සකස් කර ගන්නා ඖෂධ වීම නිසාය. වර්තමානයේ මෙන් නොව අතීතයේ දී රෝහල් පහසුකම් සුලබ නොවින වෛද්‍යවරයෙකු හමුවට යාමට පෙර සරල ඖෂධ රෝගියාට දීම පුරුද්දක් විය අදටත් එය තරමක් දුරට පිරිසර පළාත් වල ගම්බද හඳුනාගත හැකිය.

> **උදාහරණ** : පපුවේ අමාරුව, බඩේ අමාරුවක් හැඩුම් බිඳුම් තැලීම් වෙනත් කුඩා රෝග හිස්සොරි උඳුගොව්වන් කෑම කටු ඇනීම දත් කැක්කුම් ආදී රෝග වලට බොහෝ විට අත් බෙහෙත් යෙදීම් වර්තමානයේ දී ද සිදු කරයි.

මෙම අත්බෙහෙත් තුළ ප්‍රධාන ලක්ෂණ කිහිපයකි. එනම්,

- ඖෂධ එකක් හෝ කිහිපයක් අඩුම වශයෙන් පහක්වත් සමන්විත වෙයි. ගෙවත්තෙන් මුළුතැන්ගෙයින් හා අවට පරිසරයෙන් සොයා ගන්නා ලද දේ වලින් සකසා ගත හැකිය.
- වෛද්‍යවරයෙකු කරා ගෙන යාමට මත්තෙන් ක්ෂණිකව කුඩා ප්‍රමාණයක් දිය හැක්කකි.
- බොහෝ විට මෙම අත් බෙහෙත් භාවිතා වන්නේ මුඛ පරම්පරාවෙන්, කළ පුරුද්දෙන් හා දැක පුරුද්දෙන් මේවා ජනයා අතර ප්‍රසිද්ධ වූයේ කවි ගැට පද තේරවිලි හා කෙම් ක්‍රම ආදී ලෙසින්ය.

- **අත් බෙහෙත් භාවිතා කළ යුතු අවස්ථා ලෙස,**

- සරල රෝගවලදී වෛද්‍යවරයා කරා යාමට පෙර
- බෝ නොවන රෝග පාලනයට
- රුව රැකගැනීමට
- උණ අතීසාරය ඩෙංගු වැනි රෝග වලදී වෛද්‍යවරයා කරා යාමට පෙර

රෝග පාලනයට යම් රෝග අවස්ථාවකදී පමණක් භාවිතා කිරීමට සුදුසු නැත. බොහෝ විට අත් බෙහෙත් මගින් එම රෝග අවස්ථා ගැන සලකා බලා දින දෙකක් වැනි කාලයකදී සුවයක් පෙන්නුම් නොකරයි නම් වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට රෝගියා යොමු කිරීම වැදගතත්ය.

ඒ වගේම අත් බෙහෙත් සඳහා ශාක සත්ව හා ඛනිජ ද්‍රව්‍ය උපයෝගී කරගනු ලැබේ. බහුතරයක් අත් බෙහෙත් සඳහා යොදාගනුයේ ගසක පස් පංගුව යන මුල්, පොතු, ගෙඩි, මල් හා කොළ ආදියයි.

**උදාහරණ :**

**සත්ව ද්‍රව්‍යක් ලෙස : ගවයින්ගේ මුත්‍ර, එළකිරි, මුවන්ගේ කස්තුරි, මීමැස්සන්ගේ මී පැණි**

**ඛනිජ ද්‍රව්‍ය : ලෙස ලෝක හා ලවණ වර්ග යනාදී ලෙස හඳුනා ගත හැක.**

- **වර්තමානයේ අත් බෙහෙත් භාවිතයේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.**

අත් බෙහෙත් දීමේදී වන සංකූලතා ඇති වේ ද යනාදි කරණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- සිහි මද ගතිය
- දින දෙකකට වඩා උණ පැවතීම
- හුස්ම ගැනීමේ අපහසුතා
- රෝගියා සුව අතට පත් වීම වෙනුවට තවදුරටත් දුර්වලයන් වනවාද යන වග
- ආහාර ගැනීමේ අපහසුතා වැඩිවීම
- රෝගියාගේ නාඩි වේගය අඩුවීම හා වැඩිවීම

- ➢ වමනය හා පාචනය තත්ත්වයන් ඇතිවීම හා වැඩිවීම
- ➢ මළ මුත්‍ර සමඟ රුධිරය පිටවීම විජලනය ඇති වීම

- **තවදුරටත් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු අංශ ලෙස**
    - ගර්භණී මව්වරුන්ට
    - කිරි දෙන මව්වරුන්ට
    - කුඩා ළමයින්ට
    - දියවැඩියා රෝගීන්ට
    - ඇදුම රෝගීන්ට

යනාදි පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීමේදී සැලකිලිමත් විය යුතු අතර නිර්දේශිත බෙහෙත් පමණක් නියමිත මාත්‍රාවෙන් දිය යුතු වෙයි. විශේෂයෙන්ම අක්ෂි රෝග වලදී ඖෂධ භාවිතා කිරීමේ දී ඉතා පිරිසිදු මෙන්ම නියමිත ඖෂධ පමණක් පළපුරුදු අයකු විසින් එබිය යුතුය. ඒ වගේම යම් රෝග පාලනයකට එකම අත් බෙහෙත දීමේදී දීර්ඝ කාලීනව භාවිත නොකළ යුතු අතර රෝග පාලනය වීමක් හෝ සුව වීමක් නැත්නම් ඒ මාර්ගයේත් භාවිතයෙන් වැළකිය යුතුය. අප සාදා ගන්නා අත් බෙහෙත් බාහිර මෙන්ම අභ්‍යන්තරව ද යොදන අතර යොදා ගන්නා ඖෂධ වර්ග සපයා ගතයුතු ස්ථාන ද සතුන් හානි නොකළ, රසායනික ද්‍රව්‍යන්ගෙන් තොර ඉතා පිරිසිදු ඒවා විය යුතුය. තවද දේවාල හුඹස්, තුන්මංසල්, සොහොන් බිම් ආදී ස්ථානවලින් ඖෂධ නොගත යුතුය සිද්ධායුර්වේද සඳහන් වේ. අප භාවිතා කරන අත්බෙහෙත් පහත ආකාරයට භාවිතා වේ.

- ශරීර අභ්‍යන්තරයට අත් බෙහෙත් ගැන්වීමේදී,
    - කසාය
    - කැඳ
    - චූර්ණ
    - යූෂ
    - අවලේහ
    - තැම්බුම්
    - පාණ්ඩ

යනාදි ලෙසටත්,

සර්ප විෂට, කැඩුම් බිඳුම් හා වාත රෝග ආදියේදී ඖෂධ යොදනුයේ බොහෝ විට ශරීරයේ බාහිරවය. එහිදී,

- මැල්ලුම්
- වේදුව
- පත්තුව
- පොට්ටනි
- දුම් ඇල්ලීම

යනාකාරයට අත්බෙහෙත් භාවිතා කළ හැක (ගීගන, 2007).

මේ ආකාරයට හඳුනා ගන්නා අත්බෙහෙත් පිළිබඳව සමාජීය පුද්ගලයින් අතර වර්තමානය වන විට විවිධ කථිකාවත් ගොඩ නැගී ඇති බව පෙනෙයි. එවා අතරේ විශේෂ කරුණු කිහිපයක් අපට හඳුනා ගත හැකිය. ගැමියන් අතර මෙන්ම අනෙකුත් ප්‍රජාවන් අතරද අත් බෙහෙත් භාවිතය ක්‍රමයෙන් අඩුවෙමින් පවති. එයට හේතූන් ලෙස දැකගත හැක්කේ ඔවුන් අත් බෙහෙත් භාවිතා කර ඉන් පසු රෝහල් ගතවීමට සිදුවුවඑහොත් එම අවස්ථාවේදී බටහිර වෛද්‍යවරුන්ගෙන් දෝෂාරෝපණයන් එල්ල වේ යැයි යන සිතුවිල්ල නිසාවෙනි. එමෙන්ම මෙකී පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රයන් ඉගෙන ගැනීමට නව පරපුරේ පිරිස් යොමු වීමට දක්වන මැලි කමද හේතුවකි. ඒ වගේම කෙතරම් සාර්ථක බෙහෙත් වට්ටෝරු කල්ක පෙති ආදිය නිෂ්පාදනය කළද ලොක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය ලබා ගැනීම අපහසු කාර්යයක් වීමද එයට හේතුවකි. එනම් සැමවිටම ඖෂධ නිෂ්පාදන සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතියට අනුකූල වීය යුතු වීමත් වැදගත්. විශේෂයෙන්ම අපේ දේ ගැන ප්‍රශ්න කිරිමත් ප්‍රශ්නයක් වී ඇත. ඒ වගේම හඳුනාගත හැකි තවත් ලක්ෂණයක් නම් මෙකී දේශිය පාරම්පරික වෙදකමේ අන්තර්ගත බෙහෙත් වට්ටෝරු වල ඉතා දුර්ලභ බෙහෙත් වර්ග සඳහන් වීමත් ඒවාට ආදේශක ඖෂධ සඳහන් වුවත් ඒවාගෙත් යම් යම් ගැටලු පැවතිමයි. ඒ වගේම ඒවා නිරන්තර පර්යේෂණයන්ට ලක්වීමද වැදගත්ය. එසේ නොමැතිව ඒවා ජාත්‍යන්තරය හමුවේ ඉදිරිපත් කිරීම අපහසුය. මෙවැනි තත්වයක් තුළ දේශිය වෛද්‍ය ක්‍රමයේ ස්ථාවර පැවැත්මට ඇති වී ඇති ගැටලු හඳුනා ගත හැක.

**උදාහරණ : පිළිකාවලට හා ඩෙංගු සඳහා දේශිය වශයෙන් විවිධ ඖෂධ සොයා ගැනුනද ඒවා ලංකාව තුළ නිෂ්පාදනයේ පවත්නා ගැටලුද හඳුනා ගත හැක.**

මෙකී තත්ත්වයන් වර්තමාන පාරම්පරික වෙදකම තත්ත්වයන් විමසා බැලිය හැක.

## 8. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය වර්තමානයේ මුහුණ පාන ගැටලු

බටහිර වෙදකම වසර 800 ක් වැනි කෙටි ඉතිහාසයක් ඇති වෛද්‍ය ක්‍රමයක් වන අතර දේශීය වෙදකම වසර 4000 ක් 5000 කටත් වඩා වැඩි ඉතිහාසයක් ඇති වෛද්‍ය ක්‍රමයකි. එසේම දේශීය වෙදකම පරිපූර්ණ වෛද්‍ය ක්‍රමයක් වශයෙන් හැඳින්විය හැකිය. බටහර වෙදකම දිනෙන් දින වර්ධනය වෙමින් තවත් අලුත් දේවල් සොයාගන්නා වෛද්‍ය ක්‍රමයකි. නමුත් දේශීය වෙදකමෙහි ආයුර්වේදයෙහි එසේ නැත. සොයා ගත යුතු දෙයක් නැත. ඖෂධ සහ ඒ ඒ රෝගවලට ප්‍රතිකාර තිබේ. නමුත් විවිධ හේතු නිසා ඇතැම් වෙදකම් භාවිතයෙන් ඈත්වී තිබේ. අතීතයේ සිදුවුණ විදේශීය ආක්‍රමණවලදී පොත්පත් විනාශ වූ අතර ලංකාවෙ තිබුණු ශල්‍ය වෛද්‍ය ක්‍රම විදේශිකයන් විසින් විනාශකොට දැමීමද හේතු වී ඇත. එවැනි හේතු නිසාවෙන් මෙම වෛද්‍ය ක්‍රමයේ යම්කිසි පරිහානියක් සිදු වී තිබේ.

ඒ අනුව වර්තමානයේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය මුහුණ පාන ගැටලු කිහිපයක් දෙස මෙසේ අවධානය යොමු කළ හැක.

### 8.1. රෝග සුව වීමට කාලයක් ගතවීම

බොහෝ වෙලාවට රෝගීන් සිංහල වෙදකමට යොමුවන්නේ බටහිර වෙදකම ඇතුළු බොහෝ වෛද්‍ය ක්‍රම වෙත ගොස් සුවකරගත නොහැකි අවස්ථාවන්හිදීය. එවිට එම රෝගීන්ට රෝගය සුවකර ගැනීමට කාලයක් ගතවේ. නමුත් රෝගය නිට්ටාවටම සුව වේ. අනෙකුත් වෛද්‍ය ක්‍රම පසුපස ගොස් ප්‍රතිපලයක් නොලැබ සාම්ප්‍රදායික වෙදුන් කරා එන පිරිස් ඉකමන් ප්‍රතිපල බලාපොරොත්තු වුනද රෝගයන් කල් ගතවීම නිසා ස්ථිර සුව වීමට කාලයක් ගතවෙන බව පෙන්වා දෙයි.

### 8.2. නිශ්චිත ප්‍රතිකාර මධ්‍යස්ථාන නොමැති වීම

විස්මිත වෙදකම් කරන ලංකාවේ දේශීය වෛද්‍යවරුන්ට බෙහෙත් කිරීම සඳහා එක ස්ථානයක් නොමැති වීමද ගැටලුවකි. වෙන වෙනම පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවලදී බෙහෙත් කරනු ලබන බවක් දැකගත හැකිය. එයද සාම්ප්‍රදායික වෛද්‍යවරුන් මුහුණ පාන ගැටලුවකි.

### 8.3. ඔවුනට අවශ්‍ය තාක්ෂණික මෙවලම් සාදාගැනීමේ ක්‍රමයක් ද නැති වීම.

එනම් ඔවුනට වෛද්‍ය කටයුතුවලට අවශ්‍ය උපකරණ නිර්මාණය කර දීමට හැකියාවක් ඇත්නම් මෙම වෙදකම මීට වඩා දියුණු කළ හැකියයි අනුමාන කළ හැක.

### 8.4. දේශීය ඖෂධවල හිඟකම

දේශීය වෛද්‍යවරුනට ඇති ලොකුම ගැටලුව වී ඇත්තේ ඖෂධ සොයා ගැනීමය. බෙහෙත් පැළෑටි සොයා ගැනීමට ඇති අපහසුව හේතුවෙන් ඇතැම් විට අත්‍යවශ්‍යම ප්‍රතිකාර නොමැතිව විකල්ප ඖෂධ (ප්‍රතිනිධි) යොදාගෙන ප්‍රතිකාර කෙරේ. එවිට නියමිත ඖෂධවල ඇති ගුණය ප්‍රතිනිධිය තුළ නොමැත. මෙම බෙහෙත් පැළෑටි කිනම් හෝ ක්‍රමයකින් ඔවුනට වගාකොට දිය හැකි නම් එය ඔවුනට ඉදිරි ප්‍රතිකාර කිරීම්වලට විශාල උදව්වක් වනු ඇත. මීට අමතරව රජයට අයිති අතහැර දමා ඇති ඉඩම්වල ද ඖෂධ පැළෑටි වගා කළ හැකිය. එවැනි ස්ථානවලද ඖෂධ පැළෑටි වැවිය හැකි නම් ඉන් පරිසර හානිය නැතිකළ හැකි සේම සිංහල වෛද්‍ය ක්‍රමය රැකගැනීමට අවශ්‍ය බෙහෙත් පැළෑටි ද සොයාගත හැකි වේ. එලෙසින්ම මෙම ඖෂධ පැළෑටි සිටුවීම ද රැල්ලක් කළ හැකි නම් සිටුවිය හැකි හැම බිම් අඟලකම බෙහෙත් පැළෑටියක් සිටුවිය හැකිය.

### 8.5. බොහෝ පිරිසක් හෙළ ඖෂධ පිළිබඳ අවම දැනුමකින් පසු වීම ද ප්‍රධාන ගැටලුවකි.

### 8.6. ව්‍යාජ වෙදුන්ගේ ක්‍රියාකලාපයන් නිසා හෙළ වෙදකම පිළිබඳව ඇති විශ්වාසය බිඳී යාම.

මේ ආකාරයට සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් පිළිබඳව සහ ඒවා මුහුණ පාන ගැටලු පිළිබඳව කරුණු සැලකිල්ලට ලක් කළ හැකිය.

**9. සාරාංශය**

මෙම අධ්‍යයනය තුළින් මා අවධානය යොමු කර ඇත්තේ ලංකාවේ වර්තමානය වන තෙක් ක්‍රියාත්මක වන්නාවූ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් පිළිබඳව වන අතර එහිදි විශේෂයෙන්ම ආයුර්වේදය, දේශීය චිකිත්සාව වගේම සිද්ධ, යුනානි, හෝමියෝපති, කටුචිකිත්සාව, ප්‍රජාවන් අතර ප්‍රසිද්ධ ආගමික සම්ප්‍රදාය මත පදනම් වූ අභිචාර ආදිය මත පදනම් වු වෛද්‍ය ක්‍රමයන් ලෙස විමර්ශනය කළ හැකිය. එහිදි බෞද්ධාගමේ මෙන්ම අන්‍ය ආගම්වලටද ආවේණික අභිචාර පිළිබඳවද අවදානය යොමු කර ඇත. තවද මෙකී අධ්‍යයනය තුළ එන පාරම්පරික වෙදකම හෙවත් දේශිය චිකිත්සාවේ එන අංගයක් ලෙස අත් බෙහෙත් පිළිබඳවත් කරුණු රැස් කර ඇත.

ආයුර්වේදය යනු සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයකි. එහි සරල අර්ථය දීර්ඝායුෂ පිළිබඳ දැනුමයි. ඉන්දියාවෙන් ආරම්භ වන්නට ඇතැයි සැළකෙන ආයුර්වේදයේ නිර්මාතෘ වන්නේ ධන්වන්තරී ඍෂිවරයාය. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඉන්දියානු උප මහද්වීපයකට ආවේනික වූ පැරණි වෛද්‍ය ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ පැවති දේශීය වෛද්‍ය ක්‍රමය වූයේ දේශීය චිකිත්සාව හෙවත් සිංහල වෙදකමයි. දහ අටවන සියවසේ දී සිද්ධ හා යුනානි සම්ප්‍රදාය ආයුර්වේදයට සමගාමීව ශ්‍රී ලංකාවේ වර්ධනය වී ඇත. පොළොන්නරුව යුගය වන විට මෙම ආයුර්වේද ක්‍රමය ඉතා දියුණු මට්ටමක පැවති බව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් පැහැදිළි වේ. අදවන විට ශ්‍රී ලංකාවේ පවතින ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උතුරු ඉන්දීය ආයුර්වේද සම්ප්‍රදාය, දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය, අරාබියේ යුනානි හා ශ්‍රී ලංකවේ දේශීය වෛද්‍ය සම්ප්‍රදාය යන සියල්ලන්ගේම එකතුවක් වන බව පැහැදිළි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.


අපේ සංස්කෘතික උරුමය. (1998). සංස්කෘතිය හා ආගමික කටයුතු අමාත්‍යාංශය.

අරංගල, එස්.(2017). ලංකාවේ ප්‍රාග් බෞද්ධ ආගමික විශ්වාස : මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව.

ආනන්ද හිමි. (2013). ශ්‍රී ලාංකේය අභිචාර විධි මෙහි දක්නට ලැබෙන බෞද්ධාගමික ආභාෂය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්. කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය.

ආරච්චිගේ, පි. එස්. ඒ. (2017). හෙළ වෙදකම අත්පොත. ඩිල්මා සංරක්ෂණ ආයතනය.

ඉන්ද්‍රජෝති හිමි, බි. ඩි. (2013). ආයුර්වේද ශාස්ත්‍රයේ ආරම්භය සම්බන්ධ සාම්ප්‍රදායික විග්‍රහය පිළිබඳ විමර්ශනයක්. මානව ශාස්ත්‍ර පීඨය කැළණිය විශ්වවිද්‍යාලය.

ඌව පළාත් මධ්‍ය කාලය ආංශික සංවර්ධන සැලැස්ම (2019). දේශීය වෛද්‍ය අංශය

කරුණාරත්න, ඊ. කේ. (2001). යෝගාර්ණවය ඇසුරින් හෙළිවන පරිදි සිංහල ජනයාගේ චිකිත්සක අභිචාර - කෙම් ක්‍රම පිළිබඳ විමර්ශනයක්. කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යනාංශය.

කරුණාරත්න, යූ. ඩී පී. ටී. (2016). පැරණි ශ්‍රී ලංකා ආයුර්වේද ඉතිහාසය අනුරාධපුර හා පොලොන්නරු යුගයේ ඇසුරින්. ගම්පහ ආයුර්වේද ආයතනය.

කුලරත්න, එල්. (2020). යුනානි වෛද්‍ය ක්‍රමය. යුනානි වෛද්‍ය අංශය.

ගල්මන්ගොඩ, එස්. (2003). ආයුර්වේද ඉතිහාසයේ මූලධර්ම හා සමගාමී සංකල්ප. ප්‍රභා ප්‍රකාශන.

ජාතික පුස්තකාල විමර්ශන පළවෙනි වෙළුම. (2014). ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

දිවියට හෙළ ඔසු. (2011). දකුණු පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

පතිරගේ, එස්. (1999). හෝමියෝපති. කර්තෘ ප්‍රකාශනයකි.

පරනවිතාරණ, ඩී. බී. (2017). දේශීය ගැමි අභිචාර විධි හා සබැඳි මනෝරෝග චිකිත්සාමය වටිනාකම.

වන්නිනායක, එස්. (වර්ෂයක් සඳහන් නොවේ). හෝමියෝපති ප්‍රථමාධාර අත්පොත. ලංකා හෝමියෝපති පදනම.

වාර්ෂික වාර්තාව. (2018). දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය.

සමරසිංහ, එස්. (2010). අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය. ජයන්ත ජයසිරි මානව විද්‍යා අධ්‍යයන අංශය.

Obeyesekera, Gannath. (1976). The Impact of Ayurvedic Ideas on the Culture and the Individual in Sri Lanka. edited by Charles Leslie, 201–227. Berkeley: University of California Press

# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා පළිබෝධ නාශක භාවිත කිරීමේ අර්බුදය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**ආර්.ඩී.ඒ.එන්. තිලකසේන**

**සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරදෙණිය විශ්වවිද්‍යාලය**

**පේරාදෙණිය**

## 1. හැඳින්වීම.

රසායනික පොහොර භාවිත කිරීමත් සමගම එකී පොහොරවලට සංවේදී බීජ වර්ග භාවිතයෙන් වගා කිරීම ඇරඹුණු අතර මේ හේතුවෙන් ඒ සඳහාම නිර්මාණය වුණු පළිබෝධනාශක ද භාවිත කිරීම ඇරඹුණි. ලෝකයේ විවිධ රටවල කෘෂිකර්මාන්තය සඳහා මෙකී පළිබෝධනාශක භාවිත කිරීම සිදු කරයි. අතීතයේ සිට මිනිසා ඔහු අවට පරිසරය විවිධ අවස්ථාවල නොයෙකුත් ව්‍යසනයන්ට ගොදුරු වන අවස්ථාවල දී එයින් මිදීමට උත්සාහ කර ඇත. මෙහිදී මිනිසා කෘෂි කර්මාන්තයට යොමු වීමත් සමගම පළිබෝධකයන්ගෙන් ඔවුන්ගේ අස්වනුවලට වූ හානියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. අතීතයේ දී මෙවැනි අවස්ථාවල මිනිසා තමන් ජීවත් වන පරිසරය සහ අස්වැන්න ආරක්ෂා කර ගැනීම සඳහා නොයෙකුත් ක්‍රම භාවිතා කර ඇත.

කෙම් ක්‍රම, සාම්ප්‍රදායික ක්‍රම, ජෛවීය පාලන ක්‍රම ආදිය අතීතයේ දී භාවිත වූ අතර වර්තමානය වන විට එකී සාම්ප්‍රදායික හා ස්වභාවික පළිබෝධ නාශක ක්‍රමවලින් බැහැරව රසායනික පළිබෝධ නාශක භාවිතය දක්වා පළිබෝධනාශක වර්ධනය වී තිබේ. සරලව පළිබෝධනාශක ලෙස හඳුන්වනු ලබන්නේ කෘමිනාශක, දිලීර නාශක සහ වල් පැලෑටි නාශක වේ. ඉහත කී ද්‍රව්‍ය බොහෝ විට විෂ සහිත වේ.

වේගයෙන් ඉහළ යන ජනගහනයට සාපේක්ෂව අස්වනු වර්ධනය නොවීම හේතුවෙන් ලෝකයේ හරිත විප්ලවය නැමැති

කෘෂිකාර්මික විප්ලවයක් ඇතිවිය. මෙහි ක්‍රියාදාමය තුළ බිම් ඒකකයකින් වැඩි අස්වනු ලබාගත හැකි වගා ප්‍රභේද පිළිබඳව පර්යේෂණ සිදු කිරීම ඇරඹුණි. එසේම හඳුන්වාදුන් නව වගා ප්‍රභේද අධි පෝෂක අවශ්‍යතාවයන්ගෙන් සමන්විත වූ අතර එහෙත් පරිසරයේ සිටි පළිබෝධකයන්ට ඉතා අඩු ප්‍රතිරෝධීතාවක් දක්වා ඇත. නව ප්‍රභේද කෙටි කාලීන ප්‍රභේද වීම් හේතුවෙන් වසරකට කන්න කිහිපයක් පවා වගා කර අස්වනු ලබා ගැනීමට හැකියාව පැවතුණි. භූමියට නව බෝග වර්ගවලට ශාක පෝෂක යෙදීමේ දී වල් පැළෑටි වර්ධනය සහ නව පළිබෝධකයන් වර්ධනය ද ක්‍රමයෙන් ඉහළ ගියේය.

ශ්‍රී ලංකාව මෙන්ම ආසියාතික රටවල් බොහෝමයකම ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය ලෙස කෘෂිකර්මාන්තය සිදු කරයි. කෘෂිකාර්මික සංවර්ධනය තුළින් ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයක් ගොඩනගා ගැනීමට මෙහි රටවල් උත්සාහ කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මුල්වරට පළිබෝධනාශක භාවිත කර ඇත්තේ 1940 දශකයේ දී ය. ඒ මැලේරියා රෝගය මර්දනය කිරීම උදෙසා වේ. එහෙත් 1960 වනවිට බෝග වගාව වෙනුවෙන් පළිබෝධනාශක භාවිත කිරීම ආරම්භ කර ඇත. මෙහිදී මුලින්ම පළිබෝධ නාශක යොදා ඇත්තේ වතු වගාව සඳහාය. මේ සඳහා වඩාත්ම පළිබෝධනාශක භාවිත කර ඇත්තේ තේ වගාව ආශ්‍රිතවය. එයට සාපේක්ෂව බැලීමේ දී පොල් සහ රබර් වගාවන් සඳහා පළිබෝධ නාශක භාවිත කිරීම මදක් අඩු මට්ටමක පැවතුණි. එමෙන්ම වාරි ජලය සහිතව වගා කරන ප්‍රදේශවල ගොවීන්ගෙන් 70% පමණ කෘමි පළිබෝධකයන් හා වල් මර්දනය සඳහා රසායනික ද්‍රව්‍ය භාවිත කිරීම සිදුවේ. වාරි ජලය සහිතව වගාකරන වෙළෙඳ භෝග හා එළවළු වගා කරන ගොවීන් ගෙන් 80% ක් පමණ පළිබෝධනාශක වර්ග භාවිත කරනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක වර්ග නිෂ්පාදනය කිරීම අවම මට්ටමක පවතින අතර බොහෝ පළිබෝධනාශක වර්ග විදේශ රටවලින් ආනයනය කිරීම සිදුවේ. 1962 වන තුරු මෙම පළිබෝධනාශක මෙරටට ගෙන්වීම කිසිදු බාධාවකින් තොරව සිදුවිය. 1963දී ආනයන අපනයන සීමා කිරීම් සිදු කළ බැවින් පළිබෝධනාශක ගෙන්විය හැකි වූයේ ද නිශ්චිත උපරිමයක් දක්වා පමණි. 1977 දී මෙරටට හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා

නිදහස් වෙළඳ තත්ත්වයක් මෙරට බිහි වූ අතර ඒ යටතේ නැවත පළිබෝධනාශක වෙළඳාම සිදු කිරීම ඇරඹුණි (M. විජේරත්න සහ V. විජේරත්න, 2006).

## 2. ශ්‍රී ලාංකික ගොවියන් අතර කෘමිනාශක අනිසි ලෙස භාවිත කිරීමට හේතු.

### 2.1 කෘමිනාශක පිළිබඳව නිවැරැදි දත්ත පිළිබඳව ඔවුන්ට අවබෝධයක් නොවීම.

කෘමිනාශක හරියාකාරව භාවිත කරන්නේ කෙසේද යන්න පිළිබඳව අවශ්‍ය තොරතුරු ව්‍යාප්ති සේවාවන් මගින් ගොවි ජනතාවට ලබා දෙයි. ඒහෙත් එකී සේවාවන්වලින් ගොවීන් අවශ්‍ය දැනුම ලබා ගැනීමට නැඹුරු වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. නිදසුනක් ලෙස ගතහොත් ශ්‍රී ලංකාවේ අල ගොවීන් ගෙන් 90% පමණ අවිධිමත් ක්‍රමවලින් පළිබෝධනාශක පිළිබඳව තොරතුරු ලබාගන්නා අතර 09%ක් පමණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔස්සේ තොරතුරු ලබා ගනී. වී ගොවීන්ගේ ද තොරතුරු ලබා ගැනීම මේ හා සමාන මට්ටමක පවතී.

### 2.2 දැනුමේ අඩු බව.

මෙකී දැනුමේ පවතින අඩු භාවය විශාල ගැටලුවක් බවට පත්වී ඇත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවලට වේ. මේ හේතුවෙන් මෙකී රටවල පරිසරයට හා සෞඛ්‍යයට පලිබෝධ නාශක භාවිතයෙන් සිදුවන හානිය පිළිබඳව ගොවීන්ට හෝ රටවැසියන්ට පවතින්නේ අඩු දැනුමකි. එබැවින් ඔවුන් මෙම ද්‍රව්‍ය අනිසි ලෙස භාවිත කිරීමට යොමු වී ඇත. තායිලන්තයේ දී කරන ලැබූ පරීක්ෂණයකින් හෙළිවී ඇත්තේ කෘමිනාශක යෙදීමෙන් වැඩි අස්වැන්නක් ලබාදෙන බවට ගොවීන්ගේ තිබූ විශ්වාසය එරට ක්‍රියාත්මක වූ ගොවි අධ්‍යයන වැඩසටහනකින් සියයට 83% සිට 18% දක්වා පහත හෙළීමට ඉවහල් වී ඇති බවයි. එමෙන්ම වගා භූමියේ සිටින කෘමි පලිබෝධකයන් වෙනත් පළිබෝධකයින් හා ඔවුන්ගේ ස්වභාවික සතුරන් වෙන්කර හඳුනාගැනීමේ හැකියාවක් අද සිටින ගොවීන්ට නොමැත. විවිධ අවස්ථාවල දී ගොවීන් පරිසර හිතකාමී සතුන් පවා මර්දනයට පෙළඹෙන බව පර්යේෂණවලින් හඳුනාගෙන

තිබේ. ශ්‍රී ලංකාවේ ද මෙවැනි හා සමාන තත්ත්වයක් පවතී. ශ්‍රී ලංකාවේ අතීත ගොවීන්ට පරිසරයට හිතකාමී සතුන් කවුරුන්ද, අහිතකර සතුන් වඳ කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව මනා දැනුමක් පැවතුණි.

එහෙත් වර්තමාන ගොවීන් සතුව එම දැනුම දක්නට නොලැබේ. එමෙන්ම පළිබෝධ මර්දන ක්‍රම පිළිබඳව ද ගොවීන්ගේ දැනුවත් භාවය අඩු බැවින් කෘමිනාශක අනිසි ලෙස භාවිතා කිරීමට ඔවුන් යොමුවේ. කෙසේ වුවද  වර්තමානයේ වාණිජ මට්ටමින් සිදුකරන කෘෂිකර්මාන්තය සඳහා සාම්ප්‍රදායික ක්‍රම කෙතරම් යෝග්‍ය ද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය. එයට හේතුව වාණිජ කෘෂි කර්මාන්තයක් වර්තමානයේ දී සිදු කරන නිසා ගොවීන් විසින් අනුගමනය කරන පළිබෝධනාශක උපක්‍රම සරල මෙන්ම ඉක්මන් ප්‍රතිඵල ලබා දෙන ඒවා බවට පත්කර ගැනීම ද වැදගත් වේ. ඒ සඳහා පර්යේෂණ සිදු කිරීම වැදගත් වේ. නිදසුනක් ලෙස ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ගොවිජනතාව ඇසුරෙන් රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ කරන ලද පර්යේෂණයකින් හෙළි වී ඇති ආකාරයට එම ප්‍රදේශවල ගොවීන් ගෙන් වැඩි පිරිසක් එනම් 78% පමණ  පරිසර හිතකාමි ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳව දැනුමක් සහිතව සිටි අය වී ඇති අතර එහෙත් සරල හා කාර්යයක්ෂම  ක්‍රමයක් වන රසායනික වල් මර්දන ක්‍රම මත මේ වන තුරු රැඳී සිටින බව හෙළිවිය. එබැවින් සාම්ප්‍රදායික ක්‍රම මතම එල්බ නොගෙන සාම්ප්‍රදායික ක්‍රම සහ නවීන තාක්ෂණය යොදාගෙන පරිසර හිතකාමි හා පහසු කාර්යක්ෂම පලිබෝධනාශක වර්ග නිර්මාණය කිරීම කෙරෙහි රජය යොමුවිය යුතුය. මේ සඳහා රජය නිසි ප්‍රතිපත්ති සැලසුමකින් යුක්තව අදාළ අංශ මෙහෙය වීම වැදගත් වේ.

## 2.3 නීති රීතිවල ලිහිල් බව

පළිබෝධනාශකවල පවතින ආරක්ෂාකාරී භාවය සඳහා අවශ්‍ය වන බොහෝ නීති රීති රජය මඟින් හඳුන්වා දී ඇත. එහෙත් ඒවාගේ ක්‍රියාකාරිත්වය නිසි පරිදි අධීක්ෂණයකින් තොරව සිදු වූ නිසා ඒවා බොහෝමයක සාර්ථක ප්‍රතිඵල අත් වී නොමැත. රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා අංශය විසින් මෙහෙය වූ

පර්යේෂණයක ප්‍රතිඵලයකින් මෙවැනි අධීක්ෂණ කටයුතු බොහෝ දුරට සිදුවන්නේ වසරකට වරක් බවත් එය නගරාසන්න ප්‍රදේශවලට පමණක් සීමා වන බවත් සොයාගෙන ඇත.

මෙවැනි තත්ත්ව මත සිදුවන්නේ පළිබෝධනාශක අනිසි භාවිතයට ගොවි ජනතාව තවදුරටත් යොමුකර වීමකි. බැවින් රජය විසින් පනවන ලද නීති රීති ගොවීන් නිසි ලෙස අනුගමනය කරනවා ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා රජය විසින් නිසි වැඩපිළිවෙලක් සැකසිය යුතුය. එහිදී වංචා දූෂණ අල්ලස් ගැනීමෙන් තොරව අවංක නිලධාරීන් මේ සඳහා පත් කළ යුතු අතර එකී ක්‍රියාවලිය සඳහා විනිවිද භාවයක් පැවතිය යුතුය.

ඇතැම් විට බහුජාතික සමාගම් සමග සම්බන්ධතා ඇති පුද්ගලයන් මෙවැනි කාර්යයන් සඳහා පත් කළ විට ඔවුන් සිතාමතාම මෙම කාර්යය අසාර්ථක කරවන අතර එවිට ගොවි ජනයා කිසිඳු සිතා බැලීමකින් තොරව මෙවැනි පළිබෝධනාශක මිළට ගැනීමත් ඒවා පරිහරණය කිරීමත් සිදුවන කරන අතර මෙය බහු ජාතික සමාගම්වල පළිබෝධනාශක අලෙවියට වාසි ගෙන දිය හැකිය.

එමෙන්ම කිසියම් පළිබෝධ නාශකය විෂ බව හඳුනාගැනීම සඳහා ගොවීන් භාවිත කරන උපක්‍රම පිළිබඳව සිදුකරන ලද අධ්‍යයනයක දී පෙනී ගොස් ඇත්තේ ගොවීන් අතරින් බහුතරයක්ම කිසියම් පළිබෝධ නාශකයක විෂ බව හඳුනාගෙන ඇත්තේ එහි භෞතික ස්වභාවය අනුව බවයි. එනම් ඝන තත්ත්වයේ පළිබෝධ නාශක විෂ භාවයෙන් වැඩි බවත්, ද්‍රව තත්ත්වයේ ඒවා ඊට වඩා විෂ බවින් අඩු බවත් ඔවුන් විශ්වාස කර ඇති අතර තවත් ගොවීන් පළිබෝධනාශක අඩංගු රසායනික ද්‍රව්‍ය කාණ්ඩ අනුව විෂ මට්ටම තීරණය කර ඇත.

එහෙත් මෙවැනි දෑ ඔවුන්ගේ දැනුමේ පවතින අඩු බව හේතුවෙන් ගන්නා තීරණ වන අතර පළිබෝධ නාශකයක විෂ බව නිවැරැදිව තීරණය කළ හැක්කේ ලේබලයේ වූ වර්ණ තීරුව අනුව වේ. ඒ අනුව එහි විෂ බව තීරණය කිරීමට යොමු වී ඇත්තේ 03%ක් වැනි ගොවීන් ප්‍රතිශතයක් පමණි. එසේනම් මෙහි දී ඉස්මතු වන ගැටලුව වන්නේ මෙවැනි වැරදි මත ගොවීන් අතර පැවතීමටත් නිවැරදි ලෙස අඩුම තරමේ පළිබෝධනාශකවල නිවැරදි විෂ ප්‍රමාණය

පිළිබඳවත් අවබෝධයක් නොමැති ඔවුන් මෙවැනි ද්‍රව්‍ය පරිහරණය කිරීමේ ඇති භයානක බවත් එය ඔවුන්ට පමණක් නොව පරිසරයට සහ ඔවුන් වගා කරන බෝග වර්ග ආහාරයට ගන්නා ජනතාවට ද භයානක බවත් පැහැදිලි වේ (M. විජේරත්න සහ V. විජේරත්න, 2006).

## 03. ශ්‍රී ලංකාවේ අධික පලිබෝධනාශක භාවිතය හේතුවෙන් ඇති වී ඇති හානිකර තත්ත්වයන්

ශ්‍රී ලංකාවේ පලිබෝධනාශක භාවිතය පිළිබඳව සලකා බැලීමේ දී මෙරට පළිබෝධනාශක භාවිතය අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල් පවා අභිබවා යන ආකාරයේ අධි භාවිතයක් සිදු කරයි. එම රටවල හෙක්ටයාරයකට පළිබෝධනාශක ග්‍රෑම් 1013 පමණ යොදන අතර ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයකට ග්‍රෑම් 1800 පවා ඉක්මවා යන ආකාරයේ පළිබෝධනාශක භූමියට යෙදීමක් සිදු කරයි. සාමාන්‍යයෙන් පලිබෝධනාශක යොදා ගනු ලබන්නේ ගොවිතැනට හානි කරන හෝ ඒ සඳහා අනවශ්‍ය ලෙස සලකන ශාක හා සතුන් විනාශ කිරීමේ උපක්‍රමයක් වශයෙනි. මේවාගෙන් පලිබෝධකයන්ගේ සියලුම ක්‍රියාකාරකම් අඩපණ කිරීම හෝ සපුරා නැති කර දැමීම සිදු කරයි.

එහෙත් ඒ ආසන්න ප්‍රදේශවල හා ඊට බොහෝ දුර බැහැර පිහිටි පරිසරවල පවා පැවැත්මට අත්‍යවශ්‍ය ජීවීන් මෙකී පළිබෝධනාශක හේතුවෙන් විනාශ වී යාමේ ප්‍රවණතාවක් පවතී. මේ නිසා බොහෝ වල් පැළ විනාශ වන අතරතුර මී මැස්සන්, සමනලයන්, බත්කූරන්, පක්ෂීන්, මත්ස්‍යයන් ආදී ජීවීන් විශාල පිරිසක් මරණයට පත් වීමද සිදු වේ. ශ්‍රී ලංකාවේ ගේ කුරුල්ලා, වී කුරුල්ලා, පිළිහුඬුවා යනාදී සත්ත්වයන් දැඩි ලෙස වඳ වීමේ තර්ජනයට ලක්වීමට මෙකී පලිබෝධනාශකවල බලපෑම හේතු වී ඇති බව වර්තමානය වන විට සොයාගෙන ඇත. නිසා ආහාරවල ස්වෛරීභාවය හා ජෛව විවිධත්වය පවා ශ්‍රී ලංකාවට අහිමි වී යාමේ තර්ජනයක් මතු වී ඇත.

විෂ භාවිතය හේතුවෙන් ලංකාවේ මාසයකට විසිදාහකට ආසන්න සංඛ්‍යාවක් විෂවීම්වලට ගොදුරු වන අතර දෙදාහකට ආසන්න ප්‍රමාණයක් මිය යන යන බවද රෝහල් වාර්තා පෙන්නුම්

කරයි. ලෝකය පුරාම වන දිවිනසාගැනීම් අතරින් ශ්‍රී ලංකාව මුල්පෙළේ රටවල් අතර සිටියි. එමෙන්ම මෙකී පළිබෝධනාශක ආහාර දාම ඔස්සේ විවිධ සතුන් වෙත ගමන් කරයි. මෙම පළිබෝධනාශක ශාකවලට යෙදූ විට එකී ශාක ආහාරයට ගන්නා ශාක භක්ෂකයින්ට මෙකී විෂවලින් කොටසක් ශරීර කර ගැනීමට සිදුවන අතර එම සතුන්ගේ විලෝපිකයන් වන මාංශභක්ෂකයන්ට ද ශාකභක්ෂක ජීවීන්ගේ ශරීරවල තිබෙන විසවලින් කොටසක් ඔවුන්ගේ ශරීරවලට ඇතුළු කර ගැනීමට සිදුවේ.

මෙය ආහාර දාම ඔස්සේ සිදුවන ක්‍රියාවලියකි. නිදසුනක් ලෙස කිසියම් විෂ සහිත පළිබෝධනාශකයක් නිසි පරිදි බැහැර නොකර ජලය ගලා යන ස්ථානයකට යෙදුවහොත් එම පළිබෝධනාශක ජලයට මිශ්‍ර වන අතර ජලයේ සිටින මාළුන්ගේ හා වෙනත් ජලජ ජීවීන්ගේ ශරීර ගත වීම සිදුවේ. මාළුන් ආහාරයට ගන්නා මිනිසුන්ට ද මෙකී විෂ සහිත ද්‍රව්‍ය ශරීරගත කර ගැනීමට සිදුවේ. මෙය ආහාර දාම ඔස්සේ සිදුවේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ ගොවිපවුල්වල පුද්ගලයන් අතර පළිබෝධනාශක භාවිතයෙන් දිවි නසා ගැනීමේ ප්‍රවණතාවයක් පළිබෝධ නාශක හඳුන්වා දුන් මුල් කාලයේ දී දක්නට ලැබුණි.

වර්තමානය වන විට ද ඇතැම්විට කෘෂිකාර්මික ප්‍රදේශ ආශ්‍රිතව ඇතැම් පුද්ගලයන් මෙවැනි පළිබෝධනාශක වර්ග ශරීරගත කර ගැනීමෙන් දිවි නසා ගැනීමේ අවස්ථා දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ගොවි පවුල්වල ප්‍රමාණයෙන් හරි අඩක් කාන්තාවන් නියෝජනය කරන අතර ඔවුන් පුරුෂයන් හා සම සමව තම ශ්‍රමය වගා භූමි වල මුදාහරිනු ලබයි. මේ නිසා පළිබෝධනාශක ගොවි බිමේ දී භාවිත කරන බොහෝ අවස්ථාවල දී කාන්තාවන් ඊට නිරාවරණය වීම සිදුවේ. එවැනි විටෙක දී පළිබෝධනාශක ඉසීමට කවලම් කිරීම ආදී දෙයට කාන්තාවන්ගේ සහාය ලැබෙයි. නැතහොත් කාන්තාවන්ම ඒවා ඉසින අවස්ථා ද දක්නට ලැබේ. බොහෝ විට පළිබෝධනාශක ගොවිබිම්වල අස්වනු නෙළීම ආදී කටයුතුවල ද කාන්තාව නිරත වීමේ හේතුවෙන් කාන්තාවට පවතින්නේ දැඩි අවදානමකි.

විශේෂයෙන් ආරක්ෂිත ඇඳුම් ඇඳ මෙකී පලිබෝධ නාශක යෙදීම සිදුකළ ද කාන්තාවන් එවැනි දේවලින් සැරසීමක් දක්නට ලැබේ. පලිබෝධනාශක හේතුවෙන් හෘදයාබාධ, පියයුරු පිළිකා, ගැබ්ගෙල පිළිකා, ගර්භාෂ ආබාධ, විකෘති තරල හා අංගවිකල දරු උපත් ඇතිවීම, ගබ්සාවීම, නිල් දරු උපත්, ඇස් රෝග, වඳභාවය ඇතිවීම, මව්කිරි අඩුවීම, ලිංගාශ්‍රිත රෝග, ප්‍රජනනයේ සරු බව අඩු වීම, විවිධ ආසාදන ස්නායු හා ඇස් ආබාධ ආදි රෝගී තත්ත්වයන්ට ගොවීන් මෙන්ම ගොවි කාන්තාවන් ද බහුලව ගොදුරු වන බවට මේ වන විට සොයාගෙන තිබේ.

කෘමිනාශක, වල්නාශක, දිලීරනාශක ලෙස වසරින් වසර පලිබෝධ නාශක භාවිතය වැඩි වීම සිදුවේ. 1974 දී ඉඩම් හෙක්ටයාරයකට භාවිත කරන පලිබෝධනාශකවල ක්‍රියාකාරී සංයෝගයේ ප්‍රමාණය ග්‍රෑම් 145 වූ අතර එය දෙවෙනි වූයේ ජපානයට සහ කොරියාවටය. දශක දෙකකට පසු මෙය ග්‍රෑම් දහසක් ඉක්මවා කිහිප ගුණයකින් ඉහළ ගොස් ඇත. විවිධ සමීක්ෂණවලින් පෙන්නුම් කරන ආකාරයට ශ්‍රී ලංකාවේ එළවළු වගාකරන ගොවීන්ගෙන් 60% වඩා නිර්දේශිත ප්‍රමාණයට වඩා ඉහළ ප්‍රමාණවලින් පලිබෝධනාශක පරිහරණය කරන බව ද පෙනීයන කරුණකි (සෝලංගආරච්චි, 2009.)

**3.1 කහල්ල පල්ලකැලේ ගොවීන් පළිබෝධනාශක අධිකව භාවිත කිරීම නිසා ඇතිවූ තත්ත්වය.**

මෙම ප්‍රදේශයේ බීට් වගා කරන ගොවීන් දැකිය හැකිය. මෙහි එක් ගොවියෙක් අක්කරකට පොහොර මිටි තිහක් පමණ භාවිත කරයි. ඊට සමගාමීව පලිබෝධනාශක ද අති විශාල ප්‍රමාණයක් ඔවුන් භාවිත කරයි. එමෙන්ම මෙම බීට් අල ප්‍රමාණයෙන් නුවරඑළියෙ බීට් වර්ගවලට වඩා විශාල වේ. නුවරඑළියේ වී ගොවියා එක් කන්නයක් සඳහා බිම් සකස් කර පැළ තවාන් කරන කාලය වන විට කහල්ල පල්ලෙකැලේ ගොවියා අස්වැන්නෙන් බීට් අල උගුල්ලා අවසන් වන බවට ද එම ගොවීන් පැවසීම සිදු වේ. එමෙන්ම එම බීට් කිලෝ 75,000 ක පමණ ප්‍රමාණයක් දිනපතා දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට යවන බවත් ඔවුන් මහත් ආඩම්බරයෙන් කියා පායි.

එහෙත් ඒ සියල්ලෙන්ම නොදැනුවත්වම හෙළිවන කරුණු වන්නේ පොළවට ඉතා සීඝ්‍රයෙන් නොනවත්වා යොදනු ලබන

පළිබෝධ නාශක හා රසායනික පොහොර නිසා එහි පස ක්‍රමයෙන් විස සහිත පොළවක් බවට පත්වන අයුරු වේ. එහෙත් ගොවියා ඒ පිළිබඳව දැනුවත් නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස කහල්ල ප්‍රදේශයේ නිල් දරු උපත් පවා සිදු වී තිබුණ ද එකී ප්‍රදේශයේ ගොවීන් මේවන විටත් නොනවත්වා බීට් වගාව සඳහා පොළොවට වස විෂ මුසු කිරීම සිදුවේ.

මෙයට තවත් නිදසුනක් ලෙස කල්පිටිය දැක්විය හැකිය. එහි සිටින ගොවීන් නුවරඑළියේ එළවළු කල්පිටියේ පවතින හුණු මිශ්‍ර වූ නිසරු පොළොව මත වවනු ලබන බවට පවසයි. කල්පිටියේ තැන් තැන්වල පිහිටා තිබෙන පොහොර හා පළිබෝධන නාශක අළෙවිසැල් මෙම බීජ පැළ කළ දිනයේ සිට අස්වනු කපා අවසන් වන දින තෙක් ම වස විෂ දෙමින් එකී වගාවන් ආරක්ෂා කර ගැනීමට එම ගොවීන්ට විශාල අනුග්‍රහයක් ලබා දෙයි. කල්පිටිය ප්‍රදේශයේ පරිහරණය කරන මෙකී පළිබෝධනාශක ජලයට එකතු වී මිනිස් ශරීරවලට ද ගමන් කළ බව කියන උදාහරණයක් ලෙස එහි සිදු වූ නිල් දරු උපත් දැක්විය හැකිය. කල්පිටිය ප්‍රදේශයේ ගොවීන් සරු ඉතා විශාල කැරට්, වම්බටු, බටානා, රාබු, නෝකෝල්, බීට් ආදී එළවළු වර්ග පුරවාගත් ලොරි හා තීරෝද රථවලින් කල්පිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවලට ගෙන යයි. මෙහි දීර්ඝකාලීන අනතුර පිළිබඳව ඔවුන් කිසි විටෙකත් නොසිතයි.

එමෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ පළිබෝධනාශක භාවිත කළ නුවරඑළිය ප්‍රදේශයේ එළවළු ගොවිපළවල පසෙහි ක්ෂුද්‍ර ජීවීන්ගේ සංඛ්‍යාව අඩු වී ඇති බවට පර්යේෂණ වාර්තාවලින් ද හෙළි වී ඇත. ඒ අනුව දිවයිනේ සෙසු ගොවිබිම්වල පසෙහි තත්ත්වය පිළිබඳව පරීක්ෂා කර බැලුවහොත් මෙකී තත්ත්වයම දැකගත හැකි වේ. විශේෂයෙන් අභය භූමියක් ලෙස නම් කර ඇති කහල්ල පල්ලෙකැලේ වැනි ප්‍රදේශයක පසට, භූගත ජලයට පළිබෝධනාශක මුසුවීම සත්ත්වයාගේ පැවැත්මට අහිතකර තත්ත්වයන් උදා කරවන්නක් වේ. වැඩි ලාභ අපේක්ෂාවෙන් හා කෘමි හානිවලින් තොරව අස්වැන්නක් ලබා ගැනීම සඳහා බෝග වගාවට යොදන මෙකී පළිබෝධනාශක හේතුවෙන් ලෝකය පුරාම ජලය හා සත්ත්ව සංහතිය විනාශ වූ බවට වාර්තා ඕනෑ තරම් දක්නට ලැබේ.

නිදසුනක් ලෙස ඇමරිකාවේ ඇලබාමා හා ටෙක්සාස් යන ප්‍රදේශවල ගොවිබිම්වලට තර්ජනයක් වූ ගිනි කුහුඹුවන් මර්දනය කිරීම සඳහා කෘමිනාශක යොදා ඇති අතර සති දෙකකට පසු එම ප්‍රදේශයේ සිටි පොළව මත කුඩු සාදන බොබ් නැමැති පක්ෂියා සම්පූර්ණයෙන්ම පාහේ වඳ වී සිටි ආකාරය දක්නට ලැබී ඇත. ටෙක්සාස්හි අක්කර 2500 ක පමණ ප්‍රදේශයක සිටි වටු කුරුල්ලන් ද ඒ පොහොරවලින් මියගොස් ඇත. පසුව සිදු කරනු ලැබූ පර්යේෂණවල දී සොයාගෙන ඇත්තේ එම වටුවන් මියයාමට හේතුව ලෙස ඔවුන්ගේ පටකවල කෘමිනාශක තැන්පත් වීම සිදු වී ඇති බවයි. එම ගොවිපළවල කලුකුමුන් හා ගංගා ආශ්‍රිත සතුන් පවා මෙකී පළිබෝධනාශක හා පොහොර හේතුවෙන් මියගොස් ඇත.

එමෙන්ම 1959 දී කැලිෆෝනියාවේ කපු බීජ සංස්ථානික කෘමිනාශකවලින් ආලේප කිරීම සිදු කර ඇත. මේ හේතුවෙන් මෙම බීජ පැළ කිරීමේ නියැළුණු ගොවිපල සේවකයන් 25 දෙනෙක් ක්ෂණික රෝගාතුර වීම්වලට ලක් වී ඇත. මේ වන විට පළිබෝධනාශක ඉතා විශාල වශයෙන් ශ්‍රී ලංකාවේ ගොවි බිම් ආක්‍රමණය කර ඇති බව පැහැදිලි වේ. ඒවා මානව පැවැත්මට හා පරිසරයට කෙතරම් අහිතකර බලපෑමක් ඇති කරන්නේ ද යන්න පිළිබඳව ගොවීන්ගේ දැනුවත් භාවය ඉතා අඩු අතර නැතහොත් දුප්පත්කම හේතුවෙන් වැඩි මුදලක් ලබා ගැනීමට නම් වැඩි අස්වැන්නක් ලබාගැනීමට අවශ්‍ය බැවින් මෙවැනි අනතුරුදායක අවස්ථා ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව මඟ හැර යාම සිදුකරයි (සෝලංගආරච්චි, 2009).

මෙම පළිබෝධනාශක නිවෙස්වල ඉතා අනාරක්ෂිත ලෙස මුදාහැර තිබීම මෙකී සංවිධානයේ සාමාජිකයන්ට දක්නට ලැබී ඇත. නමුණුකුල නගරයේ වෙළඳසැලවල එදිනෙදා ආහාර වර්ග හා රසායනික පොහොර හා පළිබෝධනාශක එක ළඟ අනාරක්ෂිතව ගබඩා කර ඇති බව ද මෙකී සංවිධානයේ සාමාජිකයන්ට දක්නට ලැබී ඇත. එම වෙළෙඳ සල්වල සේවකයන්ට පවා ආරක්ෂාවක් නොමැති වී ඇත. විශේෂයෙන් දෙමළ සේවකයන් හා දෙමළ ගොවීන් මේ පිළිබඳව කිසිසේත් දැනුවත් නොවන අතර දෙමළ බසින් නිකුත් කරන දැනුවත් කිරීමෙන් පත්‍රිකාවක් හෝ එම ප්‍රදේශවල දක්නට ලැබී නොමැත. පළිබෝධනාශක මිළ දී ගන්නා ගොවීන් පවා එදිනෙදා

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු නොයෙකුත් දේ සමඟ පළිබෝධනාශක එකම බෑගයක දමාගෙන යන බව ද ඔවුන් ප්‍රකාශ කර තිබේ. සිංහල ගොවීන්ගේ නිවාසවල යම් ප්‍රවේශමක් පැවතුණ ද දෙමළ නිවෙස්වල කුඩා ළමයින්ට පවා ඇස ගැටෙන අත තැබිය හැකි තැන්වල පළිබෝධනාශක ගබඩා කර ඇති බව ඔවුන් දැක තිබේ. ඇතැම් තැනක කුකුළු කොටුවල සහ ගව මඩුවේ වහලේ පළිබෝධනාශක තැන්පත් කර ඇත.

එමෙන්ම එම ප්‍රදේශවල සෑම ගෙදරකම පාහේ වැසිකිළියට ජලය ලබා ගැනීම සඳහා භාවිත කර ඇත්තේ ද ඉහළ කොටස කපා දැමූ හිස් ප්ලාස්ටික් කෑන් වේ. මේ අන්කිසිවක් නොව ප්‍රදේශයේ වතුවලට යෙදීමට ගෙන ආ වල්නාශක කෑන් වර්ග වේ. එමෙන්ම එවැනි දේ පාවිච්චි කිරීමට හොඳ නැති බව මෙම ගොවි ජනතාව දැන් සිටිය ද මේ නිසා ඔවුන්ට ලිංගාශ්‍රිත රෝග වැළඳුණ ද ඒ පිළිබඳව කතා කිරීමට පවා මෙකී ගොවීන් අකමැති වී ඇත. කුරේටර්, යූරියා වැනි රසායනික ද්‍රව්‍ය අත්වැසුම් පරිහරණය කිරීමකින් තොරව පවා මෙකී ගොවි ජනතාව යොදන ආකාරය එකී සංවිධානයේ සාමාජිකයන් සාමාජිකයන්ට නිරීක්ෂණය කිරීමට හැකි වී ඇත. එමෙන්ම හිස් පළිබෝධනාශක බෝතල් කෙසෙල් පඳුරු අසල හෝ දිය පීල්ලක් අසල අනාරක්ෂිතව ගොඩ ගසා තිබීම ද ඔවුන්ට දක්නට ලැබී ඇත. එමෙන්ම බොහෝ විට මෙකී ගොවි පවුල්වල ජනතාව සිය ජල අවශ්‍යතාවයන් සපුරා ගන්නේ මේ ජල මූලාශ්‍රය තුළිණි.

එමෙන්ම මෙම ප්‍රදේශයේ ගොවීන් සහ වතු සේවකයන් නිරන්තරයෙන් රෝගාබාධවලට ලක්වී ඇති අතර ඒවාට හේතුව ඔවුන් නිසි පරිදි නොදනී. මෙම ප්‍රදේශවල ගොවීන් තම ගොවිපලවල් සඳහා වල් නාශක ඉසිනු ලබන්නේ බොහෝ විට තමන්ගේ පවුලේ සමීපතමයන් තමා සමීපය තබා ගනිමිනි. එයට හේතුව කුමක්දැ'යි ගොවීන්ගෙන් විමසූ විට ඔවුන් ලබා දී ඇති පිළිතුර වන්නේ පළිබෝධනාශක නිසා තමන්ට යම් අනතුරක් වුවහොත් නිවැසියන්ට ඒ බව දැන්වීමට කිසියම් පුද්ගලයෙකු අවශ්‍ය නිසා එසේ සිදුකරන බවයි.

පළිබෝධනාශක විෂ ශරීරගත වීම මුඛයෙන් පමණක් සිදුවන බව විශ්වාස කරන මෙම ගොවීන් පර්යේෂකයන්ට ප්‍රකාශ කර

ඇත්තේ ඒවා තමන්ට විෂ වීමට ඔවුන් ඒවා ආහාරයට නොගන්නා බවයි. මෙම විෂ සමින් හා නාසයෙන් පවා ඇතුළු වී ඔවුන්ට හානි කරන බවට තරම් දැනුමක් එකී ගොවීන්ට නොමැති වේ. මෙකී ගොවි පවුල්වල පුරුෂයන් නිවසේ නොමැති අවස්ථාවකවල දී වල්නාශක ඉසිනු ලබන්නේ කාන්තාවන් විසිනි. නැතහොත් ඒවා කවලම් කර සැමියාට ලබා දෙන්නේ කාන්තාවයි. කුමන රෝගාබාධයක් වැළඳුන ද ඔවුන් ලැජ්ජාව නිසා එය සඟවාගෙන සිටී.

අල පාත්තිවලට යටින් එන උල්පතකට පිහිල්ලක් ගසා නැමට වතුර ගලා යන තැන්වල එම අල පාත්තියට වල් නාශක ඉසිනු මෙකී නිල්ධාරිනිය නිරීක්ෂණය කර ඇත. ඇයගේ වාර්තාවලට අනුව නුවරඑළිය මීපිලිමාන ප්‍රදේශයේ බොහෝ නිවෙස්වල දිවි නසා ගැනීම් බහුලව දක්නට ලැබී ඇත. ඒ සඳහා භාවිත කර ඇත්තේ පළිබෝධනාශකයි. මීපිලිපාන නිවසක වසරකට පෙර පළිබෝධනාශක පානය කර මිය ගිය මිනිසකු අවසන් මොහොතේ වමනය කළ තැනක තවමත් වල් ගස් පවා නොවැඩෙන බව ඇය නිරීක්ෂණය කර ඇත.

පළිබෝධ නාශක කොතරම් විෂ සහිත  ද එය මිනිස් ජීවිතවලට කෙබඳු බලපෑමක් ඇති කරන්නේ ද යන්න වටහා ගැනීමට මෙකී කුඩා නිදසුන වුව ද දැක්විය හැකිය. රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතයෙන් අස්වැන්න වැඩිවේ යැ'යි විවිධ පුද්ගලයන් ඔප්පු කිරීමට උත්සාහ කළ ද එය මිථ්‍යාවක් ලෙස හැඳින්විය හැකිය. රසායනික පොහොර භාවිත කිරීම ක්‍රමයෙන් වැඩි වීම සිදුවන්නේ වගාබිම් වැඩිවීම නිසා බව හුවා දැක්වීමට තැත් කළ ද ඒ සත්‍ය තත්ත්වය නො වේ. රසායනික පොහොර යොදන පස ක්‍රමයෙන් නිසරු වන විට මුල දී ලබාගත් සරු අස්වැන්න එක සේ ලබා ගැනීමට නම් යොදන පොහොර ප්‍රමාණය වැඩි කිරීමට සිදුවේ. භාවිතය වැඩි වන්නේ එබැවිනි. කාලයක් වල්නාශක හා කෘමිනාශක යොදන විට පළිබෝධ ඒවාට හොඳින් ඔරොත්තු දෙන තත්ත්වයට පත් වීම සිදුවන විට බිහිවන නව පළිබෝධ පෙර පරපුරට වඩා ඉතා ශක්තිමත් වන බැවින් එකී පළිබෝධ සඳහා යෙදිය යුතු කෘමිනාශක මාත්‍රාවට වැඩි කිරීමට සිදුවේ.

පළිබෝධනාශක භාවිතය වැඩි වන්නේ එලෙසයි. මෙහි ප්‍රතිඵල දෙකක් පවතී. පළමුවැන්න නම් ශ්‍රී ලාංකික පොළවේ පරිසරයේ වසවිෂ සාන්ද්‍රණය ක්‍රමයෙන් වැඩි වීමයි. දෙවැන්න නම් ශ්‍රී ලාංකික ගොවියා දුප්පත් වී පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන බහුජාතික සමාගම් හා එයින් වාසි ලබාගන්නා අතරමැදියා පොහොසත් බවට පැමිණ වීමයි. ගොවිතැනින් ගොවියා පාඩු ලබනවා යන සංකල්පය ගොවීන්ගේ සිත් තුළට කාන්දු වන්නේ මෙවැනි තත්ත්වයන්වල දී ය. එහෙත් සැබෑ තත්ත්වය වන්නේ ගොවියා බහුජාතික සමාගම්වල බිල්ලක් වී ඇති බවයි.

පළිබෝධනාශක හා රසායනික පොහොර වර්ග නිෂ්පාදනය කරන්නේ ලෝකයේ ධනවත්ම රටවලය. එහි අහිතකර ප්‍රතිඵල ලබන්නේ ලංකාව වැනි ලෝකයේ දුප්පත් රටවල්ය. පළිබෝධනාශක දැඩි අනතුරු සහිත බව සත්‍යයකි. එහි සඳහන් වන පරිදි එය කිසිදු විටෙක ප්‍රවේශමෙන් පරිහරණය කළ නොහැකිය. ප්‍රවේශමෙන් පරිහරණය කිරීම යනු මිත්‍යාවකි. පළිබෝධනාශක සහ රසායනික පොහොරවලින් ඈත් වී ගොවිතැන් කටයුතු සිදු කිරීමට හැකි නම් එය තමාට මෙන්ම තම අනාගත පරපුරට ද සිදු කරන මහඟු යුතුකමකි (සෝලංගආරච්චි, 2009).


## 04. හේතු හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය

මෙම වකුගඩු රෝගය මුලින්ම හඳුනා ගනු ලැබුවේ උතුරු මැද පළාතේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව වයඹ, මධ්‍යම, උතුර, දකුණ යන ප්‍රදේශවල මෙම රෝගය ව්‍යාප්ත වී ඇත. රෝගයට කාල්පනික හේතු ලෙස ආහාර ජලය ඔස්සේ කැඩ්මියම්, ආසනික් වැනි බැර ලෝහ ශරීර ගත වීම, ආහාර සැකසීමට බාල තත්ත්වයේ උපකරණ භාවිත කිරීම භාවිත කරන ජලයේ අධික ෆ්ලෝරයිඩ් ප්‍රමාණයක් තිබීම, පළිබෝධ නාශකවලට නිරාවරණය වීම, මන්දපෝෂණය හා විජලනය, ජලයේ අධික කඨිනත්වය ආදිය වකුගඩු රෝගය සඳහා බලපාන බව සොයාගෙන ඇත. එහෙත් මෙහිදී පැනනගින ගැටලුවක් වන්නේ රජරට ප්‍රදේශයට සාපේක්ෂව යාපනය ප්‍රදේශයේ ද ජලයේ කඨිනත්වය පැවතුනාණ ද එම ප්‍රදේශයේ වකුගඩු රෝගීන් අඩුවීමයි.

### 4.1 ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වකුගඩු රෝගීන්ගේ ව්‍යාප්තිය

සිතියම් අංක 01 මඟින් පැහැදිළි වන ආකාරයට වියළි කලාපයේ අනුරාධපුර පොළොන්නරුව ආශ්‍රිත කලාපවල වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයක් දක්නට ලැබෙයි. මෙම කලාප ලංකාවේ ප්‍රධානතම කෘෂිකාර්මික කලාප වන අතර විශාල වශයෙන් පළිබෝධනාශක සහ රසායනික පොහොර ආදිය පවා පරිහරණය කරනු ලබයි. එමෙන්ම මෙම ප්‍රදේශවල පවතින ජලය ද අධික කඨිනත්වයකින් යුතු වේ. මෙකී කරුණු මෙම ප්‍රදේශයේ වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ යාමට බලපා ඇත. මෙයින් පෙනී යන කරුණක් වන්නේ රජරට ප්‍රදේශයේ පොලොන්නරුව හා අනුරාධපුර ආශ්‍රිත ව වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව අධික බවයි. එමෙන්ම මෙය පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මායිම ගතහොත් එම මායිම ආශ්‍රිතව මෙකී වකුගඩු රෝගීන්ගේ ව්‍යාප්තිය වැඩි වීමක් දක්නට ලැබේ.

**සිතියම් අංක 01**




(රණසිංහ, ලොකුගේ සහ එදිරිසිංහ, 2015)

එමෙන්ම ඒ ආශ්‍රිතව අනිකුත් දිස්ත්‍රික්ක ගතහොත් එකී දිස්ත්‍රික්ක මායිම ආසන්නේ රෝගීන්ගේ ව්‍යාප්තිය ද වැඩි වෙයි. එයටද හේතු සෙවිය යුතුයි. එහෙත් නැගෙනහිර පළාතේ අම්පාර,


මඩකලපුව වැනි ප්‍රදේශ ද හොඳින් පළිබෝධ නාශක භාවිත කරන හා ගොවි ජනතාව වගා කටයුතුවල නියැලෙන ප්‍රදේශ වේ. එහෙත් එකී ප්‍රදේශවල වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව ඉතා අඩු මට්ටමක පවතී. එයට ද බලපාන හේතුව සොයා ගැනීමේ අවශ්‍යතාවයක් පවතී. එමෙන්ම ජලයේ කඨිනත්වය අධික යාපනය වැනි ප්‍රදේශවල වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව දැක්වෙන්නේ ද ඉතාමත් අවම වශයෙනි.

එසේ නම් ජලයේ කඨිනත්වය වකුගඩු රෝගයට බලපාන එකම හේතුව හෝ පළිබෝධනාශක ඒ සඳහා විශාල බලපෑමක් ඇති නොකරන්නේය යන බහුජාතික සමාගම් විසින් එල්ල කරන තර්කයට මෙය එක් නිදසුනකි. එබැවින් මෙකී ගැටලුව දෙස වෙනස්ම මානයකින් බැලිය යුතු බව මෙහිදී පැහැදිලි වෙයි (ජනනායක, 2020).

පහත දැක්වෙන සිතියම් සිතියම් අංක 02 මඟින් මිණිපේ ඇළ සහ ලොග්ගල් ඔය දැක්වෙන අතර එහි ලොග්ගල් ඔය ආශ්‍රිතව වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව අඩු මට්ටමක පවතින අතර එහෙත් මිණිපේ ඇළ ආශ්‍රිත ප්‍රදේශය ගතහොත් එකී ඇළ ආරම්භ වන ස්ථානයේ සිට ඒ ආශ්‍රිතව වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව වැඩි මට්ටමක් ගෙන ඇති අතර අවසානයේ දී තද රතු පැහැයෙන් දැක්වෙන ආකාරයට වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව වැඩි මට්ටමක් ගෙන ඇත. මෙයින් පැහැදිළි වන්නේ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිත කිරීම හා ඒවා ජලයට මිශ්‍ර වීම හා ඒවා මිනිසුන් පරිභෝජනය කරන ආකාරය අනුව වකුගඩු රෝගය ඇතිවන ආකාරය දෙස නව මානයකින් බැලිය යුතු බවයි. මෙවැනි තත්ත්වයන් පිළිබඳව හඳුනා ගැනීම මේ පිළිබඳව පර්යේෂණ සිදු කරනව පර්යේෂකයන්ට වැදගත් වේ (ජනනායක, 2020).

## 4.2 මිණිපේ ඇල සහ ලොග්ගල් ඔය ආශ්‍රිත වකුගඩු රෝගීන්ගේ ව්‍යාප්තිය.

**සිතියම් අංක - 02**




(ජනනායක,2021)

වකුගඩු රෝගයට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස ආසනික් නැමැති විෂ රසායනය හැඳින්විය හැකිය. ආසනික් මෙරට භූමියට පැමිණෙන්නේ කෙසේද? යන්න ගතහොත් ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්තය කළමණාකරණය නොකර අවශ්‍ය අවශ්‍ය ආකාරයට මෙරටට කෘෂි රසායන ද්‍රව්‍ය හා රසායනික පොහොර ආදිය ගෙන්වීමෙන් සහ මිනිසුන් කිසිදු ක්‍රමානුකූල බවකින් තොරව ඒවා පොළොවට යෙදීම හේතුවෙන් මහ පොළවට එකතු වන කෘෂි රසායන වර්ගයකි. මෙම ආසනික් භූගත ජලයට මිශ්‍ර වී ඇති අතර ආසනික් යනු සුවඳක් රසයක් නොමැති ද්‍රව්‍යයකි.

මේ නිසා ආසනික් ශරීරගත වීම වකුගඩු රෝග ඇතිවීමට බලපා ඇති බවට තහවුරු වී ඇත. ආසනික් වතුරෙන් හෝ ආහාරයෙන් ශරීරයට ඇතුල් වුවහොත් ඒවා රුධිරය මගින් ශරීරයට උරා ගැනීම සිදුකරයි. මේවා මෙම රුධිරය මගින් හෘදයේ යාකෘතික ප්‍රතිහාර ශිරාවට ගෙන යන අතර එයින් අක්මාවට ගමන් කරයි නම් ආසනික් නිසා අක්මාව හානි නොවන්නේ ඇයිද? යන්න ගැටලුවකි. ආසනික් අක්මාවේ තැන්පත් නො වේ. එමෙන්ම මෙහිදී ආසනික් සහ වර්තමානයේ ඇති ග්ලයිෆොසේට් අතර ප්‍රතික්‍රියාවක් පවතින බව

සොයාගෙන ඇත. මෙහිදී ආසනික් නැමැති රසායනය වටා ග්ලයිෆොසෙට් තැන්පත් වේ. ඒ දෙක එකට එකට ප්‍රතික්‍රියා කොට වකුගඩුවල තැන්පත්වේ. ග්ලයිෆොසේට් පැමිණෙන්නේ වල්නාශකයක් වශයෙනි. ආසනික් පවතින ජලය පානය කරන විට එහි ග්ලයිෆොසේට් පැවතියහොත් මෙකී වකුගඩු රෝග ඇති වීම අනිවාර්යයෙන්ම සිදුවෙයි.

එබැවින් ජලය පානයට ගැනීමේ දී එම ජලයේ පවතින විෂ රසායනයන් ඉවත් කළ යුතුයි. මෙහිදී පෙරහනය මගින් ජලය පෙරනය කළ ද එයින් ආසනික් ඉවත් නො වේ. මෙහිදී ජලයේ කඨිනත්වය පමණක් ජලය පිරිසුදු කිරීම මගින් ඉවත් කළ හැකිය. එහෙත් ජලයේ පවතින ග්ලයිෆොසේට් සහ ආසනික් තවදුරටත් ඒ ආකාරයෙන්ම පවතී. මේවා බැර ලෝහ වන අතර එබැවින් එවැනි බැර ලෝහ අන්තර්ගත ජලය පිරිසිදු කරන විශේෂ ක්‍රම පවතී. මේ සඳහා RO ක්‍රමය අනුගමනය කරන පෙරහන් භාවිත කළ යුතු වේ.

මේ සඳහා ලක්ෂ 10-17 පමණ මුදලක් වැය කිරීමට සිදු වේ. එහෙත් මෙවැනි ප්‍රදේශවල සිටින ගොවි ජනතාව ඉතා දුප්පත් පුද්ගලයන් වන අතර මේ සඳහා ඔවුන්ට වියදම් කිරීමට තරම් මුදල් නොමැත. එමෙන්ම කාලයක් යන විට මෙකී ජල පෙරහන් දිරාපත් වන අතර ඒවා නඩත්තු කිරීමට නැවත ඒවා සැකසීමට ද අදාල ආයතන මුදල් අය කිරීම සිදුවේ. එබැවින් එවැනි අධික මුදලක් ගොවියාට වැය කිරීමට නොහැකි වන බැවින් මෙවැනි පෙරහන් මෙම රෝගය බහුලව ව්‍යාප්ත වී ඇති සෑම ප්‍රදේශයකම ස්ථානගත කිරීම අපහසු කරුණක් වී ඇත.

එමෙන්ම මෙකී වකුගඩු රෝගීන් තත්ත්වයට මුහුණ දෙන ජනතාව අතරින් බහුතරය සංවර්ධනය අවම අනුරාධපුරය වැනි ඉතා දුෂ්කර ප්‍රදේශවල ජනතාව වේ. එබැවින් ඔවුන්ට තම අයිතීන් වෙනුවෙන් විශාල හඬක් නැගීමට හැකියාවක් නොමැත. එහෙත් මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර වන කොළඹ වැනි නගර ආශ්‍රිතව පැවතුනේ නම් ඕනෑම රජයකින් මේ සඳහා ස්ථිරසාර පිළිතුරක් ලැබීමට හැකිය. රජය විසින් කළ යුත්තේ මෙවැනි ප්‍රදේශවලට මෙවැනි ආරක්ෂාකාරී පෙරහන් ලබා දී කෙසේ හෝ

ගොවියා පානය කරන ජලය ඔවුන්ට පිරිසිදුව සහ හා සුරක්ෂිතව ලබාගැනීමට වැඩ කටයුතු සැළැස්වීමයි.

බොහෝ දුරට ඕනෑම රජයක් සිදුකරන්නේ ගොවි ජනතාවගේ ඡන්දය ලබා ගැනීමේ අරමුණින් නොමිලේ හෝ සහනදායි මිළට පොහොර හා පළිබෝධ නාශක ඔවුන් වෙත ලබා දීමයි. එවැනි දේ සිදු කරන්නේ ආත්මාර්ථකාමී පටු අරමුණකි. එහෙත් විය යුත්තේ ක්‍රමානුකූලව මෙවැනි පළිබෝධ නාශක හා රසායනික පොහොර වර්ගවලින් ගොවි ජනතාව මුදවා ගෙන ඔවුන්ව කාබනික වගාවන් වෙත යොමු කරවීමයි.

**5. වී වගාව වල් නෙලීමේ ක්‍රමය , කෘමිනාශක, දිලීර නාශක භාවිතය සහ කන්නය අනුව වගා කළ බිම් ප්‍රමාණය.** 2010-2017

| වල් නෙලීමේ ක්‍රමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| **මහ** | | | | | | | | |
| **අතින්** | 93,098 | 104,445 | 113,262 | 73,874 | 84,051 | 99,767 | 130,942 | 77,699 |
| **වල් නාශක මගින්** | 532,278 | 554,530 | 561,299 | 679,266 | 531,792 | 648,738 | 600,73 | 421,003 |
| **ජලයේ කුණු වීමට හැරීමෙන්** | 5,558 | 7,272 | 6,656 | 11,430 | 9,765 | 7,216 | 9,690 | 9,231 |
| **වල් නෙලීමක් නැත.** | 12,921 | 22,91 | 20,858 | 15,069 | 25,681 | 18,903 | 14,843 | 34,62 |
| **කෘමි නාශක භාවිතයෙන්** | | | | | | | | |
| **කෘමි නාශක යොදා ඇත.** | 494,207 | 500,452 | 210,228 | 588,196 | 456,271 | 555,308 | 525,055 | 316,614 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කෘමිනාශක යොදා නැත. | 149,649 | 198,707 | 491,847 | 191,439 | 195,018 | 217,316 | 230,950 | 225,742 |
| දිලීර නාශක භාවිතය | | | | | | | | |
| දිලීර නාශක යොදා ඇත. | 267,298 | - | - | - | - | - | - | - |
| දිලීරනාශක යොදා නැත. | 376,558 | - | - | - | - | - | - | - |
| | | | | | | | | |
| මුළු එකතුව | 643,850 | 730,136 | 702,07 | 779,635 | 651,289 | 772,62 | 756,00 | 542,55 |

| යල | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අතින් | 54,183 | 54,996 | 48,357 | 45,02 | 27,739 | 47,941 | 37,610 | 19,530 |
| වල් නාශක මගින් | 348,729 | 414,475 | 310,637 | 391,111 | 277,809 | 423,140 | 423,140 | 334,712 |
| ජලයේ කුණු වීමට හැරීමෙන් | 5,413 | 6,591 | 4,536 | 4,883 | 2,335 | 4,641 | 5,513 | 3,151 |
| වල් නෙලීමක් නැත. | 8,260 | 135,20 | 3,012 | 6,592 | 5096 | 4,967 | 7,480 | 5,798 |
| කෘමි නාශක භාවිතයෙන් | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **කෘමි නාශක යොදා ඇත.** | 307,646 | 338,649 | 123,808 | 319,326 | 215,298 | 330,415 | 233,403 | 153,076 |
| **කෘමි නාශක යොදා නැත** | 108,947 | 150,023 | 240734 | 128,287 | 97,681 | 150,247 | 151,915 | 96,047 |
| **දිලීර නාශක භාවිතය** | | | | | | | | |
| **දිලීර නාශක යොදා ඇත.** | - | 338,649 | - | - | - | - | - | - |
| **දිලීර නාශක යොදා නැත.** | - | 150,023 | - | - | - | - | - | - |
| | | | | | | | | |
| **මුළු එකතුව** | 419,246 | 493,025 | 364,542 | 447,613 | 312,979 | 480,662 | 385,218 | 249,123 |

(සංඛ්‍යාන නිබන්ධනය, 2018)

මෙලෙස පළිබෝධනාශක භාවිත කරන භූමි ප්‍රමාණය වැඩිවීම හා ශ්‍රී ලංකාවේ වගා භූමි ආශ්‍රිතව ජීවත්වන ගොවි ජනතාවගේ වකුගඩු රෝග වැඩිවීම අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව අධ්‍යයනය කිරීම වර්තමානයේ දී අතිශයින්ම වැදගත් කරුණක් වේ.

### 06. කෘෂිකර්මාන්තය හා සම්බන්ධ බහුජාතික සමාගම්

බහුජාතික සමාගමක් ලෙස හඳුන්වනු ලබන්නේ රටවල් කිහිපයක් තුළ භාණ්ඩ හා සේවා අලෙවි කරන සමාගමකි. එහි ප්‍රධාන කාර්යාලය බොහෝවිට මව් රටේ හෝ සංවර්ධිත රටක පිහිටුවා ඇත. බහුජාතික සමාගම්වල ක්‍රියාකාරීත්වය සංවර්ධනය වෙමින් පවතින රටවල නොයෙක් විවාදවලට භාජනය වී ඇත. කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවත්වාගෙන යන බහුජාතික සමාගම් වර්තමානයේ දී දක්නට ලැබේ. මෙම බහුජාතික

සමාගම් සංවර්ධනය වෙමින් පවතින තුන්වන ලෝකයේ රටවල කෘෂිකර්මාන්තය සියතට ගෙන ඔවුන්ගේ සාම්ප්‍රදායික හා දේශීය කෘෂිකර්මාන්තය විනාශයට පත්කොට ගෝලීය කෘෂිකර්මාන්තයේ සමස්ත පාලනය තමන් යටතට පත් කර ගැනීමට උත්සාහ කරන බවට ඔවුන්ට චෝදනා එල්ල වී තිබේ.

විශේෂයෙන් හරිත විප්ලවයත් සමගම රසායනික පොහොර වර්ග, පලිබෝධනාශක වර්ග, විවිධ බීජ වර්ග ආදිය ඔවුන් ගොවි ජනතාවට හඳුන්වා දුන් අතර පසුව ඒවාට ගොවි ජනතාව හුරු කොට අවසානයේ ඒවා නොමැතිව ස්වභාවික ලෙස වගා කටයුතු කළ නොහැකි තත්ත්වයටම අසරණ කොට ඔවුන්ගෙන් පොහොර, පළිබෝධනාශක හා බීජ වර්ග ලබා ගන්නා තැනට ගොවීන් පත්කොට උපරිම ලාභ ගැනීමට මෙකී සමාගම් උත්සාහ කරයි.

## 6.1 මොන්සැන්ටෝ සමාගම

කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් ලෝකයේ ඇති විශාලතමතම බහු ජාතික සමාගම වන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ මොන්සැන්ටෝ සමාගම වේ. මෙම සමාගම වල්නාශක, කෘමිනාශක හා බෝග බීජ නිෂ්පාදනය කිරීම සිදු කරයි. බොහෝ රටවල භාවිත වන වල් නාශකයක් වන රවුඩප් මෙම සමාගමේ නිෂ්පාදනයකි. මෙය ශ්‍රී ලංකාව තුළ ද භාවිත කරයි. එමෙන්ම ජාන තාක්ෂණයෙන් නිපදවූ කෘෂි බෝග වෙළඳාමෙන් 70%-100% දක්වා වූ වෙළෙඳපොළ කොටස මෙම සමාගමට අයත් වේ.

මොන්සැන්ටෝ සමාගම ඔවුන්ගේ උදාන වාක්‍ය ලෙස ප්‍රකාශ කරන්නේ ඔවුන්ගේ පරම අභිප්‍රාය ලෝකයේ කුසගින්නෙන් පෙළෙන ජනතාව පෝෂණය කිරීම බවත් ලෝකයේ කෘෂිකර්මාන්තය දියුණු කර කුසගින්න දුරලීම බවයි.

"අනාගත පරම්පරාවට සාගතයට ලක්වී පෝෂණය අහිමි වී යැ'යි බියට පත් වී සිටියි. ආහාර ජීව තාක්ෂණය එයට විසඳුම් ලබා දෙනු ඇත. චීනයේ මුළු ජනගහනයට සමාන ප්‍රමාණයකින් ලෝකයේ ජනගහනය සෑම වසර 10කට වරක් වැඩි වනු ඇත. මේ බිලියනයකට වඩා කටවල් පෝෂණය කිරීම සඳහා එක්කෝ අපට වගා කරන ප්‍රමාණය වැඩි කිරීමට හෝ දැනට වගා කරන ඉසව්වල අස්වැන්න

වැඩි කිරීමට හැකිය. 2030 දී මේ පෘථිවි ගෝලයේ අවකාශය දෙගුණ කිරීමකින් වුව ද ඉඩ ප්‍රමාණය මත යැපෙමින් කරන ගොවිතැන ඔරොත්තු නොදෙන තත්ත්වයට පත්විය හැකිය. පාංශු ඛාදනය සහ ඛනිජ කොටස් අහෝසි විය යෑම තුළින් භූමිය අහෝසි වී යා හැකිය. වැසි වනාන්තර වැනි භූමි ප්‍රදේශ වගාව සඳහා යොදා ගැනීමට බල කෙරෙනු ඇත. රසායනික පොහොර කෘමිනාශක හා වල්නාශක ගෝලීය වශයෙන් වැඩිවනු ඇත. මොන්සැන්ටෝ සමාගම තුළ අප දැන් විශ්වාස කරන්නේ ඉදිරියේ සඳහා ඇති වඩාත් හොඳම මාර්ගය ලෙස ජීව තාක්ෂණ ව්‍යුහය ඇතුල් කළ වඩා ඵලදායී ජීව තාක්ෂණික බීජ කෘමීන්ට සහ වල් පැළෑටිවලට ඔරොත්තු දෙන බීජ නිෂ්පාදනය කරනු ඇත. ඇත්ත වශයෙන්ම අප මූලික වශයෙන් සිදු කරන්නේ ව්‍යාපාරික කාර්යයකි. ජීව තාක්ෂණය පිළිබඳ අපට වඩා වෙනත් දෘෂ්ටීන් තිබෙන බව පිළිගනිමින් අප අරමුණු කරන්නේ ලාභ ඉපයීමටය. එසේ කියන්නේ ලෝකය පුරා රජය අනුමත ආයතන අපගේ බීජ සුරක්ෂිත ලෙස යොදාගෙන බෝග වගා කිරීමට අනුමත කර ඇති බැවිනි" (ඩයස්, 2014, 132).

රචෙල් කාසන් විසින් ලියන ලද නිහඬ වසන්තය (Silent Spring) නම් ග්‍රන්ථය මගින් කෘමීන් කෘමි නාශකවල ඇති විනාශකාරී බලපෑම කුමක් දැ'යි මහජනතාවට පැහැදිලි කර දුන් අතර එම පැහැදිලි කිරීමත් සමගම මෙම සමාගමේ නිෂ්පාදනවලට දැඩි බලපෑමක් එල්ල විය.

### 6.2 සින්ජෙන්ටා සමාගම

කෘෂිකාර්මික නිෂ්පාදනවලට සම්බන්ධ වූ තවත් බහු ජාතික සමාගමක් ලෙස මෙම සමාගම හඳුන්වා දිය හැකිය. මෙය වර්ෂ 2000 පිහිට වූ අතර මෙහි මූලස්ථානය පිහිටා ඇත්තේ ස්විස්ටර්ලන්තයේ ය. මෙහි නිශ්පාදනය කරනු ලබන්නේ කෘමිනාශක හා බෝග බීජ වර්ගය. මෙකී සමාගමේ නිශ්පාදනය කරන්නේ මිශ්‍ර බෝග, එළවළු හා මල්වලට අදාල බීජ වර්ග වේ. මෙම ආයතනය මගින් මඟින් නිෂ්පාදනය කරන ජනප්‍රිය වෙළඳ නාම ලෙස ආට්‍රෙක්, ඇක්ටාරා, ඇමිස්ටාර්, නෝත්‍රප්ට් කිං, රොගාර්ස්, ග්‍රැමොක්සෝන්, ආදිය දැක්විය හැකිය අතර ග්‍රැමොක්සෝන් වැරදි ලෙස භාවිත කිරීම් නිසා ලෝකය පුරා විශාල වශයෙන් මරණ සිදුවිය. එය යම් භූමියක සමස්ත පරිසර

පද්ධතිය පුරා ම පැතිරී යා හැකිය. එබැවින් මෙවැනි වල් පැළ විනාශ කිරීමට තිබෙනවාට වඩා ප්‍රබලතාවයෙන් යුතු පළිබෝධනාශක වැඩි වැඩියෙන් පරිසරයට මුදා හැරීමට සිදු වේ. එබැවින් කාබනික සහ පරිසර හිතකාමී කෘෂිකාර්මික රටාවක් වෙත යොමුවීමේ දී මෙවැනි සමාගම්වලින් දැඩි බලපෑම් එල්ල වන අතර ඒවාට එරෙහිව ක්‍රියා කිරීම ද අතිශය අභියෝගකාරී ක්‍රියාවලියක් බවට පත් වී තිබේ.

**07. වන්දනා ශිවාගේ මහත්මියගේ අදහස් තුළින් ශ්‍රී ලාංකික කෘෂිකර්මාන්තය මුහුණපා ඇති අර්බුදය පිළිබඳව හඳුනා ගැනීම.**

වන්දනා ශිවා මහත්මිය විසින් රචනා කරන ලද Stollen harvest නැමැති ග්‍රන්ථය සොරාගත් අස්වැන්න නමින් සිංහලයට පරිවර්තනය කරන සිඩ්නි මාකස් ඩයස් මහතා විසින් ශ්‍රී ලංකාවේ රසායනික පොහොර හා පළිබෝධ නාශක වර්ග භාවිත කිරීම නිසා ඇතිවී ඇති තත්ත්වය ඉන්දියාවේ ඇති වී ඇති තත්ත්වය හා ඉතා සමීප බවක් දක්වන බව ප්‍රකාශ කරයි. එහිදී ඔහු ප්‍රකාශ කරන ආකාරයට ඔහු 23 හැවිරිදි වියේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ වියළි කලාපීය ප්‍රදේශයක් වන ආණමඩුවට ගුරුවරයෙකු ලෙස සේවයට පැමිණෙන විට දී එම ප්‍රදේශයේ හේන් ගොවිතැන ඉතා සශ්‍රීක ආකාරයෙන් පැවතුණි. එහෙත් ඔහු පවසන ආකාරයට එකී සශ්‍රීකත්වය රැඳී තිබී ඇත්තේ ඉතා කෙටි කලක් පමණි. මෙම කාලය තුළ දී ආණමඩුව නගරය ප්‍රදේශයේ සාම්ප්‍රදායික හේන් ගොවීන්ගේ විවිධ ආහාර නිෂ්පාදනවලින් ගහන වී පැවතුණි.

නගරයේ මාර්ගය දෙපස එළවළු මිළ දී ගන්නන් ගෙන් පිරී තිබුණු අතර අස්වනු රැගෙන යන කාලයේ දී ඒවා ලොරි රථ කිහිපයකින්ම කොළඹට රැගෙන ගොස් ඇත. එමෙන්ම එම ලොරි රථ නැවත ගම්මානයට එන විට අත්‍යාවශ්‍ය භාණ්ඩ රැසක් ද රැගෙන ගම්මානයට පැමිණේ. එහෙත් ඉන් පසු දශක තුනක් ගතවීමෙන් අනතුරුව ඔහු පවසන පරිදි සෑම සති අන්තයකින් ම ආණමඩුව ප්‍රදේශයෙන් කොළඹට පිටත් වී එන්නේ හිස් ලොරි කිහිපයකි. ඒවාගේ සියඹලා හෝ කරපිංචා වැනි සුළු ද්‍රව්‍ය පවතී. අතීතයේ ආණ්ඩුවෙන් කොළඹට ප්‍රවාහනය කරන මුං ඇට, තල වැනි දේ පවා ආනයනය කර කොළඹින් ආණමඩුවට රැගෙන ඒම සිදුවේ. ඊට අමතරව නිතිපතා දඹුල්ලට යන ලොරි කිහිපයකින් ආණමඩුවේ

ජනතාවට ආහාර සඳහා අවශ්‍ය එළවළු රැගෙන එනු ලැබේ. දශක තුනක පමණ කාලයක් ඇතුළත මෙකී රටේ කෘෂිකර්මාන්තය උඩුයටිකුරු වී ඇති බව ඔහු ප්‍රකාශ කරයි.

ඔහු පවසන ආකාරයට එම කාල වකවානුව තුළ ආණමඩුව නගරය තුළ සහල් සැකසුම් මධ්‍යස්ථාන තිහකට අධික සංඛ්‍යාවක් සක්‍රියව පැවතුණු අතර එහෙත් එය පසුව 10 දක්වා අඩු සංඛ්‍යාවට පහත බැස තිබේ. එමෙන්ම එම ප්‍රදේශයේ තරමක් හෝ අස්වැන්නක් ලබන්නේ වී වගාවෙන් පමණි. දශක තුනකට පෙර ඔහු එම ප්‍රදේශයට යන විට එම ප්‍රදේශය සශ්‍රීක වී පැවැතුණි. ඊට හේතුව දශක දෙකකට පමණ ඉහත දී එම ප්‍රදේශයේ සිදුකරනු ලැබූ සාම්ප්‍රදායික  මිශ්‍ර හේන් වගාවට හරිත විප්ලවය විසින් හඳුන්වාදුන් දුන් ඒකීය වගා ක්‍රමය ඔස්සේ ගොවීන්  කවුපි, බඩඉරිඟු වැනි බෝග වර්ග වගා කිරීමට යොමු වීමයි. මුල් යුගයේ දී අක්කරයකට බුසල් තිහක් තිස්පහක් පමණ අස්වැන්නක් ලබාදුන් බෝග පසුව බුසල් දහයකට දොළහකට අඩු විය. එකම භූමියක නැවත නැවත වල්නාශක හා කෘමිනාශක යොදමින් වගා කිරීම නිසා මේ වන විට එම ප්‍රදේශ හේන් වගා කරන ලද සොහොන් බිම් බවට පත් වී ඇත.

එමෙන්ම මෙම තත්ත්වය එම සමාජයේ සමස්ත ජන සමාජයටම ම බලපා ඇත. ඔහු 1995 වර්ෂයේ දී  පෞද්ගලික මට්ටමින් සමීක්ෂණයක් සිදු කර ඇති අතර එහිදී පළමු වසරට ඇතුළත් වන දරුවන්ගේ උස සහ බර මැනීම සිදු කර ඇත. එහිදී ඔහු සොයාගෙන ඇත්තේ අදාල ළමුන්ගෙන් 85% ම නියමිත උස හා බර නොමැති බවත් ඒ සියලු දරුවන් සාම්ප්‍රදායික ගොවි පවුල්වලට අයත් දරුවන් වී ඇති බවයි. නියමිත බර ප්‍රමාණය නියෝජනය කළ දරුවන් ප්‍රදේශයේ රජයේ හෝ පෞද්ගලික අංශවල ස්ථිර රැකියාවල නිරත වන  පුද්ගලයන්ගේ දරුවන් විය.

එසේ නම් එයින් නිගමනය කළ හැක්කේ ගොවීන්ගේ දරුවන් මන්දපෝෂණයෙන් පෙළෙන බවයි. එම කාලයේ රටේ අවුරුදු පහට අඩු දරුවන්ගේ මන්දපෝෂණය 65% ඉක්මවා ඇතැයි යන කතිකාවතක් සමාජ ගතවී තිබුණි. 1978 දී බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සිදු කරන ලද සංගණනයකින් පුත්තලම දිස්ත්‍රික්කයේ අවුරුදු 5 ට අඩු ළමුන් අතර දැඩි මන්දපෝෂණය

පවතින බව සොයාගෙන ඇත. එය දුරු කිරීම සඳහා ද අමාත්‍යංශ මගින් විවිධ පෝෂණ වැඩසටහන් ද අරඹා තිබුණි. මෙකී බේදවාචකයත් සමඟ ම තවත් සමාජ බේදවාචක රැසක් පැන නැගී පැවතුණි. තමන්ගේ සාම්ප්‍රදායික ගොවි බිම්වල සාම්ප්‍රදායික ක්‍රම භාවිතයට ගෙන වගා කටයුතුවල නියැලුණු ගොවීන් මින් පසුව හරිත විප්ලවයෙන් හඳුන්වා දුන් ක්‍රම භාවිත කර ඒවා සාර්ථක භාවයට පත් කර ගත්තේය.

පසු කාලීනව නැවත ඒවා ඉතා ඛේදජනක ලෙස පහළට කඩා වැටීම සිදුවිය. මේ හේතුවෙන් ගොවීන් අතර ඉච්ඡාභංගත්වය ඇති වී ඇත. මෙහිදී පිරිමි ගොවීන් මත්පැනට ලොල් වූ අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා අසතුටුදායක පවුල් පරිසරයන් ඔවුන් තුළ ඇතිවිය. එමෙන්ම ගොවි පවුල් තුළ ආහාර හිඟය නිසා නිතර ඔවුන් කුසගින්නෙන් පෙළී ඇති අතර මෙකී දරිද්‍රතාවයට පිළිතුරු සෙවීමට සිදු වී ඇත්තේ ද කාන්තාවන්ටය. ගොවිතැන් බිඳ වැටීමත් සමඟම ග්‍රාමීය කාන්තාවන්ට රටේ ආර්ථිකයට දායක වීමට ඇති ඉඩකඩ ඇහිරී ගොස් ඇත. මේ හේතුව නිසා රජය ඊට පිළියමක් ලෙස සිදුකර ඇත්තේ එවැනි කාන්තාවන්ට මැදපෙරදිග රැකියා සොයා දීමයි.

රටේ සංවර්ධනයට යොදා ගන්නා කෝටි ගණන් ණය මුදල්වල පොලිවාරික සහ ණය ගෙවීමට විවිධ රජයන්ට නොහැකි වූ විට එහි බර දරන්නට සිදුවන්නේ ග්‍රාමීය කාන්තාවන්ටයි. එබැවින් ඔවුන් තම ජීවිතය පවා පරදුවට තබා මැදපෙරදිග වහල් සේවයට ගමන් කිරීම සිදුවේ. එමෙන්ම සිඩ්නි මාකස් ඩයස් සඳහන් කරන ආකාරයට රජයේ දැවැන්ත සංවර්ධනය යෝජනා ක්‍රම දියත් වූ ඉගිනිමිටිය ජලාශය ආශ්‍රිත ප්‍රදේශවල කාන්තාවන් 30% වඩා වැඩි පිරිසක් විදේශ ගත වී ඇත. ඔවුන් විදේශ ගත වී ශ්‍රී ලංකාවට පැමිණෙන මුදල්වලින් රජය විවිධ ණය වාරික ගෙවීම් හා විදේශ විනිමය උපයා ගත්ත ද කාන්තාවන්ගේ පවුල්වලට සිදුවී ඇති ඛේදනීය ඉරණම පිළිබඳව කිසිවකුගේ අවධානය යොමු වී නැත.

මව්වරුන් විදේශගත වීම නිසා ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් බීමතට ඇබ්බැහි වන අතර දරුවන් නොමඟ යාම පවුල් කඩාකප්පල් වීම ආදිය සිදු වී ඇත. එමෙන්ම ස්වාමිපුරුෂයන් වෙනත් සම්බන්ධතා

ඇරඹීම දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටීම නිසා මෙන්ම දරුවන් විවිධ ලිංගික අපයෝජනවලට ලක්වීම නිසාත් ගොවීන්ගේ පවුල් ජීවිත දැඩි අර්බුදයකට ලක් වී ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ පරපුර තම වැඩිහිටි පරපුර ගොවිතැනේ නියැලීම නිසා ඔවුන්ට අත්වූ ඛේදජනක ඉරණම හේතුවෙන් ඔවුන් ද ගොවිතැන් කටයුතු කෙරෙහි යොමු වීමට අදහස් නොකරන අතර එබැවින් ඔවුන් පෞද්ගලික අංශය හෝ රජයේ අංශය හෝ රැකියා කිරීමට සඳහා උනන්දුවක් දක්වයි.

රටේ ආර්ථිකය යළි ගොඩ නැංවීමට නම් පළමුවෙන්ම කළ යුත්තේ ග්‍රාමීය අංශයේ ආර්ථිකය යළි ගොඩ නැංවීමයි. ඒ සඳහා බිඳවැටී ඇති ගොවිබිම්වල පස නැවත සාරවත් කළ යුතුය. බහුජාතික සමාගම්වල බීජ වර්ග මතම යැපීමට බලා නොසිට දේශීය බීජ වර්ග පරිහරණය කිරීම දිරිමත් කළ යුතු අතර පළිබෝධ නාශක හා රසායනික පොහොර හැකි තරම් අවම කරගනිමින් ක්‍රමානුකූලව ඒවා අඩු කර පසුව ඒවා භාවිතයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කර දැමීමට ක්‍රමානුකූල වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය (ඩයස්, 2014).

## 08. තේ වගාව සඳහා භාවිත කරන ග්ලයිෆොසේට් නැමැති කෘෂි රසායනයට ඇමරිකා එක්සත් ජනපදය විසින් ගොනු කරනු ලැබූ නඩු තීන්දුව

ඇමරිකා එක්සත් ජනපදයේ අභියාචනාධිකරණය බේයර් සමාගමට එරෙහිව ඩොලර් මිලියන 25ක වන්දියක් අයකර ඇත. මෙහිදී බේයර් සමාගමේ ග්ලයිෆොසෙට් නැමැති කෘෂි රසායනය කැලිෆෝනියාවේ ගොවියෙකුගේ ලියුකේමියා තත්ත්වයකට හේතු වී ඇති බවට සොයාගෙන ඇත. බේයර් සමාගම විසින් තම කෘමිනාශකවලට එරෙහිව නීතිමය සීමා කිරීම් ඉවත් කර ගැනීමේ බලාපොරොත්තුව ට ද මෙය ප්‍රබල පහරක් වී ඇත. ඔවුන් ඇමරිකාව තුළ මෙවැනි කෘෂි රසායන සඳහා පනවා ඇති නීති සීමා කිරීමේ බලාපොරොත්තුවකින් සිටි ඇති අතර මෙම නඩුව ඔවුන්ට එම බලාපොරොත්තුව ඉටු කර ගැනීමට හරස් වී ඇත. බෙයර් සමාගම මෙතෙක් ඔවුන්ගේ ප්‍රචාරණ කටයුතුවල දී පවසා තිබුණේ සහ දශක ගණනාවක සිට ඔවුන් විසින් කරනු ලැබූ අධ්‍යයනවලින් පෙන්වා දී

ඇත්තේ වෙළඳපලේ ආධිපත්‍ය දරන අනෙකුත් ග්ලයිෆොසෙට් පදනම් කරගත් වල්නාශක මිනිස් භාවිතය සඳහා ආරක්ෂිත බවයි.

එමෙන්ම ග්ලයිෆොසෙට් මිනිස්සුන්ට ආරක්ෂිත යැ'යි එරට පරිසර ආරක්ෂණ ඒජන්සිය විසින් ද අනුමත කර ඇත. එහෙත් පසුව මෙම නඩු තීන්දුවත් සමගම ග්ලයිෆොසෙට්වලට නිරාවරණය වීම නිසා අනාගතයේ ගොවියන්ගේ සහ පාරිභෝගිකයන් ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ සෞඛ්‍ය අයහපත් බවට පත්විය විය හැකි පවසා ජනතාවගේ සෞඛ්‍ය වෙනුවෙන් නීතිමය පියවර ගැනීමට ඇමරිකාව පියවර ගෙන ඇත. එමෙන්ම බේයර් සමාගමට එරෙහිව නඩු තීන්දු වැඩි වන තරමටම ග්ලයිෆොසෙට් වැනි කෘෂි රසායන ද්‍රව්‍ය වෙළඳපොළෙන් ඉවත් කර ගැනීමට එම සමාගමට ඇමරිකා එක්සත් ජනපදයේ රජය විසින් එල්ල කරනු ලබන පීඩනය ද මේ වන විට වැඩි වී තිබේ.

මෙහිදී සැලකිය යුතු කරුණ වන්නේ මෙම බේයර් වැනි සමාගම්වල මව් සමාගම් පවතින්නේ ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල්වල ය. එබැවින් ඔවුන්ට එම සමාගම්වල ද්‍රව්‍ය ඇමරිකාව තුළ විකිණීම තහනම් කිරීම හෝ පාලනය කිරීමට ඇමරිකන් රජයට හැකියාව ලැබේ. එහෙත් කණගාටුවට කරුණ වන්නේ ඔවුන්ගේ නිෂ්පාදන පරිහරණය කරන අනිකුත් රටවලට මෙවැනි සමාගම්වලට එරෙහිව නඩු පැවරීමට ද වන්දි ඉල්ලා සිටීම ද නොහැකි තත්ත්වයක් පැවතීමයි. මෙවැනි වන්දියක් ඉල්ලනවා තබා දිළිඳු රටවල ගොවීන් තමා රෝගී වූයේ මෙම රසායන ද්‍රව්‍ය පරිහරණය නිසා යැ'ය කියා හෝ ඔවුන්ට දැනුමක් නොමැත. ඔවුන්ගේ රජය විසින් ද එවැනි දේ පිළිබඳව සොයා බලා ගොවීන් වෙනුවෙන් යුක්තිය ඉල්ලා සිටීමක් හෝ දක්නට නොලැබේ (U.S.News, 2021).

එමෙන්ම වර්තමානයේ සොයාගෙන ඇති ආකාරයට ශ්‍රී ලංකාවට ගෙන්වනු ලබන ග්ලයිෆොසේට් පිරිමි පුද්ගලයන් අතර වඳ භාවය ඇති කරන වල් නාශකයක් බවට ද සොයා ගෙන තිබේ. ශ්‍රී ලංකාවට ලෝකයේ ඇති ඕනෑම විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් ගෙන්වා ඒවා ශ්‍රී ලංකාවේම පවතින රසායනාගාරවලින් අනුමත කර ගැනීමට හැකි වී ඇත්තේ එම රසායනාගාර අධ්‍යක්ෂක මණ්ඩලවල

සහ පළිබෝධනාශක සමාගම්වල නිලධාරීන් ද කටයුතු කරන නිසා බව ප්‍රසිද්ධ රහසකි.

වෙළඳපොලේ පවතින ග්ලයිෆොසේට් නම් වල් නාශකය පිරිමින්ගේ වඳභාවයට හේතු වන බව පර්යේෂණාත්මක දත්ත මගින් හඳුනාගෙන ඇතැයි බී.බී.සී. පුවත් සේවය වාර්තා කරයි. කෙසේ වුව ද ශ්‍රී ලංකාවට මෙම ග්ලයිෆොසේට් නම් වල් නාශකය ගෙන්වන එක් සමාගමක් වන හේලීස් ඇග්‍රෝ ආයතනය විසින් පවසන්නේ ලෝකයේ තාක්ෂණික වශයෙන් දියුණු ම තත්ත්වය සිටින ඇමරිකාව, යුරෝපය සහ ජපානය වැනි රටවල් 80 ක පමණ මෙම වල්නාශක භාවිත කරන්නේ ඒවා පිළිබඳව විධිමත් පර්යේෂණ කිරීමෙන් පසු වන බැවින් ඒවා සෞඛ්‍යයට හානි දායක වීමේ ගැටලුවක් නොමැති බවයි.

මෙම ප්‍රකාශයේ වැරදි සහ සහගත බව ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ම ඔප්පු කර තිබේ. මෙම පළිබෝධනාශක ප්‍රධාන නිෂ්පාදකයන්ගෙන් මිළ දී ගන්නා ආයතන පවසන පරිදි ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට සාම්පල ලබා දී අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් මේවා වෙළෙඳ පොළට නිකුත් කරයි. ජාත්‍යන්තර වෙළෙඳ පොළේ අලෙවිය සඳහා පවතින කෘෂි රසායන ද්‍රව්‍ය සහ ශ්‍රී ලංකාවට ගෙන්වනු ලබන කෘෂි රසායන ද්‍රව්‍ය අතර විශාල වෙනසක් පවතී. ශ්‍රී ලංකාවේ විකිණීමට පවතින පළිබෝධනාශකවල ගුණාත්මක තත්ත්වය ලෝක වෙළෙඳපොළේ පවතින රසායනික ද්‍රව්‍යවලට වඩා බෙහෙවින් පහළ මට්ටමක පවතී. එමෙන්ම මේවාගේ ගුණාත්මක භාවය හඳුනා ගැනීම සඳහා විධිමත් පර්යේෂණ පැවැත්විය හැකි රසායනාගාර ද මේ වන තෙක් ශ්‍රී ලංකාවේ නොමැත. මෙහිදී ශ්‍රී ලාංකික ගොවියා සහ ඔවුන්ගේ අස්වනු පරිභෝජනය කරන අනිකුත් ශ්‍රී ලාංකිකයන් ද විශාල ව්‍යසනයකට ගොදුරු වී සිටින බව පැහැදිලි වේ (BBC පුවත්, 2016).

නවීන ආහාර නිශ්පාදනය යටතේ ග්ලයිෆොසෙට් යන වල් නාශකයට ඔරොත්තු දෙන බැක්ටීරියාවක් විද්‍යාඥයින් විසින් සොයා ගත් අතර මෙම බැක්ටීරියාවේ ජාන ශාකවලට බද්ධකොට ග්ලයිෆොසෙට් වල්නාශකයට ඔරොත්තු දෙන ශාක වර්ග නිර්මාණයය කර ගැනීමට ද හැකි විය. මෙයින් ඉදිරියෙන්ම තිබෙන්නේ සීනි

නිෂ්පාදනය කරන බීට් වර්ග සහ සෝයා බෝංචි යන ශාකයයි. මීට අමතරව තවත් ශාක ගණනාවක් මෙම වල් නාශකයට ඔරොත්තු දෙන ලෙස සකසා ඇත. අප ආහාරයට ගන්නා සීනි බොහෝ සෙයින් නිශ්පාදනය කරන්නේ ග්ලයිෆොසෙට්වලට ඔරොත්තු දෙන බීට් ශාකය මගිනි.

කලක් තිස්සේ සීනි නිෂ්පාදනය කරන ගොවීන්ට විශාල ගැටලුවක්ව පැවතියේ එම බීට් වර්ගයට එන වල් මර්දනය කිරීමට නොහැකි වීමයි. එහෙත් මෙම ජාන තාක්ෂණය නිසා ඔවුන්ට ග්ලයොෆොසේට් යොදාගෙන බීට් වගාවේ වල් මර්දනය කොට ඉතා ලාභදායි ලෙස සීනි නිශ්පාදනය කිරීමට හැකි වූ අතර වර්තමානයේ උක් වගාවෙන් සීනි නිෂ්පාදනය කිරීම වෙනුවට බීට්වලින් සීනි නිශ්පාදනය කිරීම ඉතා ලාභදායී වේ. එබැවින් අප ආහාරයට ගන්නා සීනිවල ඉතා අංශුමාත්‍ර වශයෙන් ග්ලයිෆොසේට් අඩංගු වේ. මේවා අපේ ශරීරයේ තැම්පත් වීම නිසා අපට විවිධ ලෙඩ රෝග වැළඳීමේ ඉඩක් ඇත. මේ වන විට නිශ්පාදනය කරන සෝයා ආහාරවල ද මේ ආකාරයෙන්ම ග්ලයිෆොසෙට් අංශුමාත්‍ර වශයෙන් අඩංගු වේ. එමෙන්ම බඩ ඉරිගු, සීනි සිරප්, ආදියේ ද මෙම ග්ලයිෆොසේට් අංශුමාත්‍රික වශයෙන් අඩංගු වේ.

මෙම වල් නාශකය බටහිර රටවල වගා කරන තිරිගු සහ මෝල්ට් යන වගාවන් සඳහා ද යොදා ගනු ලබයි. එහෙත් ඔවුන් මෙම වල් නාශකය යොදා ගන්නේ වල් නාශයකයක් ලෙස නොව අස්වැන්න නෙළීම පහසු කරවන උපාය මාර්ගයක් වශයෙනි. ඔවුන් අස්වැන්න පැසුණු පසු ග්ලයිෆොසේට් භාවිත කර වගාව වියලා ගනු ලබයි. වගාවේ ශාක මියගොස් ඉක්මනින් වියලා ගත් පසු ඉතා ඉක්මණින් අඩු කාලයකින් අස්වැන්න නෙලා ගත හැකි වන අතර අස්වැන්න අපතේ යාම ද අඩුවේ. එබැවින් අප වර්තමානයේ ආහාරයට ගන්නා තිරිගුපිටිවලින් නිෂ්පාදනය කරන සියලුම නිෂ්පාදනවල මෙම ග්ලයිෆොසෙට් අඩංගු විය හැකිය. එමෙනම අප කිරිපිටි ලෙස භාවිත කරන මෝල්ට් අඩංගු සියලු කිරිපිටි වර්ග විදේශ රටවලින් ආනයනය කරන අතර මේවාගේ ග්ලයිෆොසෙට් අඩංගු විය හැකිය.

එබැවින් අප රට තුළ ග්ලයිෆොසේට් අඩංගු නිශ්පාදන අප දැන හෝ නොදැන දිනකට කී වරක් නම් අප උපත ලැබූ දිනයේ සිටම භාවිත කරනවා ද යන්න පැහැදිළි වේ. ඇමරිකාවේ මෙම ග්ලයිෆොසෙට් භාවිත කිරීමත් සමග විවිධ බෝ නොවන රෝගාබාධ රැසක් හඳුනා ගැනීමට ලැබුණි. මේවා නම් දියවැඩියාව වකුගඩු ආබාධ, ස්නායු අබාධ ආදිය ඇති වන බව සොයාගෙන ඇත. ස්නායු ආබාධ පිළිබඳව සැළකීමේ දී වයස්ගත වීමේ දී ඇති වන අමතක වීම, ශරීරයේ සමබරතාවය පවත්වා ගැනීමට අපහසු වීම ආදිය ඇති විය. විශේෂයෙන් ඇමරිකාවේ කුඩා දරුවන් අතර අධි ක්‍රියාකාරී බව මෑත වසර විස්ස තුළ වාර්ථාවීමට පටන් ගත් අතර එමෙන්ම ඕටිසම් නැමැති රෝගී තත්ත්වය පවතින දරුවන් බිහි වීමද වැඩි විය (මදුෂාන්, 2019).)

මෙහිදී අපට පැහැදිලි වන කරුණක් වන්නේ මෙවැනි පළිබෝධ නාශක රට තුළ පමණක් පාලනය කර නිශ්ශබ්දව සිටීම නොකළ යුතු බවයි. අප රට තුළ නිශ්පාදනය නොකරන බොහෝ නිශ්පාදන අප පරිහරණය කරන අතර ඒවාගේ ඕනෑම් තරම් මෙම විෂ රසායනය පැවතිය හැකිය. එබැවින් මෙවැනි ආහාර මෙරටට ගෙන්වීමේ දී නිසි අධීක්ෂණයක් යටතේ මිනිසුන්ගේ සෞඛ්‍යයට හානි නොවන දෑ පමණක් ගෙන්වීමට රජය ක්‍රියා කළ යුතුය. එමෙන්ම මෙරට ජතාවට අවශ්‍ය දෑ මෙරට තුළම නිශ්පාදනය කර පරිභෝජනයට උත්සහ කළ යුතුය.

**9. සාරාංශය**

ශ්‍රී ලංකාවේ මේ වන විට වේගයෙන් පැතිරී යන වකුගඩු රෝගය සමාජ ව්‍යසනයක් බවට පත්වී තිබේ. මෙය වේගයෙන් වර්ධනය වීම ආරම්භ වූයේ මෙරට තුළ කෘෂි රසායනික සහ පොහොර භාවිතය අධික වීමත් සමගම ය. එමෙන්ම මෙරට ඇතැම් ප්‍රදේශවල පවතින ජලයේ ඇති අධික කඨිනත්වය ද එම ජලය පරිහරණය කරන ජනයාට වකුගඩු රෝග ඇති කිරීමට බලපානු ලබයි. එමෙන්ම මෙවැනි වගා කටයුතු සඳහා භාවිත කරනු ලබන පලිබෝධනාශක සහ රසායනික පොහොර ආදිය ගොවීන් විසින් ක්‍රමාණුකූල ලෙස බැහැර කිරීමක් සිදු නොකරයි. ඒවා ජල මූලාශ්‍ර අවට සහ පාරිසරික වශයෙන් ඉතා සංවේදී කලාපවලට බැහැර කිරීම

හේතුවෙන් මෙම රසායනිකයන් ජල මූලාශ්‍රවලට එක් වීම අතිශය භයානක ප්‍රතිපල ඇති කරයි.

එමෙන්ම රජයේ නිසි නියාමයක් නොමැති කම හේතුවෙන් මෙකී පළිබෝධනාශක අලෙවි කරන බහු ජාතික සමාගම්වල අලෙවි නියෝජිතවරුන් මෙම පලිබෝධනාශක ඇතුලු රසායනයන් භාවිත කරන ආකාරය පිළිබදව ගොවීන් දැනුවත් කරන අතර ඔවුන් මෙකී දැනුවත් කිරීම් කරන්නේ තම පලිබෝධනාශක වැඩියෙන් අලෙවි කර ලාභ ලබා ගැනීමට බැවින් මේවා භාවිතයේ දීර්ඝකාලින අතුරු විපාක පිළිබඳව ජනයා දැනුවත් නොකරයි. කෙටි කාලයකින් තම වගාවන්වල පළිබෝධ මර්ධනය කිරීමේ අවශ්‍යතාවය ගොවීන්ට ද පවතින බැවින් ඔවුන් මේවා තම වගාවන්වල අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලෙස මිළ දී ගන්න අතර තම වගාවන් මෙම රසායනයන් නොමැතිව කල නොහැකි බවට මතයක් ඇති වීමට ද මෙය බලපායි.

මෙහි ඇති කණගාටුදායකම කරුණ වන්නේ ඇතැම් ගොවීන් විකිණීම සදහා ඇති එළවලුවලට මෙවැනි ක්‍රියා සිදු කළ ද තම නිවාසවල පරිභෝජනය සදහා කිසිදු පළිබෝධ නාශකයක් නොයෙදූ එළවලු වර්ග භාවිත කිරීමයි. එයින් ඔවුන්ගේ නොදැනුවත්කමටත් වඩා වාණිජ අරමුණු උදෙසා අනෙක් පුද්ගලයන්ගේ ජීවිත පිළිබඳ නොසිතා ක්‍රියා කරන බවයි. එබැවින් මේවා අවම කිරීමටත් පරිසර හිතකාමී සොබාවික පළිබෝධ නාශක ගොවි ජනතාවට හඳුන්වා දීමටත් රජය නිසි නියාමයකින් යුතුව ක්‍රියා කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ජනනායක, ටී. [Channel Thissa jananayaka]. (2021, ජූනි 19). අපට වස කවන බහු ජාතික සමාගම් [video]. You Tube. Retrieved from https://youtu.be/aC_gQfWisjk

ජනනායක, ටී. [Channel Thissa jananayaka]. (2020). හේතු හඳුනා නොගත් වකුගඩු රෝගය [video]. You Tube. Retrieved from https://youtu.be/coK9EeB5Zao

ඩයස්, M.S. (පරි.) සොරාගත් අස්වැන්න. ශිවා,W. තෝතැන්න පබ්ලිෂිං හවුස්, (2014.)

මධුෂාන්, ඒ. [Channel SLDOC]. (2018, මැයි 18). ග්ලයිෆොසෙට් තිත්ත ඇත්ත [video]. You Tube.

Retrieved from https://youtu.be/UVwbP1ZKNws

Hals, T. (2021). U.S. Appeals Court Million Roundup Verdict In Blow in to Bayer. Retrieved from

https://www.youtube.com/redirect?event=video_description&redir_token=QUFFLUhqbENvVUYtU2JtMHpZMURKYUVMSXFacUpsanQ2QXxBQ3Jtc0tuWmYtNUJNQUR2dVNiWjVrR19kMGlVWHhVbktjQXdDRXUtOVZmMEowSlc0VW9jQXoybF9WXzVxdldwNVFjd2ZSVmNMLTU3ck54ZTlXR256X3pRQURscnNUazZyNEk1R0g0Q1JzVFJ4Yjg3QU5reUZ1MA&q=https%3A%2F%2Fwww.usnews.com%2Fnews%2Ftop-news%2Farticles%2F2021-05-14%2Fus-appeals-court-upholds-verdict-that-bayers-roundup-caused-cancer&v=u7vJVp4cgqI

විජේරත්න, මහින්ද සහ විජේරත්න, විනිතා (2006). *පළිබෝධනාශක භාවිතයේ ප්‍රතිවිපාක සහ ප්‍රායෝගික විසඳුම්.* මාතර: කර්තෘ ප්‍රකාශන.

සෝලංග ආරච්චි, ආර්. (2009). *අගස්මංගල්ලය.* නුගේගොඩ: සංදේශය ප්‍රකාශන.

BBC පුවත්, (2016). ග්ලයිෆොසෙට් පිරිමින් වඳ කරන වල් නාශකයක්, Retrieved from https://www.bbc.com/sinhala/sri-lanka-36653018

Bandara,L., Edirisinghe,J.C., Lokuge,N., Ranasingha, H.R.A.LN.,(2015). Water Treatment Preventive Measures and the Chronic kidney Disease in the Farming Community in Sri Lanka. *journal Of Agricultural Sciences – Sri Lanka, 10(02),* 98-108, Retriever from

https://www.researchgate.net/figure/Usage-of-preventive-measures-when-applying- agrochemicals_tbl5_277013630

Hals, T. (2021). U.S. Appeals Court Million Roundup Verdict In Blow in to Bayer. Retrieved from

https://www.youtube.com/redirect?event=video_description&redir_token=QUFFLUhqbENvVUYtU2JtMHpZMURKYUVMSXFacUpsanQ2QXxBQ3Jtc0tuWmYtNUJNQUR2dVNiWjVrR19kMGlVWHhVbktjQXdDRXUtOVZmMEowSlc0VW9jQXoybF9WXzVxdldwNVFjd2ZSVmNMLTU3ck54ZTlXR256X3pRQURscnNUazZyNEk1R0g0Q1JzVFJ4Yjg3QU5reUZ1MA&q=https%3A%2F%2Fwww.usnews.com%2Fnews%2Ftop-news%2Farticles%2F2021-05-14%2Fus-appeals-court-upholds-verdict-that-bayers-roundup-caused-cancer&v=u7vJVp4cgqI

Statistical Abstract, (2018). Department of Census and Statistics Ministry of Economics Affairs Sri Lanka.